201 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 201 - இல. 2
**Volume 201 - No. 2**

**2011 අගෝස්තු 10 වන බදාදා**
2011 ஓகஸ்ட் 10, புதன்கிழமை
**Wednesday, 10th August, 2011**



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
යාපනය මැතිවරණ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව අඩු කිරීම

**ශ්‍රී ලංකාවේ ගුවන් කලාපයට විදේශ හමුදා ගුවන් යානා සමූහයක් අනවසරයෙන් ඇතුළු වීම:**
සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
කාසිමි පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු එම්.එස්. තව්ෆික් මහතා] – පළමුවන වර කියවන ලදී

**ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත:**
නියමය

**රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත:**
නියමය

**කල් තැබීමේ යෝජනාව:**
ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ සේවකයන් මුහුණ පාන ගැටලු

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா**
யாழ்ப்பாணம் தேர்தல் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்களின் எண்ணிக்கை குறைப்பு

**இலங்கை வான் பரப்பினுள் வெளிநாட்டுப் போர் விமானங்களின் அத்துமீறிய பிரவேசம்:**
சிவில் விமானச் சேவைகள் அமைச்சரினது கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
காசிமி மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு எம்.எஸ். தௌபீக்]– முதன்முறை மதிப்பிடப்பட்டது

**செயல் நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்:**
கட்டளை

**அரச கைத்தொழில் கூட்டுத்தாபனங்கள் சட்டம்:**
கட்டளை

**ஒத்திவைப்புப் பிரேரணை:**
லங்கா சோல்ட் லிமிரெட் நிறுவன ஊழியர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Reduction of Number of Members of Parliament in Jaffna Electoral District

INTRUSION OF FOREIGN MILITARY AIRCRAFT INTO SRI LANKAN AIRSPACE:
Statement by Minister of Civil Aviation

PRIVATE MEMBERS' BILLS:
Casimi Foundation (Incorporation) – [Hon. M.S. Thowfeek] – Read the First time

STRATEGIC DEVELOPMENT PROJECTS ACT:
Order

STATE INDUSTRIAL CORPORATION ACT:
Order

ADJOURNMENT MOTION:
Problems Encountered by Employees of Lanka Salt Limited

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 අගෝස්තු 10 වන බදාදා***
*2011 ஓகஸ்ட் 10, புதன்கிழமை*
*Wednesday, 10th August, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු කථානායකතුමා වෙත ලැබී තිබෙනවා.

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය: ජීජේඑල්/308
2011 අගෝස්තු මස 06 වන දින.
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ"

# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
### MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 අගෝස්තු මස 10 වන බදාදා, එනම් අද දින පස් වරු 3.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් එයට පැමිණ සහභාගි වන ලෙස සියලුම ගරු සභික මන්ත්‍රීවරුන් හට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008-2009 වර්ෂ සඳහා සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රම සම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 10 වැනි වගන්තිය යටතේ වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2011; සහ

2010 අංක 20 දරන විසර්ජන පනතේ 6(1) වැනි වගන්තිය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අයවැය සහාය සේවා

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන් කිරීම් - 2011. - [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධිකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2009 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව - [අධිකරණ අමාත්‍ය ගරු රවුෆ් හකීම් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2010 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

2010 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු බන්දුල ගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු ඩිව් ගුණසේකර මහතා - පැමිණ නැත.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා - පැමිණ නැත.

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා - පැමිණ නැත.

ගරු නවීන් දිසානායක මහතා - පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු කථානායකතුමනි, මම හේවායින්න, කොස්හේනගම පදිංචි පී.කේ.ඩබ්ලිව්.එස්. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දික්වැල්ල, වත්තේගම දකුණ, අංක 451/බී. දරන ස්ථානයේ පදිංචි ටී.ඩී. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා - පැමිණ නැත.

ගරු කබීර් හෂීම් මහතා - පැමිණ නැත.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා - පැමිණ නැත.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇත්කඳුර, වැව රවුම පදිංචි ශ්‍රියානි වැකුණගොඩ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දිළුම් අමුණුගම මහතා - පැමිණ නැත.

ගරු සජිත් රෝහණ කොඩිතුවක්කු මහතා - පැමිණ නැත.

ගරු සනත් ජයසූරිය මහතා - පැමිණ නැත.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් නවය පිළිගන්වමි.

(1) වලහන්දූව, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන අජිත් කොළඹගේ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන එස්.ටී. ඩබ්ලිව්. ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගාල්ල දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයේ සේවය කරන ජී.එල්. දයාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන එන්. ධනපාල මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ජී.එල්. බන්දුල රණසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ඩබ්ලිව්.ආර්. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන එල්.පී.එස්. රංජිත් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ඩී.ඩබ්ලිව්. නන්දසේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(9) බෝපෙ, පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන කේ.එච්.ජී. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 77/2 දරන ස්ථානයේ පදිංචි ජී.පී.එච්. හර්මන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා - පැමිණ නැත.

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## ශ්‍රී ලංකා විදුහල්පති සේවය: සේවක සංඛ්‍යාව
## இலங்கை பாடசாலை அதிபர்கள் சேவை: ஆளணிக் கணிப்பீடு
## SRI LANKA PRINCIPALS' SERVICE: CADRE COUNT

0754/'10

1. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විදුහල්පති සේවයේ සිටින විදුහල්පතිවරුන්ගේ හිඟය හේතුවෙන් දැනට වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත්වීම් ලැබ පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව සෑම වර්ෂයකම ජනවාරි 01 හා ජූනි 01 යන දින දෙකෙන් විදුහල්පති සේවයේ සේවක සංඛ්‍යාව ගණනය කළ යුතු බවත්;

(ii) පසුගිය වර්ෂ 15ක පමණ කාල සීමාවකදී නියමිත දින වකවානුවලදී විදුහල්පති සේවයේ උසස්වීම් ලබා දී නොමැති බවත්;

(iii) ඉහත ආ(i) පරිදි විදුහල්පති සේවයේ සේවක සංඛ්‍යාව ගණනය කිරීම සිදු කර නියමානුකූලව පුරප්පාඩු පිරවීම සිදුකරන්නේ නම්, වැඩ බලන විදුහල්පතිවරු පත් කිරීමකින් තොරව විදුහල්පති සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව ඉදිරියේදී කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை பாடசாலை அதிபர்கள் சேவையில் இடம்பெறும் பாடசாலை அதிபர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) பாடசாலை அதிபர்கள் சேவையில் இடம்பெறும் பாடசாலை அதிபர்களுக்கான பற்றாக்குறை காரணமாக தற்போது பதில் பாடசாலை அதிபர்களாக நியமனம் பெற்று பாடசாலைகளில் கடமையாற்றும் பாடசாலை அதிபர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) பாடசாலை அதிபர் சேவை யாப்பின் பிரகாரம் ஒவ்வோராண்டும் சனவரி 01 மற்றும் யூன் 01 ஆகிய இரண்டு திகதிகளிலும் பாடசாலை அதிபர்கள் சேவையிலுள்ள ஆளணி எண்ணிக்கையை கணிப்பீடு செய்தல் வேண்டுமென்பதையும்,

(ii) கடந்த சுமார் 15 ஆண்டு காலமாக உரிய காலத்தில் பாடசாலை அதிபர்கள் சேவையில் பதவி உயர்வுகள் வழங்கப்படவில்லையென்பதையும்,

(iii) மேற்படி (ஆ) (i) இன் பிரகாரம் பாடசாலை அதிபர்கள் சேவையிலுள்ள ஆளணி எண்ணிக்கையை கணிப்பீடு செய்து உரிய விதத்தில் வெற்றிடங்கள் நிரப்பப்படுமாயின் பதில் பாடசாலை அதிபர்களை நியமிக்காது பாடசாலை அதிபர்கள் சேவை யாப்பினை நடைமுறைப்படுத்த முடியுமென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) பாடசாலை அதிபர்கள் சேவை யாப்பின் பிரகாரம் எதிர்காலத்தில் நடவடிக்கைகள் முன்னெடுக்கப்படுமா வென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) the number of principals in the Sri Lanka Principals' Service; and

(ii) the number of principals who have been appointed as acting principals and are currently serving in schools due to the shortage of principals in the Principals' Service?

(b) Will he admit that-

(i) according to the Principals' Service Minute, the cadre of the Principals' Service should be

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

counted on first of June and first of January every year ;

(ii) the promotions in the Principals' Service have not been granted on due dates during the period of nearly past 15 years ; and

(iii) the Principals' Service Minute can be implemented without appointing acting principals, if the cadre of the Principals' Service is counted as mentioned in (b)(i) and vacancies are filled in the proper manner ?

(c) Will he state whether action will be taken in accordance with the Principals' Service Minute in the future?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i)

| පන්තිය / ශ්‍රේණිය | 2011.06.01 දිනට සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව |
|---|---|
| 1 පන්තිය | 2042 |
| 2 - i ශ්‍රේණිය | 2367 |
| 2-ii ශ්‍රේණිය | 2257 |
| 3 පන්තිය | 1219 |

(ii)

| | | | |
|---|---|---|---|
| 01. | උතුරු මැද පළාත | - | 273 |
| 02. | බස්නාහිර පළාත | - | 244 |
| 03. | ඌව පළාත | - | 309 |
| 04. | උතුරු පළාත | - | 266 |
| 05. | දකුණු පළාත | - | 275 |
| 06. | මධ්‍යම පළාත | - | 450 |
| 07. | සබරගමු පළාත | - | 274 |
| 08. | වයඹ පළාත | - | 308 |
| 09. | නැගෙනහිර පළාත | - | 368 |
| | එකතුව | - | 2767 |

(ආ) (i) ඔව්.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුකමිටුව වන අධ්‍යාපන සේවා කමිටුව යටතේ විදුහල්පති සේවයේ උසස්වීම් සහ පත් කිරීම් සිදු කරන ලදී.

i. කාර්ය නියුක්ත විදුහල්පතිවරුන් සඳහා 1993 මැයි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව එහි දී ක්‍රියාත්මක වූ 1985-01-01 විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව විදුහල්පති ii ශ්‍රේණිය හා iii ශ්‍රේණිය ලබා දී ඇත. එවකට පත්වීම් ලබා දීම සම්බන්ධව කටයුතු කරන ලද්දේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුකමිටුව වන අධ්‍යාපන සේවා කමිටුව විසිනි.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුකමිටුව විසින් 2001 වර්ෂයේ 2000.08.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුහල්පති 3 පන්තියේ හා 2 - ii ශ්‍රේණිය වැඩ බලන විදුහල්පතිවරුන් හට ලබා දී ඇත.

iii. ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 20 හා 21 ඡේද ප්‍රකාර 1999 වර්ෂයේ දී පවත්වන ලද සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත 2002.01.01 වර්ෂයේ 3 පන්තියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුකමිටුව වන අධ්‍යාපන සේවා කමිටුව නියමය පරිදි පත් කිරීම් සිදු කර ඇත.

iv. ඉන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසුරුවා හැරීමත් සමඟ අධ්‍යාපන ලේකම් යටතේ ඉන් පසු ඇති වූ පුරප්පාඩු මත විදුහල්පති සේවය,

3 පන්තියේ සිට 2 - ii ශ්‍රේණියටද

2 - ii ශ්‍රේණියේ සිට 2 - i ශ්‍රේණියටද

2 - i ශ්‍රේණියේ සිට 1 පන්තියටද උසස් කරන ලදී.

තවද 2005 වර්ෂයේ පවත්වන ලද විදුහල්පති සේවයේ 3 පන්තියට හා 2 - ii ශ්‍රේණියට විභාගය මත සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු බඳවා ගන්නා ලදී.

| විදුහල්පති පන්තිය/ ශ්‍රේණිය | රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසුරුවා හැරීමෙන් පසු අධ්‍යාපන ලේකම් විසින් ලබා දුන් උසස්වීම් සංඛ්‍යාව | 2005 වර්ෂයේ පැවති විභාගය මත බඳවා ගන්නා ලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 පන්තිය | 2592 | - |
| 2 - i ශ්‍රේණිය | 2002 | - |
| 2-ii ශ්‍රේණිය | 516 | 1948 |
| 3 පන්තිය | - | 1705 |

(iii) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අනුමත සේවක සංඛ්‍යාව 16512 වුවත් මීට වසරකට පෙර හා ඊටත් පෙර මෙම සේවයේ සත්‍ය වශයෙන් සිටි නිලධාරීන් සංඛ්‍යාව 10,000කට වඩා අඩු විය. 2002.01.01 වසරේදී පත්වීම් සහ 1996.12.31 දිනට උසස් වීම් දීමෙන් පසු 2009 වසර වන තෙක් කිසිදු උසස්වීමක් හෝ පත්වීමක් ලබා දී නැත. මේ හේතුවෙන් පසාල් බොහොමයක විශේෂයෙන් දුෂ්කර පළාත්වල පාසල්වල විදුහල්පති ඡ්‍රේණීධාරින්ගේ හිඟයක් පැවතිණි. මේ හේතුවෙන් සෑම පළාතකම පළාත් බලධාරීන් විසින් ශ්‍රී ලංකා ගුරු සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙවැනි පාසල්වල විදුහල්පති තනතුරුවල රාජකාරි ආවරණයට පත් කර ඇත.

දැනට අනුමත කිරීමට නියමිතව ඇති නව ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව උසස්වීම් ලබා දීමට හා විභාග පවත්වා විධිමත්ව 2011 වසරේ සිට බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු සිදු කල හැක.

එසේම විදුහල්පති සේවය 3 පන්තිය හා 2 - ii ශ්‍රේණිය සඳහා පුරප්පාඩු පිරවීම කළ නොහැකි වීඇත්තේ විදුහල්පතිවරුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය යටතේ (නඩු අංක 212/2010FR) හා 979/09(FR) ගොනු කළ නඩු පවතින බැවිනි.

(ඈ) දැනටමත් විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව කටයුතු කරනු ලබන අතර විධිමත් පරිදි නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුමත වීමෙන් පසුව ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.

(2011.04.05 දිනැතිව නව විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලයට යොමු කර ඇත.)

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අතුරු ප්‍රශ්න තුනක් මා සතුව තිබෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විද්‍යාලවල විදුහල්පතිවරුන්ගේ හිඟයක් ඇති අවස්ථාවන්වලදී ගුරු සේවයේ පිරිස් වැඩ බලන විදුහල්පතිවරුන් හැටියට පත් කිරීමේදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයත්, රේඛීය අමාත්‍යාංශයත් අනුගමනය කරන පොදු නිර්ණායකයක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ පත්වීම්වලට එකම සුදුසුකම වෙලා තිබෙන්නේ දේශපාලන හිතවත්කමයි. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ වරද නිවැරැදි කරලා සාධාරණ ක්‍රමවේදයක් ස්ථාපනය කරන්න කටයුතු කරන්නේ කවදාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ කථාව ඉතාමත් පිළිකුල්සහගතව ප්‍රතික්ෂේප කරනවා. පළාත් නවය සඳහා විදුහල්පතිවරුන් 2,767 දෙනකු පත් කර තිබෙනවා. මෙයින් වැඩිපුරම -450 දෙනකු- බඳවා ගෙන තිබෙන්නේ මධ්‍යම පළාතේ වතුකරයේ පාසල් සඳහායි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වාගේ දුෂ්කර පාසල්වලට විදුහල්පතිවරුන් බඳවා නොගැනීමේ හේතුවෙන් තමන්ගේ පුංචි එකාට ගමේ පාසලෙන් ඉගෙන ගන්න තිබෙන අවස්ථාව නැති වනවා. ඔවුන්ගේ අධ්‍යාපනය කඩා වැටෙන්න නොදී ඒ පාසල නඟා සිටුවන්න ඕනෑ නිසා පළාත් සභාවලට ඉතාම ඍජු ලෙස එයට මැදිහත් වන්න සිදු වුණා. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුදුසුකම් තිබෙන මේ විදුහල්පතිවරුන් පළාත් සභා මඟින් පත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ දැන ගැනීමට දේශපාලන පත්වීම් ලබා දීපු ආකාරය පිළිබඳව මා කරුණු පහක් ඉදිරිපත් කරනවා. දේශපාලන පත්වීම් අනුව 1977 සිට 1994 දක්වා එක්සත් ජාතික පක්ෂය උපගුරුවරුන්ට විදුහල්පති ශ්‍රේණි ලබා දුන් ආකාරය මා කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඒ විස්තර මෙසේයි:

1980.12.12 හැන්සාඩ් වාර්තාවේ 13 වන කාණ්ඩයේ 14 වන කලාපයේ 3050 සිට 3072 දක්වා තීරුවල නම් සඳහන් සහනලාභීන්ට ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරු ප්‍රදානය කිරීම. ඊ ළඟට 1986.11.18 වන දින හැන්සාඩ් වාර්තාවේ 43 වන කාණ්ඩයේ 5 වන කලාපයේ 549 වන තීරුවේ සඳහන් වන පරිදි, ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ V වන පන්තියේ තනතුරු 62ක් ප්‍රදානය කිරීම. ඊ ළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1982.04.21 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 1982.04.21 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පාසලේ ශ්‍රේණියට අනුව කා.නි. විදුහල්පතිවරුන්ට ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ V සහ වන විදුහල්පති ශ්‍රේණි ප්‍රදානය කිරීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියවන්න කාලය නොගෙන පුද්ගලයන්ගේ නම් ඇතුළත් මෙම ලේඛනය මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි පැහැදිලිව කියනවා දීර්ඝ කාලයක් කඩා වැටී තිබුණු අධ්‍යාපනය නඟා සිටු වන්න, ග්‍රාමීය අධ්‍යාපනය ආරක්ෂා කරන්න පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ගේ, පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ මැදිහත් වීමෙන් ප්‍රබල උත්සාහයක් අරගෙන තිබෙන බව. මේ වැඩ බලන විදුහල්පතිවරු කිසිම කෙනෙකුට දීලා තිබෙන්නේ දේශපාලන පත්වීම් නොවෙයි. ගමේ ළමයාගේ අධ්‍යාපනය ආරක්ෂා කිරීමට ගත්ත පියවරක් හැටියට ඒ අය වැඩ බලන විදුහල්පතිවරු හැටියට පත් කරලා මේ පාසල්වල කටයුතු කරලා තිබෙනවා. එහෙම නොකළොත් සුදුසුකම් ඇති මෙම විදුහල්පතිවරුන්ට මහ අපරාධයක් වෙනවා. ගැට කොට පළනවා වාගේ බැරි අමාරු රාජකාරි කරලා, වැටෙන් පනින දුරකින් නැති පාසලට ගිරි දුර්ග, වන දුර්ග පසු කරමින් පයින් ගිහිල්ලා දීර්ඝ කාලයක් සේවය කරපු මේ විදුහල්පතිවරුන් ඔවුන්ගේ සුදුසුකම් මත සේවයේ ස්ථිර කිරීම අත්‍යවශ්‍ය කාරණාවක් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, සුදුසුකම් මත. සුදුසුකම් නැති කිසිම කෙනකුට මේ තනතුරු දීලා නැහැ කියන එකත් මම මේ ගරු සභාවට කියනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අංක දෙකට යන්න ඉස්සර වෙලා මේ කාරණය කියන්න ඕනෑ. මා බොහොම සරල ප්‍රශ්නයක් ඇහුවේ. පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශයටත්, රේඛීය අමාත්‍යාංශයටත් මේ වන විට පොදු නිර්ණායකයක් නැහැ විදුහල්පතිවරුන්ගේ හිඟයක් ඇති වෙන වෙලාවක ගුරු සේවයේ පිරිස් වැඩ බලන විදුහල්පතිවරුන් හැටියට පත් කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අර බලන්න. වැඩ බලන්නයි පත් කරන්න කියන්නේ. ඒක තමයි කරලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒ කටයුත්ත සහමුලින්ම ක්‍රියාත්මක වෙන්නේ දේශපාලනය මුදුන් පත් කර ගෙන. කවදාද මේ වැරැදි ක්‍රමය නිවැරැදි කරන්නට කටයුතු කරන්නේ? ඒ මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
වැඩ බලන නායකයකු නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
වැඩ බලන විදුහල්පතිවරු පත් කරලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඒකයි. [බාධා කිරීම්] ඒකට නොවෙයි උත්තර දුන්නේ. [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වැඩ බලන නායකයා වෙන්න හදනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඇහෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාම නේ කෑ ගහන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ පිළිතුර මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
වැඩ බලන විදුහල්පතිවරු පත් කරලා තිබෙන්නේ. එතුමා කියපු එකමයි කරලා තිබෙන්නේ. වැඩ බලන නායකයකු නොවෙයි පත් කරලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පත් කර තිබෙනවා ලු. අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විදුහල්පති සේවා විභාගයක් පවත්වන්නේ නැතිව, වැඩ බලන විදුහල්පතිවරු විදුහල්පතිවරු හැටියට ස්ථිර කිරීමේදී, ඒ විදුහල්පති පත්වීම් දෙස බාහිර සමාජය බලන්නේ ඇත්ත වශයෙන්ම ඒවා නුසුදුසු දේශපාලන පත්වීම් හැටියට. මේ දැක්ම නිසා, මේ බැල්ම නිසා අධ්‍යාපනයේ කඩා වැටීමක් සිදු වෙනවාද කියලා මා අහන්න කැමැතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මොකක්ද? මට ආයෙත් පාරක් කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වෙනත් අය එක්ක අමතර කථා කර කර ඉන්නවා නම් හරි යන්නේ නැහැ නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නැහැ. අමතර කථා නැහැ. ඔබතුමා එක්ක දැන් කෙළින් කථා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි.

මා ඇහුවේ මේකයි. මේ වාගේ දේශපාලන පත්වීම් ලබා දෙන කොට, ඒවා නුසුදුසු දේශපාලන පත්වීම් නිසා සමාජය ඒවා දිහා දේශපාලන දෘෂ්ටි කෝණයකින් බලනවා. ඒ වාගේම, නුසුදුස්සන් විදුහල්පතිවරුන් හැටියට පත් කිරීම තුළින් ඇත්ත වශයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ බිඳ වැටීමක් සිද්ධ වන්නේ නැද්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා අහන ප්‍රශ්නය බලන්න. ඊයේ මෙතුමා කිව්වා, ආනන්ද විද්‍යාලයට සෞන්දර්ය ගුරුවරුන් පස් දෙනෙක් දමලා කියලා. මම ඒ ගැන පොඩ්ඩක් කිව්වාට කමක් නැහැ නේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒකට තමයි මම මේ උත්තර දෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්නකෝ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මේක මහා සංකීර්ණ ප්‍රශ්නයක්. එහෙම සරල උත්තර දෙන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ ප්‍රශ්නයට අදාළව, ප්‍රකාරව උත්තර දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට ඔබතුමාගේ උත්තරය දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞන්දර්ය ගුරුවරු හත් දෙනෙක් පත් කරලා තිබෙනවා. සෞන්දර්ය විෂයය ඇතුළේ විෂය ධාරා කීයක් තිබෙනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නය ඒක නොවෙයි. මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පොඩ්ඩක් ඉන්න. විදුහල්පතිවරයාගේ තැනට එන්නම් ගුරුවරයාගේ ඉඳලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න ගරු ඇමතිතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අහපු ප්‍රශ්නයට තමයි මේ උත්තර දෙන්නේ. ඔබතුමා ටිකක් නිවිහැනහිල්ලේ මේක අහගන්නකෝ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අහපු ප්‍රශ්නයට තමයි උත්තර දෙන්නේ. පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සෞන්දර්ය විෂයය ඇතුළේ නැටුම් තිබෙනවා, සංගීතය තිබෙනවා, නාට්‍ය හා රංග කලාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම සෞන්දර්ය විෂයය ගැන ප්‍රශ්නයක් ඇහුවේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඉතින් ආනන්ද විද්‍යාලය වැනි සිංහල, බෞද්ධ විද්‍යාලයකට මෙතුමා මෙච්චර විරුද්ධ මොකද කියන ප්‍රශ්නයයි මට තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම සෞන්දර්ය විෂයය ගැන ප්‍රශ්නයක් ඇහුවේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා නායකයාට විරුද්ධ වුණාට කමක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චිත්‍ර විෂයය තිබෙනවා.

මේ රටේ තිබෙන ප්‍රබල සිංහල, බෞද්ධ විද්‍යාලයකට සෞන්දර්ය ගුරුවරු 7 දෙනෙක් දැම්මාම විරුද්ධ වෙන නායකයා විදුහල්පතිවරු ගැන මොන තක්සේරුවක් ඇති කර ගෙන තිබෙනවාද කියන එක මම දන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහපු ප්‍රශ්නයට උත්තරය දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, මොකක්ද ඔබතුමාගේ උත්තරේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
උත්තරයක් නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මොකද නැත්තේ? මේ තිබෙන්නේ. ඔබතුමාට ඕනෑ උත්තරය දෙන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්නයට ප්‍රකාරව පිළිතුර ලබා දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඊළඟ ප්‍රශ්නය අහන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දුන්නාද ගරු ඇමතිතුමනි?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එහෙම නම් දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි.

මම දැන් ඔබතුමාට පැහැදිලිව කිව්වා, වැඩ බලන විදුහල්පතිවරුන් පත් කිරීමේදී ඇත්ත වශයෙන්ම මේකට දේශපාලනය සම්බන්ධ වෙලා තිබෙනවා කියලා. [බාධා කිරීමක්] කරුණාකරලා මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නයට ඉඩ දෙන්නකෝ. දැන් බලන්න, අමාත්‍ය මණ්ඩල සන්දේශයක් තිබෙනවා, 2011/ ED/E/14 කියලා. ඒකේ "සාධාරණීකරණය" කියන මාතෘකාව යටතේ කාර්ය බහුලතාව මත දුෂ්කරතාව නිසා විභාග අසමත් වුවත් තනතුරු, වරප්‍රසාද ලබා දීමට සුදුසුයි කියන යෝජනාව කැබිනට් එකටත් ඉදිරිපත් කරලා තිබෙනවා. මම අහන්න කැමැතියි ඔබතුමාගෙන්, කොහොමද ඒ විභාග අසමත් වුවන්ට ඒ වාගේ විදුහල්පති තනතුරු ලබා දෙන්න හැකියාව තිබෙන්නේ කියලා?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මෙන්න, මා ළඟ තිබෙනවා ඒ සන්දේශය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, මම එය ප්‍රතික්ෂේප කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඒ සන්දේශය හැන්සාඩ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය දෙන්න ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම එය ප්‍රතික්ෂේප කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එවැනි කැබිනට් පත්‍රිකාවක් දමලා නැහැ කියලා මම බය නැතිව කියනවා. මම පැහැදිලි කරන්න ඕනෑ විභාග අසමත් කිසිම කෙනෙකුට මොනම කැබිනට් පත්‍රිකාවකින්වත් විදුහල්පති තනතුරක් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය සූදානම් නැහැ කියන එක. සුදුසුකම් ඇති අයට පමණයි ඒවා ලබා දෙන්නේ කියන එක මම ස්ථිරවම ප්‍රකාශ කර සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙතුමාගේ පියාගේ කැබිනට් පත්‍රිකාත් මා ළඟ තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මේ ගරු සභාව නොමඟ යවනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නොමඟ යවන්නේ නැහැ. ඔබතුමාගේ පියාගේ කැබිනට් පත්‍රිකා නම් මා ළඟ තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අමාත්‍ය මණ්ඩල සන්දේශයේ කොපියක් මා ළඟ තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ගරු ඇමතිතුමාගේ පිළිතුර එතුමා පිළිතුර හැටියට දැක්වූවාට පස්සේ-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
එතුමාගේ පියාගේ කාලයේ කැබිනට් පත්‍රිකාත් මා ළඟ තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකරලා මම අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න. ඔබතුමා බොරුවක් කළේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ, නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කැබිනට් සන්දේශය මා ගාව තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම බොරුවක් කළේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියා සිටිනවා නම්, එසේ දෙයක් නැත්නම් ස්ථාවර නියෝග අනුව අපට භාර ගන්න සිද්ධ වන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරයි.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම එම කැබිනට් සන්දේශය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කළා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමාගේ පියාගේ කාලයේ කැබිනට් පත්‍රිකා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හැන්සාඩගත කරන්න.

## තොරතුරු තාක්ෂණය සහ පරිගණක අධ්‍යාපනය: මාතර දිස්ත්‍රික්කයේ පාසල්
## தகவல் தொழிநுட்பம் மற்றும் கணனிக் கல்வி: மாத்தறை மாவட்டப் பாடசாலைகள்
## INFORMATION TECHNOLOGY AND COMPUTER EDUCATION: SCHOOLS IN MATARA DISTRICT

0938/'10

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පාසල්වල තොරතුරු තාක්ෂණය සහ පරිගණක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා වර්ෂ 2005 සිට මේ දක්වා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ පරිගණක මධ්‍යස්ථාන ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉදිරි වර්ෂයේදී මාතර දිස්ත්‍රික්කයේ පාසල් තුළ නව පරිගණක මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ යටතේ පරිගණක මධ්‍යස්ථාන ආරම්භ කරන පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) එම මධ්‍යස්ථාන ආරම්භ කිරීමට නියමිත දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

***ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் உள்ள பாடசாலைகளில் தகவல் தொழிநுட்பம் மற்றும் கணனிக் கல்வியை ஊக்குவிப்பதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) இதற்காக 2005 ஆம் ஆண்டிலிருந்து இதுவரை ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்பதையும்;

(iii) மாத்தறை மாவட்டத்தில் காணப்படும் பாடசாலை களின் கணனி நிலையங்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) மேற்படி பாடசாலைகளின் பெயர்களும் விலாசங்க ளும் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அடுத்த ஆண்டில் மாத்தறை மாவட்ட பாடசாலை களில் புதிய கணனி நிலையங்களை ஆரம்பிப்ப தற்கு திட்டங்கள் வகுக்கப்பட்டுள்ளதா என்பதை யும்;

(ii) அவ்வாறெனில், அதன் கீழ் கணனி நிலையங்கள் ஆரம்பிக்கப்படும் பாடசாலைகளின் பெயர்களும் விலாசங்களும் யாவையென்பதையும்;

(iii) இதற்காக ஒதுக்கப்பட்ட தொகை எவ்வளவென்ப தையும்;

(iv) மேற்படி நிலையங்கள் ஆரம்பிக்கப்படும் திகதிகள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) the steps that have been taken by the government to promote information technology and computer education in schools in the Matara District;

(ii) the amount of money that has been allocated for the aforesaid purpose from the year 2005 up to now;

(iii) the number of schools where there are computer centres in Matara District; and

(iv) the names and addresses of those schools?

(b) Will he inform this House-

(i) whether plans have been drawn to start new computer centres at schools in the Matara District in the coming year;

(ii) if so, the names and addresses of the schools in which computer centres will be started under the above mentioned plans;

(iii) of the amount of money that has been allocated for the aforesaid purpose; and

(iv) of the dates on which the aforesaid computer centres are due to be started ?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா]
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ඇති පාසල්වල තොරතුරු තාක්ෂණය සහ පරිගණක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ගෙන ඇති පියවර:

(1) 2004 වර්ෂයේදී පාසල් පද්ධතිය තුළ 12 ශ්‍රේණිය සඳහා අතිරේක විෂයක් ලෙස සාමාන්‍ය තොරතුරු තාක්ෂණය ආරම්භ කරන ලද අතර මේ යටතේ මාතර දිස්ත්‍රික්කයේ පාසල් 75ක විෂය ආරම්භ කර මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ පිළිබඳ විස්තර **ඇමුණුම 01**හි දක්වා ඇත.

(2) 2002 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ සියලුම කලාප ආවරණය වන ලෙස කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථාන ද පළාත් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන ද ලබා දීම. විස්තර **ඇමුණුම 02**හි දක්වා ඇත.

(3) 2006 වර්ෂයේදී පාසල් තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස 10,11 ශ්‍රේණි සඳහා ආරම්භ කරන ලද අතර මාතර දිස්ත්‍රික්කයේ පාසල් 113 තුළ විෂය ක්‍රියාත්මක වේ. විස්තර **ඇමුණුම 03**හි දක්වා ඇත.

(4) 2009 වර්ෂයේ අපොස (උ.පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස ආරම්භ කරන ලදී. ඒ යටතේ පාසල් 11ක පමණ විෂය ක්‍රියාත්මක වේ. විස්තර **ඇමුණුම 04** හි දක්වා ඇත.

(5) 2007 වර්ෂයේ දී පාසල් පරිගණක විද්‍යාගාරවල නඩත්තු විධිමත් කිරීම සඳහා ජාතික මට්ටමේ පරිගණක දෘඩාංග හා ජාලගත විසඳුම් සංචිතයක් ආරම්භ කර ලදී. මේ යටතේ කලාප මට්ටමින් ගුරුවරුන් පුහුණු කරන ලදී. එම ගුරුවරුන් පාසල් පරිගණක විද්‍යාගාරවල දෘඩාංග ගැටලු විසඳීමට සෘජුවම දායක වේ. විස්තර **ඇමුණුම 05** හි දක්වා ඇත.

(6) 2008/2009/2010 යන වර්ෂවල දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය මෙවලමක්ලෙස පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා මාතර දිස්ත්‍රික්කයේ ගුරුවරුන් 06ක් පමණ විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා සම්පත් පුද්ගලයින් ලෙස පුහුණු කිරීම. විස්තර **ඇමුණුම 06** හි දක්වා ඇත.

(7) 2005 සිට 2011/05/30 දින දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මාතර දිස්ත්‍රික්කයේ පාසල්වලට ලබා දී ඇති පරිගණක විද්‍යාගාර සංඛ්‍යාව 157 ක් පමණය වේ. විස්තර නාමලේඛනය සඳහා **ඇමුණුම 07** බලන්න.

(8) පාසල් තුළ ගුරුවරුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂය දැනුම යාවත්කාලීන කිරීම සඳහා සම්පත් පුද්ගල සංචිතයක් ස්ථාපිත කිරීම. මේ යටතේ ගුරුවරු 06ක් පමණ පුහුණු කරන ලදී. විස්තර **ඇමුණුම 08** හි දක්වා ඇත.

(9) නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පාසල් තුළට හඳුන්වා දීම යටතේ 2009 වර්ෂයේ Interactive whiteboard (අන්තර්ක්‍රියාකාරී සුදුපුවරුව) ලබා දීම - මාතර රාහුල විද්‍යාලය (පළාතකට එක බැගින් වන සේ ලබා දෙන ලදී.) මාතර රාහුල විද්‍යාලය සඳහා සියලුම පහසුකම් සහිත අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාරයක් ලබා දීම. මේ සඳහා රුපියල් මිලියන 8. 48ක් පමණ වැය කරන ලදී.

10. ජාතික පාසල් තුළ පරිගණක පහසුකම් සංවර්ධනය යටතේ පරිගණක ලබා දීම. (ඇමුණුම් 09හි දක්වා ඇත.)

11. පාසල්වලට අන්තර්ජාල පහසුකම් ලබා දීම. (schoolnet යටතේ)

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා විෂය සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද මුදල පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | වෙන් කරන ලද මුදල |
|---|---|
| පාසල් පරිගණක සහ පරිගණක විද්‍යාගාර ලබා දීම | මිලියන 110ක් පමණ |
| විෂය පුහුණු වැඩමුළු | මිලියන 01ක් පමණ |
| එකතුව | මිලියන111ක් පමණ |

(iii) 2005 සිට 2011.05.30 දින දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය හා දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මාතර දිස්ත්‍රික්කයේ පාසල්වලට පරිගණක විද්‍යාගාර 157ක් පමණ ලබා දී ඇත. (ඇමුණුම 07හි දක්වා ඇත.

(iv) ඇමුණුම 07හි දක්වා ඇත. 01-09 දක්වා ඇමුණුම් **සභාගත*** කරමි.

(ආ) සැලසුම් කර තිබේ.

ප්‍රශ්න අංක (ii), ප්‍රශ්න අංක (iii) සහ ප්‍රශ්න අංක (iv) ට අදාළ පිළිතුරු පහත වගුවේ දැක්වේ.

| ප්‍රශ්න අංක (ii) | ප්‍රශ්න අංක (iii) | ප්‍රශ්න අංක (iv) |
|---|---|---|
| 1. නව පරිගණක විද්‍යාගාර ආරම්භ කිරීම<br>* මාතර කලාපය සඳහා කලාපීය පරිගණක සම්පත් මධ්‍යස්ථානයක් (Computer Resource Center) ස්ථාපිත කිරීම. | රු. මිලියන 3.75 | 2012 වර්ෂයේ පෙබරවාරි මස පමණ ආරම්භ කිරීමට නියමිතය. |
| 2. ප්‍රාථමික පාසල් 7 ක් සඳහා පරිගණක 10 බැගින් යුත් පරිගණක විද්‍යාගාර 7 ක් ලබාදීම. රු. මිලියන 3.5 | රු. මිලියන 3.5 | 2012/ 2013 |
| 3. GEP 2 ව්‍යාපෘතිය යටතේ ලබාදුන් පාසල් 3 කට අලුතින් පරිගණක 21 ක බැගින් ලබාදීම. | රු. මිලියන 3 | 2012/ 2013 |
| 4. පළාත් පාසල් 8 ක් සඳහා පරිගණක 15 බැගින් ලබාදී දැනට පවතින පරිගණක සම්පත් මධ්‍යස්ථාන යාවත්කාලීන කිරීම. | රු. මිලියන 8 | 2012/ 2013 |
| 5. ද්විතීයික පාසල් 1000 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාතර දිස්ත්‍රික්කයෙන් තෝරාගන්නා පාසල් සඳහා අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාර ලබාදීමට නියමිතය. | සැලසුම් සකස් කරමින් පවතී. | ද්විතීයික පාසල් 1000 ආරම්භ කිරීම සමගාමීව අංග සම්පූර්ණ පරිගණක විද්‍යාගාර ආරම්භ කිරීමට නියමිතය. |

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*

*Annexes tabled:*

ඇමුණුම 01

**අ.පො.ස. (උ. පෙළ) 12 ශ්‍රේණිය සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය උගන්වන පාසල් නාම ලේඛනය**

| අංකය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | මා/දාරුල් උලූම් මහා විදුහල | මාතර |
| 2 | මා/දික්වැල්ල උතුර ම.වි. | දික්වැල්ල |
| 3 | මා/ඇහැලපෙ විද්‍යාරාජ ම.වි. | අකුරැස්ස |
| 4 | ගොඩපිටිය ම.ම.වි. | අකුරැස්ස |
| 5 | මා/හල්ලාල ම.වි. | වැලිගම |
| 6 | මා/හිත්තැටිය ධර්මරාජ ක.වි. | මාතර |
| 7 | හොරගොඩ ම.වි. | තෙලිජ්ජවිල |
| 8 | ජේ.ආර්.එස්.ද අල්මේදා ක.වි. | අකුරැස්ස |
| 9 | මා/කඹුරුගමුව ම.වි. | කඹුරුගමුව |
| 10 | මා/කිත්තලගම බටහිර ම.වි. | තිහගොඩ |
| 11 | මා/කොකාවල ම.වි. | කැකණදුර |
| 12 | මා/කොන්ගල ම.ම.වි. | හක්මන |
| 13 | මා/කොටපල ම.වි. | කොටපල |
| 14 | මා/කොටවිල ම.වි. | කඹුරුගමුව |
| 15 | මා/කොටුව ජනාධිපති වි. | මාතර |
| 16 | මා/කොටුවේගොඩ ඉල්මා වි. | මාතර |
| 17 | මා/කුමාරතුංග මුනිදාස වි. | දික්වැල්ල |
| 18 | මා/මහමායා බාලිකා වි. | මාතර |
| 19 | මා/මාලිම්බඩ ශ්‍රී සුමේධා ම.වි. | පාලටුව |
| 20 | මා/මාතර ම.ම.වි. | මාතර |
| 21 | මා/මෙතොඩිස් ම.ම.වි. | හක්මන |
| 22 | ම/මිංහාත් ම.වි. | දික්වැල්ල |
| 23 | මා/මිරිස්ස ම.ම.වි. | මිරිස්ස |
| 24 | මා/මොරවක බෞද්ධ ම.වි. | මොරවක |
| 25 | මා/නාරංදෙණිය ම.ම.වි. | කඹුරුපිටිය |
| 26 | මා/නාරවැල්පිට දකුණ ම.වි. | හක්මන |
| 27 | මා/ඉව්විගමුව ම.වි. | කරපුටුගල |
| 28 | මා/පාලටුව ගුණරතන ම.වි. | පාලටුව |
| 29 | මා/පල්ලේගම ම.වි. | කොලවෙනිගම |
| 30 | මා/පඹුරන සාරිපුත්ත ම.වි. | මාතර |
| 31 | මා/පිටබැද්දර ම.වි. | පිටබැද්දර |
| 32 | මා/ පොල්වතුමෝදර ම.වි. | මිරිස්ස |
| 33 | මා/පුහුල්වැල්ල ම.වි. | පුහුල්වැල්ල |
| 34 | මා/රදම්පොල ශ්‍රී සුමංගල ම.ම.වි. | ඌරුගමුව |
| 35 | මා/රාහුල වි. | මාතර |
| 36 | මා/රොටුඹ ම.වි. | මාතර හරහා |
| 37 | මා/ශ්‍රී සුමංගල බාලිකා වි. | වැලිගම |
| 38 | මා/ශාන්ත මරියා කන්‍යාරාමය | මාතර |
| 39 | මා/ ශාන්ත සර්වර්ටියස් වි. | මාතර |
| 40 | මා/ශාන්ත තෝමස් බා.ම.වි. | මාතර |
| 41 | මා/ශා.තෝමස් කුමර වි. | මාතර |
| 42 | මා/සුජාතා බාලිකා ම.වි. | මාතර |
| 43 | මා/තලල්ල උතුර ම.වි. | කැකුණදුර |
| 44 | මා/තලාල්ල දකුණ ම.වි. | කෝට්ටගොඩ |
| 45 | මා/තල්පාවිල ම.ම.වි. | දෙවිනුවර |
| 46 | මා/තෙලිජ්ජවිල රාජකීය ම.වි. | තෙලිජ්ජවිල |
| 47 | මා/තිහගොඩ ම.ම.වි. | තිහගොඩ |
| 48 | මා/ඌරුබොක්ක ම.ම.වි. | ඌරුබොක්ක |
| 49 | මා/විජිත ම.ම.වි. | දික්වැල්ල |
| 50 | මා/වල්ගම මහානාම ම.වි. | මාතර |
| 51 | මා/වනිගසේකර ම.වි. | මාතර |
| 52 | මා/සිද්ධාර්ත බාලක ම.ම.වි. | වැලිගම |
| 53 | මා/විල්පිට ම.වි. | අකුරැස්ස |
| 54 | මා/සහිරා ම.වි. | වැලිගම |
| 55 | මා/අපරැක්ක ම.වි. | දියගහ |
| 56 | මා/ගන්දර ම.වි. | ගන්දර |
| 57 | මා/ගොඩඋඩ ම.වි. | කෝට්ටගොඩ |
| 58 | මා/තෙලිජ්ජාවිල ම.ම.වි. | තෙලිජ්ජාවිල |
| 59 | මා/විද්‍යානිකේත විද්‍යාරතන පිරිවෙන | කඹුරුපිටිය |
| 60 | මා/මාරම්බ ම.වි. | අකුරැස්ස |
| 61 | මා/මාකදුර ම.වි. | මාතර |
| 62 | මා/මොරවක කීර්ති අබේවික්‍රම ම.ම.වි. | මොරවක |
| 63 | මා/අකුරැස්ස ම.වි. | අකුරැස්ස |
| 64 | මා/අල්මින මුස්ලිම් ම.වි. | හක්මන |
| 65 | මා/අරහා ම.ම.වි | වැලිගම |
| 66 | මා/අතුරලිය ම.වි. | අකුරැස්ස |
| 67 | මා/දම්පෙල්ල ම.වි. | තෙලිජ්ජවිල |
| 68 | මා/දියගහ බටහිර ම.වි. | නාවින්න |
| 69 | මා/දෙහිගස්පා ඩඩ්ලි සේනානායක ම.වි. | පිටබැද්දර |
| 70 | මා/දෙනගම විපුලසාර ම.ම.වි. | දෙනගම |
| 71 | මා/දෙනිපිටිය ම.වි. | දෙනිපිටිය |
| 72 | මා/දෙනියාය ම.ම.වි | දෙනියාය |
| 73 | මා/දෙනියාය රාජ[illegible] ම.වි. | දෙනියාය |
| 74 | මා/දෙනියාය ශාන්ත මැතිව්ස් ක.වි. | දෙනියාය |
| 75 | මා/දෙවිනුවර ම.ම.වි. | දෙවිනුවර |

ඇමුණුම 02

**පරිගණක සම්පත් මධ්‍යස්ථාන ලේඛනය**

| කලාපය | නම | ලිපිනය |
|---|---|---|
| අකුරැස්ස | ගොඩපිටිය පරිගණක සම්පත් මධ්‍යස්ථානය | මා/ගොඩපිටිය ම.ම.වි. අකුරැස්ස |
| | තෙලිජ්ජවිල පරිගණක සම්පත් මධ්‍යස්ථානය | තෙලිජ්ජවිල ම.ම.වි., තෙලිජ්ජවිල |
| දෙනියාය | කොටපොල පරිගණක සම්පත් මධ්‍යස්ථානය | දෙනියාය ජා.පා., දෙනියාය |

පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය, අමරසූරිය පුහුණු විද්‍යාලය, උනවටුන

ඇමුණුම 03

**අ.පො.ස. (සා. පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය උගන්වන පාසල් නාම ලේඛනය**

| අංකය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | මා/අනුර වි. | නො.54,ශ්‍රී රත්නපාල මාවත, මාතර |
| 2 | මා/අරහා ම.ම.වි. | වැලිගම |
| 3 | මා/බතීගම ම.වි. | දික්වැල්ල |
| 4 | මා/බෙලිදෙනිය ම.වි. | බෙලිදෙනිය,කොට්ටටගොඩ |
| 5 | මා/දියගහ බටහිර ම.වි. | නවිමාන |
| 6 | මා/දෙවිනුවර ම.ම.වි. | දෙවිනුවර |
| 7 | මා/දික්වැල්ල උතුර ම.වි. | දික්වැල්ල |
| 8 | මා/හිත්තැටිය ධර්මරාජ ම.වි. | මාතර |
| 9 | මා/කඹුරුගමුව නැගෙනහිර වි. | කඹුරුගමුව |
| 10 | මා/කඹුරුගමුව ම.වි. | කඹුරුගමුව |
| 11 | මා/කොකාවල ම.ම.වි. | කැකුණදුර |
| 12 | මා/කොටවිල ශ්‍රී රනපාල ම.වි. | කොටවිල,කඹුරුගමුව |
| 13 | මා/කොටුව ජනාධිපති ක.වි. | මාතර |
| 14 | මා/ කුමාරතුංග මුනිදාස ම.වි. | දික්වැල්ල |
| 15 | මා/කොටුවේගොඩ ඉල්මා වි. | කොටුවේගොඩ, මාතර |
| 16 | මා/ මහමායා බා.ම.වි. | බීච් පාර, කොටුවේගොඩ, මාතර |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

| | | |
|---|---|---|
| 17 | මා/මාතර ම.ම.වි. | මාතර |
| 18 | මා/මින්හත් ජාතික පාසල | යෝනාකපුර, දික්වැල්ල |
| 19 | මා/මිරිස්ස ම.ම.වි. | මිරිස්ස |
| 20 | මා/නායිම්බල බණ්ඩත්තර ම.වි. | තිහගොඩ |
| 21 | මා/නාවිමන මහාරාජ ම.වි. | නාවිමන |
| 22 | මා/පාලටුව ගුණරතන ම.වි. | පාලටුව |
| 23 | මා/පඹුරන සාරිපුත්ත ම.වි. | පඹුරන,මාතර |
| 24 | මා/පොල්වතුමෝදර ම.වි. | මිරිස්ස |
| 25 | මා/පොල්වත්ත ක.වි. | පොල්වත්ත,දෙනිපිටිය |
| 26 | මා/රදම්පොල ශ්‍රී සුමංගල ම.ම.වි. | ඌරුගමුව |
| 27 | මා/රාහුල වි. | මාතර |
| 28 | මා/රෝහන ම.වි. | මැදවත්ත,මාතර |
| 29 | මා/ශ්‍රී සුමංගල බාලිකා වි. | වැලිගම |
| 30 | මා/ශාන්ත මරියා කන්‍යාරාමය | මාතර |
| 31 | මා/ශාන්ත සර්වටියස් වි. | කොටුවේගොඩ,මාතර |
| 32 | මා/ශාන්ත තෝමස් බා.ම.වි. | වල්පොල,මාතර |
| 33 | මා/ශාන්ත තෝමස් කුමර වි. | කුමාරතුංග මාවත,මාතර |
| 34 | මා/සුජාතා බා.ම.වි. | රාහුල පාර,මාතර |
| 35 | මා/තලල්ල උතුර ධර්මවිජය ම.වි. | කැකුණදුර |
| 36 | මා/තලල්ල දකුණ ම.වි. | කෝට්ටගොඩ |
| 37 | මා/තල්අරඹ ශ්‍රී ඉන්ද්‍රසාර ම.වි. | කඹුරුගමුව |
| 38 | මා/තල්පාවිල ම.ම.වි. | තල්පාවිල,දෙව්නුවර |
| 39 | මා/තුඩාව ම.වි. | මාතර |
| 40 | මා/විජිත ම.ම.වි. | දික්වැල්ල |
| 41 | මා/මහානාම ම.වි. | වල්ගම,මාතර |
| 42 | මා/වේවහමන්දුව වනිගසේකර ම.වි. | වේවහමන්දුව,මාතර |
| 43 | මා/වැලිගම ධර්මරාජ ක.වි. | වැලිගම |
| 44 | මා/සිද්ධාර්ථ වි. | වැලිගම |
| 45 | මා/අපරැක්ක ම.වි. | දියගහ |
| 46 | මා/අසෝක ම.වි. | වැව්රුකන්නල,දික්වැල්ල |
| 47 | මා/ජයමහා විහාර විද්‍යායතන පිරිවෙන | කිතුල්වෙල, මාතර |
| 48 | මා/ගන්ධර ම.වි. | ගන්ධර |
| 49 | මා/ ගොඩඋඩ නවෝද්‍යා වි. | කෝට්ටගොඩ |
| 50 | මා/විද්‍යාතුංග විද්‍යායතන පිරිවෙන | වැව්රුකන්නල,දික්වැල්ල |
| 51 | මා/මහමන්තින්ද පිරිවෙන | ශ්‍රී රතනපාල මාවත,මාතර |
| 52 | මා/මොරවකගදර බණ්ඩාරනායක ම.වි. | කැකුණදුර |
| 53 | මා/අල්මිනා මුස්ලිම් ම.වි. | මීඇල්ල,හක්මන |
| 54 | මා/බමුණුගම ම.වි. | හොරපාවිට |
| 55 | මා/දෙයියන්දර ජා.පා | දෙයියන්දර |
| 56 | මා/දෙනගම ක.වි. | දෙනගම |
| 57 | මා/දෙනගම විපුලසාර ම.ම.වි. | දෙනගම |
| 58 | මා/කැන්දගොඩ ක.වි. | හක්මන |
| 59 | මා/කැටියපේ ම.වි. | දෙයියන්දර |
| 60 | මා/කැබිලියපොල ක.වි. | හක්මන |
| 61 | මා/කිතල්ගම බටහිර ම.වි. | තිහගොඩ |
| 62 | මා/කෝන්ගල ම.ම.වි. | හක්මන |
| 63 | මා/මෙතෝදිස් ම.ම.වි. | හක්මන |
| 64 | මා/නාරංදෙණිය ම.ම.වි. | කඹුරුපිටිය |
| 65 | මා/නරවැල්පිට දකුණ ම.වි. | හක්මන |
| 66 | මා/ඕවිටිගමුව ම.වි. | කරපුටුගල |
| 67 | මා/පුහුවැල්ල ම.ම.වි. | පුහුවැල්ල |
| 68 | මා/තිහගොඩ ම.ම.වි. | තිහගොඩ |
| 69 | මා/යටියන ම.වි. | යටියන |
| 70 | මා/කරගොඩ උයන්ගොඩ ම.වි. | කරගොඩ, උයන්ගොඩ |
| 71 | මා/ශ්‍රී රතනජෝති ජ්‍යෙෂ්ඨ පිරිවෙන | ඌරපොළ, තිහගොඩ |
| 72 | මා/විද්‍යානිකේත වි. | ශ්‍රී රතනපාල මාවත,කඹුරුපිටිය |
| 73 | මා/විද්‍යානිකේත විද්‍යායතන පිරිවෙන | කඹුරුපිටිය |
| 74 | මා/මාකඳුර ම.ම.වි. | මාකඳුර,මාතර |
| 75 | මා/විද්‍යාරාජ පිරිවෙන | පන්නවල,මී ඇල්ල |
| 76 | මා/ඇලපල්දෙණිය ම.වි. | ඇලපල්දෙණිය |
| 77 | මා/ බෙන්ගමුව ම.වි. | බෙන්ගමුව |
| 78 | මා/බෙරලපනාතර ම.වි. | බෙරලපනාතර |
| 79 | මා/දෙණියාය ම.ම.වි. | දෙණියාය |
| 80 | මා/දෙණියාය රාජපක්ෂ ක.වි. | දෙණියාය |
| 81 | මා/ගින්නලිය ක.වි. | ඌරුබොක්ක |
| 82 | මා/කළුබෝවිටියන ම.වි. | කළුබෝවිටියන |
| 83 | මා/කිරිලිපන ක.වි. | මොරගල්ල, කිරිලිපන |
| 84 | මා/කොටපල ම.වි. | කොටපල |
| 85 | මා/මැදිරිපිටිය ක.වි. | දෙනියාය |
| 86 | මා/පල්ලේගම ම.වි. | කොලවෙණිගම |
| 87 | මා/පරගල ක.වි. | පරගල,මොරවක |
| 88 | මා/පිටබැද්දර ම.වි. | පිටබැද්දර |
| 89 | මා/රොටුඹ විජයබා ම.වි. | රොටුඹ, මාතර හරහා |
| 90 | මා/ඌරුබොක්ක ම.ම.වි. | ඌරුබොක්ක |
| 91 | මා/එම්.ඩී.යාපා ම.වි. | දෙණියාය පාර, වැරැල්ල |
| 92 | මා/මොරවක කීර්ති අබේවික්‍රම ම.ම.වි. | මොරවක |
| 93 | මා/අකුරැස්ස ම.වි. | අමල්ගොඩ, අකුරැස්ස |
| 94 | මා/අන්නූර් මුස්ලිම් බා.ම.වි. | කපුවත්ත, දෙනිපිටිය |
| 95 | මා/අතුරලිය ම.වි. | අතුරලිය, අකුරැස්ස |
| 96 | මා/දම්පැල්ල ම.වි. | දම්පැල්ල,තෙලිජ්ජවිල |
| 97 | මා/දෙනිපිටිය ම.වි. | දෙනිපිටිය |
| 98 | මා/ඇහැලපේ විද්‍යාරාජ ම.වි. | මාලිදූව,අකුරැස්ස |
| 99 | මා/ගොඩපිටිය ක.වි. | තිබ්බොටුව,අකුරැස්ස |
| 100 | මා/ගොඩපිටිය ම.ම.වි. | අකුරැස්ස |
| 101 | මා/හල්ලල ම.වි. | වැලිගම |
| 102 | මා/හොරගොඩ ම.වි. | හොරගොඩ,තෙලිජ්ජවිල |
| 103 | ම/ජේ.ආර්.එස් ද අල්මේදා ක.වි. | ඌරුමුත්ත,අකුරැස්ස |
| 104 | මා/ජඹුරේගොඩ ම.වි. | ජඹුරේගොඩ,වැලිගම |
| 105 | මා/මාලිම්බොඩ ශ්‍රී සුමේධ ම.වි. | පාලටුව |
| 106 | මා/තෙලිජ්ජවිල රාජකීය ම.වි. | තෙලිජ්ජවිල |
| 107 | මා/වැලිහේන ක.වි. | බෝපාගොඩ,අකුරැස්ස |
| 108 | මා/විල්පිටිය ම.වි. | අකුරැස්ස |
| 109 | මා/සහිරා ම.වි. | වැලිපිටිය, වැලිගම |
| 110 | මා/ශ්‍රී පරමානන්ද විද්‍යායතන පිරිවෙන | බෝපාගොඩ,අකුරැස්ස |
| 111 | මා/තෙලිජ්ජවිල ම.ම.වි. | තෙලිජ්ජවිල |
| 112 | මා/මාරඹ ම.වි. | අකුරැස්ස |
| 113 | මා/මලිදූව නවෝද්‍යා ම.වි. | මලිදූව |

ඇමුණුම 04

**අ. පො. ස. (උ.පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය උගන්වන පාසල් ලැයිස්තුව**

1 මා/ මාතර ම.ම.වි.

2 මා/ශ්‍රී සුමංගල වි.,වැලිගම

3 මා/කොටුව ජනාධිපති වි.,මාතර

4 රාහුල වි.,අකුරැස්ස පාර, මාතර

5 මා/විජිත ම.ම.වි.,දික්වැල්ල

6 මා/තලාල්ල දකුණ ම.වි.

7 මා/අර්ෆා ම.ම.වි.,වැලිගම

8 මා/සුජාතා බා.වි.,මාතර

9 ඌරුබොක්ක ජා.පා.,ඌරුබොක්ක

10 මා/ ඇහැල්පේ විද්‍යාරාජ ම.වි.,මාලිදූව, අකුරැස්ස

11 මා/මාලිම්බඩ උතුර ම.වි.,පැලැතුව

ඇමුණුම 05

**දෘඪාංග හා ජාලගත විසඳුම් සංචිතය**

| අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 1 | ඩබ්.ඒ.සුමිත් ප්‍රියන්ත ජයවර්ධන මයා | මා/ ශ්‍රී සුමංගල බා.වි. , වැලිගම |
| 2 | නලින් වීරසිංහ මයා | මා/ කුමාරතුංග මුණිදාස ම.වි., මාතර |
| 3 | එල්.ජී.කේ.කිත්සිරි මයා | මා/බෙලිදෙණිය ම.වි.,කොටවේගොඩ |
| 4 | එස්.එම්.ඒ.වසන්ත මයා | මා/බතිගම වි., බතිගම,දික්වැල්ල |
| 5 | මනෝජ් කස්තුරිආරච්චි මයා | මා/රාජකීය ම.වි.,තෙලිජ්ජවිල |
| 6 | එල්.ඩී.ආර්.පී.උදයකුමාර මයා | මා/අකුරැස්ස ම.වි.,අකුරැස්ස |
| 7 | එම්.චන්දන ගුණසේකර මයා | මා/තෙලිජ්ජවිල ම.ම.වි.,තෙලිජ්ජවිල |
| 8 | පී.ඒ.චන්ද්‍රදාස මයා | මා/නරාවැල්පිටිය දකුණ ම.වි, නාරවැල්පිටිය |
| 9 | ජී.ධර්මසිරි මයා | මා/දෙනගම විපුලසේන ම.වි. |
| 10 | ජී.ජී.විජිත කුමාර මයා | කලාප අධ්‍යාපන කාර්යාලය, හක්මන |
| 11 | කේ.වී.එස්.එම්.මොහාන්ලාල් මයා | මා/බෙරලපනාතර ම.වි, බෙරලපනාතර |
| 12 | ඩී.ඩී. රණවීර මයා | මා/ඌරුබොක්ක ම.ම.වි., ඌරුබොක්ක |
| 13 | ඩබ්.ජේ.කේ.වී. කුසුම්සිරි මයා | මා/ රාජපක්ෂ ම.වි., දෙණියාය |

ඇමුණුම 06

**විෂයානුබද්ධ මෘදුකාංග නිපැයුම් සංචිතය**

| අංකය | ගුරුභවතාගේ නම | පාසලේ නම |
|---|---|---|
| 1 | ඩී.එම්.එන්.දිසානායක මයා | තෙලිජ්ජවිල රාජකීය වි.,තෙලිජ්ජවිල |
| 2 | ආර්.එස්.එදිරිසිංහ මයා | සිද්ධාර්ථ වි.,වැලිගම |
| 3 | එම්.ජී.එන්.මනෝහර මයා | මා/ මාකඳුර ම.ම.වි., මාකඳුර |

**වෙබ් අඩවි නිර්මාණ සංචිතය**

| අංකය | ගුරුභවතා නම | කාර්යාලීය ලිපිනය |
|---|---|---|
| 1 | කේ.සී.පී.අබේසිරිවර්ධන මයා | කලාප අධ්‍යාපන කාර්යාලය, මාතර |

**අන්තර් ක්‍රියාකාරී පුවරුව පිළිබඳව පුහුණු කල ගුරු නාම ලේඛනය**

| අංකය | නම | කාර්යාලීය ලිපිනය |
|---|---|---|
| 1 | ටී.ටී.සිරිවර්ධන මිය | මා/රාහුල වි., මාතර |
| 2 | එච්.ඒ. ජානක ප්‍රසන්න මයා | |

ඇමුණුම 07

**සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය II (GEP II) යටතේ පරිගණක විද්‍යාගාර ලබාදුන් පාසල් නාම ලේඛනය**

| අංකය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | මාර/ තෙලිජ්ජවිල ම.ම.වි. | තෙලිජ්ජවිල |
| 2 | මාර/ කනන්කේ සිරිපැරකුම්බා ම.ම.වි. | කනන්කේ කඩවීදිය |
| 3 | මාර/ ගොඩපිටිය ම.ම.වි. | ගොඩපිටිය , අකුරැස්ස |
| 4 | සිද්ධාර්ථ බාලක ම.වි. | වැලිගම |
| 5 | රාහුල වි. | මාතර |
| 6 | සුජාතා බාලිකා වි. | මාතර |
| 7 | ශාන්ත තෝමස් බාලක වි. | කුමාරතුංග මාවත, මාතර |
| 8 | ශාන්ත තෝමස් බාලිකා උසස් පාසල | වල්පොල, මාතර |
| 9 | තල්පාවිල ම.ම.වි. | දෙවිනුවර |
| 10 | විජිත ම.ම.වි. | දික්වැල්ල |
| 11 | කීර්ති අබේවික්‍රම ම.ම.වි. | මොරවක |
| 12 | ඌරුබොක්ක ම.ම.වි. | ඌරුබොක්ක |
| 13 | දෙනියාය ම.ම.වි. | දෙනියාය |
| 14 | නාරංදෙනිය ම.ම.වි. | කඹුරුපිටිය |
| 15 | දෙයියන්දර ම.ම.වි. | දෙයියන්දර |
| 16 | මාකඳුර ම.ම.වි. | මාකඳුර |

**ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය I**

**පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන (2002 – 2005)**

| අංකය | පාසලේ නම | ලිපිනය | පරිගණක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අර්ෆා ම.වි. | වැලිගම | 13 |
| 2 | දෙවිනුවර ම.ම.වි. | දෙවිනුවර | 13 |
| 3 | කොග්ගල ම.වි. | හක්මන | 23 |
| 4 | කුමාරතුංග මුනිදාස ම.වි. | දික්වැල්ල | 23 |
| 5 | මාතර ම.වි. | මාතර | 23 |
| 6 | පුහුල්වැල්ල ම.වි. | පුහුල්වැල්ල | 13 |
| 7 | ශ්‍රී සුමංගල බා.ම.වි. | වැලිගම | 23 |
| 8 | ශාන්ත සර්වියටිස් වි. | මාතර | 23 |
| 9 | ගුණරතන ම.ම.වි. | පාලටුව, මාතර | 23 |
| 10 | ශ්‍රී සුමංගල ම.වි. | රදම්පොල | 23 |
| 11 | අකුරුස්ස ම.වි. | අකුරුස්ස | 23 |
| 12 | මෙතෝඩිස් ම.වි. | හක්මන | 23 |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

| | | | |
|---|---|---|---|
| 13 | නරවැල්පිට දකුණ ම.වි. | හක්මන | 23 |
| 14 | විපුලසාර ම.වි. | දෙනගම | 18 |
| 15 | බෙරලපනාතර ම.වි. | බෙරලපනාතර | 23 |
| 16 | කොටපොළ ම.වි. | කොටපොළ | 18 |
| 17 | තිහගොඩ ම.වි. | තිහගොඩ | 18 |
| 18 | තලල්ල උතුර ම.වි. | කැකනදුර | 18 |
| 19 | ඩඩ්ලි සේනානායක ම.වි. | දෙහිගස්පෙ | 23 |
| 20 | අලපලාදෙනිය ම.වි. | අලපලාදෙනිය | 18 |
| 21 | මිරිස්ස ම.වි. | මිරිස්ස | 18 |
| 22 | සාරිපුත්‍ර ම.වි. | පඹුරණ, මාතර | 18 |
| 23 | මහමායා බාලිකා ම.වි. | මාතර | 23 |
| 24 | රාජකීය වි. | තෙලිජ්ජවිල | 18 |
| 25 | දෙනිපිටිය ම.වි. | දෙනිපිටිය | 13 |
| 26 | ගොඩඋඩ ම.වි. | කෝට්ටෙගොඩ | 18 |
| 27 | හල්ලාල ම.වි. | වැලිගම | 13 |
| 28 | කළුබෝවිටියන ම.වි. | කළුබෝවිටියන | 18 |
| | කිතලගම (බස්නාහිර) ම.වි. | තිහගොඩ | 13 |
| 30 | මහානාම ම.වි. | වල්ගම, මාතර | 18 |
| 31 | මලිදූව ම.වි. | අකුරැස්ස | 13 |
| 32 | මාලිම්බඩ සුමේධ ම.වි. | මාලිම්බඩ | 13 |
| 33 | මාවරැල්ල ම.වි. | මාවැල්ල | 18 |
| 34 | ඕවිටිගමුව ම.වි. | කරපුටුගල | 13 |
| 35 | පල්ලේගම ම.වි. | පල්ලේගම, කොලනිගම | 18 |
| 36 | පිටබැද්දර ම.වි. | පිටබැද්දර | 18 |
| 37 | තලල්ල (දකුණ) ම.වි. | තලල්ල (දකුණ), කෝට්ටෙගොඩ | 13 |
| 38 | විල්පිට ම.වි. | අකුරැස්ස | 18 |
| 39 | යටියන ම.වි. | යටියන | 13 |
| 40 | විජයබා ම.වි. | රොටුඹ, මාතර | 23 |
| 41 | පොල්වතුමොදර ම.වි. | මිරිස්ස | 23 |
| 42 | බමුණුගම ම.වි. | හොරපාවිට | 23 |
| 43 | හොරගොඩ ම.වි. | තෙලිජ්ජවිල | 23 |
| 44 | මින්හාත් මුස්ලිම් ම.වි. | දික්වැල්ල | 23 |
| 45 | මාරම්බෙ ම.වි. | අකුරැස්ස | 23 |
| 46 | කොකාවෙල ම.වි. | කැකනදුර, මාතර | 23 |
| 47 | රාජපක්ෂ ම.වි. | දෙනියාය | 23 |

**ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය II**

**පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන (2002 – 2008)**

| අංකය | පාසලේ නම | ලිපිනය | පරිගණක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගන්දර ම.වි. | ගන්දර | 23 |
| 2 | ඇහැලපේ විද්‍යාරාජ ම.වි. | මලිදූව, අකුරැස්ස | 23 |
| 3 | උරුමුත්ත අල්මේදා ම.වි. | උරුමුත්ත , අකුරැස්ස | 23 |
| 4 | බෙන්ගමුව ම.වි. | බෙන්ගමුව | 23 |
| 5 | ධර්මරාජ ම.වි. | හිට්ටාටිය, මාතර | 23 |
| 6 | කොටුවෙ ජනාධිපති ම.වි. | කොටුවෙ , මාතර | 23 |
| 7 | දියගහ බස්නාහිර ම.වි. | නාවිමන, මාතර | 13 |
| 8 | කඹුරුගමුව ම.වි. | කඹුරුගමුව | 23 |
| 9 | අතුරලිය ම.වි. | අතුරලිය | 18 |
| 10 | සහිරා ම.වි. | විල්පිටිය, වැලිගම | 23 |
| 11 | සියඹලාගොඩ උතුර ම.වි. | සියඹලාගොඩ, පිටබැද්දර | 18 |

**දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP)**

**පරිගණක ඉගෙනුම් මධ්‍යස්ථාන**

**(2009- 2010 – 2011)**

| අංකය | පාසලේ නම | ලිපිනය | පරිගණක සංඛ්‍යාව |
|---|---|---|---|
| **පළමු කොටස** | | | |
| 1 | මාර/ හැන්ෆර්ඩ් ක.වි. | හැන්ෆර්ඩ් ,දෙනියාය | 5 |
| 2 | මාර/ එනසාල්වත්ත ක.වි. | විහාරගේන, දෙනියාය | 5 |
| 3 | මාර/ අන්නූර් මුස්ලිම් බා. ම.වි. | කපුවත්ත, දෙනිපිටිය | 5 |
| 4 | මාර/ දෙවිනුවර සරනපාල ක.වි. | දෙවිනුවර | 7 |
| 5 | මාර/ ඉල්මා ක.වි. | කොටුවේගොඩ, මාතර | 5 |
| 6 | මාර/ මොරවක බෞද්ධ ම.වි. | වැලිව, මොරවක | 3 |
| 7 | මාර/ අපරැක්ක ම.වි. | අපරැක්ක | 5 |
| 8 | මාර/ මොරවක ක.වි. | මොරවක | 5 |
| 9 | මාර/ පස්ගොඩ ක.වි. | පස්ගොඩ | 6 |
| 10 | මාර/ අනින්කන්ද දෙමළ ක.වි. | දෙනියාය | 5 |
| 11 | මාර/ මාලිම්බඩ උතුර ම.වි. | පාලටුව, මාතර | 5 |
| 12 | මාර/ ජම්බුරේගොඩ ම.වි. | ජම්බුරේගොඩ, වැලිගම | 5 |
| 13 | මාර/ අල් මිනා මුස්ලිම් ම.වි. | මිල්ල | 5 |
| 14 | මාර/ හෙන්රි ආරියරත්න ම.වි. | නරවැල්පිට උතුර | 10 |
| **දෙවෙනි කොටස** | | | |
| 1 | ගින්නාලිය ක.වි. | ගින්නාලිය, උරුබොක්ක | 5 |
| 2 | කැයියාලේ ම.වි. | දෙයියන්දර | 5 |
| 3 | අස්සපා ක.වි. | දෙනිපිටිය, වැලිගම | 5 |
| 4 | බෝපිටිය ක.වි. | මලිදූව, අකුරැස්ස | 5 |
| 5 | ජයවර්ධන ම.වි. | ගන්ගොඩගම, හක්මන | 5 |
| 6 | නරවැල්පිට උතුර ක.වි. | නරවැලපිට උතුර | 5 |
| 7 | නාදුගල ම.වි. | නාදුගල | 5 |
| 8 | ඇහැලකන්ද ම.වි. | ගෝමිලා, මාවරැල්ල | 5 |
| 9 | උල්ලල ම.වි. | කඹුරුපිටිය | 5 |
| 10 | අත්තුඩාව ම.වි. | පාලටුව, මාතර | 5 |
| 11 | මැදකන්ද ම.වි. | පාරතොට, ගොඩපිටිය, අකුරැස්ස | 5 |

| | | | |
|---|---|---|---|
| [illegible] | මාකඳුර ක.වි. | මාකඳුර | 5 |
| 13 | ආතාපත්තුකන්ද ක.වි. | පරපාමුල්ල | 5 |
| **තුන්වෙනි කොටස** | | | |
| 1 | සුජාතා බා.වි. | රාහුල පාර, මාතර | 10 |
| 2 | නාරන්දෙනිය ජා.පා. | කඹුරුපිටිය | 5 |
| 3 | ධාරුල් අලූම් ම.වි. | බද්ද පාර, මාතර | 5 |
| 4 | අකුරුගොඩ ක.වි. | අකුරුගොඩ, සුල්තාන්ගොඩ | 5 |
| 5 | බතිගම ම.වි. | බතිගම, දික්වැල්ල | 5 |
| 6 | අකුරුබැව්ල ක.වි. | දිකවැල්ල | 5 |
| 7 | හේන්වෙල ජයතිස්ස වි. | හේන්වෙල, මිරිස්ස | 5 |
| 8 | දොඩම්පහල ක.වි. | දොඩම්පහල , දික්වැල්ල | 5 |
| 9 | පනාකඩුව ක.වි. | පනාකඩුව, රොටුඹ, මාතර | 5 |
| 10 | දෙරනගල ක.වි. | පළමු පියවර, දෙරනගල, පිටබැද්දර | 5 |
| 11 | පරගල ක.වි. | පරගල, මොරවක | 5 |
| 12 | කොලලවෙනිගම ම.වි. | කොලවෙනිගම | 5 |
| 13 | වැලිගම ධර්මරාජ ක.වි. | අග්‍රබෝධි මාවත, වැලිගම | 5 |
| 14 | කොරඹුරුවාන ම.වි. | රන්සේගොඩ | 5 |
| 15 | වැලකන්ද ම.වි. | පුහුල්වැල්ල | 5 |
| 16 | මොලොග්ගමුව ක.වි. | මොරගල, කිරිලිපාන | 5 |
| 17 | ගෝමිල ක.වි. | ගෝමිල, මාවරැල්ල | 5 |
| 18 | ගොම්බද්දල බස්නාහිර ක.වි. | ගොම්බද්දල, මාතර | 5 |
| 19 | දෙන්කදලිය ක.වි. | දෙන්කදලිය, රොටුඹ, මාතර | 5 |
| 20 | කුඩාගලහේන ක.වි. | ගොරකවෙල, පිටබැද්දර | 5 |
| 21 | වැයිහේන ක.වි. | බෝපාගොඩ, අකුරැස්ස | 5 |
| 22 | හේනෙගම ක.වි. | හේනේගම, අකුරැස්ස | 5 |
| 23 | පෝරඹ ක.වි. | පෝරඹ, අකුරැස්ස | 5 |
| 24 | දිද්දෙනිපොත ම.වි. | මුලටියන හන්දිය, මුලටියන | 5 |
| 25 | රදාවෙල ක.වි. | රදාවෙල | 5 |
| 26 | පට්ටිගල ක.වි. | පට්ටිගල, බෙරලපනාතර | 5 |
| 27 | පරදූව ක.වි. | පරදූව, අල්ගිරිය, තෙලිජ්ජවිල | 5 |
| 28 | ලෙනම ක.වි. | දීගල, ලෙනම, පිටබැද්දර | 5 |
| 29 | කිරින්ද ක.වි. | කිරින්ද, පුහුල්වැල්ල | 5 |
| [illegible] | කිතලගම නැගෙනහිර ක.වි. | තිහගොඩ | 5 |
| 31 | ගෙරොඩපිටිය ක.වි. | අකුරැස්ස | 5 |
| 32 | වරකාපිටිය ම.වි. | වරකාපිටිය, දෙනිපිටිය | 5 |
| 33 | මීපාවිට ක.වි. | රන්සෙගොඩ | 5 |
| 34 | කොටවිල ම.වි. | කරන්දෙනිය | 5 |
| 35 | හුලන්දාව දෙමළ ම.වි. | පිටබැද්දර | 5 |
| 36 | මොටගෙදර ම.වි. | කැකනදුර | 5 |
| 37 | තුන්දූව මුස්ලිම් ම.වි. | තුන්දූව, හඹුරුගල | 5 |
| 38 | රුහුණු විජයබා ම.වි. | සිතිනමලූව, බෙලිඅත්ත | 5 |
| **හතරවෙනි කොටස** | | | |
| 1 | හෙට්ටියාවල නැගෙනහිර ම.වි. | කිරින්ද, පුහුල්වැල්ල | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 2 | මාපලාන ම.වි. (ශ්‍රී පඤ්ඤාලන්කාර) | මාපලාන, කඹුරුපිටිය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 3 | පල්ලේවෙල බැටදොල ක.වි. | රදාවල | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 4 | රන්සෙගොඩ අතුර ක.වි. | මාකඳුර | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 5 | ශ්‍රී සංඝානන්ද වි. | කප්පරතොට, වැලිගම | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 6 | නිදන්ගල ක.වි. | නිදන්ගල, දෙනිපිටිය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 7 | තල්අරඹ නැගෙනහිර ක.වි. | තල්අරඹ, කඹුරුගමුව | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 8 | ගොඩපිටිය සදත් ම.වි. | අකුරැස්ස | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 9 | කඩොල්ගල්ල ක.වි. | දෙනිපිටිය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 10 | කොක්මදුව ක.වි. | කොක්මදුව, වැලිගම | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 11 | උඩුකාව ක.වි. | උඩුකාව, දෙනිපිටිය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 12 | දැදියාගල ක.වි. | දැදියාගල, මලිදූව | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 13 | මැදිරිපිටිය ක.වි. | මැදිරිපිටිය, දෙනියාය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 14 | කොස්නිල්ගොඩ ක.වි. | මොරවක | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 15 | විහාරහේන ක.වි. | අදරදෙනිය, විහාරහේන | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 16 | කිරිවැල්දොල ක.වි. | කිරිවැල්දොල, දෙනියාය | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 17 | විලයාය වි. | දම්පහල | ක්‍රියාත්මකවෙමින් පවතී |
| 18 | අකුරුගොඩ ක.වි. | අකුරුගොඩ, සුල්තානාගොඩ | ක්‍රියාත්මකවෙමින් පවතී |

| | පාසලේ නම | මූලාශ්‍රය | ප්‍රතිපාදන | | උපාංග |
|---|---|---|---|---|---|
| 2006 | ගොඩපිටිය ම.වි.ල, අකුරැස්ස | ESDG | මුළු ව්‍යාපෘතිය සඳහා මිලියන 35ක් | | |
| | මාකඳුර ම.ම.වි. | | | | |
| | අපරැක්ක ම.වි., අපරැක්ක, මාතර | CF | මිලියන 1.3 | | පරිගණක 10 |
| 2009 | රාහුල ම.වි., මාතර | ESDG | පරිගණක සඳහා මිලියන 3ක් සහ විද්‍යාගාරය සඳහා මිලියන 5.48ක් | නව පරිගණක විද්‍යාගාරය ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන භාවිතා කරන ලදි | පරිගණක 20/ සර්වර්ස් 1/ ජාල මුද්‍රණ යන්ත්‍ර 1/ UPS 2 |
| 2010 | සුජාතා බා.වි., මාතර | CF | මිලියන 2.2 | | පරිගණක 20/ සර්වර්ස් 1/ ජාල මුද්‍රණ යන්ත්‍ර 1/ UPS 2/ පුටු 20 |
| | නාරන්දෙනිය ම.වි., කඹුරුපිටිය | ESDG | මිලියන 1.19 | | |
| | අකුරුබැව්ල ක.වි., දික්වැල්ල | | මිලියන 0.59 | | |
| | කොක්මදුව ක.වි., කොක්මදුව, වැලිගම | මිලියන 0.59 | පළාත් අධික්ෂණය යටතේ පරිගණක මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන පළාතට වෙන් කරන ලදි. | | |
| | මැදිරිපිටිය ක.වි., කැටපොල | මිලියන 0.59 | | | |
| | කැඹිලියාපොල ගුණරතන ක.වි., හක්මන | මිලියන 0.59 | | | |

**අන්තර් ක්‍රියාකාරී පුවරුව**

| වර්ෂය | පාසලේ නම | මූලාශ්‍රය | ප්‍රතිපාදන |
|---|---|---|---|
| 2009 | මාර/ රාහුල ම.වි., මාතර | අන්තර් ක්‍රියාකාරී පුවරුව කැනඩා රජය මඟින් ප්‍රදානය කරන ලදි | - |
| | | අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය ලබා දෙන ලදි | මිලියන 0.2 |

ඇමුණුම 08

**අ.පො.ස. (උ. පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සඳහා ප්‍රධාන පුහුණුකරු සංචිතය**

| අංකය | නම | කාර්යාලීය ලිපිනය |
|---|---|---|
| 1 | එම්.ආර්.පී.කේ. මද්දුමගේ මයා | මා/ සුජාතා බ.වි., මාතර |
| 2 | එල්.එම්. ලලනි ද සිල්වා මිය | කලාප අධ්‍යාපන කාර්යාලය, මාතර |
| 3 | ජී.ජී.ශීරෝමි මිය | ඌරුබොක්ක ජා.පා., ඌරුබොක්ක |
| 4 | යූ.ටී.දමයන්ති මිය | මා/ඇහැලපේ විද්‍යාරාජ ම.වි., මලිදූව,අකුරැස්ස |
| 5 | එච්.පී.වික්‍රමරත්න මයා | මා/ මාලිම්බඩ උතුර ම.වි., පාලටුව |

**අ.පො.ස. (උ. පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සඳහා පෙරහුරු ප්‍රශ්න සහ පිළිතුරු සකස් කිරීමේ සංචිතය**

| අංකය | නම | කාර්යාලීය ලිපිනය |
|---|---|---|
| 1 | එල්.එම්.ලලනි ද සිල්වා | කාලප අධ්‍යාපන අධ්‍යක්ෂ, මාතර |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

ඇමුණුම 09

ජාතික පාසල් පරිගණක විද්‍යාගාර පහසුකම් - මාතර දිස්ත්‍රික්කය

| අංකය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | මා/මොරවක කීර්ති අබේවික්‍රම ජා.පා | දෙනියාය පාර, මොරවක |
| 2 | මා/ කොටපල ම.වි. | කොටපල |
| 3 | මා/ඌරුබොක්ක ම.ම.වි. | ඌරුබොක්ක |
| 4 | මා/දෙනියාය ම.ම.වි. | දෙනියාය |
| 5 | මා/තෙලිජ්ජවිල ම.ම.වි | තෙලිජ්ජවිල |
| 6 | මා/ගොඩපිටිය ජා.පා. | අකුරැස්ස |
| 7 | නාරංදෙනිය ම.ම.වි. | කඹුරුපිටිය |
| 8 | තිහගොඩ ම.ම.වි. | තිහගොඩ |
| 9 | දෙයියන්දර ම.ම.වි. | දෙයියන්දර |
| 10 | සිද්ධාර්ථ වි. | වැලිගම |
| 11 | ශ්‍රී සුමංගල බා.වි. | වැලිගම |
| 12 | අරහා ජා.පා | වැලිගම |
| 13 | රාහුල වි. | අකුරැස්ස පාර,මාතර |
| 14 | සුජාතා වි. | රාහුල පාර, මාතර |
| 15 | මාතර ම.ම.වි | රාහුල පාර, මාතර |
| 16 | මා/ශා.තෝමස් බා.වි. | කුමාරතුංග මාවත, මාතර |
| 17 | ශාන්ත තෝමස් උසස් බා.වි. | වල්පොල,මාතර |
| 18 | ශාන්ත සර්වේෂස් වි. | කොටුවේගොඩ, මාතර |
| 19 | මා/දෙවිනුවර ජා.පා | දෙවිනුවර |
| 20 | විජිත ම.ම.වි. | දික්වැල්ල |
| 21 | මින්හත් ජා.පා | සැන්ඩිස් පාර, දික්වැල්ල |

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමු වන අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
[மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙසේයි. නියෝජ්‍ය ඇමතිතුමා දීර්ඝ විස්තරයක් කළා. එතුමාට ඒ පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. පරිගණක විෂය නැත්නම් තොරතුරු තාක්ෂණ විෂය උගන්වන ගුරුවරුන්ගේ දැනුම නිතර නිතර අලුත් කළ යුතුව තිබෙනවා. මොකද, තොරතුරු තාක්ෂණය හා සබැඳි ක්ෂේත්‍රය දිනපතා අලුත් වනවා.

නමුත් අවාසනාවකට එවැනි ගුරු සංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න යොදන බර අඩුයි. ඒ නිසා තොරතුරු තාක්ෂණයට අදාළ ගුරු භවතුන්ගේ දැනුම කෙටි කාලීනව, බොහොම වේගවත්ව සංවර්ධනය කරන්න අමාත්‍යාංශය පියවර ගන්නේ කවදාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, software, hardware කියන අංශ දෙකම සම්බන්ධයෙන් පරිගණක තාක්ෂණය පිළිබඳ ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා ඉතාමත්ම විධිමත් වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයෙන් ආරම්භ කරලා තිබෙනවා. පාසල් අතර, කලාප අතර, කොට්ඨාස මට්ටමෙන් සහ කලාප මට්ටමෙන් ප්‍රදර්ශන සහ තරග පවත්වමින් ක්‍රියා කිරීමේ වගකීම අධ්‍යාපන පරිපාලන පහළ ස්ථරයට පැවරෙනවා. ඒ එක පැත්තකින්.

අනෙක් පැත්තෙන් රාජ්‍ය මධ්‍යස්ථාන සහ සම්පත් දායකයන් යොදවා ගෙන මෙම කටයුත්ත ඉතා පැහැදිලිව කරන ලද බව මේ ප්‍රශ්නයට ලබා දී ඇති උත්තරයෙන් තමුන්නාන්සේට පැහැදිලි වනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
[மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේ පරිගණක විෂයය නැත්නම් තොරතුරු තාක්ෂණ විෂයයට අදාළ ගුරු භවතුන් පිළිබඳව නොවෙයි. පරිගණක යන්ත්‍රවලත් බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ තමයි මේ යන්ත්‍ර අබලන් වන කොට ඒ යන්ත්‍රවලට සමහර වෙලාවකට අලුත්ම යන්ත්‍රයක් අවශ්‍ය නැහැ කියන එක. ඒකට යම් කොටසක් පමණක් යොදවන්න ඕනෑ. සමහර වෙලාවට කාලයෙන් කාලයට මේ යන්ත්‍ර upgrade කිරීම, නැත්නම් වැඩි දියුණු කිරීම කළ යුතුව තිබෙනවා. ඒ සඳහා යොදවන මුදල පාසල්වලට ලැබෙන්නේ ප්‍රමාණවත් ආකාරයෙන් නොවෙයි, ඒ ලැබෙන මුදල ප්‍රමාණත් නැහැ සහ නියම වෙලාවට නැහැයි කියලා මේ තොරතුරු තාක්ෂණ ගුරුවරුත් විදුහල්පතිවරුත් චෝදනා කරනවා. මේකට අමාත්‍යාංශයෙන් ගන්නා වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඇත්තටම, ප්‍රායෝගික වැඩ පිළිවෙළක්. මේ පරිගණකය කියන මෙවලම විදුහල්පතිතුමාගේ භාණ්ඩ ලේඛනයේ - inventory එකේ - එක අයිතමයක් හැටියට සඳහන් නොවන ආකාරයට එය පවත්වා ගෙන යැම සඳහා ප්‍රායෝගික වැඩ පිළිවෙළවල් ඒ පළාත් සභාවලට ආරම්භ කිරීමට පුළුවන්කම තිබෙනවා.

විශේෂයෙන් විදුලි බිල ගෙවීම. ඒ වාගේම පාසල් කාලයෙන් පස්සේ ගොවි ජනතාවට සහ වෙනම ඒ අධ්‍යාපනය ලබා ගැනීමට කැමැති වෙනත් බාහිර පුද්ගලයන්ට පාසලේ පන්ති කාමරය සහ පරිගණක මධ්‍යස්ථානය පාවිච්චි කිරීමට ලබා දීමෙන් පරිගණකය බහුතර ජනතාව අතර ජනප්‍රිය මෙවලමක් බවට පත් කිරීම සහ ඒ සඳහා යම් කිසි මුදලක් අය කර ගැනීමේ හැකියාව සහ ඒ නිදහස මේ සෑම පාසල් පරිගණක කාමරයකටම, සෑම පාසල් පරිගණක මධ්‍යස්ථානයකටම ලබා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විදුහල්පතිවරයා සහ පාසල් සංවර්ධන සමිතියත්, ඊට පරිබාහිරව කලාප සහ කොට්ඨාස මට්ටමින් ඒ අදාළ ගුරුවරුන්ට ඒ කාරණාව සඳහා මැදිහත්වීමේ පුළුවන්කම හා ඉඩකඩ ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේ නඩත්තුව, කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳව ගැටලුවක් ඇති වන්නේ නැහැ කියලා මම විශ්වාස කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කරපු ඒ කරුණු දැක්වීමත් එක්ක කාරණා දෙකක් පැන නඟින බව පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. එතුමා එහෙම කිව්වාට මට උදාහරණයක් විධියට වග කීමක් ඇතුව කියන්න පුළුවන් මාතර, බමුණුගම මහා විද්‍යාලයට පරිගණක 25ක් තිබුණත්, දැන් වසර කීපයක ඉඳලා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් ස්ථිර ගුරුවරයෙක් නැහැ කියලා. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ බමුණුගම මහා විද්‍යාලයට තොරතුරු තාක්ෂණයට ගුරුවරයෙක් නැහැ. අනෙක් අතට පාසල් පරිගණකවලින් අන්තර්ජාලයට පිවිසෙන්න නොහැකි බොහෝ තත්ත්වයන් තිබෙනවා. සමහර ගම්වල දුරකථන හරහා අන්තර්ජාලයට පිවිසෙන්න බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න දෙකක් එකටද අහන්නේ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, එක ප්‍රශ්නයයි. කරුණු දෙකක් පැන නැඟුණා. මම ඒකයි කිව්වේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්තර්ජාලයට පිවිසෙන්න පහසුකම් නැහැ. මෙන්න මේ ප්‍රශ්න තිබෙනවා. දැන් මේ ප්‍රශ්න පිළිබඳව ඔබතුමාට ලැබෙන වාර්තා මේ භූමියේ යථාර්ථයත් එක්ක සම්පූර්ණ පටහැනියි.

අපෙන් නැහුවාට කමක් නැහැ, ගරු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් අහලා හරි කරුණාකරලා මේකට මැදිහත් වෙනවාද කියලායි අපි අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන විධියට භූමියේ විෂමතා පිළිබඳ යමක් තිබෙනවා නම් අපිට ඒ භූවිෂමතා ඉවත් කරන්න කටයුතු කරන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
භූවිෂමතා නොවෙයි. අයියෝ! ගරු නියෝජ්‍ය ඇමතිතුමා පටලවා ගන්නවා. නියෝජ්‍ය ඇමතිතුමාට මම කියන්නේ -

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
භූමිය ගැන දැනුමක් තිබෙන නිසා තමයි මේ පිළිතුර ලැබිලා තිබෙන්නේ. ඔබතුමා කියන විධියට භූවිෂමතා තිබෙනවා නම් ඒවා ඉවත් කරන්න කටයුතු කළ හැකියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, භූගෝල විද්‍යාවේ තියෙන භූවිෂමතා ගැන නොවෙයි මම මේ කිව්වේ. යථාර්ථය.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අර සිරිකොත භූමියේ විෂමතා මේ දවස්වල කොහොමද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, නැහැ. නිම්න, නෙරු, සානු නොවෙයි. භූවිෂමතාව නොවෙයි. ඔබතුමාගේ සංඛ්‍යා ලේඛන සහ යථාර්ථය අතර වෙනස.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමාට පිළිතුරු දුන්නා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් දරුවෝ ඉන්නවා. අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මේ වාගේ උත්තර දුන්නාම දරුවන්ට -

## 5 වසර ශිෂ්‍යත්ව විභාගය : ශිෂ්‍යාධාර
### 5 ஆம் ஆண்டு புலமைப்பரிசில் பரீட்சை: உதவித்தொகை
### YEAR 5 SCHOLARSHIP EXAMINATION : GRANTS

0961/'10

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්, දැනට ශිෂ්‍යාධාර ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශිෂ්‍යාධාර ලබන සිසුවෙකුට එක් මාසයකදී ශිෂ්‍යාධාර ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) එක් වර්ෂයක් තුළ ශිෂ්‍යාධාර ගෙවනු ලබන මාස ගණන සහ එක් සිසුවෙකු වෙනුවෙන් ශිෂ්‍යාධාර ගෙවනු ලබන වර්ෂ ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යාධාර ගෙවීමට මාසයේ නිශ්චිත දිනයක් වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) 2010 වර්ෂයේ එක් එක් මාසය සඳහා ශිෂ්‍යාධාර ලබා දීමට වෙන් කළ දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී නිසි පරිදි නියමිත කාල සීමාවට අනුව ශිෂ්‍යාධාර ගෙවා නොමැති බවත්;

(ii) එබැවින් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් ශිෂ්‍යාධාරලාභී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි කර ගෙන යාමට නොහැකි තත්ත්වයක් පැන නැඟී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 5 ஆம் ஆண்டு புலமைப்பரிசில் பரீட்சையில் சித்தியடைந்து, தற்போது மாணவர் உதவித்தொகை பெறும் மொத்த மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மாணவர் உதவித்தொகை பெறும் மாணவரொருவருக்கு மாதமொன்றில் உதவித்தொகையாகச் செலுத்தப்படும் தொகை யாதென்பதையும்;

(iii) ஓர் ஆண்டில் மாணவர் உதவித் தொகை செலுத்தப்படும் மாதங்களின் எண்ணிக்கை மற்றும் ஒரு மாணவருக்கென உதவித்தொகை செலுத்தப்படும் ஆண்டுகளின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மாணவர் உதவித்தொகையை செலுத்துவதற்காக மாதத்தில் குறிப்பிட்ட திகதியொன்று ஒதுக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின் அத்திகதி யாதென்பதையும்;

(iii) 2010 ஆம் ஆண்டில் ஒவ்வொரு மாதத்திற்குமென மாணவர் உதவித்தொகை வழங்க ஒதுக்கிய திகதிகள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) 2010 ஆம் ஆண்டில் உரிய கால எல்லைக்கு உரிய முறையில் மாணவர் உதவித் தொகைகள் செலுத்தப்படவில்லையென்பதையும்;

(ii) அதனால் குறைந்த வருமானம் ஈட்டும் குடும்பங்களைச் சேர்ந்த மாணவர் உதவித் தொகை பெறும் பிள்ளைகளின் கல்வி நடவடிக்கைகளை உரிய முறையில் முன்னெடுக்க முடியாத நிலை தோன்றியுள்ளதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House-

(i) the total number of students who have passed the year 5 scholarship examination and receive the grants at present ;

(ii) the amount of money paid monthly as grants to each student who is entitled to grants ; and

(iii) the number of months in a year for which the grants are paid and the number of years for which the grants are paid to each student?

(b) Will he state-

(i) whether a definite date in a month has been fixed for the payment of grants ;

(ii) if so, the date fixed for the payment ; and

(iii) the date and the periods of time that were fixed for each month of the year 2010 for the purpose of paying grants?

(c) Will he admit that-

(i) grants have not been paid properly according to the fixed periods of time in the year 2010; and

(ii) as a result, a situation under which the students of low income families who receive grants cannot pursue their educational activities properly has arisen?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 84,310

(ii) මසකට රුපියල් 500ක් පමණි.

(iii) වර්ෂයකට මාස 10ක් පමණි. 6 ශ්‍රේණියේ සිට 13 වන වසර දක්වා වසර 08ක කාලයක් ශිෂ්‍යාධාර ගෙවනු ලැබේ.

(ආ) (i) ඔව්.

(ii) 2006/27 චක්‍රලේඛයට අනුව පෙර මාසය සඳහා පසු මාසයේ 25 වන දිනට පෙර ශිෂ්‍යාධාර මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

(iii) 2010 වර්ෂයේ එක් මාසයක් සඳහා ශිෂ්‍යාධාර ලබා දීමට අදාළ වවුචර් පසු මාසයේ 07වැනි දිනට පෙර කලාප කාර්යාලය වෙත විද්‍යුත් ඉදිරිපත් කළ යුතු වීම.

එලෙස ඉදිරිපත් වන වවුචර් සඳහා එම මාසයේ 25වැනි දින ගෙවීම් කටයුතු කරන ලෙස දන්වා තිබීම.

(ඇ) (i) සහ (ii) වාර්තා සැකසීමේ ප්‍රමාදය හේතුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීම අපහසුය.

එය නිවැරදි කරනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ 5 වසර ශිෂ්‍යත්වලාභින් 84,210කට එම ශිෂ්‍යාධාර අදාළ මාසයේ 25වැනි දිනට පෙර දිනයේ දෙන්න කියලා තමයි සඳහන් වෙලා තිබෙන්නේ. නමුත් 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් ළමයින්ට 2010 වසරේ ශිෂ්‍යාධාර ගෙවීම තවම කරලා නැහැ. මේක වාර්තා පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි ඇමතිතුමා. ඔබතුමා ඒක පිළිගන්නවා ඇති. වාර්තා පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි, මුදල් එන්නේ නැති ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු මන්ත්‍රීතුමා, ඒ කුමන කොට්ඨාසයේද, කලාපයේද කියලා සාමාන්‍යයෙන් කිව්වොත් මට ඒ ගැන සොයා බලන්න පුළුවන්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තොත් කිසිම කෙනෙකුට එම මුදල් හම්බ වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි තවමත් ලංකාවේ පහේ ශිෂ්‍යත්ව ආධාර ලබා දීලා නැහැ. මම බොහොම වග කීමක් ඇතිව කියන්නේ. තවම ශිෂ්‍යත්ව ආධාර රුපියල් 500 දුන්නේ නැහැ කියලා දෙමව්පියෝ අපට කථා කරලා කියනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා බොහොම බලවත්ව මේ කාරණාව කියන නිසා මේ ගැන සොයා බලා මා ඔබතුමාට පෞද්ගලිකව වාර්තා කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා විධියට, අධ්‍යාපන අමාත්‍යාංශය භාරව ඉන්න කෙනකු විධියට අපි කියනකම් ඉන්න ඕනෑ නැහැ. පහ වසර ශිෂ්‍යත්ව ළමයින්ට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම කියන්නේ. [බාධා කිරීම්] ඉන්නකෝ ඉතින් කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා නැහැ කියන නිසායි- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කියලා දෙන්න උවමනාවක් නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔය ටීවී එකට කථා කරන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පහ වසර ශිෂ්‍යත්වලාභීන්ට මේ ශිෂ්‍යාධාර ලබා දෙන්න පුළුවන් දිනය කවදාද කියලා ඔබතුමාට කරුණාකර කියන්න පුළුවන්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා දිනය කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙවන්න ඕනෑ ඒවායේ මුදල් අපි පළාත් සභාවලට යවලායි තිබෙන්නේ. පළාත් සභා මඟින් ගෙවිය යුතුයි. දින වකවානු පළාත් සභාවෙන් තමයි ගන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ආයෙත් ඔබතුමා ප්‍රශ්නයක් අහන්න. මම එතකොට තමුන්නාන්සේට දැනුම් දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කියන්නේ බොරුමයි. ශත පහක්වත් පළාත් සභාවලට යවලා නැහැ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "බොරු" කියන වචනය පාවිච්චි කරන්න බැහැ මේ සභාවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙන වෙන ඒවාට කෝටි ගණන් වියදම් කරන්න මේ ආණ්ඩුවට සල්ලි තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. He cannot use that word. - [*Interruption.*]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපේ අහිංසක, දුප්පත් අම්මලා තාත්තලාගේ දරුවන්ට පහේ ශිෂ්‍යත්ව- [බාධා කිරීම්] බොරු තමයි කිව්වේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනි දේවල් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා මෙතැනට ඇවිල්ලා එක එක බොරු කියනවා. [බාධා කිරීම්] අර අනෙක් එක් කෙනා. ඔබතුමා පොඩ්ඩක් පැත්තකට වෙලා ඉන්නකෝ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You cannot use that word. - [*Interruption.*]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඉඳ ගන්නකෝ. [බාධා කිරීම්] නත්තල් පප්පා ඉඳ ගන්න.[බාධා කිරීම්] කථා කරන්න දෙන්නේ නැහැනේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Whatever that is contrary to the Standing Orders will be expunged.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
It is contrary. - [*Interruption.*]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ගෞරවයෙන් කියන්නේ. අනෙක් ඒවාට කෝටි ගණන් වියදම් කරනවා. දැයට කිරුළ ප්‍රදර්ශනයට කෝටි ගණන් වියදම් කරනවා. මේ එක එක-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාවක් පැවැත්වීමට අවකාශ කර ගන්නේ නැතිව තමන්ගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රශ්නයක් තමයි මේ අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ දීර්ඝ කථා- [බාධා කිරීම්] අපටත් අවස්ථාව දිය යුතුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යාංශයෙන් දැයට කිරුළ ප්‍රදර්ශනයට ලක්ෂ ගණන් වෙන් කරනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියනවා මෙතුමා බොරු කිව්වාට මම බොරු කියන්නේ නැහැ කියලා. මෙතුමා තමයි බොරු කියන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හැබැයි පහ වසර ශිෂ්‍යත්ව ලාභීන්ට ශිෂ්‍යත්ව ටික දී ගන්න, රුපියල් 500 දී ගන්න මේ ආණ්ඩුවට හැකියාවක් නැහැ. ඉතින් මම අහන්නේ මේක දෙන්නේ කවදාද කියලායි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පිළිතුරු දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි ඒ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මට අයිතියක් තිබෙනවා නියෝජ්‍ය ඇමතිවරයා හැටියට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ, ඒකාධිපතිත්වය- [බාධා කිරීම්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම කියන දේ බොරුයි කියලා කියනවා නම් මම පිළිතුරු දෙන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කියන්නේ.

## ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහා විද්‍යාලය: ගුරු හිඟය
## திரு/புல்மோட்டை முஸ்லிம் மஹா வித்தியாலயம்: ஆசிரியர் பற்றாக்குறை
## TRI/PULMUDE MUSLIM MAHA VIDYALAYA: TEACHER SHORTAGE

1150/'11

5. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහා විද්‍යාලයෙහි 2010 වර්ෂයේදී ගුරුවරුන් 68 දෙනෙකු සේවය කළ බවත්;

(ii) වර්ෂ අටක් එකම පාසලෙහි සේවය කර ඇති ගුරුවරුන් ස්ථාන මාරු කිරීමේ ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේ එම පාසලේ ගුරුවරුන් 30 දෙනෙකු ස්ථාන මාරු ලද බවත්;

(iii) අලුතින් ස්ථාන මාරු ලැබූ ගුරුවරුන් හත් දෙනෙකු පාසලට පත් කොට ඇති බවත්;

(iv) 1500කට අධික ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන මෙම පාසලට ගුරුවරුන් 72 දෙනෙකු අවශ්‍ය වෙතත්, දැනට ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ගේ සංඛ්‍යාව 42ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිකු/පුල්මුඩේ මුස්ලිම් මහා විද්‍යාලයේ පවතින එම ගුරු හිඟය මඟ හැර වීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) திரு/புல்மோட்டை முஸ்லிம் மஹா வித்தியாலயத்தில் 2010 ஆம் ஆண்டில் ஆசிரியர்கள் 68 பேர் கடமையாற்றினார்கள் என்பதையும்;

(ii) எட்டு வருடங்கள் ஒரே பாடசாலையில் கடமை யாற்றிய ஆசிரியர்களை இடமாற்றம் செய்கின்ற ஆசிரியர் இடமாற்ற கொள்கைக்கு அமைவாக மேற்படி பாடசாலையின் ஆசிரியர்கள் 30 பேர் இடமாற்றம் செய்யப்பட்டனர் என்பதையும்;

(iii) புதிதாக இடமாற்றம் பெற்றுள்ள ஆசிரியர்கள் ஏழு பேர் பாடசாலைக்கு நியமனம் செய்யப்பட்டுள்ளார்கள் என்பதையும்;

(iv) மாணவர்கள் 1500 பேருக்கும் அதிகமானவர்கள் கல்வி கற்கும் மேற்படி பாடசாலைக்கு ஆசிரியர்கள் 72 பேர் அவசியமாக உள்ள போதிலும், தற்போது கற்பித்தல் நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை 42 மாத்திரமே என்பதையும்

அவர் அறிவாரா?

(ஆ) திரு/புல்மோட்டை முஸ்லிம் மஹா வித்தியாலயத்தில் நிலவுகின்ற மேற்படி ஆசிரியர் பற்றாக்குறையை நீக்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Is he aware that-

(i) 68 teachers served in the Tri/Pulmude Muslim Maha Vidyalaya in year 2010;

(ii) 30 teachers of this school were transferred under the Teacher Transfer Policy of transferring teachers who have served in the same school for eight years;

(iii) seven teachers on transfers have been posted to this school; and

(iv) even though this school, which has a student population of over 1500, requires 72 teachers, only 42 teachers teach there at present ?

(b) Will he inform this house whether steps will be taken to remedy the teacher shortage prevailing in the Tri/ Pulmude Muslim Maha Vidyalaya ?

(c) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

අදාළ ලිපිය මඟින් ඔවුන්ට ගුරු සහායක පත්වීම් ලබා දීමට අනුමැතිය යවා ඇත.

(ii) 2009.08.14 දින රජයේ ගැසට් නිවේදනය මඟින් රජයේ පාසල්වල ගුරු සහායක

තනතුරු දරන අයගෙන් ගුරු පුහුණුව සඳහා අයදුම්පත් කැඳවනු ලැබූ අතර, ස්වේච්ඡා ගුරුවරුන්ද මේ සඳහා අයදුම් කර තිබූ නමුත් ඔවුන් අයදුම්පත් අනුව වර්ගීකරණය කර ගත නොහැකි වූ බැවින් සියලුම දෙනා සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අතර, ගුරු සහායකයන් පමණක් ගුරු පුහුණු වැඩ සටහනට ලියා පදිංචි කර ගන්නා ලදී.

(iii) දැනට 484/2008 අංක දරන නඩුව ගොනු කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ඇත.

(ආ) තාවකාලිකව අත් හිටුවන ලද අනුමැතිය ලබා දුන් මුදල් ලේඛනය සඳහා ඉතා කඩිනමින් පළාත් බලධාරීන් හා සාකච්ඡා කර ඉදිරි කටයුතු කරන බව දන්වා සිටිමි.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 01 අසන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்களே, இது தமிழ்ப் பகுதியைச் சேர்ந்த ஒரு முக்கியமான பாடசாலை என்பதனால் நான் எனது வினாவைத் தமிழிலே கேட்க விரும்புகின்றேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, ආපසු කියන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තේරුණේ නැහැ. ඒක ආපසු කියන්න ලු.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
அதாவது கிழக்கு மாகாணத்தில் திருகோணமலை மாவட்டத்திலுள்ள புல்மோட்டை முஸ்லிம் மகா வித்தியாலயம் மிகவும் முக்கியமான ஒரு வித்தியாலயம். ஆகவே, நீங்கள் அங்கு இந்த ஆசிரியர்களை நியமிப்பதற்கு வேண்டிய நடவடிக்கைகளை எடுப்பீர்களா?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා ඉක්මනින් පත් කිරීමට කටයුතු කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
மிகவும் நன்றி.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අසන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
அதனை நீங்கள் உங்களுடைய அமைச்சின்மூலம் செய்வீர்களா? அல்லது மாகாண சபையின்மூலம் செய்வீர்களா? [இடையீடு] Sir, I protest. [இடையீடு] இங்கு தமிழிலே பேசுவதற்கு ஐக்கிய தேசியக் கட்சிக்காரர்கள் விரோதம் காட்டுகின்றார்கள். தமிழ் உறுப்பினர்களே! இதுதான் அவர்கள் இங்கே செய்வது. மாண்புமிகு சம்பந்தன் அவர்களும் மாண்புமிகு மாவை சேனாதிராசா அவர்களும் இது சம்பந்தமாக அவர்களிடம் கேள்வி கேட்க வேண்டும்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
යූඑන්පී එකේ විරෝධතාව. දන්නේ නැත්නම් අහ ගෙන ඉන්න. තමුන්නාන්සේලා එහෙම තමයි පැනලා දෙන්නේ. වියරු වැටිලා ඉන්නේ සිරිකොත. [බාධා කිරීමක්]

நான் இந்தச் சபையிலே தமிழிலே கேட்கின்றேன். ஆனால், இவர்கள் அதற்கு வேட்டு வைக்கின்றார்கள். இங்கே தமிழிலே கேள்வி கேட்க முடியாதா? தமிழிலே கேள்வி கேட்க நீங்கள் சுதந்திரம் தாருங்கள் எனக்கு!

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ සජිත් පිල තමයි දෙමළ භාෂාවට විරුද්ධව බාධා කිරීම් කරන්නේ. ඒක අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක අපි අද මේ ගරු සභාවේ වාර්තා කරනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කොහේද යන්නේ මල්ලේ පොල්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
There is no point of Order in it. Hon. Member, please sit down. අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
இந்த நியமனங்களை உங்களுடைய அமைச்சின் மூலம் செய்வீர்களா? அல்லது மாகாண சபையின் மூலம் செய்வீர்களா?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මධ්‍යම රජය මැදිහත් වෙලා ලබා දීමට කටයුතු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
மிக்க நன்றி.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8 - 0756/' 10 - (2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සත්‍ය ප්‍රකාශ කරන නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සත්‍යවාදී සජිත් ප්‍රේමදාස මැතිතුමාගෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මාතර - නූපේ - ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය :විස්තර

## மாத்தறை - நூபே- கொடகம பாதை விஸ்தரிப்புக் கருத்திட்டம்: விபரம்

## MATARA-NUPE-GODAGAMA ROAD WIDENING PROJECT : DETAILS

1005/'10

9. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ මාතර පිවිසුම් දොරටුව වන මාතර - නූපේ - ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය හා අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල කොපමණද;

(iv) එම මුදලින් ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී දේපළ අහිමි වන පාර්ශ්වයන් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ණය හෝ ආධාර ලබා දෙන රට හෝ ආයතනය කවරේද;

(ii) ව්‍යාපෘතිය සඳහා ලැබෙන මුළු ණය හෝ ආධාර මුදල කොපමණද;

(iii) එය ණය මුදලක් නම්, එම මුදල ආපසු ගෙවා නිම කළ යුතු කාලය කොපමණද;

(iv) ඒ සඳහා අය කරන පොලී ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை கொழும்பு கடுகதி நெடுஞ்சாலையில் மாத்தறை புகுவழியான மாத்தறை நூபே - கொடகம பாதையை விஸ்தரிக்கும் கருத்திட்டத்தின் பணிகளை ஆரம்பிக்க திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி வீதியின் விஸ்தரிப்புக் கருத்திட்டப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி மற்றும் பூர்த்தி செய்ய உத்தேசிக்கப்பட்டுள்ள திகதி யாதென்பதையும்;

(iii) இதற்காக மதிப்பீடு செய்யப்பட்டுள்ள மொத்தத் தொகை எவ்வளவென்பதையும்;

(iv) இப் பணத்தொகையில், மேற்கூறிய கருத்திட்டத்தை நடைமுறைப்படுத்தும் போது சொத்துக்களை இழக்கும் தரப்பினருக்கு இழப்பீடு செலுத்துவதற்கு ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) இக்கருத்திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு கடன் அல்லது உதவிகளை வழங்கும் நாடு அல்ல து நிறுவனம் யாது;

(ii) கருத்திட்டத்துக்கு கிடைக்கும் மொத்தக் கடன் அல்லது உதவித் தொகை எவ்வளவு;

(iii) கடனாக இருப்பின், இக் கடனை மீளச் செலுத்தி முடிக்க வேண்டிய காலம் எவ்வளவு;

(iv) அதற்கு அறவிடப்படும் வட்டி வீதம் எவ்வளவு

என்பதை அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways :

(a) Will he inform this House-

(i) whether it has been planned to commence the activities of the project to widen the Nupe-Godagama Road, which is the Matara access point of the Matara-Colombo Expressway;

(ii) the date of commencement and the proposed date of completion of the project to widen the aforesaid road;

(iii) the total estimated amount for that; and

(iv) out of that amount, the money allocated for the payment of compensation to parties who will lose their properties as a result of the implementation of the above project ?

(b) Will he sate -

(i) the country or institution that provide loans or aid for the implementation of this project;

(ii) the total amount of money received as loans or aid for the project;

(iii) if it is a loan, the period of time within which it has to be paid back; and

(iv) the rate of interest charged on it ?

(c) If not, why ?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මාතර-කොළඹ අධිවේගී මාර්ගයේ පිවිසුම් දොරටුව වන මාතර-නූපේ ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.

(ii) ආරම්භ කරන දිනය - 2012 ජූලි 01

අවසන් කිරීමට යෝජිත දිනය - 2013 මාර්තු 31

(iii) ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන එක්දහස් හතලිස් එකයි දශම තුනයි.

(රුපියල් මිලියන 1041.3)

(iv) රුපියල් මිලියන පන්සිය හතලිස් අටයි දශම පහයි (රුපියල් මිලියන 548.5)

[ගරු නිර්මල කොතලාවල මහතා]

(ආ) (i) ආසියානු සංවර්ධන බැංකුව.

(ii) සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ලැබෙන ණය මුදල රුපියල් මිලියන හාරසිය අනූ දෙකයි දශම අටයි. (රුපියල් මිලියන 492.8)

(iii) මෙම ණය මුදල වසර 5ක සහන කාලයක් ඇතුළුව වසර 25කදී ගෙවිය යුතුය.

(iv) වාර්ෂික පොලී අනුපාතය, ලන්ඩන් අන්තර් බැංකු පොලී අනුපාතයට 0.6%ක් එකතු කර එම අනුපාතයෙන් 0.3%ක් බැර කර ගණනය කරනු ලබයි.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
[பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අංක 1.

**ගරු බුද්ධික පතිරණ මහතා**
[மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්න අහන්නට කලින් මා දැන ගන්නට කැමැතියි, රුපියල් මිලියන 492ක්ද, ඩොලර් මිලියන 492ක්ද? කියන එක.

**ගරු නිර්මල කොතලාවල මහතා**
[மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඒ කොයි ප්‍රශ්නයද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු බුද්ධික පතිරණ මහතා**
[மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා අන්තිමට සඳහන් කළ මුදල.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ණය මුදලද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඔව්.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
රුපියල් මිලියන 492යි. අපේ ඇස්තමේන්තුගත මුදල මිලියන 1,041යි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මිලියන 1,041 රුපියල්ද ඩොලර්ද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
රුපියල්. ඔබතුමා අහන්නේ පිවිසුම් දොරටුව සම්බන්ධයෙන්. අදාළ සම්පූර්ණ මාර්ගය සම්බන්ධයෙන් නොවෙයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. මේ ලැබුණු ණය ආධාර මුදලෙන් යම් කිසි කොටසක් පාවිච්චි වෙනවාද, අර වන්දි ලබා දීමේ ක්‍රියාවලිය සඳහා?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
අදාළ මාර්ගයේ ප්‍රවේශ දොරටුව ඉදි කිරීම සඳහා ණය ආධාර මුදල සහ ඉඩම් අත් පත් කර ගැනීම සඳහා වන්දි මුදල් ගෙවීමට භාණ්ඩාගාරයේ මුදල් යොදවන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වන්දි මුදල් සඳහා ඔබතුමන්ලා වෙන් කරපු මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් වෙනවාද? මොකද, දැන් ආපහු සැරයක් නිලධාරීන් වරින් වර -මේක දේශපාලන මට්ටමෙන් නොවෙයි නිලධාරි මට්ටමෙන්- මුලින් වෙන් කරපු වන්දි මුදලට වඩා වන්දි මුදල් සමහර කණ්ඩායම්වලට වැඩියෙන් ගෙවනවා. ඒ තත්ත්වය තුළ වන්දි මුදල් සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් කියලා ඔබතුමා හිතනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාර්ෂික අය වැයේදී ඉඩම් අත් පත් කර ගැනීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශයට අදාළ ප්‍රතිපාදන වෙන් වෙනවා. ඒ අදාළ ප්‍රතිපාදන සමඟ කටයුතු කරනවා. ඊට වැඩි ප්‍රමාණයක් ලැබෙනවා නම් ඉල්ලීම් ලැබෙනවා නම් ඒ කටයුතු සඳහාත් අදාළ වැඩ පිළිවෙළක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, තුන්වන අතුරු ප්‍රශ්නය? තුන්වන අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
තුන්වන අතුරු ප්‍රශ්නය මා අහනවා. මා ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ පිවිසුම් දොරටුවේ වාහන තදබදයක් ඇති වෙයි කියලා මහාචාර්යවරු සඳහන් කරලා තිබෙනවා. මොකද, පැයට කිලෝ මීටර් 100ක වේගයෙන් ඇවිල්ලා toll එක ගෙවා ගන්න පැය ගණනක් පෝළිමේ ඉන්න වෙයි කියනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්න ක්‍රියා පටිපාටිය මොකක්ද කියලා දැන ගන්න කැමැතියි.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawela)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා තිබුණේ 2012 වැඩ ආරම්භ කරන මාතර - නුපේ පිවිසුම් දොරටුව සම්බන්ධයෙනුයි. මෙතුමා අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කොයි පිවිසුම් දොරටුව සම්බන්ධයෙන් ද දන්නේ නැහැ. මෙතුමා කියන්නේ මහාචාර්යවරුන්ගේ අදහසක්. රියදුරු මහත්වරුන්ගේ ඉල්ලීමක් තිබෙනවා නම් අපි ඒ පිළිබඳව සාකච්ඡා කරන්න සූදානම්.

## රංජිත් පද්මසිරි මහතා: වැඩ තහනම
## திரு. ரஞ்சித் பத்மசிறி: வேலை இடைநிறுத்தம்
## MR. RANJITH PREMASIRI: INTERDICTION

1043/'10

10. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජන මාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 ඔක්තෝබර් 29වැනි දින "දිනමිණ" පුවත් පතේ නියෝජ්‍ය කර්තෘ රංජිත් පද්මසිරි මහතාගේ වැඩ තහනම් කර තිබේද;

(ii) එසේ නම්, ඔහුට එරෙහිව ඇති චෝදනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රංජිත් පද්මසිරි මහතාට එරෙහිව ඇති චෝදනාව "ෆොන්සේකාගේ පෙත්සම් විභාගයට නොගෙනම ඉවත දමන්නැයි ජනපති ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලයි" යන සිරස්තලය යොදා ප්‍රවෘත්තියක් පළකිරීම ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට ඒ මහතාගේ වැඩ තහනම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 29 ஆம் திகதி `தினமின' பத்திரிகையின் பிரதி ஆசிரியர் திரு. ரஞ்சித் பத்மசிறியின் வேலை இடைநிறுத்தப் பட்டதா என்பதையும்,

(ii) ஆமெனில், இவருக்கெதிராக உள்ள குற்றச் சாட்டுகள் யாவையென்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(ஆ) திரு. ரஞ்சித் பத்மசிறிக்கு எதிராக உள்ள குற்றச்சாட்டு, "பொன்சேகாவின் மனுவை விசாரணைக்கு எடுக்காமலே நிராகரிக்குமாறு சனாதிபதி உயர் நீதிமன்றத்தைக் கோருகின்றார்" எனும் தலைப்பைக் கொண்ட செய்தி யொன்றை பிரசுரித்தமையா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இற்றைவரை இவரின் வேலை இடைநிறுத்தம் சம்பந்தமாக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கை யாதென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information :

(a) Will he state -

(i) whether the Deputy Editor of the "Dinamina" newspaper, Mr. Ranjith Padmasiri was interdicted on 29th October, 2010; and

(ii) if so, the charges against him ?

(b) Will he inform this House whether the charge against Mr. Ranjith Padmasiri was the publication of a news item titled "President appeals to Supreme Court to dismiss Fonseka's petition without trial" ?

(c) Will he state as to what action has been taken with regard to his interdiction by now ?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ජන මාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2010-10-26 දින ඩේලි නිවුස් පුවත් පතේ "Reject Petition in Limine" යන සිරස්තලය යටතේ පළ වූ ප්‍රවෘත්තිය විකෘති ලෙස පරිවර්තනය කරමින් "ෆොන්සේකාගේ ඡන්ද පෙත්සම නීති විරෝධියි. විභාගයට නොගෙනම ඉවත දමන්න. ජනපති ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලයි." යන සිරස්තලය යටතේ සාවද්‍ය ලෙස එම පුවත සකස් කිරීම හේතුවෙන් 2010 ඔක්තෝබර් 29 දින ඔහු වැඩ තහනමට ලක් කරනු ලැබීය.

ඉන් පසුව ඔහු විසින් ලේක්හවුස් ආයතනයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ පෙත්සම සලකා බැලීමෙන් අනතුරුව නිශ්ප්‍රභ කරන ලදී.

(ආ) ඔව්.

(ඇ) සානුකම්පිත හේතු මත 2011- 03 - 03 ඔහු නැවත සේවයේ පිහිටවනු ලැබීය.

(ඈ) අදාළ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

"නිෂ්ප්‍රභා කරන ලදී" කියන්නේ මොකක්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔහුගේ ඉල්ලීම පිළිගත්තේ නැහැ කියන එකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔහුගේ ඉල්ලීම කියන එක මට පැහැදිලි නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

වැඩ තහනම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ පෙත්සමට ශ්‍රේෂ්ඨාධිකරණයේ එකඟතාවක් ලැබුණේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය ඒක ප්‍රතික්ෂේප කළාය කියන එක?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Leave has not been granted.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, I know. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද අබේසුන්දර මහත්මයාත්, සරත් මලලසේකර කියන මහත්මයාත් තමයි මේ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් හෙඩිම දමලා තිබෙන්නේ. ඇත්ත වශයෙන් මේකට මේ අදාළ මාධ්‍යවේදියාගේ සම්බන්ධතාවක් තිබුණේ නැහැ. මම කියන්නේ- [බාධා කිරීම්] පොඞ්ඩක් ඉන්න කෝ. අවුරුදු හැත්තෑ ගණන්වල කට්ටිය - outdated කට්ටිය - තියා ගෙන ඉන්න කොට මේක තමයි වන්නේ. ඒකයි මම මේ කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නොකළ වරදකට තමයි අද එතුමාට මේ දඬුවම ලබා දී තිබෙන්නේ. ඇත්තටම කනගාටු වන්න ඕනෑ ඒක නිසායි. එතුමා නොවෙයි මේ හෙඩිම දමලා තිබෙන්නේ. ඒ නිසා එතුමා නොකළ වරදකට කර තිබෙන දේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා නිවැරදි පරීක්ෂණයක් කරලා, නිවැරදි පියවරක් ගන්න කටයුතු කරනවාද නැද්ද කියලා මම අහන්න කැමැතියි. මොකද, එතුමා ආණ්ඩුව වෙනුවෙන්ම ලියපු කෙනෙක්. ඔබතුමන්ලාගේ headings වල ප්‍රශ්නවලට තමයි -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,මේ කාරණය සම්බන්ධව අදාළ තැනැත්තා වග කීමක් දැරීමක් සිදු වනවා. ඒ නිසා ඔහුගේ සේවය අත් හිටුවලා පරීක්ෂණයක් කරලා තිබෙනවා. ඒ පරීක්ෂණය හමාරයි. එනමුත් මම දුන්න පිළිතුර ගරු මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු වෙලා නැහැ.

ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්නේ මා දුන්නු පිළිතුර අවධානයට නොගෙන. සානුකම්පික හේතු මත 2011.03.03 වන දින ඔහු නැවත සේවයේ පිහිටුවා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ ඒවා ලේක්හවුස් එකේ සිද්ධ වනවා. ලේක්හවුස් එකේ අරුම පුදුම ඒවා සිද්ධ වන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඒකයි කිව්වේ. හරි නම් හෙඩිම දමාපු එක් කෙනායි වරදකාරයා වන්න ඕනෑ. මේකේ -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නයක් අහන්න. අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව කථාවකට පාවිච්චි කරන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. කථාවක් කරන්නේ නැහැ. ලේක්හවුස් එකේ ප්‍රධාන පුටුවේ ඉඳ ගත්තා, මාර්ටින් වික්‍රමසිංහ වැනි වැදගත් අය. නමුත් මේ හෙඩිම දමන එක සම්බන්ධයෙන් outdated -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොනවාද මේ කථා කරන්නේ? මට තේරෙන්නේ නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Outdated කට්ටිය ගෙනැවිත් දමා ගැනීමේ ප්‍රතිඵලයක් තමයි මේ තිබෙන්නේ. එම නිසා,- [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේවා අදාළ නැහැ. මේවා ඉවත් කරන්න ඕනෑ. නිකම් ප්‍රකාශ කරන්නේ. කිසිම වැඩක් ඇති දේවල් නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අහගන්න. ලේක්හවුස් කියන කොට දඟලනවා. නළියනවා. ඉන්න බැරුවයි ඉන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මාර්ටින් වික්‍රමසිංහ ගැන කථා කරනවා. ඩී.එස්. සේනානායකගේ පක්ෂයේ ඉඳ ගෙන වෙන දෙයක් කථා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තවමත් ඩී.ආර්. විජේවර්ධන මහත්මයාට වැඳලා තමයි සේවකයෝ තවමත් එන්නේ. දැන් ඒ ආයතනය කාලා තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ළඟින්වත් ඉන්න බැහැ. [බාධා කිරීම්] මොන තරම් උතුමෙක්ද, ඩී.එස්. සේනානායක මැතිතුමා කියන්නේ. එතුමා ජාතියේ පියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
2001 දී 45,000ක් විකුණුනු "දිනමිණ" පත්‍රවලින් දැන් විකිණෙන්නේ 7,000යි. ඒකයි අපි කියන්නේ. ලක්ෂ හතරක්, පහක් විකිණුව "සිළුමිණ" පත්‍රවලින් දැන් විකිණෙන්නේ 70,000යි. ඒකයි අපි මේ කියන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, උත්තරයක් තිබෙනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කිසිම දෙයකට නොවෙයි මේ කථා කරන්නේ, ප්‍රචාරයටයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඩී.ආර්. විජේවර්ධන මහත්මයාට වැඳලා තමයි අදත් මිනිස්සු එන්නේ. ඒකයි අපි කියන්නේ.

## මාතර - නූපේ - ගොඩගම මාර්ගය පුළුල් කිරීම: වන්දි මුදල්
## மாத்தறை - நூபே- கொடகம பாதை விஸ்தரிப்பு: இழப்பீடு
## WIDENING OF MATARA-NUPE-GODAGAMA ROAD: COMPENSATION

1006/'10

12. **ගරු බුද්ධික පතිරණ මහතා**
( மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ මාතර පිවිසුම් දොරටුව වන මාතර - නූපේ - ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ කටයුතුවලදී පවරා ගනු ලබන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ගය පුළුල් කිරීම නිසා අහිමි වන ස්ථිර නිවාස සහ ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉඩම් ඇතුළු අනෙකුත් දේපළ අහිමි වන අයගේ නම්, ලිපිනයන් සහ එක් එක් පුද්ගලයාට ගෙවීමට එකඟව ඇති වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නගර සභා සහ ප්‍රාදේශීය සභා සීමාවේ පර්චස් එකක බිම් ප්‍රමාණයක් සඳහා ගෙවනු ලබන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එලෙස වන්දි ගෙවීමේදී අහිමි වන මුඩු බිම් හා වගුරු බිම් පර්චස් එකක් සඳහා ගෙවනු ලබන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙළඳපොළේ වර්තමාන දේපළ මිල ගණන් හා සැසඳීමේදී අහිමි වන ඉඩම් හෝ දේපළ වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை - கொழும்பு கடுகதி நெடுஞ்சாலையின் மாத்தறை புகுமுக வாயிலான மாத்தறை நூப்பே - கொடகம வீதியை விஸ்தரிக்கும் பணிகளுக்கென சுவீகரிக்கப்படவுள்ள மொத்த நிலப்பரப்பு யாதென்பதையும்;

(ii) வீதியை விஸ்தரிப்பதன் காரணமாக இழக்கப்படும் நிரந்தர வசிப்பிடத்தைக் கொண்ட வீடுகள் மற்றும் வர்த்தக நிலையங்களின் எண்ணிக்கை தனித்தனி யாக யாதென்பதையும்;

(iii) காணிகள் உட்பட ஏனைய ஆதனங்களை இழப்போரின் பெயர்கள், முகவரிகள் மற்றும் ஒவ் வொரு நபருக்கும் செலுத்த உடன்பட்டுள்ள இழப்பீட்டுத் தொகை தனித்தனியாக யாவை யென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இழப்பீட்டுத் தொகை செலுத்தும்போது நகரசபை மற்றும் பிரதேச சபை எல்லைகளில் ஒரு பேச் (01) காணித்துண்டுக்கென செலுத்தப்படும் இழப்பீட்டுத் தொகை தனித்தனியாக யாதென்பதையும்;

(ii) அவ்வாறு இழப்பீடு செலுத்தும்போது இழக்கப்படும் ஒரு பேச் தரிசு நிலம் மற்றும் ஒரு பேச் சதுப்பு நிலத்திற்கென செலுத்தப்படும் இழப்பீட்டுத் தொகை தனித்தனியாக யாதென்பதையும்;

(iii) சந்தையில் தற்போது நிலவும் ஆதன விலைகளுடன் ஒப்பிடும்போது இழக்கப்படும் காணிகள் அல்லது ஆதனங்களுக்கென செலுத்தப்படும் இழப்பீட்டுத் தொகை போதுமானதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House -

(i) the total extent of land acquired for the purpose of widening the Nupe-Godagama Road which is the Matara access point of the Matara-Colombo Expressway;

(ii) separately, the number of permanent residences and places of business that will be lost owing to the widening of the aforesaid road; and

(iii) separately, the names and addresses of those who will lose lands and other properties along with the amount of compensation agreed to be paid to each person ?

(b) Will he inform this House-

(i) separately the amount of money paid in respect of a perch of land in the Urban Council and Pradeshiya Sabha limits, at the payment of compensation;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) separately the amount of money paid in respect of a perch of land that will be lost in waste-lands and marshy lands, at the payment of compensation; and

(iii) whether the amount paid as compensation in respect of lands and properties that will be lost is sufficient in comparison to the prices of the properties in the current market ?

(c) If not, why ?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මාතර නුපේ සිට ගොඩගම දක්වා අත් කර ගනු ලැබූ මුළු බිම් ප්‍රමාණය

වන්නේ හෙක්ටයාර් 5.6282 (පර්චස් 2224.54)කි.

(ii) මාර්ගය පුළුල් කිරීම නිසා සම්පූර්ණයෙන්ම අහිමි වන ස්ථිර නිවාස ගණන 22ක් වන අතර ස්ථිර ව්‍යාපාරික ස්ථාන ගණන 59කි.

(iii) ඉඩම් අහිමි වන අයගේ නම, ලිපිනය, ගෙවීමට එකඟව ඇති වන්දි ප්‍රමාණය සහිත ලේඛනයක් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමට සහ එම විස්තර විධිමත්ව සකස් කිරීමට කාලයක් ගත වන බැවින් එම කොටසට පමණක් පිළිතුරු සැපයීමට මාසයක කාලයක් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

(ආ) (i) ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉඩම් පර්චස් එකක් සඳහා රුපියල් එක්ලක්ෂ පන්දහසේ (රුපියල් 1,05,000.00) සිට රුපියල් දෙලක්ෂ විසිපන්දහසක් (රුපියල් 2,25,000.00) දක්වා පරාසයක වන්දි ගෙවීමට තීරණය කර ඇති අතර, නගර සභා සීමාව තුළ ඉඩම් පර්චස් එකක් සඳහා රුපියල් ලක්ෂ තුනේ (රුපියල් 3,00,000.00) සිට රුපියල් හයලක්ෂ පනස්දහසක් (රුපියල් 6,50,000.00) දක්වා පරාසයක වන්දි ගෙවීමට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇත.

(ii) මාර්ගය දෙපස ඇති සියලු ඉඩම් නේවාසික ඉඩම් වන බැවින් මුඩු බිම් හෝ වගුරු බිම් ලෙස ප්‍රශ්නයක් පැන නොනඟී.

(iii) නුපේ ගොඩගම මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අත් පත් කර ගත් සියලුම ඉඩම් සහ ගොඩනැඟිලි සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් වර්තමාන වෙළෙඳ පොළ මිල ගණන්වලට සමාන සාධාරණ සහ යුක්ති සහගත වන්දි මුදලක් ගෙවා ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. මේ සමහර වන්දිලාභීන්ට ලබා දුන්නු මුදල අසාධාරණයි කියලා ඒ අය කියද්දී, LARC කමිටු දෙකටම පවා යද්දී, ඒ අයගෙන් බලහත්කාරයෙන් අත්සන් අරගෙන තිබෙනවා මේ මුදලත් නැති වෙනවා, බලෙන් ගොඩනැඟිලි කඩලා අයින් කරනවා කියලා. මේ පිළිබඳව ඇමතිතුමාට වාර්තා වෙලා තිබෙනවාද? නොඑසේ නම් ඒ සම්බන්ධයෙන් ඔබතුමා සොයලා බලලා, වගකිව යුතු පිළිතුරක් ප්‍රශ්නයේ (අ) (iii) කොටසට පිළිතුරු දෙනවාය කිව්ව දවසේදීම ලබා දෙන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ ප්‍රශ්නය යොමු කිරීම පිළිබඳව. ඒ වාගේම මීට පෙරත් මේ ප්‍රශ්නය මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා අපට ඉදිරිපත් කරලා, අපේ අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳව විමර්ශන කටයුතු කළා. එහෙම වන්දි ලබා දීම සඳහා බලහත්කාරයෙන් අත්සන් අරගෙන නැහැ. නමුත් මේ වන්දි ලබා ගැනීමේ යම් කිසි විෂමතාවක් තිබෙනවාය කියන එක ගැන ඉල්ලීම් කළා. ඒ පිළිබඳව අපි මේ වන විටත් අදාළ කටයුතු කරමින් පවතිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. ඒ නිවාස අහිමි වන ඇතැම් අයගේ තරාතිරම අනුවයි මුදල් ගෙවන්නේ. ඒ කියන්නේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන කෙනකුට නම් එක මුදලක්, එහෙම නැති තවත් කෙනකුට නම් තව මුදලක් ගෙවන්නේ. එක තැනක ගරා වැටිච්ච ගෙයක් මැද්දේ ගහක් පැළ වෙලා තිබෙනවා. හැබැයි ඒක පාවිච්චි කරන ඉතා ඉස්තරම් මට්ටමේ ගෙයක් හැටියට තමයි වන්දි මුදල් තීරණය කරලා තිබෙන්නේ. කොහොම කිව්වත් මේ වාගේ විෂමතාවන් තිබෙනවා. ඒ නිසා මේ අය බලාපොරොත්තු වෙනවා, LARC එකට අමතරව ජනාධිපති විමර්ශන ඒකකය වාගේ තැනකින් ගිහිල්ලා මේ ගැන පරීක්ෂණයක් කරයි කියලා. එම නිසා ලිපියකින් දැනුම් දීලා, මේ අය කැඳවලා යළි පරීක්ෂණයක් කරන්න ඔබතුමාගේ ගෞරවණීය අවධානය යොමු කරනවාද?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රදේශය ප්‍රාදේශීය සභා බල සීමාවටත් නගර සභා බල සීමාවටත් අදාළ වෙනවා. පසු කාලීනව නගර සභා සීමාව මහ නගර සභා සීමාවක් දක්වා පුළුල් කළා. ඒ අවස්ථාවේදී මිල ගණන් වෙනස් වීම මත අදාළ ඉඩම් හිමියන් විවිධ ඉල්ලීම් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් රජය පිළිගත් ක්‍රියාවලියක් තිබෙනවා. විශේෂ LARC එක ඒ අනුව කටයුතු කරනවා. යම් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඔබතුමා ඒ කාරණය ඉදිරිපත් කරන්න. මීට පෙරත් ඔබතුමා මේ පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකටත් ස්තුතිවන්ත වෙනවා. මොනවා හරි ගැටලුවක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්න මාතරත් තැනක් තිබෙනවා නේ. අපි ඒ කාරණය පිළිබඳව පැහැදිලිවම ඇහුම් කන් දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය. LARC-2නුත් සාධාරණයක් ඉෂ්ට වන්නේ නැත්නම් ඒ අසාධාරණයට ලක් වන අය යා යුත්තේ කොතැනටද? කුමක්ද ඔවුන් කළ යුත්තේ?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
LARC-1න් පසු, මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා යටතේ තිබෙනවා විශේෂ LARC එක. ඒ කියන්නේ Super LARC එක.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒකටත් ගියා.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
එහෙම ගිහිල්ලාත් තීන්දුවක් පිළිබඳ එකඟතාවක් නැති කාරණා පිළිබඳව තමයි ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා අපට කරුණු ඉදිරිපත් කරලා තිබුණේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ඒකට ගියාම කිව්වා ලු, මේකට ආපු හන්දා - කොළඹ ඇවිල්ලා යන එකට- ගමන් ගාස්තුව වශයෙන් රුපියල් 1,000ක් දෙන්නම් කියලා. අන්න ඒකයි ප්‍රශ්නය. එච්චරයි හම්බ වෙලා තිබෙන්නේ.

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)
ඔබතුමා පොඩ්ඩක් ඒකට ඇහුම් කන් දුන්නා නම් හොඳයි. ඔබතුමාට ඔය කාරණය ඉදිරිපත් කරපු කවුරු හරි ඉඩම් ලාභියකු ඉන්නවා නම් ලක්ෂ්මන් යාපා නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළා වාගේ ඒ කාරණය අපට ඉදිරිපත් කරන්න. එතකොට අපි ඔබතුමාට අදාළ සහාය ලබා දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-1023/'10-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වාහන දුම් පරීක්ෂාව: විස්තර
### வாகனப் புகை பரிசோதனை: விபரம்
### VEHICLE EMISSION TEST: DETAILS

1044/'10

14. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය මඟින් වාහන දුම් පරීක්ෂාව ආරම්භ කරන ලද දිනය කවරේද;
(ii) එදින සිට වර්ෂ 2010 දෙසැම්බර් දක්වා පරීක්ෂා කරන ලද වාහන සංඛ්‍යාව සහ එමඟින් ලැබූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) දිවයිනේ එක් එක් දිස්ත්‍රික්කය තුළ දුම් පරීක්ෂාව සඳහා පිහිටුවා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) දුම් පරීක්ෂාවෙන් අනතුරුව ලංකාවේ ධාවනයෙන් ඉවත් කරන ලද වාහන සංඛ්‍යාව එක් එක් වාහන වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தால் வாகனப் புகை பரிசோதனை ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்;
(ii) அன்றைய திகதியிலிருந்து 2010 ஆம் ஆண்டு திசெம்பர் வரை பரிசோதனை செய்யப்பட்ட வாகனங்களின் எண்ணிக்கை மற்றும் அதன் மூலம் பெறப்பட்ட வருமானம் வருடாந்த ரீதியாக தனித்தனியாக யாதென்பதையும்;
(iii) நாட்டின் ஒவ்வொரு மாவட்டத்திலும் புகைப் பரிசோதனைக்கென அமைக்கப்பட்டுள்ள நிலையங்கள் தனித்தனியாக யாவை என்பதையும்;
(iv) புகைப் பரிசோதனையின் பின்னர் இலங்கையில் போக்குவரத்திலிருந்து அகற்றப்பட்ட வாகனங் களின் எண்ணிக்கை ஒவ்வொரு வாகன வகைக்கேற்ப தனித்தனியாக யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state -
(i) the date on which the vehicle emission testing was started by the government ;
(ii) separately, the number of vehicles tested from the aforesaid date upto December 2010 and the income received through that, on annual basis;
(iii) separately, the places established for vehicle emission testing within each district of the island; and
(iv) separately, the number of vehicles withdrawn from running in Sri Lanka after vehicle emission testing, in terms of each type of vehicle ?

(b) If not, why

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2008.11.17

(ii)

| වර්ෂය | වාහන සංඛ්‍යාව | ආදායම(රු.) |
|---|---|---|
| 2008 | 1,01,538 | 4,201,767.71 (හතළිස් දෙලක්ෂ එක්දහස් හත්සිය හැට හතයි ශත හැත්තෑ එකයි) |
| 2009 | 9,52,737 | 40,033,944.00 (හාර කෝටි තුන්ලක්ෂ තුන් දහස් නවසිය හතළිස් හතරයි) |
| 2010 | 16,14,370 | 136,225,820.31 (දහතුන් කෝටි හැට දෙලක්ෂ විසි පන්දහස් අටසිය විස්සයි ශත තිස් එකයි) |

(iii)

| දිස්ත්‍රික්කය | ක්ලින්කෝ ලංකා පුද්.සමාගම | | ලාෆ් එකෝ ශ්‍රී සමාගම | |
|---|---|---|---|---|
| | ස්ථිර මධ්‍යස්ථාන | ජංගම මධ්‍යස්ථාන | ස්ථිර මධ්‍යස්ථාන | ජංගම මධ්‍යස්ථාන |
| කොළඹ | 9 | - | 13 | - |
| ගම්පහ | 9 | - | 9 | - |
| කළුතර | 3 | 5 | 4 | - |
| ගාල්ල | 3 | 6 | 4 | 6 |
| මාතර | 2 | 6 | 3 | 6 |
| හම්බන්තොට | 2 | - | 2 | - |
| කුරුණෑගල | 5 | 12 | 4 | 21 |
| පුත්තලම | 1 | - | 3 | 5 |
| අනුරාධපුරය | 2 | 6 | 1 | 12 |
| පොලොන්නරුව | - | 6 | 1 | 5 |
| මාතලේ | 1 | - | 2 | 1 |
| මහනුවර | 4 | - | 4 | 6 |
| නුවරඑළිය | 1 | - | 1 | - |
| රත්නපුරය | 2 | 2 | 3 | 6 |
| කෑගල්ල | 3 | - | 2 | - |
| බදුල්ල | 1 | - | 2 | 4 |
| අම්පාර | 1 | - | 2 | 1 |
| ත්‍රිකුණාමලය | - | 3 | 1 | - |
| මඩකලපුව | - | 1 | 1 | - |
| එකතුව | **49** | **47** | **62** | **73** |

ස්ථිර මධ්‍යස්ථාන - 111
ජංගම මධ්‍යස්ථාන - 120
සම්පූර්ණ පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන - 231

(iv) මෙම වායු විමෝචන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු 2010 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා පරීක්ෂා කරන ලද සම්පූර්ණ වාහන ගණන 26,68,645 ක් වන අතර එයින් වාහන 4,33,108 ක් එනම් 16.22% ක වාහන සංඛ්‍යාවක් අසමත් වී ඇත. පළමු වරට අසමත් වූ වාහන නැවත අලුත් වැඩියා කිරීමෙන් පසු දෙවන වරට පරීක්ෂා කිරීමේදී වැඩි ප්‍රමාණයක් සමත් වී ඇති අතර එයින් කොටසක් අසමත් වී ඇත. මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ වාහනවල වායු විමෝචන ප්‍රමිතීන් නියමිත මට්ටමේ පවත්වා ගෙන යාම හා වාහන හිමියන් අතර පරිසර දූෂණය අවම කිරීම සඳහා වාහන නිසි පරිදි නඩත්තු කිරීමේ අවශ්‍යතාව අවබෝධ කිරීම මෙන්ම ක්‍රමානුකූල වාහන නඩත්තු කිරීමේ වැඩපිළිවෙළක් ප්‍රචලිත කිරීම වන අතර වාහන ධාවනයෙන් ඉවත් කිරීම නොවේ. ඒ අනුව දෙවන වරට අසමත් වූ වාහන ධාවනයෙන් ඉවත් වූ වාහන ලෙස සැලකිය නොහැක. එම වාහන ද නැවත අලුත්වැඩියා කිරීමෙන් පසු යථා තත්වයට පත් කර ධාවනය කළ හැක.

(ආ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ආණ්ඩුව මේ වැඩ පිළිවෙළ ගෙනෙනකොට කිව්වා මට මතකයි, ලංකාවේ ධාවනයට නුසුදුසු වාහන සංඛ්‍යාවක් තිබෙනවා, ඒවා ධාවනයෙන් ඉවත් කිරීම සඳහා තමයි මේ කටයුතු කරන්නේ කියලා. දැන් කරන්නේ එක වතාවක් ඒ පරීක්ෂණයෙන් අසමත් වෙච්ච වාහන, ආයෙත් හදලා පරීක්ෂා කරලා ආපහු දුවවන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මීටත් වඩා ප්‍රශ්නයක් තිබෙනවා. අබලන් වෙච්ච වාහන නැවතත් ආපසු යථා තත්ත්වයට පත් වෙනවා. වාහන ඉවත් කරන එක නොවෙයි වැදගත් වෙන්නේ. ඒ ගැන අපි කල්පනා කරන්න ඕනෑ. සියයට 16ක වාහන ප්‍රමාණයක් පළමු පරීක්ෂණයෙන් අසමත් වෙලා තිබුණා නේ. දෙවන වටයේ පරීක්ෂා කරනකොට කොච්චර වාහන ප්‍රමාණයක් අසමත් වෙලා තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

දෙවන වටය සම්බන්ධයෙන් නම් විස්තර දීලා නැහැ ගරු මන්ත්‍රීතුමනි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙතැනදී බලාපොරොත්තු වෙන්නේ වාහන ඉවත් කිරීම නොවෙයි. මේ රටේ පරිසරයට හානි නොවන පරිදි, ජනතාවගේ සෞඛ්‍යයට හානි නොවන පරිදි, ඉන්ධන කළමනාකරණය වන පරිදි, රටට උචිත ලෙස, රටට බරක් නොවන පරිදි වාහන පවත්වාගෙන යෑම තමයි මේ වායු විමෝචන පරීක්ෂාවෙන් බලාපොරොත්තු වෙන්නේ.

ඒ අනුව ධාවනයට නුදුසුසු තත්ත්වයේ ඒවා සියයට 16ක් තිබුණා. ඊට පසුව සියයට 4ක් පමණ නැවත එයට එකතු වෙලා තිබෙනවා. ඒ සියයට හතරත් ගරාජ්වලට දමලා වියදමත් ලෙස සකස් කරලා පරීක්ෂණයට ලක් කළාට පස්සේ නැවත ඒ වාහන මාර්ගයේ ධාවනය කරන්න පුළුවන්කම තිබෙනවා. කෙනෙකුට වාහනයක් ඉවත් කිරීම තුළ විශාල හානියක් වෙනවා. ඒ නිසා රටට හිතකර පරිදි, පරිසරයට හිතකර පරිදි ඒ වාහනය ධාවනය කරන්න අවශ්‍ය කටයුතු සැලැස්වීම තමයි මේකේ පළමුවෙනි පරමාර්ථය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න අංක 2.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට තිබෙන ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ දුම් පරීක්ෂාව සම්බන්ධව ගෙවන මුදලට -ඔබතුමන්ලා දමලා තිබෙන ප්‍රමාණයට- අමතරව ඒ බිලට තව රුපියල් හත් අටසියක් ඒ ස්ථානවලින් ඇතුළත් කරනවා. [බාධා කිරීමක්] නැහැ, ඒක ඇතුළත් කරලා තිබෙන්නේ.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

එවැනි අවස්ථාවක් තිබෙනවා නම් ඔබතුමා අපට ඉදිරිපත් කරන්න. අපි වහාම ඒ ගැන පරීක්ෂණ පවත්වන්න සූදානම්. එවැනි ආකාරයේ අමතර අය කිරීමක් කිසිම ආකාරයකින් කරන්න මේ වැඩ පිළිවෙළ තුළින් සකස් කරලා නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් මේ විධියට දවස ගණනේ වාහනවල දුම් පරීක්ෂා කරලා ආණ්ඩුව 2010 වසරේ කෝටි 13කට වැඩි ප්‍රමාණයක් අය කර ගෙන තිබෙනවා. ඉතින් ඇත්ත වශයෙන් මේකෙන් වෙනත් කාරණයක් සිද්ධ වන්නේ නැහැ. මේකෙන්

සිද්ධ වන්නේ අපේ අහිංසක මෝටර් බයිසිකල් අයිතිකරුවන්ගෙන්, ත්‍රී වීලර් එකක් තිබෙන දුප්පත් අහිංසක මිනිසුන්ගෙන් අවුරුද්දට ගණනක් අරගෙන කෝටි 13ක් ආණ්ඩුවට එකතු කර ගන්නා වැඩ පිළිවෙළක් යන එක විතරයි. ඒ නිසා මේ කෝටි 13 පාවිච්චි කරලා අඩුම තරමේ ත්‍රී වීලර් රියැදුරන්ට දෙනවා කියපු සහනාධාරය වාගේ සහනාධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද, නැද්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට මම මේ විධියට පිළිතුරු දෙන්න කැමැතියි. මේ රටේ වායු විමෝචනයෙන් මේ විධියට පරිසරය අපවිත්‍ර වීම නිසා හැදෙන අසනීප ආදිය දිහා බැලුවාම ඒ එක patient කෙනෙක් වෙනුවෙන් ශල්‍යකර්මයක් කරන කොට රුපියල් ලක්ෂ දහයක්, පහළොවක් වියදම් වෙනවා. එක ආරෝග්‍ය ශාලාවක දවසකට ශල්‍යකර්ම 90ක්, 100ක් සිද්ධ වෙනවා. ඒකට යන මුදල් ප්‍රමාණය සහ මේ වැඩ පිළිවෙළ දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ වාහන දුම් පරීක්ෂාව තුළින් ඉතාම දැනෙන ප්‍රතිඵලයක් රටට ලැබෙන බව. ඒ නිසා මේ දෙස තමුන්නාන්සේ ඍජුව බලන්න එපා; වක්‍රව බලන්න. ඉතාම සෞඛ්‍ය සම්පන්න ජනතාවක් සිටීම, ඒ වාගේම හොඳ පරිසරයක් තිබීම කියන මේ කාරණා සියල්ලම බැලුවාම එයින් ලැබෙන ප්‍රතිලාභයේ ප්‍රමාණය ගැන තමුන්නාන්සේට ගණන් හදන්නත් බැහැ ගරු මන්ත්‍රීතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දෙවන වටය. ප්‍රශ්න අංක 4-1050/'10-(3), ගරු මොහොමඩ් අස්ලම් මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
அந்தக் கேள்வியை நான் கேட்கின்றேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 6-1165/'11-(3), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: கலாசார, கலை அலுவல்கள் அமைச்சு
## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF CULTURE AND THE ARTS

1232/'11

7. **ගරු අජිත් කුමාර මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அஜித் குமார - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Ajith Kumara - on behalf of the Hon. Sunil Handunnetti)

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கலாசார, கலை அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக கலாசார, கலை அலுவல்கள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

[ගරු අජිත් කුමාර මහතා]

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Culture and the Arts:

(a) Will he state the total amount of money spent by the Ministry of Culture and the Arts on the 'Deyata kirula' exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) රු. 2,184,216/=

(ආ) (I)
- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව රු. 1,581,390/=
- ටවර්හෝල් රඟහල පදනම රු. 579,678.32
- ප්‍රසිද්ධ රැඟුම්පාලක මණ්ඩලය රු. 54,506/=
- මධ්‍යම සංස්කෘතික අරමුදල රු. 302,011/=

(II)
- <u>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව</u>
  - ප්‍රදර්ශන කුටිය
  - රූකඩ නාට්‍ය සංදර්ශනය
  - උදාන ගී ප්‍රසංගය
  - කෙටි නාට්‍ය සංදර්ශනය
  - ආබද්ධ කලාංග වැඩමුළුව (ගොක්කොළ සැරසිලි)
  - ගම්මඩු යාගය
- <u>ටවර්හෝල් රඟහල පදනම</u>
  - ප්‍රදර්ශන කුටිය
  - විදුරු තුර්තිය ප්‍රදර්ශනය
- <u>ප්‍රසිද්ධ රැඟුම්පාලක මණ්ඩලය</u>
  - ප්‍රදර්ශන කුටිය
- <u>මධ්‍යම සංස්කෘතික අරමුදල</u>
  - ප්‍රදර්ශන කුටිය

(III)
- <u>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව</u>
  - ප්‍රදර්ශන කුටිය රු. 311,456/=
  - රූකඩ නාට්‍ය සංදර්ශනය රු. 174,000/=
  - උදාන ගී ප්‍රසංගය රු. 195,225/=
  - කෙටි නාට්‍ය සංදර්ශන රු. 184,998/=
  - ආබද්ධ කලාංග වැඩමුළුව රු. 17,240/=
  - ගම්මඩු යාගය රු. 228,678/=
- <u>ටවර්හෝල් රඟහල පදනම</u>
  - ප්‍රදර්ශන කුටිය රු. 517,963.32
  - විදුරු තුර්තිය ප්‍රදර්ශනය රු. 61,805.00
- <u>ප්‍රසිද්ධ රැඟුම්පාලක මණ්ඩලය</u>
  - ප්‍රදර්ශන කුටිය රු. 54,506/=
- <u>මධ්‍යම සංස්කෘතික අරමුදල</u>
  - ප්‍රදර්ශන කුටිය රු. 302,011/=

(ඇ) කුමාර සංස්කෘතික ඒකාබද්ධතා - 177 - 2 - 3 - 1405 (4)
සංස්කෘතික මධ්‍යස්ථාන විවිධ වියදම් - 177 - 2 - 3 - 22 - 1405

(ඈ) පැන නොනඟී.

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල : පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்:தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு

## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF COCONUT DEVELOPMENT AND JANATHA ESTATE DEVELOPMENT

1233/'11

**11. ගරු අජිත් කුමාර මහතා (ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு அஜித் குமார - மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி சார்பாக)
(The Hon. Ajith Kumara on behalf of the Hon. Sunil Handunnetti)

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்க ளினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத் துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Coconut Development and Janatha Estate Development:

(a) Will he state the total amount of money spent by the Ministry of Coconut Development and Janatha Estate Development on the "Deyata Kirula" Exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(c) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(d) If not, why?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)

(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) රු. 96,000කි. (අනූහය දහසකි.)

(ආ) (i)

| ආයතනය | වැය කළ මුළු මුදල (රු.) |
|---|---|
| පොල් පර්යේෂණ ආයතනය | 526,848.00 (පන්ලක්ෂ විසි හයදහස් අටසිය හතලිස් අටකි.) |
| පොල් වගා කිරීමේ මණ්ඩලය | 990,000.00 (නව ලක්ෂ අනූදහසකි.) |
| පොල් සංවර්ධන අධිකාරිය | 421,250.00 (හාර ලක්ෂ විසිඑක්දහස් දෙසිය පනහකි.) |
| කුරුණෑගල වැවිලි සමාගම | 80,000 (අසූ දහසකි) |
| හලාවත වැවිලි සමාගම | 408,569.50 (හාරලක්ෂ අටදහස් පන්සිය හැට නවයයි ශත පනහකි.) |

(ii) පොල් පර්යේෂණ ආයතනය

- පොල් මයිටා පාලනය පිළිබඳව ආදර්ශන පැවැත්වීම.
- පොල් ක්‍රීම් හා නව පොල් ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආකාරය පිළිබඳව ආදර්ශනය පැවැත්වීම.
- නව පොල් ප්‍රභේද හා වගා නඩත්තුව පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීම.
- අතුරු බෝග හා සත්ව පාලන වගා රටා පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම.
- පාසල් ළමයින් සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් පැවැත්වීම.
- පොල් වගාව ආශ්‍රිතව වගාකරුවන්ගේ ගැටලු හඳුනා ගෙන පිළිතුරු සැපයීම.
- ඉහත කාර්යයන් සඳහා ඒකාබද්ධ වියදම රු. 526,848.00කි. (පන්ලක්ෂ විසිහයදහස් අටසියහතලිස් අටකි.)

පොල් වගා කිරීමේ මණ්ඩලය

- පොල් පැළ සිටුවීම.
- විවිධ වයස් කාණ්ඩයන්ට අයත් පොල් වගාවන් ආදර්ශනය කිරීම ( වයස අවුරුදු 01 සිට ඵල දරණ ගසක් දක්වා)
- අතුරු භෝග ආර්ශනය - අන්නාසි, කෙසෙල්, පැපොල්, දෙහි, දොඩම්, කිරි අල
- පොහොර යෙදීමේ ක්ෂේත්‍ර ආදර්ශනය.
- පාංශු සංරක්ෂණය, තෙතමනය සංරක්ෂණය හා පාංශු සරුබව පාලනය
- පලිබෝධ මර්දන කුටිය
- සාම්ප්‍රදායික මෙවලම් විදහා දැක්වෙන ගැමි ගෙදර
- තොරතුරු තාක්ෂණ ඒකකය
- ආදර්ශන පවත්වා ගොවි ජනතාව දැනුවත් කිරීම.
- ඉහත කාර්යයන් සඳහා ඒකාබද්ධ වියදම රු. 990,000.00 (නව ලක්ෂ අනූදහසකි.)

පොල් සංවර්ධන අධිකාරිය

- පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කටයුතු
- අලෙවි ප්‍රවර්ධන කටයුතු
- පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
- ඉහත කාර්යයන් සඳහා ඒකාබද්ධ වියදම රු. 421,250.00කි. (හාරලක්ෂ විසිඑක්දහස් දෙසිය පනහකි.)

[ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා]

කුරුණෑගල වැවිලි සමාගම

- අත්යන්ත්‍ර මඟින් පොල්තෙල් සිඳීම ආදර්ශනය කිරීම.
- වෙනත් ආදර්ශන පවත්වා ජනතාව දැනුවත් කිරීම.
- ඉහත කාර්යයන් සඳහා ඒකාබද්ධ වියදම රු. 80,000.00කි. (අසූදහසකි.)

හලාවත වැවිලි සමාගම

- ආදර්ශන පැවැත්වීම.
- ජනතාව දැනුවත් කිරීමේ පොත් සහ පත්‍රිකා බෙදා හැරීම.
- ජනතාව දැනුවත් කිරීමේ වීඩියෝ පටයක් නිෂ්පාදනය කොට ප්‍රදර්ශනය කිරීම.
- ඉහත කාර්යයන් සඳහා ඒකාබද්ධ වියදම රු. 408,569.50කි. (හාරලක්ෂ අටදහස් පන්සීය හැටනවයයි ශත පනහකි.)

(iii) ඉහත (ආ) (i) හා (ii) ප්‍රශ්නවලට දුන් පිළිතුර අනුව පැන නොනඟී.

(ඇ) ඔව්.
වෙනත් වියදම් වැය ශීර්ෂය වන 1405 යටතේ වැය කරන ලදී.

(ඈ) ඉහත පිළිතුර අනුව පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15-1234/'11-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### යාපනය මැතිවරණ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව අඩු කිරීම
### யாழ்ப்பாணம் தேர்தல் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்களின் எண்ணிக்கை குறைப்பு
### REDUCTION OF NUMBER OF MEMBERS OF PARLIAMENT IN JAFFNA ELECTORAL DISTRICT

**ගරු ආර්. සම්පන්දන් මහතා**
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)
Mr. Deputy Speaker, I raise as a matter of urgent public importance, the question relating to the number of Members of Parliament entitled to be elected to the Jaffna Electoral District.

The total number of Members of Parliament elected to the territory covered by the present Jaffna Electoral District in 1977 under the first-past-the-post system was 11. The total number of Members of Parliament elected to the Jaffna Electoral District under the proportional representation system at the last General Election was nine. It would appear that this number is to further decline and become six.

This reduction is attributed to the decline in the total number of voters currently registered within the Jaffna Electoral District.

It cannot be denied that this decline has not been caused voluntarily. It has been due to various circumstances that were the result of the war that prevailed for around three decades and the violent and abnormal situation that prevailed within the Jaffna Electoral District throughout that period. As a consequence of the war, the Jaffna Peninsula, the main population base of the Jaffna Electoral District, was depopulated almost entirely around 1995 and 1996, from which it has not yet fully recovered. People were also compelled to move to areas outside the Jaffna Electoral District as a result of aerial bombing, artillery and rocket launcher fire, combat between the Sri Lankan - almost entirely Sinhala - armed forces and Tamil rebels, as it became utterly unsafe for them to remain in their original residences within the Jaffna Electoral District. Extreme difficulties in regard to food, medical attention, safe shelter, livelihood opportunities and scarcity of other essentials also compelled people to vacate and move out of their original residences within the Jaffna Electoral District.

In the situation prevalent, registration of voters has not been as regular and methodical as at normal times; many voters were not in possession of their National Identity Cards, and consequently their names have been omitted from the voters' registers. People's attention was more focused on other matters of urgent and immediate concern, such as ensuring their personal safety rather than registering themselves as voters.

A large number of these people took up residence in other parts of the country, have resided with host families in other districts in the North, some have gone to India and some others have gone to other parts of the world. These people have the desire and also the right to return to their original places of residence and be registered as voters within the Jaffna Electoral District. Many of them are unable to do so on account of the existence of a large number of High Security Zones, Restricted Areas controlled by the military and the people being denied the right to resettle in such areas; the excessive presence of the military even in civilian residential areas, several civilian properties are being occupied by the armed

forces, a suspension of the rule of law and the imposition of a State of Emergency rendering civilian life vulnerable and unsafe, the presence of para-military groups with the blessings of the Government who violate the law brazenly and the overweening culture of impunity still prevails.

A situation of normalcy is yet to return to the Jaffna Electoral District that would enable the displaced people to return to their original places of residence with confidence in regard to their safety and security. The people are also being compelled and are also being compulsorily kept out of their places of habitat and residence by the continued existence of High Security Zones and Restricted Areas.

The vast majority of voters within the Jaffna Electoral District are Tamils. A substantial reduction of their representation in Parliament is tantamount not merely to a denial of their franchise but also to an erosion of their sovereignty.

The Tamil people in the North and East of Sri Lanka have consistently urged paradigm changes in the structure of governance as the only means to achieve genuine reconciliation between the different peoples and ensure that the country does not return to the path of violence with all its evil consequences.

Reduction of the representation of the Jaffna Electoral District would in reality mean, the reduction of effective Tamil representation in Parliament and the denial of equal treatment and political justice to the Tamil people.

The abnormal situation that has prevailed and is yet prevalent within the Jaffna Electoral District, should not be ignored and disregarded. Legal provisions pertaining to representation in Parliament meant to be applicable in normal situations should not be applied to situations which are abnormal and in which people are prevented from returning to their residence and being registered as voters. Such a step would in fact distort the true objective of the said legal provisions intended to guarantee the right to equality in representation in Parliament. This constitutes a perversion which will result in grave injustice to an already deprived and disenchanted people.

It is within the part of the State to preserve the *status quo ante*, until a situation of normalcy returns to the Jaffna Electoral District and a decision is arrived at in regard to representation from the Jaffna Electoral District to Parliament in normal times.

The Sri Lankan State has thus far disrespected and disregarded the democratic verdicts of the Tamil people. A hasty determination in regard to representation to Parliament from the Jaffna Electoral District can only be interpreted as a deliberate move on the part of the Sri Lankan State to further emasculate the democratic and political freedom of the Tamil people.

Before I conclude, Mr. Deputy Speaker, I may just refer to this one stark and significant fact. The first Parliament after Independence in 1947 had 101 Members: 95 elected and six nominated. Out of those 95 Members, a total of seven Tamil Members were elected from the constituencies comprising the Jaffna Electoral District. The said total of 95 Members in the Sri Lankan Parliament were elected by the people. Sixty four years later, from 1947 to 2011, the representation for the same territory comprising the Jaffna Electoral District is to be reduced from seven to six. After 64 years, the representation in this House from the Jaffna District, which was seven in 1947 will come down to six in 2011. This is a graphic demonstration of how the political strength of the Tamil people is being diluted, and unless reversed, will raise serious questions in regard to this country's political future.

In the circumstances above defined, Mr. Deputy Speaker, we call upon the Government to take necessary steps to preserve the *status quo ante* and to prevent a grave injustice.

I thank you.

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සම්පන්දන් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයට පිළිතුර මෙසේයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමසාරිස්වරයා අංක 1715/4 සහ 2011.07.18 දිනැතිව නිකුත් කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව යාපනය මැතිවරණ කොට්ඨාසය සඳහා වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර සංඛ්‍යාව දහයේ සිට හය දක්වා අඩු වීමට හේතුන් කුමක්දැයි නිරතුරුවම විමසුම් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව 225ක් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99.අ. අනු ව්‍යවස්ථාව අනුව එම ධුර සංඛ්‍යාවෙන් ජාතික ලැයිස්තුව යටතට ගැනෙන මන්ත්‍රීවරුන් 29 දෙනා ගණනය කරනු ලබන්නේ පාර්ලිමේන්තු මැතිවරණයේදී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව හා එම මැතිවරණයේදී එක් එක් පක්ෂය හා ස්වාධීන කණ්ඩායම් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව අනුවය.

මුළු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර 225න් ඉතිරි මන්ත්‍රී ධුර 196 දිස්ත්‍රික්ක අතර බෙදී යන ආකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96, 97 හා 98 ව්‍යවස්ථාවල පැහැදිලි කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාව පළාත් නවයකින් සමන්විත වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96(4) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් පළාතට මන්ත්‍රී ධුර හතර බැගින් හිමි විය යුතු වේ. එම සෑම පළාතකටම අයත් එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා වෙන් කළ යුතු මන්ත්‍රී ධුර සංඛ්‍යාව පිළිබඳ නිවේදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව අනුව 1978.11.29 වැනි දින පත් කරන ලද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවේ

[ගරු දි.මු. ජයරත්න මහතා]

නිර්දේශය මත 1981.01.05 දිනැති අංක 123/3 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

එම ගැසට් නිවේදනයට අනුව උතුරු පළාතට අයත් අංක 10 යාපනය මැතිවරණ කොට්ඨාසය (යාපනය පරිපාලන දිස්ත්‍රික්කය හා කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්කය) සඳහා මන්ත්‍රී ධුර එකක් හා අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය සඳහා (මන්නාරම, වවුනියාව හා මුලතිව් පරිපාලන දිස්ත්‍රික්ක) මන්ත්‍රී ධුර තුනක්ද වෙන් කර ඇත. ඉහත ගැසට් නිවේදනය නිකුත් කර ඇත්තේ මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවේ නිර්දේශය මත අතිගරු ජනාධිපතිවරයා විසින් බැවින් මැතිවරණ කොමසාරිස්වරයාට හෝ ජනාධිපතිවරයාට එම සංඛ්‍යාව වෙනස් කළ නොහැක.

ඉතිරි පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර සංඛ්‍යාව වූ 160, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා බෙදා වෙන් කිරීම, වාර්ෂික ඡන්ද හිමි නාම ලේඛනය සහතික කිරීමෙන් පසු ඒ ඒ මැතිවරණ කොට්ඨාස සඳහා ලියා පදිංචි වී ඇති ඡන්ද සංඛ්‍යාව අනුව වාර්ෂිකව මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු කරනු ලැබේ. එම ගණනය කිරීමෙන් අනතුරුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා 96(4) සහ 98 යන ව්‍යවස්ථා දෙක යටතේ පත් කිරීමට නියමිත මන්ත්‍රීවරුන් සංඛ්‍යාවේ එකතුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම මෙම සංගණනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව සිදු කර ඇත. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයකම මන්ත්‍රී සංඛ්‍යාව සමානව හෝ අඩු වැඩි කොට ඇත. මෙය යාපනයේ පමණක් සිදු වූ සිද්ධියක් නොවේ.

යාපනය මැතිවරණ කොට්ඨාසය සඳහා 2009 නාම ලේඛනය අනුව ඡන්ද හිමියන් 8,16,005 දෙනකු ලියා පදිංචි වී සිටි අතර, ඒ අනුව 98 වන ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රීවරු 09 දෙනෙකු ද, 96(4) අනු ව්‍යවස්ථාව අනුව එක මන්ත්‍රීවරයකුද වශයෙන් මන්ත්‍රීවරු 10 දෙනෙකුට හිමිකම් ලැබුණි. එසේ වුවද, 2010 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන සැකසීමේදී යාපනය මැතිවරණ කොට්ඨාසයේ පදිංචි නොමැති පුද්ගලයන්ගේ නම් එකී නාම ලේඛනයෙන් ඉවත් කිරීමේ හේතුවෙන් එහි ලියා පදිංචි ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව 4,84,709 දක්වා අඩු වී තිබේ. ඒ නිසාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාව පරිදි ගණනය කිරීමෙන් යාපනය මැතිවරණ කොට්ඨාසයට ලැබෙන මන්ත්‍රී ධුර 05 හා 96(4) අනු ව්‍යවස්ථාව අනුව හිමි වූ මන්ත්‍රී ධුරය සමඟ මුළු මන්ත්‍රී ධුර සංඛ්‍යාව 06ක් වී තිබේ. එසේම වන්නි මැතිවරණ කොට්ඨාසයට, 98 වන ව්‍යවස්ථාවට අනුව මන්ත්‍රී ධුර 03ක්ද, 96(4) අනු ව්‍යවස්ථාව අනුව මන්ත්‍රී ධුර 03ක්ද වශයෙන් හිමි මුළු මන්ත්‍රී ධුර සංඛ්‍යාව 06ක් වේ.

1980 දශකයේ මැද භාගයේ සිට 2010 වසර දක්වා උතුරු පළාතේ ප්‍රදේශ වැඩි සංඛ්‍යාවක ඡන්ද හිමියන් ලියා පදිංචි කිරීමේ දී ගෘහයෙන් ගෘහයට ගොස් කරනු ලබන ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු නොකළ අතර, පූර්ව වර්ෂයේ ලියා පදිංචි වී සිටි ඡන්ද හිමියන් සියලු දෙනා දිගින් දිගටම ඡන්ද හිමි නාම ලේඛනයේ තබා ගන්නා ලදී.

එසේ වුවද ග්‍රාම නිලධාරි මාර්ගයෙන් ලබා ගන්නා ලද වයස 18 සම්පූර්ණ කළ අයගේ නම් නව ඇතුළත් කිරීම් ලෙස ඇතුළත් කර ගන්නා ලදී.

2010 ප්‍රතිශෝධනයේදී යාපනය හා වන්නි මැතිවරණ කොට්ඨාසවල ප්‍රදේශ සුළු ප්‍රමාණයක හැර අන් ප්‍රදේශවල එක් එක් ගෘහය වෙත ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු කරන ලදී. එම නිසා එම නිවෙස්වල පදිංචියක් නොමැති අයගේ නම් ඉවත් කිරීමට කටයුතු කළ අතර, අලුතින් ඇතුළු කිරීමට සුදුසුකම් ලබා සිටි අයගේ නම් ඇතුළත් කිරීමට ද කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා පුරවැසිභාවය හිමි විදේශගත වී සිටින පුද්ගලයින්ගේ නම් ගෘහ මූලිකයින් විසින් හෝ පවුලේ වෙනත් අය විසින් ගණන් ගැනීමේ ආකෘතියට ඇතුළත් කර තිබූ විටදී දිවයිනේ සෙසු ප්‍රදේශවලදී මෙන් උතුරු පළාතේදී ද එම නම් ඡන්ද හිමි නාම ලේඛනයට ඇතුළත් කරන ලදී. තවද බිම් බෝම්බ ඉවත් නොකිරීම නිසා හෝ සිවිල් ජනයාට පදිංචි වීම සඳහා තවමත් පහසුකම් නොමැති වීම නිසා හෝ වෙනත් හේතු නිසා හෝ මහ ජනතාවට පදිංචි වීමට අවකාශ නැති ප්‍රදේශවල මෙයට පෙර සිදු කළ පරිදි පූර්ව වර්ෂයේ නාම ලේඛනය ඒ ආකාරයෙන්ම තැබීමට කටයුතු කරන ලදී. මේ නිසා ඡන්ද හිමි නාම ලේඛනයේ නම් සඳහන්ව තිබූ අයගෙන් විශාල පිරිසකගේ නම් පදිංචිය හැර යාම නිසා හෝ ජීවතුන් අතර නොමැති වීම නිසා හෝ 2010 නාම ලේඛනයෙන් ඉවත් වී ඇති අතර, ඒ නිසාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාව පරිදි ගණනය කිරීමෙන් යාපනය මැතිවරණ කොට්ඨාසයට ලැබෙන මන්ත්‍රී ධුර සංඛ්‍යාව 05 දක්වා අඩු වී ඇත. එවිට 96(4) අනු ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රතිපාදනයද සමඟ තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 06ක් වේ. එසේ අඩු වන මන්ත්‍රී ධුර සංඛ්‍යාව සෙසු මැතිවරණ කොට්ඨාස අතර බෙදී යන අතර, එසේ වන්නේ ඒ ඒ මැතිවරණ කොට්ඨාසයන්හිදී ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව මත වේ.

එබැවින්, ඉහත ගණනය කිරීම සෑම වර්ෂයකම ඡන්ද හිමි නාම ලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කර ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව කරනු ලබන එකක් බවත්, කිසිම මැතිවරණ කොට්ඨාසයක මන්ත්‍රී ධුර සංඛ්‍යාව අඩු කිරීමට හෝ වැඩි කිරීමට හෝ සිය අභිමතය පාවිච්චි කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට බලතල නොමැත.

මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරනු ලබන්නේ ඔහුට පැවරී ඇති පැහැර හැරිය නොහැකි ව්‍යවස්ථාපිත කර්තව්‍යයන් ඉටු කිරීම පමණි.

එසේම මෙය වාර්ෂිකව සිදු කරනු ලබන ගණනය කිරීමක් බව තව දුරටත් පැහැදිලි වීම සඳහා 1985 වර්ෂයේ සිට 2010 දක්වා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදන අනුසාරයෙන් සැකසූ වාර්තාවක් ඇත. වත්මන් කිලිනොච්චි දිස්ත්‍රික්කය මෙම කොමිෂන් සභා වාර්තාව නිකුත් කිරීමට අදාළ කාලය තුළදී යාපනය දිස්ත්‍රික්කයට අයත්ව තිබුණි. රැකියා හා වෙනත් ව්‍යාපාර සඳහා පිට රටවලට ගොස් සිටින සිංහල, දෙමළ, මුස්ලිම් බොහෝ දෙනෙක් නැවත ලංකාවට නොපැමිණ එම රටවල පුරවැසියන් ලෙස ජීවත් වේ.

එසේම ශ්‍රී ලංකාව ආරක්ෂාව සඳහා පොලීසිය සහ හමුදාව යොදා ඇත. හදිසි නීතිය නමින් තිබුණත් එය ප්‍රයෝජනයට ගන්නේ සාමාන්‍ය ජනතාවගේ ආරක්ෂාව සඳහා සහ හදිසි විදේශ බලපෑම් මත නැවතත් ත්‍රස්ත ක්‍රියා ඇති වේ යැයි සිතායි.

අද ලංකාවේ ක්‍රියාත්මක වන්නේ සාමාන්‍ය නීතියයි. හමුදාවට හා රජයට විරුද්ධව විපක්ෂය නොයෙක් ප්‍රකාශ කරන්නේ තමන්ගේ පටු පරමාර්ථ ඉෂ්ට කර ගැනීමටයි. බොරු චෝදනාවලින් රටට වන අපහාසය ගැන ඔවුන් කල්පනා නොකරයි.

දැනට උතුරු නැඟෙනහිර පළාත්වල පදිංචියට කිසිවෙකුට අපහසුවක් නැත. ඉතාම සාමකාමීත්වයක් ඇත. ජාතිවාදයෙන් තොරව ජනතාවට අවබෝධය ලබා දෙමින් ශ්‍රී ලාංකික කල්‍යාණ මිත්‍ර ජාතියක් ගොඩ නැඟීමට ජනාධිපතිතුමා සහ රජය ගන්නා උත්සාහයට පූර්ණ සහයෝගය දෙන ලෙස ඔබතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

## ශ්‍රී ලංකාවේ ගුවන් කලාපයට විදේශ හමුදා ගුවන් යානා සමූහයක් අනවසරයෙන් ඇතුළු වීම: සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## இலங்கை வான் பரப்பினுள் வெளிநாட்டுப் போர் விமானங்களின் அத்துமீறிய பிரவேசம்: சிவில் விமானச் சேவைகள் அமைச்சரினது கூற்று

## INTRUSION OF FOREIGN MILITARY AIRCRAFT INTO SRI LANKAN AIRSPACE: STATEMENT BY MINISTER OF CIVIL AVIATION

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ ප්‍රකාශයක් කිරීම සඳහා මවිසින් කරනු ලැබූ ඉල්ලීමට අනුව මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ප්‍රථමයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමි.

ශ්‍රී ලංකාවෙහි ගුවන් කලාපය තුළට විදේශ හමුදා ගුවන් යානාවන් සමූහයක් අනවසරයෙන් ඇතුළු වූ බවට පසු ගියදා ශ්‍රී ලංකාවේ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි පළ වූ ප්‍රවෘත්තිය සම්බන්ධව මෙම උත්තරීතර සභාව හමුවේ වග කීමෙන් යුතුව ප්‍රකාශයක් කිරීමට මම මේ අවස්ථාව ලබා ගන්නවා.

ශ්‍රී ලංකාව ස්වෛරී ස්වාධීන රාජ්‍යයක් වන අතර, එහි භෞමික අඛණ්ඩතාව රැක ගැනීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ශ්‍රී ලංකා රජය සෑම විටම ඇප කැප වී ක්‍රියා කරනු ලබන බව පළමුවෙන්ම ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

සිවිල් ගුවන් සේවා විෂය භාර කැබිනට් අමාත්‍යවරයා ලෙස ශ්‍රී ලංකාවේ ගුවන් කලාපය අතුරු උපද්‍රවයන්ගෙන් තොරවූත්, ආරක්ෂාකාරීවූත් ගුවන් අවකාශයක් ලෙස පවත්වා ගෙන යෑම මා ඇතුළු මාගේ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතනවල වගකීම සහ පරම අභිලාෂය වේ. මීට අමතරව අප සතු ගුවන් අවකාශය තුළ අදාළ අංශයන්හි නිසි අවසරයකින් තොරව කිසිදු විදේශීය ගුවන් යානාවකට මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා නොදෙන බව තහවුරු කිරීමටත්, එසේ වූ යම් සිදු වීමක් ගැන යම් තොරතුරක් ලදොත් ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු කිරීම සඳහා අදාළ ආරක්ෂක අංශයනට නිසි පරිදි දැන්වීමට ද අප්‍රමාදව කටයුතු කරන බව මෙම අවස්ථාවේදී ප්‍රකාශ කර සිටීමට කැමැත්තෙමි.

මා පළමුව ප්‍රකාශ කළ පරිදි පසු ගිය දා සිදු වූයේ යැයි පළව තිබූ සිද්ධීන් පිළිබඳව සියලු තොරතුරු සොයා බලා කඩිනමින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට මගේ අමාත්‍යාංශය යටතේ ඇති අදාළ ආයතනවල නිලධාරින් හට නිසි උපදෙස් ලබා දුනිමි. ඒ අනුව ඔවුන් විසින් මා වෙත ඉදිරිපත් කර ඇති කරුණු හදාරා, අමාත්‍යාංශ ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති උපදේශක සහ අදාළ කාරණය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇති ව්‍යවස්ථාපිත නියාමන ආයතනය වන සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් සහ අදාළ නිලධාරින් සමඟද සාකච්ඡා කොට කරුණු අවබෝධ කර ගැනීමෙන් පසු පහත දැක්වෙන දෑ පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට කැමැත්තෙමි.

1. ශ්‍රී ලංකාව සතු ස්වෛරී ගුවන් අවකාශය වන්නේ ශ්‍රී ලංකා භූමියට සහ එහි වෙරළ තීරයේ සිට නාවික සැතපුම් 12ක් ඈතට විහිදී යන මුහුදු සීමාවට ඉහළින් පිහිටා ඇති ගුවන් අවකාශය වේ.

2. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියට අනුව යම් රාජ්‍යයක ස්වෛරී ගුවන් අවකාශය තුළට ඇතුළු වීම සඳහා ඕනෑම සිවිල් හෝ හමුදාමය විදේශීය ගුවන් යානාවක් එම රාජ්‍යයෙන් නිසි අවසරයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

3. ඒ අනුව අපගේ ස්වෛරී ගුවන් අවකාශයට ඇතුළු වන්නා වූ ඕනෑම ගුවන් යානාවක් ඒ සඳහා අවශ්‍ය අවසරය අදාළ බලධාරින්ගෙන් ලබා ගත යුතුය.

4. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා මෙහෙයුම් කටයුතු සිදු කිරීමේදී එම කාර්යයන් නිරුපද්‍රිතව, කාර්යක්ෂමව සහ ක්‍රමවත්ව පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වන්නා වූ ගුවන් සංතරණ සේවා සැපයීම වෙනුවෙන් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි බැඳුම්කාර රාජ්‍යයන් වෙත තම ස්වෛරී ගුවන් අවකාශයට අමතරව ඉන් ඔබ්බෙහි පිහිටියා වූ ජාත්‍යන්තර ගුවන් අවකාශයෙන් කොටසක්ද අවස්ථානුකූලව අනුයුක්ත කළ හැක. එම කොටස සහ රටෙහි ස්වෛරී ගුවන් අවකාශය පොදුවේ ගත් කල්හි එය එම රාජ්‍යයෙහි ගුවන් තොරතුරු කලාපය ලෙස හඳුන්වනු ලැබේ.

5. එසේ අනුයුක්ත කළ හැකි ඉහත කී ගුවන් අවකාශය ජාත්‍යන්තර ගුවන් අවකාශයක් වන අතර එය එම කලාපය තුළ ගුවන් සංතරණ සේවා සපයන්නා වූ රාජ්‍යයට අයත් වන්නා වූ භූදු දේපළක් නොවන්නේය.

6. ශ්‍රී ලංකාවටද ස්වකීය ස්වෛරී ගුවන් අවකාශයට අමතරව ගුවන් සංතරණ සේවා සැපයීම සඳහා ජාත්‍යන්තර ගුවන් අවකාශයෙන් කොටසක් අනුයුක්ත කර ඇත. එම සම්පූර්ණ කලාපය හඳුන්වන්නේ කොළඹ ගුවන් තොරතුරු කලාපය වශයෙනි.

7. බලපවත්නා ජාත්‍යන්තර නීතියට අනුව යම් රටක ස්වෛරී ගුවන් අවකාශයෙන් ඔබ්බට පිහිටි ජාත්‍යන්තර ගුවන් අවකාශය තුළ සිවිල් ගුවන් සේවාවන්ට අවහිර නොවන පරිදි ගුවන් යානා මෙහෙය වීමට ඕනෑම රටකට අයිතියක් ඇත.

8. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දා වාර්තා වී ඇති අනවසරයෙන් සිදු කරනු ලැබුවේ යැයි සඳහන් වී ඇති ගුවන් මෙහෙයුම් කටයුතු සිදුව ඇත්තේ ශ්‍රී ලංකා දේශයේ ආධිපත්‍ය පවතින ස්වෛරී ගුවන් අවකාශයෙහි නොවන බව මා හට ඉදිරිපත් කර ඇති වාර්තාවෙහි පැහැදිලිව සඳහන් වේ.

9. ශ්‍රී ලංකාවේ ස්වෛරී ගුවන් අවකාශයෙන් ඔබ්බෙහි පිහිටි හුදෙක් ගුවන් සංතරණ සේවා පමණක් සැපයීම සඳහා ශ්‍රී ලංකාවට අනුයුක්ත කර ඇති ජාත්‍යන්තර ගුවන් කලාපය තුළ යම් ස්ථානයක කිසියම් ගුවන් මෙහෙයුමක් සිදුවී ඇත්තේ වුවද එමඟින් ශ්‍රී ලංකාවට අයත් ස්වෛරී ගුවන් අවකාශයෙහි ආධිපත්‍ය උල්ලංඝනය කිරීමක් කිසිසේත් සිදු වී නැත.

10. එසේ හෙයින් විදේශීය ගුවන් යානා සමූහයක් ශ්‍රී ලංකාවෙහි ස්වෛරී ගුවන් අවකාශයට අනවසරයෙන් ඇතුළු වූ බවට පළ වී ඇති වාර්තාවන් පදනම් විරහිත බව ඉතා වග කීමෙන් අවධාරණය කරනු කැමැත්තෙමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම කරුණ සම්බන්ධයෙන් මාධ්‍යවලින් ලබා දෙන විවිධ ප්‍රචාරයන් පිළිබඳ

[ගරු පියංකර ජයරත්න මහතා]

සත්‍ය තත්ත්වය පහදා නොදුනහොත් එය අප විසින් මිත්‍ර රටවල් සමඟ පවත්වා ගෙන යනු ලබන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවන් කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකි හෙයින් මෙම ප්‍රකාශය කිරීමට අදහස් කළෙමි. බෙහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු එම්.එස්. තව්ෆික් මහතා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### කාසිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### காசிமி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### CASIMI FOUNDATION (INCORPORATION) BILL

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the Casimi Foundation."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සුබසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி சமூக நலன்புரி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Welfare for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 සම්මත කිරීම. ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත: නියමය
## செயல் நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT: ORDER

[අ. භා. 2.37]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා ( ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් විදුලිබල හා බලශක්ති විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා සාදන ලදුව, 2011 අප්‍රේල් 29 දිනැති අංක 1703/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක 1 සහ අංක 2 මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ ආර්ථික සංවර්ධනයේ අනාගතය දෙස බලන විට අද අප සාකච්ඡා කරන පළමුවන මාතෘකාව ඉතාමත්ම වැදගත් එකක්. අද ලෝකයේ තිබෙන ආර්ථික චිත්‍රය දෙස බැලුවාම අපට පැහැදිලිව පෙනෙන දෙයක් තමයි තෙල් නිෂ්පාදනය කරන රටවල සහ තෙල් නිෂ්පාදනය නොකරන රටවල ආර්ථිකයන් අතර ඇති වෙනස. මුල් අවධියේ, විශේෂයෙන්ම බටහිර රටවලින් ඉතාම ලාභයට තෙල් ගන්නට පුළුවන් වුණා. ඒ මත ඔවුන් විශාල ආර්ථික ව්‍යුහයක් ස්ථාපනය කළා.

ආර්ථික සංවර්ධනය බැලුවාම, භාණ්ඩ නිෂ්පාදනය බැලුවාම, භාණ්ඩ හුවමාරු කිරීම බැලුවාම ඒ සංවර්ධනය වූ රටවල ආර්ථිකයේ විවිධ සාධක අතර ප්‍රධාන සාධකයක් බවට මේ ලාභ තෙල් ලබා ගැනීමේ ප්‍රවණතාවය කරුණක් හැටියට අපට සලකන්නට සිද්ධ වුණා. කල් යාමේදී විශේෂයෙන් මැද පෙරදිග නසාර් සෙනෙවිතුමාගේ යුගයට පසු යුගයේ විශාල පිබිදීමක් ඇති වෙලා ඒ රටවල් තමන්ගේ තෙල් නිෂ්පාදනයට වටිනාකමක් දෙන්නට පටන් ගත්තා. ඒක ආර්ථික ක්‍රියාදාමයක් පමණක් නොවෙයි. දේශපාලනමය, සමාජමය ව්‍යාපාරයක් බවට පත් වෙලා අද මේ තෙල් ප්‍රශ්නය ලෝක ආර්ථිකයේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. දළ වශයෙන් අද ලෝකයේ සියලුම අර්ථ ශාස්ත්‍රඥයෝ පිළිගන්නවා, ලෝක ආර්ථිකය අර්බුද එහෙම නැත්නම් අභියෝග තුනක් හමුවේ කටයුතු කරනවාය කියන එක. පළමුවන අභියෝගය තමයි මේ තෙල් අභියෝගය; තෙල් නිෂ්පාදනය, තෙල් මිල කිරීම, තෙල් බෙදා හැරීම. දෙවන අභියෝගය තමයි ආහාර නිෂ්පාදන අභියෝගය.තුන්වන අභියෝගය තමයි, පරිසර අභියෝගය. අද අපි කථා කරන්නේ මේ පළමුවන අභියෝගයට මුහුණ දීමට අපේ රට පළමුවන පියවරක් ගන්නා අවස්ථාවේ.

අපේ රජය ඉතාම වග කීමෙන් දැන් කටයුතු ආරම්භ කරන්නට යනවා. අපේ රට අවට තිබෙන ඛනිජ තෙල් පිළිබඳ මූලික පරීක්ෂණ කරලා ඉවරයි. ඇත්ත වශයෙන්ම දියඹේ කැණීම්

ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍යමය සහ පරිපාලනමය ව්‍යුහය හැදීම තමයි මේ ඉදිරිපත් කරන නියමයෙන් අප බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පර්යේෂණ අනුව කට්ටි - blocks - දොළහක් අපි හඳුනා ගෙන තිබෙනවා, අපේ රටේ මුහුදු සීමාව තුළ. ඒවායින් තුනක් තිබෙන්නේ කාවේරි ද්‍රෝණිය - Cauvery Basin - තුළ. ඒ වාගේම අටක් තිබෙනවා, මන්නාරම් ද්‍රෝණිය තුළ. ඊට අමතර එකක් තිබෙනවා, හම්බන්තොටට ආසන්න දකුණු ද්‍රෝණිය තුළ. කාවේරි ද්‍රෝණියේ කට්ටි තුනයි, මන්නාරම් ද්‍රෝණියේ කට්ටි අටයි, හම්බන්තොට දකුණු ද්‍රෝණියේ එක කට්ටියයි. මේවා අතරින් පළමු වැනි ගවේෂණය ලෙස ඒ මන්නාරම් ද්‍රෝණියේ තිබෙන Block M2 කියන කට්ටිය තුළ තෙල් ළිං තුනක් කණින්න පටන් ගන්න දැන් අපි කටයුතු කරනවා. තමුන්නාන්සේලා දන්නවා මේ තෙල් කණින සෙල්ලම අපට විශාල ප්‍රශ්නයක් බව. අපි අතීතයේ පුරුදු විධියට එක්කෝ සිමෙන්ති කම්හලක් දැම්මා, එහෙම නැත්නම් වෙනත් ව්‍යාපාරයක් කිරීම කරන්න පුළුවන්. ඒවා ඉතාම හොඳයි. ඒවාට මුදල් ගිහිල්ලා තිබෙනවා. නමුත් ඒවාත් එක්ක මේ අපි ආරම්භ කරන කටයුත්ත බැලුවාම ඒක අහසට පොළොව වාගේ විශාල ව්‍යාපෘතියක්. අපේ ලංකාවේ සියලු දෙනාම මේක ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

අපි ආරම්භ කරන දේ සාර්ථක වුණොත් - ඒක සාර්ථක වෙයි කියලා අපි ප්‍රාර්ථනා කරනවා. සියලුම ඉඟි තිබෙන්නේ ඒක සාර්ථක වන බවටයි- අපේ ආර්ථිකයේ විශාල ඉදිරි පිම්මක් පනින්නට හැකි වනවා කියලා අපට කියන්න පුළුවන්. අද අපේ ආර්ථිකය ඉදිරියට යනකොට අපි යම් විධියක අවිනිශ්චිත තත්ත්වයකට මුහුණ දෙනවා නම්, තෙල් ප්‍රශ්නය ඒ සාධක අතර ඉතාම වැදගත්. ඒක අපට විතරක් තිබෙන දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම බැලුවාම අපේ අභියෝගය පොඩියි. අපේ ආර්ථිකය පොඩියි. අද ඉන්දියාවේ ආර්ථිකය, චීනයේ ආර්ථිකය, ඇමෙරිකාවේ ආර්ථිකය, යුරෝපයේ ආර්ථිකය යන මේ සියල්ලම හුඟක් දුරට භ්‍රමණය වන්නේ - කැරකෙන්නේ - මේ තෙල් ප්‍රශ්නයට උත්තරයක් සෙවීම තුළ. ඒ නිසා වග කීමක් සහ හොඳ අනාගතයක් තිබෙන රජයක් හැටියට, රටක් හැටියට අද අපි පා තබන්නේ ඉතාම වැදගත් දෙයකටයි.

තමුන්නාන්සේට මා කියන්න කැමැතියි, අපේ අසල්වැසි ඉන්දියාවේ "ද හින්දු" පත්‍රයේ දින කිහිපයකට පෙර සඳහන් වුණු කාරණයක්. මම මේ කියන්නේ අගෝස්තු මාසයේ 08 වැනිදා ඉන්දියාවේ "ද හින්දු" පත්‍රයේ සඳහන් වුණු කාරණයක්. ඉන්දියාවේ තිබෙන ලොකුම ආර්ථික පර්යේෂණ කණ්ඩායමේ නායකයා වන සී. රංගරාජන් මැතිතුමා ඉන්දියා රජයට කියන දෙයක් මෙසේ සඳහන් වී තිබෙනවා:

"A candid assessment of the Indian economy - The challenge in the case of the Centre is the rising crude oil bill"

ඒක ඉන්දියානු ආර්ථිකය ගැන යථාවාදී විග්‍රහයක්. එකක් අපි කියන්න ඕනෑ ඉන්දියානු විශේෂඥයන් ගැන. ඒ රටේ මේ වාගේ අදහස් උදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරනවා. පර්යේෂණ කරනවා. ඒවා අවශ්‍යයි.

මගේ මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා පිළිගන්නවා ඇති, ඒ විධියේ හුඟක් පර්යේෂණ අවශ්‍යයි කියන එක. දැන් මෙන්න බලන්න ඉන්දියාවේ ඒ පර්යේෂණ කණ්ඩායම කියන දේ. ඒ අය මෙහෙම කියනවා: "A candid assessment of the Indian economy." ඒ ගොල්ලන් කියන මූලික අභියෝගය කුමක්ද? "The challenge in the case of the Centre is the rising crude oil bill" මෙතැන "Centre" කියලා පාවිච්චි කරන්නේ ඉන්දියානු රජයට. ඒ මුළු ආර්ථිකයටම බලපාන ප්‍රධානම සාධකය බවට පත් වෙන්නේ තෙල් මිල. මම තව ටිකක් කියවන්නම්. මොකද, ඒක අපටත් බලපාන නිසා. මේ වාර්තාවෙන් මා මේ කියවන්නේ. එහි මෙසේ සඳහන් වනවා :

"In the short-term, the challenge in the case of the Centre.."

"Centre" කියන්නේ ඉන්දියානු රජය කියන අදහස. මා කියවන්නම් එහි සඳහන් වන කාරණය.

"In the short-term, the challenge in the case of the Centre is the rising crude oil bill, which creates an upward pressure on the subsidy bill, while lower taxes on crude and diesel are impacting revenues. In the case of State governments, the deteriorating finances of the electricity utilities are creating substantial liabilities."

මෙන්න මේකයි ඒ ආර්ථික බුද්ධි අංශය ඉන්දියාවේ ප්‍රශ්නය ගැන කියන්නේ. එහෙම නම් අපේ ප්‍රශ්නත් ඒ හා සමානයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு சந்திரகுமார் முருகேசு] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තව ටිකක් විස්තර කරන්න කැමැතියි අපේ ආර්ථික සංවර්ධනය සහ මේ තෙල් ප්‍රශ්නය කොයි තරම් එකට බැඳී තිබෙනවාද කියන එක. තමුන්නාන්සේලාත් දන්නා පරිදි පසු ගිය සති කිහිපය තුළ මුලින්ම සිද්ධ වුණේ මොකක්ද? තෙල් මිල වැඩි වීගෙන, වැඩි වීගෙන ආවා. Brent crude කියන වර්ගය ඇමෙරිකන් ඩොලර් 100, 110 දක්වා ගියා. නමුත් මොකද වුණේ? ඇමෙරිකන් නිෂ්පාදනවල ශක්තිය අඩු වෙන කොට, rating එක අඩු වෙන කොට වහාම තෙල් මිල අඩු වෙන්න පටන් ගත්තා. මොකද, ඒ ගොල්ලන් උපකල්පනය කළා දැන් නිෂ්පාදනය අඩු වෙයි, ඇමෙරිකාවට අවශ්‍ය තෙල් ප්‍රමාණය අඩු වෙයි කියලා. එතකොට වෙළෙඳ පොළේ විපර්යාසයක් ඇති වෙනවා. ඒ නිසා ඒ තෙල් ගොඩ ගහගෙන ඉන්නේ නැහැ. ඒ නිසා තව විශාල මුදලක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් තෙල් හංගා ගෙන ඉන්න අය වහාම වෙළෙඳ පොළට ඒ තෙල් නිකුත් කරනවා.

මේ විධියට තෙල් පිළිබඳව ගවේෂණය කිරීම ලංකාවේ ඓතිහාසික සන්ධිස්ථානයක්ය කියන එක මේ සභාවේ අපි සියලු දෙනා පළමුවෙන්ම හිතා ගන්න ඕනෑ. ඒ ගැන අපි, අපේ රජය හරි ආඩම්බරයි. මේ ගැන මැදිහත් වෙලා මේසා විශාල පියවරක් ගැනීම වෙනුවෙන් විශේෂයෙන් අපේ අතිගරු ජනාධිපතිතුමා, ඇමති මණ්ඩලය ඇතුළු අපේ රජයට අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මීට ඉස්සර සිහින තිබුණා. මගේ හිතවත් ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමාට මතක ඇති පේසාලෙයි තෙල් තිබෙනවා කියලා ඒ කාලයේ කිව්වා. එහෙම නොයෙක් විධියේ සිහින තිබුණා. මා හිතන විධියට අවුරුදු 30, 40කට ඉස්සෙල්ලා පවා මේ රටේ ඒ බලාපොරොත්තුව තිබුණා. නමුත් ඒකට ප්‍රායෝගික වශයෙන් ක්‍රියාමාර්ගයක් දැන් අරගෙන

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

තිබෙනවා. දැන්මම ඒ නැව් ගිහිල්ලා. ඒ තෙල් කනින මූලික නැව අද වෙනකොට මන්නාරම් වෙරළට ගිහිල්ලා තිබෙනවා. ඒ ගැන ලාංකිකයෝ හැටියට අපි ආඩම්බර වෙන්න ඕනෑ. මා තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, අද මේ සභාවේ ඓතිහාසික දිනයක් බව. මෙන්න කියවලා බලන්න, අද ආපු මේ text එක. එහි මෙසේ සඳහන් වනවා:

"Oil exploration off Mannar basin has commenced. Cairn India which has been awarded rights to drill in block M2 will three oil wells over the next few months."

It further states, I quote:

"Cairn India had contracted a deepwater rig from Japan Drilling to embark on the three-well exploration drilling campaign in its frontier deepwater block in the Mannar basin."

දැනටමත් නැව ජපානයෙන් එනවා. ඒ වැඩ පටන් ගන්නවා. ඒ හන්දා මේ අවස්ථාව අපි රටක් හැටියට කුඩුකේඩුකම් කරන්නේ නැතිව සියලු දෙනාම ආඩම්බර විය යුතු අවස්ථාවක්.

එතකොට කොහොමද අපි මේ කටයුතු ක්‍රියාත්මක කරන්නේ? තිබෙන පසුබිම අනුව ලංකාවේ දැනට තිබෙන පුංචි නීතිරීති -BOI නීතිරීති, පරණ ක්‍රම- යටතේ මේ කටයුත්ත කරන්න බැහැ. මේකේ මූලික වියදම US Dollars 110 million. මගේ හිතවත් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා තමුන්නාන්සේලාට ඒ විස්තර කියයි. මේවා නිකම් සෙල්ලම් වැඩ නොවෙයි. මේවා නිකම් පත්තරේට නිවේදනයක් දෙනවා වාගේ වැඩ නොවෙයි. මේවාට ඉතාම ගැඹුරු තීරණ ගන්න ඕනෑ. මේවා ගැන දිනපතා පරීක්ෂණ කරලා, ඒ අමාත්‍යාංශ කටයුතු කරලා, විදේශ පිරිස් එක්ක සාකච්ඡා කරලා, BOI එකත් එක්ක සාකච්ඡා කරලා විවිධ විධියේ negotiations කරලා මේ එන්නේ. හිතන්න එපා, මේවා නිකම් එහෙට මෙහෙට ආපු ඒවා කියලා. අපි රජයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේවා ක්‍රමානුකූලව ඇවිල්ලා මේ තැනට ඒම ගැන. [බාධා කිරීමක්] මට බාධා කරන්න එපා. තමුන්නාන්සේගේ වෙලාවේදී කථා කරන්න. ඒ විතරක් නොවෙයි. අපි කියන්න කැමැතියි,- [බාධා කිරීමක්] මේවා හොඳට අහගන්න. දන්නේ නැති දේවල් ගැන කථා කරන්න එපා. දැනට මාස කිහිපයකට ඉස්සෙල්ලා අපි අතිගරු ජනාධිපතිතුමාත් එක්ක St. Petersburgවලට ගියා. ඒ වෙලාවේ Gazprom කියන රුසියානු සමාගම -ලෝකයේ තෙල් ගවේෂණය කරන ලොකු සමාගමක්- කිව්වා, ලංකාවට එනවා කියලා. මේවා තමුන්නාන්සේලා දන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Hon. Minister -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
No, I am sorry. I do not have time. You can make your own speech later. ඒ ගොල්ලනුත් ලංකාවට එන්න ලැහැස්තියි. මේක ඉතාමත්ම වැදගත් දෙයක්. දැන් අපි ඒ නීතිමය රාමුව ගැන කථා කරමු. අපි ඒකට නීතිමය රාමුවක් හදලා තිබෙනවා. තමුන්නාන්සේලා හොඳට හිතේ තියා ගන්න. BOI එකේ තිබුණු නියෝග අනුව තමයි මෙතෙක් කල් අපට ඒ පහසුකම් ලබා දෙන්න පුළුවන් වුණේ. නමුත් අපේ රජය "Strategic Development Projects Act" එකක් ගෙනාවා. ඒකට සිංහලෙන් කියන්නේ "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත" කියලා වෙන්න ඇති. නමුත් "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත" කියලා අපි ඒ පරිවර්තනය කළාම මේකේ නියම වැදගත්කම ඉස්සරහට එන්නේ නැහැ. ඒ කියන්නේ අපේ ආර්ථිකයට අතිශයින්ම strategic; අතිශයින්ම තීරණාත්මකයි කියලා කියන්න පුළුවන්. එවැනි ආයෝජනවලට තමයි මේ විශාල සහයෝගය. ක්‍රමෝපාය කියන එක තමයි. නමුත් ඊට වඩා මෙතැන strategic කියන අදහස දෙන්නේ ආර්ථිකයට අත්‍යවශ්‍ය වූ, ආර්ථිකයට නැතිවම බැරි ආයෝජන යනුවෙන් කිව්වොත් තමයි.

ඒ පනත මේ සභාවෙන් සම්මත කරපු පනතක්. මගේ අදහසේ හැටියට මේ පාර්ලිමේන්තුවට ගරු කරන පනතක්. මොකද, අපි ඒ වැඩ කටයුතු පටන් ගත්තාම, යම්කිසි නියෝගයක් අනුව ඒ වැඩවලට ඒ පහසුකම් අපි සලසපුවාම -ඒ පහසුකම් අපි සඳහන් කරලා තිබෙනවා.- මාස තුනක් ඇතුළත අපි ඒක මේ පාර්ලිමේන්තුවට ගේනවා. එහිදී තමුන්නාන්සේලාගේ අදහස් ඔක්කොම අපි කල්පනාවට ගන්නවා. අවශ්‍ය වුණොත් ඡන්දයක් පවත්වනවා. තමුන්නාන්සේලා හොඳට කල්පනා කරන්න. තමුන්නාන්සේලාගේ කාලය ගැන ආ පස්සට හිතලා ටිකක් ලජ්ජා වෙන්න. ලෝකයේ කොහෙද, මේ වාගේ සියලුම වැදගත් ආයෝජන පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සාකච්ඡාවට ලක් කරන්නේ? ඒ රටවල්වල විවිධ ආයතන අනුමැතිය දෙනවා. ඒ එකක්වත් කෙළින්ම පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අනුමැතිය ගන්නේ නැහැ. අපි ඒක කරලා තිබෙනවා. එතකොට අපට ඒ විස්තර තමුන්නාන්සේලාට සම්පූර්ණයෙන් තේරුම් කරලා දෙන්න පුළුවන්. ප්‍රශ්න අහන්න පුළුවන්. අඩු පාඩු තිබෙනවා නම් සාකච්ඡා කරන්න පුළුවන්. අවසානයේදී ඒ ආයෝජනයට අපේ මුළු පාර්ලිමේන්තුවේම seal එක වැදුණායි කියලා ඒ ආයෝජකයාටත් සතුටු වෙන්න පුළුවන්. මා දන්නා තරමින් ලෝකයේ කොහේවත් එහෙම කරන්නේ නැහැ. අපේ BOI එක බාර ඇමතිතුමාත් ඒ ගැන පසුව කථා කරයි.

මේ වාගේ ආයෝජන ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඒ විස්තර ඔක්කොම තේරුම් කරලා තමුන්නාන්සේලාගේ අනුමැතිය අරගෙන පාර්ලිමේන්තුවේ seal එක ගහලා මේක strategic investment එකක් කියලා පෙන්වන රටක් ලෝකයේ කොහේවත් තිබෙනවා කියලා මම නම් අහලා නැහැ. ඒකට එක්කෝ අමාත්‍යාංශයෙන් අනුමැතියක් දෙනවා. එහෙම නැත්නම් කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් දෙනවා. එහෙමත් නැත්නම් ඒ නිලධාරි පැලැන්තියෙන් අනුමැතිය දෙනවා. නමුත් මේක එහෙම නැහැ. මම හිතන්නේ මේක ලෝක වාර්තාවක්. වෙන රටවල්වල එහෙම කරන්නේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා නම් කියන්න, වෙන කොහේද මෙහෙම investment law එකක් ගෙනැල්ලා තිබෙන්නේ කියලා. මේ ගේන්නේ මේ රටට අත්‍යවශ්‍ය ආයෝජනයක්. අපේ ආර්ථික ව්‍යුහය ආර්ථික දේහය වෙනස් කරන ආයෝජනයක්. ඒ ආයෝජනය පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුව ඉදිරියට ගෙනැල්ලා, නීතියෙන් සඳහන් කරපු කාල සීමාවන් තුළ ගැසට් එකෙන් ඉදිරිපත් කරලා තමුන්නාන්සේලාගේත් අදහස් අරගෙන මේ පාර්ලිමේන්තුවේ වැඩි ඡන්දයෙන් තමයි ඒකට seal එක ගහන්නේ. ඒ ගැන අපි ආඩම්බර වෙනවා. ඒ අනුමැතිය දුන්නාට පස්සේ තමයි ගරු බැසිල් රාජපක්ෂ මහත්මයා අවසාන වශයෙන් seal එක ගහන්නේ. දුන්නේ නැත්නම් ඒක ආපසු ගන්නවා. අපට ඡන්ද 160ක් තිබෙන එක වෙනම කථාවක්. කොහොම වුණත්, තමුන්නාන්සේලා මොනවා කිව්වත් අපේ seal එක වැදෙන බව අපි දන්නවා. ඒ නිසා බය නැතුව අපට ඒක ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමන්ලා ඒ 160 හදා ගත්තා කියලාත් අපි දන්නවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

තමුන්නාන්සේලාට පුළුවන් කථා කරන්න විතරයි. අපට ඡන්ද 160ක් තිබෙනවා. ඇත්ත කියන්න ඕනෑ. අපට ඕනෑම පනත් කෙටුම්පතක් ගෙනැල්ලා පාස් කර ගන්න පුළුවන්. ඒක දැන ගන්න. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ වෙලාවේදී කථා කරන්න. අපිට කියන්න තිබෙන දේ අපි කියන්න ඕනෑ. කරුණාකරලා හිතේ තියා ගන්න, ව්‍යවස්ථාදායකයට වැඩ කරන්න පුළුවන්, නමුත් විධායකයේ වැඩ තමුන්නාන්සේලාට භාර දෙන්න බැහැයි කියන එක. විධායකයේ වැඩ විරුද්ධ පක්ෂයට භාර දෙන්න බැහැ නේ. ඒකට මෙන්න මෙහෙම කියනවා: "The Opposition must have its say; the Government must have its way". අන්න ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

තමුන්නාන්සේ ඒක හැමදාම කියනවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

මම හැමදාම කියනවා තමයි. නමුත් තමුන්නාන්සේලා පිළිගන්නේ නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

No, I do not think.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, now please, wind up .

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ඒක තමයි කියන්නේ. මම මීට වඩා කථා කරන්නේ නැහැ. අපි මේ ආර්ථිකය සඳහා ඉතාමත්ම වැදගත් පියවරක් ගන්නවා. ඒක නීත්‍යනුකූලව තමුන්නාන්සේලා ඉදිරියට ගේනවා. මේ ගරු සභාවේ තමුන්නාන්සේලාගේ සහාය අර ගෙන ලෝකයේ කොහේවත් නැති විධියට ඉතාමත් පාරදෘශ්‍යභාවයෙන් යුතුව - transparent - ඒ ආයෝජනයට පාර්ලිමේන්තුවේ seal එකත් ගහලා අපේ හිතවත් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට භාර දෙනවාය කියන එක ප්‍රකාශ කරමින්, තමුන්නාන්සේලාගේ සහයෝගය අපට ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.56]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය ප්‍රකාරව ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදනය අනුමත කිරීම සම්බන්ධයෙන් කෙරෙන මේ විවාදයට විපක්ෂය වෙනුවෙන් මගේ අදහස් ඉදිරිපත් කරන්න කාලය ලබා දීම ගැන මුලින්ම මගේ කෘතඥතාව පුද කරනවා.

ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කිව්ව "සීල්" එක ගැනත් කථා කරන්න අවශ්‍යයි. හදිසි වැඩක් තිබෙනවාද? ඔබතුමා කිව්වා, ගියා.

එතුමා කිව්වා,මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට ප්‍රකාරව ගැසට් පත්‍රය ඉදිරිපත් කළා, ඒක දැන් පාර්ලිමේන්තුවට ගෙනාවා, පාර්ලිමේන්තුවේ අනුමැතිය අර ගෙන තමයි, අපේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේක ඉදිරියට ගෙන යන්නේ කියලා. ඒ ගැන අපි ඉතාමත්ම සන්තෝෂ වනවා. ඔය දේ කරන්න තමයි මාර්තු මාසයේ 9 වැනිදා අපි මෙතැන නැඟිටලා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳව කථා කළේ. මම ඒ ගැන පස්සේ කථා කරන්නම්. ඔය දේ කරන්න කියලා තමයි අපි විපක්ෂයක් හැටියට ආණ්ඩුවට බල කළේ. දැන් ආණ්ඩුව මේ දේ කරනවා නම් අපි ඉතාමත්ම සන්තෝෂ වනවා. ඒ කියන්නේ මෙහෙම වනවා නම් අපි අපේ විපක්ෂයේ කාර්ය භාරය රටේ ජනතාව වෙනුවෙන් වග කීමකින් යුක්තව ඉටු කරන බව තමයි අපට තේරෙන්නේ. Like he said, the Opposition can have its say. We are having our say and we are also having our way in this matter because our way is to do it the right way. So, if the Government is going to do it the right way, then we are not only having our say but are also having our way.

දැන් අපට පොඩ්ඩක් කථා කරන්න වනවා, මේ කායින් ලංකා ව්‍යාපෘතියේ ගැසට් පත්‍රය සම්බන්ධයෙන්. මෙතැන කියන්නේ 2016 ඔක්තෝබර් 15 වැනිදා වන තෙක් මේ ව්‍යාපෘතියට අදාළ සියලු බදු - සංස්ථාපිත බදු යනාදී වශයෙන් බදු වර්ග හතක් ඉදිරිපත් කරලා තිබෙනවා. - ඉවත් කරනවා කියලායි. අපි කල්පනා කරලා බලන්න ඕනෑ, මේ ගැසට් නිවේදනය ඉදිරිපත් කරන්නේ ඇයි කියලා. මේ ගැසට් නිවේදනය ඉදිරිපත් කරන්නේ අපි මේ ව්‍යාපෘතියෙන් කරන්න බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන එක ගැන රට, ජනතාව දැනුවත් කරන්නයි. ඒක තමයි අපි විනිවිද භාවය කියලා අදහස් කරන්නේ. ඒක හොඳ දෙයක්. නමුත් මම මේකේ එක අඩු පාඩුවක් දකිනවා. දැන් මේ තෙල් නිධි කාගෙද? මේ තෙල් ආණ්ඩුවේ තෙල් නොවෙයි; ඇමතිතුමාගේ තෙල් නොවෙයි; අපේ රටේ ජනතාවගේ තෙල්. අපි විශ්වාස කරනවා, කේන් ලංකා සමාගම කරන ගවේෂණයේදී තෙල් හම්බ වෙයි කියලා. මේ තෙල් හම්බ වුණොත් අපට පිට රටින් ගෙනෙන තෙල් ප්‍රමාණය අඩු කර ගන්න පුළුවන්. එම නිසා අපේ විදේශ විනිමය ඉතුරු කර ගන්න පුළුවන්.

අද වන කොට the trade deficit has gone up, close to US Dollars 6 billion. ඒ කියන්නේ 2008 - 2009 වර්ෂවල තිබුණා වාගේ බැරෑරුම් විධියට වෙළෙඳ ශේෂයේ හිඟය වැඩි වෙලා තිබෙනවා. ඒකට එක හේතුවක් තමයි මේ තෙල්වලට ඩොලර් බිලියන තුනක පමණ ප්‍රමාණයක් වියදම් කරන්න වෙලා තිබෙන එක. එම නිසා තෙල් හම්බ වනවා නම් හොඳයි.

අපි විපක්ෂයක් හැටියට ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, දැන් තෙල් ලැබුණාම ලංකාවේ ජනතාවට මේකෙන් ලැබෙන ප්‍රතිලාභය මොකක්ද කියලා. ඒ ගැන ගැසට් පත්‍රයේ කොහේවත්ම සඳහන් කරලා නැහැ. ඒ අය බදු ගෙවන්නේ නැහැ. නමුත් අපට royalty එකක් ගෙවනවාද?

අපි දන්නා විධියට තෙල් ගවේෂණය කරන්න සැහෙන වියදමක් දරන්න වනවා. දැන් ගරු ඇමතිතුමා කිව්වා, මේ සඳහා ඩොලර් මිලියන 110ක් වියදම් කරන්න වනවාය කියලා. ඒ අය කියන්නේ මේ තෙල් ලැබුණාම ඒ තෙල්වල ලාභය ඒ අය ලබා ගෙන සාමාන්‍යයෙන් royalty එකක් -රාජ්‍ය භාගය- මේ රටට ගෙවනවාය කියලායි. සාමාන්‍යයෙන් මෙය හෝටලයක් හදනවා

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

වාගේ නොවෙයි; ඊට වඩා වෙනස්. හෝටලයක් හැදුවාම ඒක අපේ රටට අයිති වන්නේ නැහැ. ඒ හෝටලයේ කාමර හදලා, ඒවාට touristsලා ආවාම ඔවුන් ඒකට ගණනක් ගෙවනවා. ඒක ඒ හෝටල්කාරයෝ තබා ගන්නවා. නමුත් තෙල් එහෙම නොවෙයි. එම නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ, royalty එක මොකක්ද කියලා කරුණාකරලා පාර්ලිමේන්තුව මඟින් ජනතාවට ඉදිරිපත් කරන්න කියලායි. What is the royalty that we are going to get if these people find oil? We hope they will. What is our royalty? How much is it? Is it 50 per cent, 60 per cent or 10 per cent? How much do we get as our royalty? ඒ අඩු පාඩුව මා පෙන්වා දුන්නාට මූලික වශයෙන් මා පිළිගන්නවා, මේ කරන්නේ හොඳ දෙයක්ය කියලා.

ඒත් එක්කම මේ කාරණය ගැනත් මා කථා කරන්න ඕනෑ. ජූලි මාසයේ 07වන දා තමයි මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේ.

ගරු ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා කලින් කිව්වා, කට්ටි - the different blocks - සම්බන්ධයෙන්. මන්නාරම් ද්‍රෝණියේ කට්ටි අටක් තිබෙනවාය, කාවේරි ද්‍රෝණියේ කට්ටි තුනක් තිබෙනවාය කියලා එතුමා කිව්වා. දැන් මේ කට්ටි ප්‍රමාණය වැඩි කරන්න, කට්ටි ප්‍රමාණය එහේට මෙහේට කරන්න අවශ්‍යයි කියලා කායින් ලංකා සමාගම ආයාචනයක් ඉදිරිපත් කළාම අපට ආරංචි වුණු විධියට කැබිනට් මණ්ඩලයෙන් ඒක වෙනස් කළා. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. අපි එදාම පත්‍රවල දැක්කා; SMS ආවා; "Katana City Tourist Zone" එකක් -තරු හතරේ, තරු පහේ හෝටල් කාමර 2,300ක්- හදන්න යනවාය, වෙළෙඳ සංකීර්ණ දෙකක් හදන්න යනවාය කියලා. දැන් telephone ආයතනයකින් ආණ්ඩුවේ SMS කොයි වෙලාවෙත් ඉදිරිපත් කරනවා.

අපි දන්නේ නැහැ, මෙය Strategic Development Project එකක්ද, නැද්ද කියලා. අපි ඒ ගැන දන්නේ නැති නිසා අපි කියන්නේ නැහැ, මෙය ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක්ද, නැද්ද කියලා. නමුත් මෙතැන කරනවාය කියන්නේ, Asian Resorts and Casinos (Pte.) Limited කියන ආයතනයට අක්කර 200ක් දෙන්න හදන එකයි. එතකොට අපි පොඩ්ඩක් මේ ගැන සොයා බැලුවා. මේ ආයතනය මොකක්ද, කොහේද මේ ආයතනය තිබෙන්නේ, මේ ආයතනයේ අයිතිකාරයන් කවුද කියලා සොයා බලන කොට අපට ආරංචි වුණු දේ තමයි Asian Resorts and Casinos (Pte.) Limited කියන ආයතනයේ paid-up capital එක - නිකුත් කර තිබෙන ප්‍රාග්ධනය- ඇමෙරිකන් ඩොලර් 10,000යි කියන එක. ඇමෙරිකන් ඩොලර් 10,000ක ප්‍රාග්ධනයක් නිකුත් කර තිබෙන මේ ආයතනය පොරොන්දු වනවා, ඇමෙරිකන් ඩොලර් බිලියන 1.5ක ආයෝජනයක් කරන්න. මේ ආයතනය මොකක්ද, මේ ආයෝජකයන් කවුද කියලා හොඳට සොයා බලන්න වනවා. සමහර විට මේ ආයතන අද ඉන්නවා; හෙට නැහැ. මේ ආයතන ලංකාවට එන්නේ ඇයි? සමහර විට අපේ ලංකාවේ තිබෙන මොකක් හෝ සම්පතක් ලබා ගන්න වන්න පුළුවන්.

ඉතින් ඒ නිසා මේ අක්කර 200 ලබා ගන්නද මේ ආයතනය එන්නේ කියන දේ ගැන හොයලා බලන්න වෙනවා.

දැන් මේකත් එක්ක අපිට කථා කරන්න වෙන තවත් වැදගත්ම කාරණයක් තිබෙනවා. ඒ කාරණය තමයි දැන් අපි මාස හයක් තිස්සේ විවාද කරපු ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෝල්ෆේස් පිටියට එහා පැත්තේ විකුණන්න ගිය අක්කර 20 ඉඩම. දැන් අපි දැකලා තිබෙනවා තාප්පය කඩලා තිබෙනවා. කවුරුත් ගෝල්ෆේස් එක පැත්තෙන් යන කොට පෙනෙනවා ෂැන්ග්‍රි-ලා එකට සින්නක්කරයට විකුණපු අක්කර 10 ඉඩම.

ආණ්ඩුව 2011 දී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට ප්‍රකාරව ගැසට් නිවේදනයක් මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා ඒ කට්ටියට දෙන්න යන බදු සහන මොනවාද කියලා. අපි ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සභා ගැබේදී කථා කරලා තිබෙනවා; හැන්සාඩ් වාර්තා ගත වෙලා තිබෙනවා. අපි කිව්වා, "ෂැන්ග්‍රි-ලා කියන්නේ ලෝකයේ විශිෂ්ට ඝණයේ හෝටල් කොම්පැනියක්. ඒ කට්ටිය විනිවිදභාවයක් ඇතිව ලංකාවේ ආයෝජනයක් කරනවා නම් එතැන වරදක් නැහැ. ඒ සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක හොඳයි" කියන එක. දැන් මා අතේ තිබෙන හැන්සාඩ් වාර්තාව පෙරළා බැලුවොත් පෙනේවි, මාස හයක් තිස්සේ මේ සම්බන්ධයෙන් මම කරපු කථා පිළිබඳව එතැන ඒ දේ කියලා තිබෙනවාය කියලා. මම දිගින් දිගටම කිව්වේ ඔන්න ඔය දේ තමයි. නමුත් ඒක නොවෙයි ගැටලුව. ගැටලුව තිබෙන්නේ ඊට එහා අක්කර 10ත් එක්කයි. නොයෙක් විධියේ නිවේදන නොයෙකුත් කට්ටිය විසින් ඉදිරිපත් කරමින් තිබෙනවා.

පළමුවෙන්ම මම ඉතාමත්ම වග කීමෙන් කියනවා, මේ සභා ගැබේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා අපිට කිව්වා, "අක්කර 10ක් වික්කා. ඒ අක්කර 10 වික්කේ ඩොලර් මිලියන 136ක් ලබා ගෙන" කියලා. දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද කියන දේ පිළිබඳව අපට ප්‍රශ්න කරන්න වෙනවා. මොකද, මේකත් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය පනත - Strategic Development Projects Act - යටතේ සිද්ධ වන ක්‍රියාවලියක් නිසා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මම මෙය ඉතාමත් වග කීමෙන් කියනවා. අපට මේ පාර්ලිමේන්තුවේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "රජයේ තක්සේරුවට වඩා කිහිප ගුණයකින් වැඩියි" කියලා. ඒක මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. What he said was that he sold this 10 acres of land to this company called CATIC for several times more than the Chief Valuer's valuation. But, we know for a fact that it is not the case. The fact is that they sold it for only US Dollars 136 million and that US Dollars 136 million is by no means anything more than the Chief Valuer's valuation. එතකොට ඒ ඉතුරු කිහිප ගුණය කොහේටද ගියේ කියලා අපට සාධාරණ ප්‍රශ්නයක් අහන්න තිබෙනවා? ඊ ළඟට ගරු නියෝජ්‍ය ඇමතිතුමා කරලා තිබෙන මාධ්‍ය ප්‍රකාශයක තිබෙනවා, "මේ ව්‍යාපෘතියට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණා" කියලා. මම ඉතාමත්ම වග කීමෙන් කියනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම කිව්වේ නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ආණ්ඩුවේ මාධ්‍ය ඒකකයෙන් ඉදිරිපත් කරපු වාර්තාවේ තිබෙනවා, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා කියලා ඇමතිතුමා කිව්වාය කියලා. [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තේ නැහැ. පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නවා තියා පාර්ලිමේන්තුවට මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ගැසට් පත්‍රයවත් අද වන තුරු ඉදිරිපත් කරලා නැහැ කියලා මම ඉතාමත්ම වග කීමෙන් කියනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේ- [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පට්ටපල් අසත්‍ය. කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේ තමයි වැරදි. තමුන්නාන්සේ තමයි කිව්වේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක තමයි කියන්නේ. අපි හොඳ දෙයට හොඳයි කියනවා. වැරදි දෙයට වැරදියි කියනවා. හොඳ දෙයට අපි කිසි භයක් නැහැ. හොඳ දේ හොඳයි. ඒක තමයි කිව්වේ. මේ "කැටික්" එකේ ගැසට් වාර්තා ඉදිරිපත් කරලා නැහැ. [බාධා කිරීමක්] අපි අද කථා කරන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය පිළිබඳවයි.

Mr. Deputy Chairman of Committees, today, we are debating an Order under the Strategic Development Projects Act. What I am saying is that however much the Hon. Minister gets up and shouts here, he has not done his duty. He has not brought to this House the Gazette Notification on the Strategic Development Project called the "CATIC Skyline Hotel and Shopping Complex Development Project" for which he says that he sold 10 acres of a prime property in Sri Lanka which is owned, not by him but by us, the people of this country, for US Dollars 136 million.

ඉතින් ඒ නිසා මේ අක්කර 200 ලබා ගන්නද මේ ආයතනය එන්නේ කියන දේ ගැන හොයලා බලන්න වෙනවා.

මේකත් එක්ක අපිට කථා කරන්න සිදු වෙන තවත් වැදගත්ම කාරණයක් තිබෙනවා. ඒ කාරණය තමයි දැන් අපි මාස හයක් තිස්සේ විවාද කරපු ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ගෝල්ෆේස් පිටියට එහා පැත්තේ විකුණන්න ගිය අක්කර 20 ඉඩම ගැන. දැන් අපි දැකලා තිබෙනවා තාප්පය කඩලා තිබෙනවා. කවුරුත් ගෝල්ෆේස් එක පැත්තෙන් යන කොට පෙනෙනවා ෂැන්ග්‍රි-ලා එකට සින්නක්කරයට විකුණපු අක්කර 10 ඉඩම. ආණ්ඩුව 2011 දී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට ප්‍රකාරව ගැසට් නිවේදනයක් මඟින් ඉදිරිපත් කරලා තිබෙනවා ඒ කට්ටියට දෙන්න යන බදු සහන මොනවාද කියලා. අපි ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සභා ගැබේදී කථා කරලා තිබෙනවා; හැන්සාඩ් වාර්තා ගත වෙලා තිබෙනවා.

අපි කිව්වා, "ෂැන්ග්‍රි-ලා කියන්නේ ලෝකයේ විශිෂ්ට ගණයේ හෝටල් කොම්පැනියක්. ඒ කට්ටිය විනිවිදභාවයක් ඇතිව ලංකාවේ ආයෝජනයක් කරනවා නම් එතැන වරදක් නැහැ. ඉතින් ඒ සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක හොඳයි" කියන එක. මේ දැන් මා අතේ තිබෙන හැන්සාඩ් වාර්තාව පෙරළා බැලුවොත් පෙනේවි, මාස හයක් තිස්සේ මේ සම්බන්ධයෙන් මම කරපු කථා පිළිබඳව එතැන ඒ දේ කියලා තිබෙනවාය කියලා. මම දිගින් දිගටම කිව්වේ ඔන්න ඔය දේ තමයි. නමුත් ඒක නොවෙයි ගැටලුව. ගැටලුව තිබෙන්නේ ඊට එහා අක්කර 10ත් එක්කයි. දැන් අපි දන්නේ නැහැ. නොයෙක් විධියේ නිවේදන නොයෙකුත් කට්ටිය විසින් ඉදිරිපත් කරමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා අපිට කිව්වා, "අක්කර 10ක් වික්කා. ඒ අක්කර 10 වික්කේ ඩොලර් මිලියන 136ක් ලබා ගෙන" කියලා. ඒක මම ඉතාමත්ම වග කීමෙන් කියනවා මේ සභා ගැබේදී. දැන් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද කියන දේ පිළිබඳව අපට ප්‍රශ්න කරන්න වෙනවා. මොකද, මේකත් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය පනත -Strategic Development Projects Act - යටතේ සිද්ධ වන ක්‍රියාවලියක් නිසා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මම මෙය ඉතාමත් වග කීමෙන් කියනවා. අපට මේ පාර්ලිමේන්තුවේදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, "රජයේ තක්සේරුවට වඩා කිහිප ගුණයකින් වැඩියි" කියලා. ඒක හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. What he said was that he sold this 10 acres of land to this company called CATIC for several times more than the Chief Valuer's valuation. But, we know for a fact that it is not the case. The fact is that they sold it for only US Dollars 136 million and that US Dollars 136 million is by no means anything more than the Chief Valuer's valuation. එතකොට ඒ ඉතුරු කිහිප ගුණය කොහේටද ගියේ කියලා අපට සාධාරණ ප්‍රශ්නයක් අහන්න තිබෙනවා? ඊ ළඟට ගරු නියෝජ්‍ය ඇමතිතුමා කරලා තිබෙන මාධ්‍ය ප්‍රකාශයක තිබෙනවා, "මේ ව්‍යාපෘතියට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණා" කියලා. මම ඉතාමත්ම වග කීමෙන් කියනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම කිව්වේ නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ආණ්ඩුවේ මාධ්‍ය ඒකකයෙන් ඉදිරිපත් කරපු වාර්තාවේ තිබෙනවා, පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තා කියලා ඇමතිතුමා කිව්වාය කියලා. [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත්තේ නැහැ. පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නවා තියා පාර්ලිමේන්තුවට මේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු ගැසට් පත්‍රයවත් අද වන තුරු ඉදිරිපත් කරලා නැහැ කියලා මම ඉතාමත්ම වග කීමෙන් කියනවා. නැඟිටලා කියන්න පුළුවන් නම් කරලා තිබෙනවාද කියලා. කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේ- [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පට්ටපල් අසත්‍ය. කරලා නැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
තමුන්නාන්සේ තමයි වැරදි. තමුන්නාන්සේ තමයි කිව්වේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක තමයි කියන්නේ. අපි හොඳ දෙයට හොඳයි කියනවා. වැරදි දෙයට වැරදියි කියනවා. හොඳ දෙයට අපි කිසි භයක් නැහැ. හොඳ දේ හොඳයි. ඒක තමයි කිව්වේ. මේ "කැටික්" එකේ ගැසට් වාර්තා ඉදිරිපත් කරලා නැහැ. [බාධා කිරීමක්] අපි අද කථා

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

කරන්නේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය පිළිබඳවයි.

Mr. Deputy Chairman of Committees, today, we are debating an Order under the Strategic Development Projects Act. What I am saying is that however much the Hon. Minister gets up and shouts here, he has not done his duty. He has not brought to this House the Gazette Notification on the Strategic Development Project called the "CATIC Skyline Hotel and Shopping Complex Development Project" for which he says that he sold 10 acres of a prime property in Sri Lanka which is owned, not by him but by us, the people of this country, for US Dollars 136 million.

ජුලි මාසයේ 31ක් වැනිදා "සන්ඩේ ටයිම්ස්" පුවත් පතේ ඉතාමත්ම ලස්සන කථාවක් තිබුණා. ඒකේ තිබුණේ මොකක්ද? "සන්ඩේ ටයිම්ස්" කියන්නේ කවුරුත් පිළිගන්නා පත්තරයක්. මේ ජනාධිපතිතුමා කිව්වා කියලා පත්තරේ තිබුණු දේ. ඒ පත්තරයට අනුව ජුලි 13න් වැනිදා කැබිනට් මීටිමේදී ජනාධිපතිතුමා කිව්වා ලු, කරුණාකරලා ඔය කරන වැඩේ නවත්වන්න, නවත්වලා මේක නැවතත් සොයා බලා ඉදිරි ක්‍රියා මාර්ග ගන්න කියලා. එතකොට නීත්‍යනුකූල විධියට වැඩේ කරන්න කියලා තිබෙනවා. මෙතැන ජනාධිපතිතුමා එකක් කියනවා, ඇමතිතුමා තව එකක් කියනවා, නියෝජ්‍ය ඇමතිතුමා තවත් එකක් කියනවා. මේ පාර්ලිමේන්තුවේ කිව්වා අක්කර 10ක් වික්කා කියලා. දැන් මේ ප්‍රශ්නය පැන නඟින කොට කියනවා, "නැහැ, නැහැ අක්කර හතරක් වික්කා" කියලා; "නැහැ, නැහැ අක්කර හතක් වික්කා" කියනවා; "නැහැ, නැහැ බදු දුන්නා" කියනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ඕනෑම තැනක, ඕනෑම රූපවාහිනී නාලිකාවකට එන්න කියලා ප්‍රසිද්ධියේ මම දෙපාරක් අභියෝග කළා. එතුමා ආ ගිය අතක් නැහැ. පැනලා ගියා. පැනලා ගියේ මොකද? කථා කරන්න විධියක් නැහැ. මේ දේ සත්‍යයි කියලා එතුමාට ඔප්පු කරන්න විධියක් නැහැ. එහෙමනම් දැන් මේ දේ හරියට කළා නම් මේ පත්තරයට අනුව ජනාධිපතිතුමා මේක නවත්වන්නයි කියලා තිබෙන්නේ මොකද? මේක හරි නම් හරි නේ. එහෙනම් එතුමා කියන්න එපා යැ ෂැන්ග්‍රි-ලා එකත් නවත්වන්න කියලා. එහෙම කියලා නැහැ නේ. එතුමා කියලා තිබෙන්නේ "කැටික්" එක නවත්වන්න කියලා. ඒකයි කියලා තිබෙන්නේ. අපි දන්නා තොරතුරු අනුව, ඔබතුමාත් සමහර විට දකින්න ඇති, "සන්ඩේ ටයිම්ස්" පත්තරේ මුල පිටුවේ ලොකු අකුරෙන් ලොකු boxed article එකක් හැටියට තමයි මේක ඉදිරිපත් කරලා තිබෙන්නේ.

දැන් ඕක ඔහොම තියෙද්දී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත අයුතු ලෙස ප්‍රයෝජනයට ගන්න නරකයි. මේ, අද තිබෙන "ලංකාදීප" පත්තරය. අද "ලංකාදීප" පත්තරයේ ප්‍රධාන පුවත මොකක්ද? මේකේ තිබෙනවා, "කොළඹ නගරයේ තවත් අක්කර 19ක් ප්‍රධාන පෙළේ සමාගම් හතරකට" කියලා. කොළඹ අක්කර 19ක් ප්‍රධාන පෙළේ ආයතන හතරකට දෙන්න යනවා ලු. මොනවාද මේ ඉඩම්? ට්‍රාන්ස්වර්ක්ස් චතුරස්‍රයේ අක්කර හතරයි.

ගාලුමුවදොර හරිත ප්‍රදේශයේ -නිකම් නොවෙයි, ගාලුමුවදොර හරිත ප්‍රදේශයේ- අක්කර 5ක පමණ ඉඩමක්. කොළඹ වාණිජ ඉඩමේ -Colombo Commercial එකේ- අක්කර 5ක්. කොළඹ 2න් අක්කර 3ක ඉඩමක්. දැන් මේවා කාටද දෙන්න යන්නේ? මේවා කාගේ ඉඩම්ද? මේවා අපේ ඉඩම්. මේවා ජනතාවගේ ඉඩම්. ඇමතිතුමාට ඕනෑ විධියට මේවා දෙන්න බැහැ නේ. මෙහි ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත තියා මොන පනතක් වුණත් රටේ නීතිය පිළිපදින්න ඕනෑ. රටේ සම්පත් වෙන කෙනකුට දෙනවා නම්, විකුණලා දමනවා නම් නීත්‍යනුකූලව විනිවිදභාවයක් ඇතිව ඒ වැඩ කරන්න ඕනෑ. කාටද මේවා දෙන්නේ? එකක්, Claridges Hotels and Resorts. කවුද මේ? තවත් එකක්, Delta Corporation Limited. තවත් එකක්, John Keells Holdings Limited. හරි, John Keells Holdings Limited කියන ආයතනය ගැන අපේ රට දන්නවා. එතුමන්ලා ගැන යම්කිසි විශ්වාසයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ ආයතනය නම් අඩුම ගණනේ ලංකාවේ කොම්පැනියක්. අනෙක් එක තමයි, Dodla International Limited. මා ආයෙත් කියන්නම්: Dodla International Limited, Delta Corporation Limited, Claridges Hotels and Resorts. මේවා ගැන අහලාවත් තිබෙනවාද? මේවාට විකුණන්න හදනවා කොළඹ ඉඩම්වලින් අක්කර 19ක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට පස්සේ එහි තවත් කථාවක් කියනවා ආණ්ඩුව කිව්වා කියලා. මෙන්න ඒක තිබෙනවා අද පත්තරයේ ප්‍රධාන ප්‍රවෘත්තිය වශයෙන් පළ වූ ලිපියේ. ඔන්න අහ ගන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙහි කියනවා, ෂැන්ග්‍රි-ලා එකටයි කැටික් එකටයි දුන්නා වාගේ -අද කථා කරන පනතට ප්‍රකාරව- ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට අවුරුදු 99කට බදු දෙනවා කියලා. හත් දෙයියනේ, මොකක්ද මේ කියන්නේ? කියන්න, මේක විකුණුවාද, විකුණුවේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඔය පත්තරේ නේ තිබෙන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
හැමදාම කියනවා ඕක ගැන.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අප කියන ඒවාද ඔය? පත්තරයේ තිබෙන ඒවා ගැන නේ කථා කරන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, මම දෙන්නම් විනාඩියක් ඔබතුමාට. කියන්න, මේක විකුණුවාද? බදු දුන්නාද? [බාධා කිරීම්] විකුණුවාද? බදු දුන්නාද? [බාධා කිරීම්] කියන්න.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திஸாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
විකුණුවේ නැහැ. ගිවිසුම් ගහලා දුන්නේ නැහැ. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා වාඩි වෙන්න කෝ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කියන්න. විකුණුවාද, බදු දුන්නාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
උත්තරයයි අහන්නේ නියෝජ්‍ය ඇමතිතුමාගෙන්.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කියන්න නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මට වෙලාව දෙන නිසායි කියන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කියන්න, කියන්න. විනාඩියක් දෙන්නම්. කියන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ෂැන්ග්‍රි-ලා සමාගමට විකුණුවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කැටික් සමාගමට?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
විකුණුවේ නැහැ. තවම එකඟතාවක් ආවේ නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අන්න කිව්වා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
එච්චරයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
හරි, දැන් මම දෙන්නම්. ඔන්න ඕක නේ කියන්නේ. I gave you the rope and you hung yourself. මම දුන්නා එතුමාට ලණුව. බෙල්ලේ දා ගෙන එල්ලිලා දැන් ඉන්නවා. [බාධා කිරීම්] මෙන්න තිබෙනවා ගිවිසුම. මොකක්ද ගිවිසුමේ කියන්නේ? ගිවිසුමේ කියන්නේ මේකයි:

"2.1 As approved by the Cabinet of Ministers, which decision has been already communicated to the Party of the Second Part,…."

Who is the Party of the Second Part? That is, China National Aero-Technology Import & Export Corporation or CATIC.

"……..the Government will transfer 10 acres of land to the party of the Second Part, depicted in red in the Plan at Annex II, for a total consideration of US$ 136 Million,…"

මොකක්ද මේ කියන්නේ? මෙතැන තිබෙන්නේ "Transfer of Land" කියලායි. ඊළඟට මොකක්ද කියන්නේ? මේක විකුණන්නේ කොහොමද?

"(a) an Advance Payment of US$ 50 Million……..on or before the 28th of February…."

On or before the 28th of February, US Dollars 50 million advance එකක් දෙන්න ඕනෑ කියලා කියනවා. ඊළඟට මොකක්ද කියන්නේ? ඊළඟට මෙන්න මෙහෙම කියනවා:

"(b) A Bank Guarantee to pay the balance US$ 86 Mn on or before 21st April 2011 will be given on or before 28th February 2011."

මොකක්ද මේ කියන්නේ? මෙහි කියනවා, bank guarantee එකක් දෙනවා, සියලුම මුදල් අප්‍රේල් මාසයේ 21 වැනිදාට කලින් ගෙවන්න ඕනෑ කියලා. [බාධා කිරීමක්] හරි, මම එන්නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාගේ තැනට එන්නම්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
මේ පැත්තට එන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න බැසිල් ඇමතිතුමා මම එන්නම්. 21 වැනිදාට කලින් advance payment එක විතරක් මදි, මේ ඉඩම විකුණන්න සියලුම මුදල් ගෙවන්න ඕනෑ කියලා කියනවා. ඊට පස්සේ මොකක්ද කියන්නේ? මම කියවන්නම්. ඔබතුමාගේ අත්සනින් තිබෙන්නේ. මෙන්න මෙහෙම සඳහන් වෙනවා:

"Parties agree in general that time will be of the essence, in particular the timeframes stipulated in Item 2 hereof,…."

ඒ කියන්නේ මා කියපු කථාව.

"…relating to the transfer of land. Hence this MOU shall stand terminated automatically…."

Do you understand that? It will stand terminated automatically.

"….in the event the Developer does not make the payment in accordance with the time periods set out in Clause 2…."

එහෙම නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා කිව්වා විකුණුවේ නැහැ කියලා. විකුණන්නත් බැහැ. විකුණුවේ නැහැ නොවෙයි, විකුණන්න බැහැ, because this Agreement is automatically terminated.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
බලමු, බලමු.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම නම් නඩු යමු. බලමු. ඒ කියන්නේ ඔබතුමන්ලාට 160ක් හිටපු පලියට seal ගහන්න බැහැ කියන එකයි. රටේ

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

නීතියක් තිබෙනවා. නැවතත් මුල ඉඳලාම මේ ක්‍රියාවලිය සිද්ධ කරන්න වෙවි. නීතියට ගරු කරන්නේ නැත්නම් 160ක් සිටියාය කියා එහෙම කරන්න බැහැ. ඒක අසාධාරණයි. නීතියේ රාමුව ඇතුළත තමයි අපි වැඩ කරන්න ඕනෑ. 21 වැනිදාට කලින් සල්ලි ගෙව්වේ නැත්නම් ඔබතුමන්ලාට ඒක විකුණන්න බැහැ කියා මේකේ තිබෙනවා. එච්චරයි කතාව. මම හිතන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමා නීතිඥවරයෙක් නිසා, එතුමා නීතිය දන්න නිසා එතුමා මේක කියවා බලා සමහර විට එතුමාට තරහ ගියාද දන්නේත් නැහැ, නීතියට පිටින් වැඩ කරනවාය කියා. කවුද දන්නේ? සමහර විට විපක්ෂය කියපු ඒවා එතුමාගේ කනට ගියාද දන්නේත් නැහැ. එතුමාත් නීතිඥයෙක් නිසා, එතුමා නීතිය දන්නා නිසා, මම හිතන්නේ එතුමා ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමාට කියා තිබෙනවා, කරුණාකරලා මේක අකුලා ගන්නය කියා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, you have two more minutes.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Okay. - [*Interruption.*] හරි හරි. මම කතා කරන්නම්කෝ. So, what I am trying to say is, we are not opposing for the sake of opposing. විරුද්ධ පක්ෂය නිසා අපි හැම දේටම විරුද්ධ වෙන්නේ නැහැ. අපි කාරණා තුනක් ගැන කතා කළා. කාරණා දෙකක් සම්බන්ධයෙන් හොඳ කිව්වා. එක කාරණයක් සම්බන්ධයෙන් වැරැද්දක් පෙන්වා දුන්නා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ලොකු දෙයක්.

**හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි. ඒක ඉතාමත්ම වැදගත්. මම එක දෙයක් කියා නවත්වනවා. මම විශ්වාස කරනවා, මෙතැන ඉන්න ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා ඉඳලා හිටලා හරි වෙලාවක් හම්බ වෙච්ච අවස්ථාවක ආර්ථිකය පිළිබඳව කෙරෙන විග්‍රහ ගැන කියවා බලාවිය කියා. ඩබ්ලිව්.ඒ. විජේවර්ධන නමැති අපි කවුරුත් ගරු කරන ආර්ථික විශේෂඥයෙක් ඉන්නවා. එතුමා තමයි මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිතුමා. මේ ළඟදී එතුමා විශ්‍රාම ගියා. සඳුදා "ඩේලි එෆ්ටී" පුවත් පතට එතුමා ඉතාමත්ම වැදගත් දෙයක් ලියා තිබෙනවා. ඒ අනුව ඉතිරි අවුරුදු දෙක තුනේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 8-9 මට්ටමේ තියා ගන්න ඕනෑ නම් දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 35ක් ආයෝජනය කරන්න වෙනවා. හැමදාම අපි කියනවා, සියයට 25ක් ආයෝජනය කරන්න ඕනෑය; සියයට 28ක් ආයෝජනය කරන්න ඕනෑය; සියයට 30ක් ආයෝජනය කරන්න ඕනෑය කියා. නමුත් ඇත්ත වශයෙන්ම කවුරුවත් කල්පනා කරලා බලන්නේ නැහැ, ඒ ආයෝජනය රුපියල්වලින් කොච්චරක්ද කියලා. සාමාන්‍යයෙන් සියයට 5ක්, 6ක් වාගේ ප්‍රමාණයක් තමයි ආණ්ඩුවට ආයෝජනය කරන්න පුළුවන් වෙන්නේ.

රටේ සමස්ත ඉතිරි කිරීම සියයට 18ක් වාගේ ප්‍රමාණයක්. එතකොට අපට සියයට 8ක් විතර ප්‍රමාණයක් - [බාධා කිරීමක්] වාඩි වෙන්නකෝ. ඔබතුමා දිනලා පෙන්වන්නකෝ. වාඩි වෙන්නකෝ. තව සියයට 8ක වැඩිපුර ආයෝජනයක් අවශ්‍යයි කියා කියනවා. පොඩ්ඩක් අහගෙන හිටියා නම් තේරේවි. සියයට 8ක ප්‍රමාණයක් කියන්නේ රුපියල් බිලියන 600ක්. It is an additional investment of Rs. 600 billion, which is US Dollars 5 1/2 billion. 2010 අවුරුද්දේ සියලුම බැංකු පෞද්ගලික අංශයට දී තිබෙන මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 430යි. ආයෝජන අංශයට විතරක් නොවෙයි, පරිභෝජන ණය පවා සියලුම බැංකුවලින් පෞද්ගලික අංශයට දී තිබෙන සියලුම ණය ප්‍රමාණය රුපියල් බිලියන 430යි. නමුත් 2012 දී අපට වැඩිපුර රුපියල් බිලියන 600ක නව ආයෝජනයක් අවශ්‍ය වෙනවා. බැංකුවලින් මේ ණය දෙන්න ගියොත් උද්ධමනය වැනි ප්‍රශ්න වැඩි වෙලා අපට ඒක කර ගන්න බැරි වෙනවා. ඒ නිසා අපට කරන්න පුළුවන් එකම දෙය තමයි සෘජු ආයෝජන ලබා ගන්න එක. සෘජු ආයෝජන ලබා ගැනීම සඳහා ගෙනල්ලා තිබෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතින් ආණ්ඩුව උපරිම ප්‍රයෝජන ගනීවිය කියා බලාපොරොත්තු වෙමින්, ලංකාවෙන් තෙල් ලැබේවාය කියා සුබ ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.23 ]

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මෙම නියමයන් පැනවීම සම්බන්ධ විවාදයේදී විපක්ෂයේ ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කරුණු කීපයක් ගෙනහැර දැක්වූවා. ප්‍රශ්න කීපයක් මතු කළා. මම පළමුවෙන්ම එතුමාට මේ කාරණය කියන්න ඕනෑ. ඔබතුමා මේ විෂයය සම්බන්ධයෙන්, මාතෘකාව සම්බන්ධයෙන් කථා කරන අතරතුර අනිකුත් විදේශ ආයෝජන සම්බන්ධයෙන්, විශේෂයෙන්ම හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනයන් පිළිබඳවත් කථා කළා. විවිධ ප්‍රශ්න නැඟුවා.

කෙයාන් කියන සමාගමත් එක්ක 2008 දී ගිවිසුම අත්සන් කළේ ටෙන්ඩර් කැඳවලා තෝරා ගත්ත, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කරපු සමාගමක් හැටියටයි. ඒකේ ඊළඟ අදියරට යන කොට, විෂය භාර අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයට ඒක ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගෙන ගැසට් නිවේදනය නිකුත් කළා. ඊළඟට ඒක මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, මෙහි විවාද කරලා, ජනතාව දැනුවත් කරලා, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන තමයි ඊළඟ අදියරට යන්නේ. මේ නියම ක්‍රමවේදය අප අනුගමනය කළා. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා දැන් පක්ෂයේ නායකයා බවට පත් කරන්න යන කරු ජයසූරිය මැතිතුමාගෙන් මෙන්න මේ කාරණය කරුණාකරලා අහන්න. එතුමා 2002 ඉඳලා 2004 දක්වා විදුලිබල හා බලශක්ති ඇමතිවරයා හැටියට ඉන්දෙද්දි, එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1962 දී ෂෙල්, කැල්ටෙක්ස් සමාගම් ජනසතු කරලා, ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත ගෙනැල්ලා හදපු ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුනකට කඩලා ඒ තුනෙන් එකක් ලංකා ඉන්දියානු තෙල් සමාගමට වික්කා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. මට පෙන්වන්න ඒ ගැසට් පත්‍රය? මට පෙන්වන්න ඒ සඳහා ටෙන්ඩර් කැඳවපු හැටි? ටෙන්ඩර් කැඳෙව්වේ නැහැ. ගැසට් කළේ නැහැ. ඒ කැබිනට් පත්‍රිකාව මා ළඟ තිබෙනවා. මොකක්ද ඒ කැබිනට් පත්‍රිකාවෙන් කිව්වේ? තෙල් සංස්ථාවේ තුනෙන් එක ඉන්දියන් සමාගමට වික්කේ ටෙන්ඩර් කැඳවලා නොවෙයි; ගැසට් කරලා නොවෙයි. කැබිනට් පත්‍රිකාවෙන්. මන්ත්‍රීතුමා මේ ටික අහගන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ෂෙල් එක?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මොකක්ද ෂෙල් එක ගැන කථා කරන්නේ. මම කියන ටික පොඩ්ඩක් අහගන්න. මේ තුනෙන් එක විකුණන කොට ඒ තුනෙන් එකත් එක්ක service stations 102ක් දුන්නා. හොඳම service stations 102 ඒ දුන්නේ. කොහොමද ඒ 102 තේරුවේ? ඒ 102 තෝරපු ක්‍රමයක් නැහැ. මේකත් එක්ක එදා බ්‍රිතාන්‍ය රාජකීය නාවික හමුදාව ඉදි කරපු ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි 102 දුන්නා. මේ service stations 102 අක්කර 800ක භූමි ප්‍රදේශයත් එක්ක තමයි ඉන්දියානු තෙල් සමාගමට තමුන්නාන්සේලා ඒ කැබිනට් පත්‍රිකාවෙන් දුන්නේ. කොහොමද ඒක දුන්නේ? මේවා පාර්ලිමේන්තුවට ආවාද? ඒ පිළිබඳව මේ රටේ ජනතාව දැනුවත් කළාද? [බාධා කිරීම්] වාඩි වෙන්න කරුණාකරලා. මම කියන එක අහගන්න. පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ කථා කරන කොට මම අහ ගෙන හිටියා. දැන් මම කථා කරන කොට තමුන්නාන්සේ අහ ගෙන ඉන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඇයි ඉතින් මගෙන් ප්‍රශ්න අහන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, ප්‍රශ්න අහන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විධියට මේක වික්කා. ඒ විකුණපු ගණන කීයද? ඩොලර් මිලියන 75ට වික්කේ. ඩොලර් මිලියන 75න් ඩොලර් මිලියන 45ක් භාණ්ඩාගාරයේ තැන්පත් කළා CPSTL සමාගමේ තමන්ගේ තුනෙන් එකේ කොටස හැටියට; ප්‍රාග්ධනය හැටියට. ඒක දැන් එතැන තිබෙනවා. ඉතුරු ඩොලර් මිලියන 30 -

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පෙට්‍රල් ගහන්න බැහැ. ඒවායේ වතුර. ඒවාත් ටෙන්ඩර් කැඳවලාද දුන්නේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පොඩ්ඩක් ඉන්න. වතුර ආව හැටි කියන්නම්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඒවාට උත්තර දෙන්නම්. අපි ඒවාට උත්තර දෙන්නම්. පොඩ්ඩක් මේක අහගන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒවාටත් උත්තර දෙන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒවාටත් ඕනෑ නම් මේ ගමන්ම පිළිතුරු දෙන්නම්. හංගන්න දේවල් නැහැ. ඒවාට උත්තර දෙන්නම්. තමුන්නාන්සේ ආචාර්ය උපාධියක් තිබෙන කෙනෙක් නේ. කරුණාකරලා පාර්ලිමේන්තුවේ විනයානුකූලව හැසිරෙන්න ඉගෙන ගන්න. තමුන්නාන්සේගේ උපාධියට ගරු කරන්න දෙන්න. [බාධා කිරීමක්] වාඩි වෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට මේවාට උත්තර දෙන්න වෙලා තිබෙන්නේ මෙතුමාගේ කථාවෙන් මතු කරපු ප්‍රශ්න නිසායි. නැතිව මේ විෂයයට අදාළ ඒවා නොවෙයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා කථාව පටන් ගත්ත ගමන් මොකක්ද කිව්වේ? මේ ගැසට් නිවේදනයේ තිබෙන එකවත් මෙතුමා හරියට කියවලා නැහැ නේ.

මේක තමයි ප්‍රශ්නය. ඉන්න මම කියවන්නම්. මොකක්ද ගැසට් නිවේදනයේ තිබෙන්නේ? ඒ ගැසට් නිවේදනයේ මෙහෙම තිබෙනවා:

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය.

ඊට පස්සේ මේකේ උපලේඛනය යටතේ මෙහෙම තිබෙනවා:

නිදහස් කිරීම ලබා දීමට අදාළ පනත් සහ වෙනත් ආශ්‍රිත සීමාවන්

එහි අංක 1 වශයෙන් මොකක්ද කියන්නේ? අංක 1 වශයෙන් මෙහෙම කියනවා:

1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

*සංස්ථාපිත බදු

පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් නිදහස ලැබේ-

මොනවාටද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා නිදා ගෙන ඉන්න ඇති මම කථා කරන වෙලාවේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ. මම නිදා ගෙන හිටියේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අහගෙන ඉන්න කෝ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ යටතේ අංක (i) වශයෙන් මෙහෙම තිබෙනවා:

(i) ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය මත පොළිය.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. (Dr.) Harsha De Silva.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, he should first learn to respect the rest of the Members.

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියාලා මෙතැන නැහැ. Sir, please ask him to withdraw those words.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාට මම ඉහළම ගරුත්වය දුන්නා. එතුමාට මම කිව්වා ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියලා. එහෙමයි කිව්වේ. [බාධා කිරීම්] Please sit down. I have given you the due respect. - [*Interruption.*] Then, it is alright.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ යටතේ මොකක්ද කියන්නේ? තමුන්නාන්සේ බලන්න, ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය මත පොලිය. මේකේ ප්‍රාග්ධන වියදම කියන්නේ මොකක්ද? කෙයාන් සමාගම මේ ව්‍යාපෘතිය කිරීමේදී ආරම්භ කරලා තිබෙන්නේ test drilling එකක් හැටියටයි. ඒ කියන්නේ පර්යේෂණ කැනීම් තුනක් ආරම්භ කරනවා. මේ පරීක්ෂණ කැණීම් තුනට යන වියදම ඩොලර් මිලියන 112.3යි. එතකොට මේකට යොදවන ප්‍රාග්ධනය මත තමයි මේ බදු නිදහස එන්නේ. තවම තෙල් හොයා ගෙන නැහැ. තවම ගෑස් හොයා ගෙන නැහැ. තවම එතැනට ඇවිල්ලා නැහැ. තවම ඇවිල්ලා නැහැ. තවම නැව මුහුදේ නැංගුරම් දාලා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මේක අහ ගන්න කෝ. නැව මුහුදේ නැංගුරම් දාලා මේ test drilling යනවා. මේ test drillingවලට යන investment එක. ඒකට දැන්-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හම්බන්තොට වරාය වාගේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පොඩ්ඩක් ඉන්න. නැව ගේන්න ඕනෑ. ඒකට ආම්පන්න ඕනෑ. [බාධා කිරීම්] ඉන්න කෝ. උපකරණ ඕනෑ. මේ ප්‍රාග්ධන වියදම්වලට යන බදු නිදහසයි දීලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ පිළිගත්ත ක්‍රමයන් අනුව යම් කිසි ආකාරයකට මෙවැනි ගවේෂණයක් කරලා - මේක මීටර් 400 ඉඳලා 1900 දක්වා පරාසයක් පොළවට විදින්න ඕනෑ, මුහුද පතුලට යන්න. පතුලේ ඉඳලාත් පල්ලෙහාට යන්න ඕනෑ.-

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගලක් එහෙම තිබුණොත්?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඉන්න කෝ. ගලක් තිබුණොත් ගල ගැන බලා ගනිමු කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගල තමයි විදින්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගල් නැති පොළවක් කොහේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නායකතුමාගෙන් අහන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please!

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක නායකතුමාගෙන් අහන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please ! Hon. Minister, you carry on. You have only three more minutes.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ මන්ත්‍රීතුමා ඇහුවා ගලක් අහු වුණොත් මොකක්ද වන්නේ? කියලා. ඒක අහන්න ඕනෑ මගෙන් නොවෙයි. ඒක එතුමාගේ පක්ෂයේ නායකයාගෙන් අහන්න ඕනෑ. [බාධා කිරීම්] ඒක තමුන්නාන්සේගේ නායකතුමාගෙන් අහන්න. මට ඒ පිළිබඳව පළපුරුද්දක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ බදු නිදහස දෙන්නේ ඒ කරන ප්‍රාග්ධන යෙදවීම් සඳහායි. මේකෙන් තෙල් හොයා ගත්තොත්, මේකෙන් ගෑස් හොයා ගත්තොත් එතකොට මොකක්ද බද්දට කරන්නේ කියන එකත් මේකේ තිබෙනවා. සියයට 50ක් නිෂ්පාදනය මත බදු පනවනවා. සියයට 10ක royalty එකක් එනවා. සියයට 12.5ක profit share එක තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තෙල් සොයා ගෙන තෙල් ගන්න පටන් ගත්ත වෙලාවේ ඉඳලා අවුරුදු පහක් යන කොට මේ 12.5 සියයට 60 දක්වා වැඩි වනවා. සියයට 60 දක්වා වැඩි වනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකේ කරුණු ටික හරියට කියවලා ඇයි මේ විධියට පනවන්නෙ කියන එක තේරුම් අර ගෙනයි අපි මේ පිළිබඳව කථා කරන්න අවශ්‍ය වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මගේ කාලය සීමා කරන නිසා මා ඉතා පැහැදිලිව කියනවා-

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මගේ කාලයෙන් විනාඩි පහක් ගන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, you are given five more minutes.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳව පුවත් පත්වල ලිපි පළ කරලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

What is your point or Order?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

You have enough speakers. Why do you not ask them to point it out?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

The Minister says that there is a royalty of 10 per cent. It is not here.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

There are a lot of speakers. Let them answer.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

That is not a point or Order.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

In the "Financial Review" supplement of the "The Island" newspaper dated 8th of August, 2011 පැහැදිලිව මෙහෙම කියනවා:

> "According to a Petroleum Resources Agreement signed between Cairn and the Government of Sri Lanka, if commercially viable deposits of hydro carbons are found, based on the investment multiple, the shares in profits will begin from 12.5 per cent to Sri Lanka and increase to 60 per cent within five years of commencement of oil extraction, Sri Lanka's share could reach significant proportions towards later stages of the lifetime of an oil rig, according to official reports."

- [*Interruption.*] - Wait, wait. - [*Interruption.*] No, no. That is the starting point. Five years වෙනකොට 60 per cent වලට එනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ඩොලර් මිලියන 112.5න් මේ ආයෝජනය නවතින්නේ නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත් ඉන්දුනීසියාව මෙවැනි ව්‍යාපෘති කරන්න ඩොලර් බිලියන තුනකට වඩා invest කරනවා. මේ සඳහා අවශ්‍ය එකක් තමයි තාක්ෂණය. අනෙක් එක තමයි මේ සඳහා කරන්නට තිබෙන විශාල ආයෝජනය. අප වාගේ කුඩා රටවල තිබෙන තත්ත්වය නිසා තමයි, ජාත්‍යන්තර වශයෙන් පිළිගත්ත ක්‍රමවේද අනුව, ප්‍රමිතීන් අනුව, ප්‍රතිපත්ති අනුව මෙවැනි ගිවිසුම්වලට එළැඹිලා ආයෝජනය කරන්නට ඉඩ දීලා, ඒ ආයෝජනත් එක්ක ඒ ලාභය බෙදා හදා ගන්නේ.

අද මොකක්ද මැද පෙරදිග කරලා තිබෙන්නේ? ඒ හැම රටක්ම මීට අවුරුදු තිහ, හතළිහකට පෙර මේ කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ මෙහෙම තමයි. අරාබිකරයේ රටවලට බ්‍රිතාන්‍යයේ BP එක ඇවිත්, නැත්නම් ෂෙල් කොම්පැනිය ඇවිත් තෙල් ළිං හෑරුවේ නැත්නම් ඒ අයට තෙල් හාරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ තාක්ෂණය තිබුණේ ඒ රටවල. ඒක තමයි තත්ත්වය. ඒක නිසා මේක තමයි ලෝකය පිළිගත් සම්ප්‍රදායය. අද අපි ඒ කරුණු කිසි දෙයක් සඟවලා නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාත් එකඟ වුණ විධියට මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙනවා; අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය අරගෙන තිබෙනවා. ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කරනවාය කියන්නේ ඒක ප්‍රසිද්ධ දැන්වීමක්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. හැබැයි මේවා වුණේ නැහැ, තෙල් සංස්ථාවේ තුනෙන් එක විකුණනකොට. එතකොට මේවා වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මම ඉතාම පැහැදිලිව සඳහන් කරනවා, මේ නියමිත ක්‍රමවේදය අනුගමනය කරලා තමයි අපි මේ ක්‍රියාදාමයට ඇවිත් තිබෙන්නේ කියන එක. ඒ තුළ තමයි මේ තත්ත්වය මතු කර ගෙන තිබෙන්නේ.

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මෙහි වාසි රාශියක් තිබෙනවා. දැන් බලන්න, මේකෙන් තිබෙන වාසි මොනවාද කියලා. මේ සමාගම මොකක්ද? මේ සමාගම ඉන්දියාවේ රාජස්ථාන්වල ගොඩබිම කටයුතු කරන එකක්. දැන් මෙහේ කටයුතු කරන්නේ offshore වල. රාජස්ථාන්වලින් තෙල් සොයා ගැනීමත් එක්ක මේ සමාගමේ කීර්ති නාමය වැඩි වුණා. අද ඒ අය offshore වලට ගිහින් වැඩ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි දැන් අවුරුද්දකට ඩොලර් බිලියන තුනක් වියදම් කරනවා තෙල් ආනයනය කරන්න. ඉස්සරහට මේක තව වැඩි වන්නට පුළුවන්. ඒක අපට අද නිශ්චය කරන්න බැහැ, තිබෙන අවිනිශ්චිතතාව උඩ. මේ ගණන මීට වඩා වැඩි වන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කළා සියයට තිස්පහක ආයෝජනයක් එන්න ඕනෑ කියලා. මේ සඳහා මෙහාට විදේශ විනිමය ගෙන එනකොට ඒක ආයෝජනයක්. ඒක විදේශ විනිමය හැටියට මෙහාට එන්නේ. ඒ වාගේම තාක්ෂණය අපට ලැබෙනවා. දැන් සාමාන්‍යයෙන් 3D Test එකක් කරන නැවක් නැංගුරම් ලා මුහුදේ තිබෙනකොට දවසකට ඩොලර් 25,000ක් වියදම් වෙනවා. නැව නිකම් මුහුදේ තිබෙන එකට එවැනි මුදලක් වියදම් වෙනවා. එවැනි ආයෝජනයක් කරන්න අපට පුළුවන්කමක් නැහැ. එම නිසා මේ සඳහා ලෝකයේ රටවල් අනුගමනය කරන ක්‍රමවේද තිබෙනවා. ඒ ක්‍රමවේදවලට තමයි අපි මේ ගිහින් තිබෙන්නේ.

ඊළඟට බලන්න මෙයින් ලැබෙන්නා වූ දත්ත පිළිබඳව. අපි තවම ගිහින් තිබෙන්නේ මන්නාරම් ද්‍රෝණියට පමණයි. ඊළඟට තව දත්ත රැස් කර ගෙන තිබෙනවා Cauvery Basin එකේ; උතුරු වෙරළ තීරයේ. ඊළඟට හම්බන්තොටින් මෙපිට Southern Basin. එකේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි මේවා අනුව, මේ රටේ තිබුණු අවුරුදු 30ක යුද්ධය අවසන් කරලා, ත්‍රස්තවාදය අවසන් කරලා මහින්ද චින්තනයේ සඳහන් ඒ වැඩ පිළිවෙළත් එක්ක රට ඉදිරියට යන තැනට ගිහින් තිබෙනවා.

අපේ රටේ ඉතිහාසයේ තමුන්නාන්සේලාගේ පක්ෂයත් බලයේ හිටියා. අපේ පක්ෂයත් බලයේ හිටියා. නමුත් ඉතිහාසයේ මෙවැනි දේවල් සිදු වුණේ නැහැ. ලෝකයේ ඇති වෙන්නා වූ ප්‍රවණතාවන් එක්ක මේ ගවේෂණයෙන් තෙල් හෝ ගෑස් කියන දෙකෙන් ඕනෑම දෙයක් - තෙල් ටිකක් විතරක් නොවෙයි- වාණිජමය පදනමක් මත සොයා ගත්තොත්, ඒ සොයා ගැනීමේ සිට අපිට අත් වන වාසි රාශියක් තිබෙනවා. මෙහි පෙනෙන නොපෙනෙන ප්‍රතිලාභ රාශියක් තිබෙනවා. මා කලින් කිව්වා වාගේ මේවාට අය කරන නිෂ්පාදන බදු, මෙයින් ඇති වන සෘජු රැකියා හා වක්‍ර රැකියා, සේවා පහසුකම් සැපයීමේදී ශ්‍රී ලාංකික සමාගම්වලට ලැබෙන්නා වූ ඉඩ ප්‍රස්තා, අප ඇති කර ගන්නාවූ තාක්ෂණ දැනුම යන මේ සියල්ල අපේ රටට, අපේ ජනතාවට ලැබෙන්නා වූ සහන බව මෙහිදී පැහැදිලිව සඳහන් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ගිවිසුම් ඇති කර ගෙන, අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත කරලා, ගැසට් නිවේදන නිකුත් කරලා, ජනතාව දැනුවත් කරලා, පාර්ලිමේන්තුවට ඇවිත් නියෝග සාදලා ඒ නියමිත ක්‍රමවේදය අනුගමනය කරලා තමයි මේ රජය, ඒ වාගේම ගරු ඇමතිතුමා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තෙල් ගවේෂණයට ගිහින් තිබෙන්නේ. ඒ පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. කවුරුත් ප්‍රාර්ථනා කළ ආකාරයට, අපත් බලාපොරොත්තු වන ආකාරයට තෙල් හෝ ගෑස් - ස්වභාවික වායුව, natural gas, ඒක liquefy කරන්න පුළුවන් - කියන දෙකෙන් කුමක් හෝ වාණිජමය ස්වරූපයට ගෙන එන්න ප්‍රමාණවත් ධාරිතාවයකින් යුතුව ලබා ගන්න පුළුවන් නම්, ඒ සියලු ප්‍රතිලාභ "මහින්ද චින්තන" වැඩසටහනේ ඉලක්කය කරා යෑමට පාදක වෙනවාය කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරමින්, ගරු අමාත්‍යතුමාටත් මේ සඳහා කටයුතු කරපු සියලුම දෙනාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

[අ. භා. 3.41]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ එන නියමය ගැන කථා කරන විට ඉඩම් විකිණීම ගැනත් සඳහන් වුණා. ඒක ගැන කරුණක් කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ඉඩම් විකිණීම සම්බන්ධව අපට ජාතික ප්‍රතිපත්තියක් තිබීම අවශ්‍යයි කියා මා හිතනවා. ඉඩම් විකිණිය යුතුද නැද්ද, එහෙම නැත්නම් ඉඩම් බද්දකට පමණක් දිය යුතුද කියන කාරණය සම්බන්ධව මා කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි.

2002 දී විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ඉඩම් විකිණීම පිළිබඳව රජයට පහරක් එල්ල කළා. 2012 දීත් අපි ඒ දේම කරලා වැඩක් නැහැ. ඒ නිසා මේ සඳහා ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍යයි කියා මා හිතනවා. අපි ඉඩම් විකිණිය යුතුද නැද්ද කියන කාරණය සම්බන්ධව මගේ පෞද්ගලික මතය නම්, -ජනතාව සතු මේ රටේ ඉඩම් ප්‍රමාණය සීමිත නිසා ඒකට විශාල විරුද්ධතාවක් තිබෙන නිසා- ඉඩම් විකුණන්නේ නැතුව බදු දීමේ ක්‍රමයකට යන්න අවශ්‍යයි කියන එකයි. ජාතික ප්‍රතිපත්තියක් හැටියට ඒ දෙස බලන්න අවශ්‍යයි. මොකද, මොන ව්‍යාපාරය කළත් ඉඩම් බද්දට දීම හරහා ඒවා ලාභ ව්‍යාපාර හැටියට පවත්වාගෙන යන්න පුළුවන් නිසා. සමහර රටවල එවැනි ප්‍රතිපත්ති තිබෙනවා. ඒ කරුණ ගැන කථා කළ නිසා මා මේ අවස්ථාවේදී ඒ කරුණ සඳහන් කරන්න ඕනෑ. නමුත් අද අපි කථා කරන්නේ ඛනිජ තෙල් සම්පත් පිළිබඳවත්, ඒ කැණීම් පිළිබඳවත්, ගවේෂණය පිළිබඳවත්.

තෙල් ගැන කථා කරනකොට මේක විශාල ජාතික සම්පතක් නිසා මෙහි ක්‍රමවේදය ගැන කරුණු කිහිපයක් කියන්න අවශ්‍යයි. ඛනිජ තෙල් සම්පත් විශාල ප්‍රමාණයක් තිබෙන තෙල් උපයන රටවල් ගණනාවක්ම තිබෙනවා. අපේ මනසට පැන නැඟෙනවා නයිජීරියාව වාගේ රටක්. එහි විශාල තෙල් සම්පත් තිබෙනවා. කොච්චර තෙල් සම්පත් තිබුණත් ඒක අධික දූෂණයක් පවතින රටක්. දුප්පත් පිරිස් විශාල වශයෙන් ඒ රටේ තවමත් සිටිනවා. අවුරුදු 30, 40කට වැඩි කාලයක් නයිජීරියාවේ තෙල් කැණීම කරලා තිබෙනවා. ඒ වාගේම පොහොසත් කියා සලකන සෞදි අරාබියාව වැනි රටක වුණත් අඩු ආදායම්ලාභීන් අද විශාල පිරිසක් සිටිනවා.

තෙල් ගැන කථා කරන කොට විරුද්ධ පාර්ශ්වය හැටියට අපි විශේෂයෙන්ම කියා සිටින්නේ ක්‍රමවේදයක් ඇතුව, විනිවිදභාවයෙන්, පැහැදිලිව මේ කරුණ ගැන කථා කරන්නට අවශ්‍යයි කියන එකයි. අද අපි දන්නවා, ලංකාවට තෙල් ගෙන එන්න යූඑස් ඩොලර්ස් බිලියන තුනක් - තෙල්වල මිල අනුව එය යූඑස් ඩොලර්ස් බිලියන හතරක් පහක් දක්වා ඉහළ යන්න පුළුවන් - අපට අවශ්‍ය බව.

විශේෂයෙන්ම මන්නාරම බොක්ක ආසන්නයේ, මන්නාරම ද්‍රෝණියේ යූඑස් ඩොලර්ස් බිලියන සියයකට වැඩි ප්‍රමාණයක වටිනාකමක් ඇති තෙල් ඇතැයි කියා අද වාර්තා වෙලා තිබෙනවා. තෙල් බැරල් බිලියනයක් විතර තියෙන්න පුළුවන් කියා සඳහන් වෙලා තිබෙනවා. සියයට 100ක් නිවැරදිව ඒක කියන්න බැහැ. 2D seismic study එකෙන් අපි දන්නවා, TGS-NOPECවලට

දීලා, ඒකෙන් ලැබුණු විස්තර ඒ සමාගම තවත් තෙල් සමාගම්වලට විකුණුවා, ඩොලර් මිලියන 2කට විතර. ඊට පස්සේ 2006 දී ඒ දත්තම අපි නැවත ගත්තා, ඩොලර් මිලියන 10ක් ගෙවලා. මම අහන්න කැමැතියි, ඇයි එහෙම කළේ කියන එක. මොකද, අපටත් සමාගමක් වාගේම ඒ දත්ත ඊට වැඩිය ලාභයට ලබා ගන්න පුළුවන්. ඩොලර් මිලියනයකට විතර ලබා ගන්න තිබුණා. නමුත් if you wanted exclusive rights, අපට තිබුණේ, මුලින්ම කථා කරලා, මුලින්ම ඒ දත්ත අරගෙන තෙල් සමාගම්වලට විකුණන්න. මට පෙනෙන්නේ එතැන සිදු වුණු දේ බොහොම අලාභයක් හැටියටයි. "ඇයි මෙවැනි දෙයක් සිදු වුණේ?" කියන ප්‍රශ්නය මම අහන්න කැමැතියි.

අපි දන්නවා, කට්ටි - blocks - දෙන කොට ඉන්දියාව සහ චීනයටත් කට්ටි එක ගානේ දුන්නු බව. නමුත් අපි දන්නා තරමට අද වන කල් තෙල් ගවේෂණය කිරීමට ඒ රටවල් දෙක රාජ්‍යයන් හැටියට ඉදිරිපත් වෙලා නැහැ. ඉන්දියාවේ ONGC සමාගම ප්‍රසිද්ධව සඳහන් කර තිබුණා, මේ දේ ඉෂ්ට කරන්න ඒ ගොල්ලන්ට බලාපොරොත්තුවක් නැහැයි කියලා. ඒ නිසා මොකක්ද මේ පිළිබඳව වර්තමාන තත්ත්වය කියන එකත් අපි දැන ගන්නට කැමැතියි.

මෙවැනි ඛනිජ තෙල් සම්පත්වලට ජාත්‍යන්තරව ඉල්ලීමක් කරන කොට යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවා. අද අපේ ගරු ඇමතිවරුන් දෙදෙනෙක් ඒ ක්‍රමවේදය අපට සැහෙන දුරකට විස්තර කළා. නමුත් ඒ පිළිබඳව ප්‍රශ්න කීපයක් අපට තිබෙනවා. විශේෂයෙන්ම වෙබ් අඩවිවලින් -ශ්‍රී ලංකා රජයේ වෙබ් අඩවිවලිනුත් තොරතුරු ලබා ගත්තා- ලබා ගත් තොරතුරු අනුව අපට පෙනෙනවා, ඒ ඉල්ලීමට අවශ්‍ය bid documents පිළියෙල කරන කොට ලංකාවේ නිකුත් කරපු bid documents ඉන්දීය බලපත්‍ර නිකුත් කරන ක්‍රමයට බොහොම ආසන්න බව. ඉන්දියාවේ ඒකට කියනවා, "NELP" කියලා. ඒකට බොහොම ආසන්න විධියට තමයි ලංකාවෙත් bid documents ඉදිරිපත් කරලා තිබෙන්නේ. නමුත් එතැන එක වෙනසක් තිබුණා. ඒ වෙනස මෙයයි. ඒ ටෙන්ඩර් ඉල්ලීමේදී ප්‍රසිද්ධියේ ඒවා විවෘත කරන කොට ඒවායේ තිබෙන ඒ කරුණු ජනතාවට දැන ගන්නට බැහැ. නමුත් ඉන්දීය ක්‍රමයේදී ප්‍රසිද්ධියේ ජනතාවට ඒක එකවරම දැන ගන්නට පුළුවන්, because it is publicly done. අපේ ක්‍රමයේ එහෙම විනිවිදභාවයක් නැහැයි කියන එක කියන්න අවශ්‍යයි. ටෙන්ඩර් විවෘත කරලා, කොම්පැනි 33කට දුන්නා.

Niko Resources Limited, Cairn India Limited, ONGC එකට ඒ කට්ටි කීපයක් ගණනේ දුන්නා. අපි දන්නවා, ඉන්දියාවේ මේ Cairn India Limited කියන සමාගම කට්ටි තුනක් ඉල්ලුවත් ඔවුන්ට ලැබුණේ එක කට්ටියක් කියන එක. සාමාන්‍යයෙන් මෙහෙම ජාත්‍යන්තර ටෙන්ඩර් පටිපාටි ක්‍රියාත්මක කරන කොට එහි වෙනසක් සිදු වන්නේ නැහැ. ඒ ඉල්ලන ක්‍රමයටම දෙනවා. එහෙම නම් මොකක් හෝ හේතුවක් තිබෙන්න ඇති, එක කට්ටියක් විතරක් දෙන්න. නමුත් මම අහන්න කැමැතියි, ඔවුන්ට එකක් පමණක් දෙන්න හේතුව මොකක්ද කියලා.

විශේෂයෙන්ම තෙල් කැණීමට ලංකාව ජාත්‍යන්තර මට්ටමින් මේ වාගේ ටෙන්ඩර් පටිපාටි ක්‍රියාත්මක කරන පළමුවැනි වතාව මෙකයි. 1967 ඉඳලාම මේ ගැන ලංකා රජයේ කැමැත්තක් තිබුණාට මෙච්චර දුරට මෙවැනි ක්‍රියාවලියක් සිදු වුණේ නැහැ කියලා කියන්න අවශ්‍යයි. මේ කරුණු අපට දැන ගන්නට ඕනෑ. ඒ වාගේම මේ Canadian සමාගමෙන් ලියුම් ලියලා ප්‍රශ්න ඉදිරිපත් කරලා තියෙනවා. ජනාධිපතිතුමාටත් ඒ ලියුම්වල පිටපත් යවලා තිබෙනවා. ඇමතිවරුන්ට යවලා තිබෙනවා. ඔවුන්ටත් ඒ පිළිබඳ විස්තර ලැබිලා නැහැ. මම හිතන්නේ විස්තර ලැබුණොත් හොඳයි. මොකද ඒකෙන් විනිවිදභාවය අපට වැඩි කරන්නට පුළුවන්. මොකක්ද මෙතැන තිබෙන ප්‍රශ්නය? මිලියන 10ක් දීලා අර දත්ත ගත්ත එක පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා.

අපි දන්නවා, මේ ක්‍රමවේදය අසතුටුදායකයි කියලා. ඇයි එහෙම සිදු වුණේ කියලා අපට දැන ගන්නට ඕනෑ. මේ වාගේ විස්තර නැති වන කොට වෙන මොකක් හරි හේතුවක් තියෙනවාද නැද්ද කියලා අපිට සැකයක් ඇති වෙනවා. ලෝක වෙළෙඳ පොළේ තෙල් ක්ෂේත්‍රය ගත්තාම ශ්‍රී ලංකාවට ඒ පිළිබඳව විශාල විශ්වාසයක් ඇති කරන්නට ඕනෑ. මේක ගවේෂණය පමණයි. තෙල් කැණීම තිබෙනවා. මේවාට විශාල ආයෝජනයක් අවශ්‍යයි කියලා මට ප්‍රථමයෙන් කථා කරපු ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා මතක් කළා. ඒ විශ්වාසය අපි ඇති කර ගන්නට අවශ්‍යයි. දැන් අපි දන්නවා, මේ Cairn India Limited කියන සමාගමට වර්ග කිලෝමීටර් 3,300ක විතර එක කට්ටියක් පමණක් දුන්නාය කියලා. තව කට්ටි දෙකක් තිබුණා, වර්ග කිලෝමීටර් 3,500ක් 4,000ක් විතර. ඇයි ඒවා ඔවුන්ට නුදුන්නේ? මොකද මේ කට්ටියේ පමණක් කැණීම් කරලා මොකක් හරි හේතුවක් නිසා ඒ තෙල් නොලැබුණොත් අලුතින් ආයෝජන ලබා ගන්න අනික් කට්ටි දෙකට අපහසු වෙයි කියන සැකයත් මතු වෙනවා. ඒ නිසා තමයි මම විශේෂයෙන්ම අහන්නේ ඇයි ඒක ඔවුන්ට නොදෙන්න හේතුව කියලා.

2007 මහ බැංකු වාර්තාවේ විශේෂයෙන්ම තෙල් ගැන සඳහන් කරපු කොටසක් තිබුණා. ඒකේ විශේෂයෙන් මේ ගැන සඳහන් කරනවා. 1974 ඉඳලා 81 දක්වාත් නොයෙකුත් වතාවල්වල මේ දේ සිදු වුණා. නමුත් ඊට පස්සේ වැදගත් දෙයක් සඳහන් වනවා. මේ සම්බන්ධ විස්තර සඳහන් ඉංග්‍රීසි photocopy එක හමු වුණු නිසා මම ඒක ඉංග්‍රීසි භාෂාවෙන්ම කියවන්නම්.

It states, I quote:

"Hence, Mannar basin being a virgin field, Sri Lanka would need to pay more attention on marketing and attracting good investors.

More than fiscal incentives, maintaining credibility, transparency and accountability will be crucial in attracting reputed investors.

A well-structured institutional arrangement should exist for policy formulation, management, regulation, and supervision of oil exploration, development and production".

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now. Your time is over.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
නතර කරන්න කියනවා නම් නතර කරන්න වෙයි. එහෙනම් මම ඉක්මනින් අවසන් කරන්නම්. මොකද මගේ ප්‍රධාන කරුණට එන්න බැරි වුණා. අපි දන්නවා, 2008 ජූලි මාසයේ 7 වැනිදා ඛනිජ තෙල් සම්පත් ගිවිසුමක් අත්සන් වුණාය කියලා. ඒක Cairn India Limited කියන සමාගමයි, ශ්‍රී ලංකා රාජ්‍යයයි අතරේ සිදු වුණේ. ඊට පස්සේ ගැසට් අංක 1703/46 මඟින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා කියලා 2008 පනත අනුව ඒක ගැසට් කරනු ලැබුවා. නමුත් 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 4 වැනි වගන්තියේ කියනවා, මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථමයෙන් ඒකට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගන්න අවශ්‍යයි කියලා.

දැන් අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා හුහක් වෑයමක් දැරුවා මේක හරියටම සිදු වෙනවා කියලා කියන්න. ඇත්තටම හරියටම සිදු වෙනවා කියලා කිව්වොත් පොඩි ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද අද තමයි අපි මේක පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවේ කැමැත්ත අනුව අනුමත කරනවාද නැද්ද කියලා දැන ගන්නේ. නමුත් මීට ප්‍රථමයෙන් අපට මාධ්‍යයෙන් මේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ගැන දැන ගන්නට ලැබුණා. "සන්ඩේ ඔබ්සර්වර්" එකේ තිබුණා. “අද දෙරණ” තුළිනුත් දැන ගන්න ලැබුණා. අද සරත් අමුනුගම ඇමතිතුමාත් මේ ගැන කිව්වා. [බාධා කිරීමක්] අද ඔබතුමාත් මොකක්ද නැවක් ආපු එකක් ගැන කිව්වා. මම ඒක ගැන දැන ගෙන හිටියේ නැහැ. නමුත් මේ ක්‍රියාවලිය පාර්ලිමේන්තුව සම්මත කරන්නට ප්‍රථමයෙන් ආරම්භ වුණා කියලා මාධ්‍යයෙනුත්, ඇමතිවරුන්ගෙනුත් අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා. මම නඟන ප්‍රශ්නය මේකයි. නීතිය උසස්. තුනෙන් දෙකේ ඡන්ද බලයක් තිබුණත්, කොපමණ ඡන්ද බලයක් තිබුණත් නීත්‍යානුකූලව ක්‍රියා කරන්නට අවශ්‍යයි. ව්‍යවස්ථාව උසස්. නීතිය උසස්. ඒ නිසා මේක සලකන්නය, නීතිය උල්ලංඝනය කරන්නේ නැතිව ක්‍රියා කරන්න කියා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.55]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හිතන හැටියට ඉතිහාසයේ ඉතාමත්ම වැදගත් අවස්ථාවක, අපි අද මේ පාර්ලිමේන්තුවේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය පිළිබඳව පැවැත් වෙන විවාදයට සහභාගි වෙනවා. අද ඉදිරිපත් කළ 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය ගැන කරන විවාදය වැදගත් වන්නේ මෙන්න මේ නිසයි. 2008 ජූලි මාසයේ 07 වෙනිදා ගරු ෆවුසි ඇමතිතුමා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමති හැටියට මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරන්න කියලා මේ ගරු සභාවට පනතක් ගෙනාවා. දිවයිනේ බටහිර වෙරළේ, මන්නාරම් ද්‍රෝණියේ වර්ග කිලෝමීටර් 3,000ක බිම් කොටසක ඛනිජ තෙල් ගවේශන කටයුතු සඳහා කෙයාන් ඉන්දියානු සමාගමත් සමඟ බදු ගිවිසුමකට එළැඹුණා. මේක තමයි ඉතාමත්ම වැදගත් වන්නේ. යුද්ධයෙන් පසුව, අපේ රටේ ආර්ථිකයේ යුද්ධය අවස්ථාවේ දැක්ක අත් දැකීම් තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අත් දැකීම් තමයි ලෝකයේ තෙල් ප්‍රශ්නය උග්‍රම වෙච්ච වෙලාවේ ජනාධිපතිතුමාට සිද්ධ වුණා පෞද්ගලිකව ඉරානයට කථා කරලා මාස 06ක grace period එකකට අපට මේ තෙල් ලබා ගන්න පෞද්ගලිකව මැදිහත් වන්න. එතකොට මේ ලෝකය පාලනය කළේ තෙල්.

අපේ වාසනාවට අපට තෙල් නිධි තිබෙනවා කියලා විශ්වාසයක් තිබෙනවා. හැබැයි අපට ආයෝජනයක් කරන්න බැහැ. ඒ නිසා ආයෝජනයක් කිරීමට සුදුසුම ආයෝජනය අපි සොයා ගත යුතුයි. ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා ඉතාමත්ම පැහැදිලිව කිව්වා ඉන්දියාවේ ගොඩ බිම් කැණීම් කටයුතුවලදී මේ සමාගම ප්‍රසංශාත්මක සමාගමක් හැටියට ගිය වසරේ පත් වුණා කියලා. ඒ නිසා මම හිතන හැටියට අපි කාටවත් ඒ සමාගම පිළිබඳව ගැටලුවක් නැහැ. එතකොට මොකක්ද එහෙම නම් තිබෙන ගැටලුව?

ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා මෙම ගරු සභාවෙන් ගිය එක ගැන මම කනගාටු වෙනවා. එතුමා එදා මේ සභාවේදී කථා කළේ මේ අණපනත් ෂැන්ග්‍රි-ලා සමාගමට ඉදිරිපත් කළා, ඒක හොඳයි කියන අදහසිනුයි. නමුත් දැන් කථා කරන්නේ මේකේ තිබෙන බදු සහන ගැනයි. මේක එතුමා පටලවා ගත්තා. ඒ කියන්නේ කැණීම් කටයුතු එකක්; බදු සහන කියන එක එකක්. අද අපි මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවේ බදු සහන ගැන දැනුවත් කරන්නයි. කැණීම් කටයුතු වෙනම එකක්. අපි මේකෙන් බදු සහන දෙන්නේ කාටද කියන එක ඉතාමත්ම පැහැදිලියි. කිසිම උප කොන්ත්‍රාත්කරුවකුට මේ බදු සහන යන්නේ නැහැ. මේ බදු සහන යන්නේ මේ ගත්ත සමාගමට විතරයි. ඒ, සමාගම ගෙන්වන භාණ්ඩවලට. ඒක මේ ඉතිහාසයේ ලෝකයේ ඕනෑම රටක මෙවැනි ආයෝජනයක් කරන කොට, ඩොලර් මිලියන 110 ත් 112කට වැඩි ප්‍රමාණයක් මේ සමාගම ඇවිල්ලා ආයෝජනය කරනවා. අපි තෙල් තිබෙනවාද, නැද්ද කියලා පූර්ව නිගමනයකට පත් වන්නේ නැහැ. අපි හිතනවා තෙල් තිබෙනවා කියලා.

ලංකාවේ මුදලින් අපට කවදාවත් මේ කැණීම් කටයුතු කරන්න බැහැ. මේ කැණීම් කටයුතු අපි කළ යුත්තේ පැහැදිලි ආයෝජනයක් රටට අරගෙනයි. එහෙම නම් මේ ආයෝජනය අපි ගෙනාවා. මේ ආයෝජනය ගෙනාවා විතරක් නොවෙයි ඉස්සෙල්ලාම කැබිනට් මණ්ඩලයට ගියා. කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා මේ සමාගමත් එක්ක ගිවිසුමකට එළැඹෙන්න කැබිනට් එකේ අනුමැතිය ගත්තා. කැබිනට් එකේ අනුමැතිය අරගෙන අපි මේ සඳහා ගැසට් පත්‍රයක් ඉදිරිත් කළා. ඒ වාගේම ඒ ගැසට් පත්‍රයේ තිබෙන කාරණා සම්බන්ධයෙන් ජනතාවට විරුද්ධත්වයක් දක්වන්න තිබුණා නම් විරුද්ධත්වයක් දක්වන්න කාල සීමාවක් තිබුණා. ඊට පසුව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත මේ පාර්ලිමේන්තුවට ගෙනාවා. එම පනත මේ පාර්ලිමේන්තුවට ගෙනල්ලා, බදු සහන පිළිබඳව අපි දැනුවත් කළා. බදු සහන පිළිබඳව දැනුවත් කරලා, මේ සමාගමට කැණීම් කටයුතු කිරීම සඳහා ලබා දෙන්න අවශ්‍ය පියවර අද ගෙන තිබෙනවා. එහෙම නම් දැන් ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කරපු යම් කාරණා තිබෙනවා. අපි අවංකව පිළිගත යුතු යි. ජෝශප් මයිකල් පෙරේරා අපේ හිටපු ඇමතිතුමා දැන් මේ අවස්ථාවේ ගරු සභාවේ සිටිනවා.

ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කළා, පාර්ලිමේන්තුව දැනුවත් කරපු නැති කාරණයක් සම්බන්ධයෙන්. මොකක්ද ඒ? කැටික් සමාගම එක්ක, අපි අර එකම බිම් ප්‍රමාණයෙන් මෙහා පැත්ත එක සමාගමකට දීලා, අනෙක් සමාගමට මේ පැත්ත දෙන කොට -ඩොලර් මිලියන 1.5කට වැඩි ප්‍රමාණයකට ඒක දෙන කොට- ඒකේ වැරැද්දක් තිබුණාය කියලා මම හිතන්නේ නැහැ. නමුත් තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේ දීපු ඒවා ගැනත් කල්පනා කරලා බලන්න. එතුමාට කිසිම අයිතියක් නැහැ, මේවා ගැන කථා කරන්න. එදා ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය දුන්නේ කීයටද කියලා මට කියන්න. අවුරුද්දකට ලැබුණු බදු මුදල කීයද කියලා කියන්න. රුපියල් 300යි. මම ආයෝජනය නරක යැයි කියන්නේ නැහැ.

Twin Towers තිබෙනවා. අද ඒකෙන් විශාල ප්‍රමාණයක ආදායම් මාර්ගයක් රටට ලැබෙනවා. හැබැයි, 99 අවුරුදු බද්දද දුන්නේ කීයටද? 99 අවුරුදු බද්ද දුන්නේ වර්ෂයකට රුපියල් තුන්සියයේ බදු ක්‍රමයකට. ආණ්ඩුවට ලැබුණු සම්පූර්ණ මුදල කොච්චරද? රුපියල් මිලියන 48යි. එතකොට අපි අර ෂැන්ග්‍රි-ලා සමාගමට දීමෙන් ලැබුණු මුදල කොච්චරද? ඩොලර් මිලියන 125යි. එතකොට WTC එක ගත්තු මුදල කොච්චරද? මේවා යි අප කල්පනා කළ යුත්තේ. මෙතැන අවුරුදු 100කට දෙන්න බැරි නිසා අවුරුදු 99කට දෙනවා. හැබැයි, මගේ පෞද්ගලික මතය වන්නේ, 99 අවුරුදු බද්දට ගත්ත මිනිහාවත්, 30 අවුරුදු බද්දට ගත්ත මිනිහාවත් මේ ඉඩම් එකක්වත් අරගෙන යන්නේ නැහැ කියන එකයි. එකම අලාභය වන්නේ ලංකාවේ භාණ්ඩාගාරයට එක සැරේට ලැබෙන මුදල් ප්‍රමාණය නැති වෙලා යන එක විතරයි.

දැන් අපි සොයනවාද, "ටාජ්" එකට දුන්නු ගිවිසුමේ කාලය දිගු කරනවාද, නැද්ද කියලා. කවුද සොයන්නේ? "ටාජ්" එකට ඉඩම් දුන්නා, අවුරුදු 30කට. දැන් ඒකේ කාලය දිගු කරනවාද, බදු ලැබෙනවාද කියලා කවුරුවත් දන්නේ නැහැ, ඒ ඉඩම ගෙනිච්චත්. එතකොට හමුදා මූලස්ථානය ගැන කථා කළා. Inter Continental Hotel එක ගොඩනගලා තිබෙන්නේ කොහේද?

සිංහ රෙජිමේන්තුවේ ඉඩමක. ඇවිලන් චතුරස්‍රයේ තිබුණු ඉඩම් සිංහ රෙජිමේන්තුවට තිබුණේ. හමුදාවට ලැබුණු මුදල් කොච්චරද? මා ළඟ තිබෙනවා, තොරතුරු. Lanka Hospitals (Pvt.) Limited සඳහා අක්කර 6 යි රූඩ් 5ක් දීලා තිබෙනවා, 99 අවුරුදු බද්දට. කීයකටද දීලා තිබෙන්නේ? රුපියල් මිලියන 469යි. එතකොට මේකට වර්ෂයකට ලැබෙන බදු මුදල කොච්චරද? රුපියල් 150යි. Asiri Medical Services Limited සඳහා 99 අවුරුද්දකට බදු දීලා තිබෙනවා. Mireka Capital Land (Pvt.) Limited බලන්න. ඒකේ රුපියල් මිලියන 100යි. රුපියල් මිලියන 100යි ලැබිලා තිබෙන්නේ. Overseas Realty (Pvt.) Limited සඳහා 99 අවුරුදු බද්දකට දීලා තිබෙනවා. රුපියල් මිලියන 48යි ලැබිලා තිබෙන්නේ. හිල්ටන් හෝටලය සඳහා අක්කර 4ක් 99 අවුරුදු බද්දකට දීලා තිබෙනවා. රුපියල් මිලියන 103යි. එතකොට වාර්ෂික බදු කීයද? රුපියල් 150යි. එහෙනම් දැන් කථා කරන්න එතුමාට අයිතියක් තිබෙනවාද? අයිතියක් තිබෙනවාද, මේ ගැන කථා කරන්න? මේ ආණ්ඩුව පනත් ගෙනල්ලා, ගැසට් ගහලා, මේ ගැන විරුද්ධත්වයක් තිබෙනවා නම් කියන්න කියලා මාස ගණනක් තිස්සේ මිනිසුන් දැනුවත් කරලා, මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය අරගෙන, කිසිම අමාත්‍යාංශයක්, කිසිම දෙයක් නැතිව භාණ්ඩාගාරයට මුදල් යන ක්‍රමවේදයක් අපි අනුගමනය කරලා ඉතාමත්ම පැහැදිලිව පසු ගිය වකවානුව ඇතුළත මේ ගනුදෙනු දෙක, තුනම කළා.

දැන් එතුමා චෝදනාවක් කළා. එතුමා මෙතැන නැති නිසා මට කනගාටුයි. අපි මේ පාර්ලිමේන්තුවේදි කියපු කිසි දෙයක් වෙනස් කර ගෙන නැහැ. ආණ්ඩුවකට පුළුවන් සමහර අවස්ථාවලදී ප්‍රතිපත්ති වෙනස් කරන්න. නමුත් ඒ ප්‍රතිපත්ති වෙනස් කරන කොට ඒ ප්‍රතිපත්තිය වෙනස් කරන්න තීන්දු කරන කොට ගනුදෙනුව ඉවර නැත්නම් ඕනෑ දෙයක් කරන්න පුළුවන්. ඒක ආණ්ඩුවේ කාර්ය භාරයක්. අනූනව අවුරුද්දකට දෙනවාද, විකුණනවාද, නැද්ද කියන එක ආණ්ඩුව තීන්දු කරන්න ඕනෑ; කැබිනට් මණ්ඩලය තීන්දු කරන්න ඕනෑ. කැබිනට් මණ්ඩලය එකක් තීන්දු කරලා ඊට පස්සේ ඒ ගනුදෙනුව ඉවර නැත්නම් කැබිනට් මණ්ඩලයට මහ ජනතාවගෙන් යම්කිසි ඉල්ලීමක් තිබෙනවා නම් සංවිධානවලින් ඉල්ලීමක් තිබෙනවා නම් කැබිනට් මණ්ඩලයට තවදුරටත් කල්පනා කරන්න පුළුවන්, ඊ ළඟට ගන්න ඕනෑ පියවර මොකක්ද කියලා. ඒක ආණ්ඩුවේ කාර්ය භාරයක්. මේ සියලුම ගනුදෙනු කළේ විනිවිදභාවයෙන්.

එදා පාර්ලිමේන්තුවේදි අපි කියපු එකක්වත් වැරදියි කියලා අපි කියන්නේ නැහැ. ආණ්ඩුව ගත්තු තීන්දුවක් ප්‍රකාශ කළේ. ඉදිරියටත් එහෙමයි. මේ එකක්වත් වහන්න දෙයක් නැහැ. හෝටල්වලට ඉඩම් දීලා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සතයක්වත් අරගෙන නැහැ. සංචාරක මණ්ඩලය සතයක්වත් අරගෙන නැහැ. ඒවා ඔක්කොම භාණ්ඩාගාරයටයි ගිහිල්ලා තිබෙන්නේ. එදා සිංහ රෙජිමේන්තුවට තිබිච්ච ඉඩම්වලට රුපියලක්වත් දුන්නේ නැතිව, ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ආටිගල මහත්තයාට කිව්වා දින පහක් ඇතුළත අයින් වෙන්නය කියලා. හමුදාවට එක රුපියලක්වත් දුන්නේ නැහැ. Sri Lanka Cement Corporation එක තිබුණේ නිදහස් චත්‍රරශ්‍රය ළඟ. ඒ වෙලාවේ හැටියට ආටිගල මහත්තයා හමුදාවත් අරගෙන ඒ ඉඩමට ගියා. අර ඉඩම දුන්නා, ඉන්ටර්කොන්ටිනෙන්ටල් හෝටලයටයි ටාජ් හෝටලයටයි. ඒකෙදි හමුදාවට රුපියලක්වත් ලැබුණේ නැහැ. හැබැයි ආයෝජනයක් බව අපි පිළිගන්නවා. අපි ආයෝජනයට විරුද්ධ නැහැ. නමුත් මොකක්ද මේ කරන්නේ? මේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා මේ රටේ ආයෝජකයන් බිය කරනවා. මේ රටට එන විදේශීය ආයෝජකයන් බිය කරනවා. රටවල් බිය කරනවා. ඒකයි මේ රටට කරන අපරාදය. අපරාදයක් මේ කරන්නේ. නොදැන නොවෙයි මේ අපරාදය කරන්නේ.

ෂැන්ග්‍රි-ලා සමාගම මේ රටට එනකොට -Shangri-La in Sri Lanka කිව්වාම- විශාල මතයක් තිබුණා. ඒක නිසා තමයි කැටික් එක ඇවිල්ලා ඩොලර් මිලියන 1.5ක් වැඩියෙන් ඉඩම ගත්තේ. මේ ඉඩම් වැඩි මිලට ගත්තේ ඒකයි. හැබැයි අපි ලෝකයට අවිශ්වාසයක් ඇති කරනවා නම් -මේ ඉඩම්වල ඔප්පුව අපි දෙයිද, මේ විරුද්ධත්වයන් ප්‍රකාශ කරන කොට අපි තව සැරයක් සලකලා බලයිද, අපි මේවාට පරීක්ෂණ තියයිද, අපි මොකක්ද කරන්නේ, අපි ආයෙත් මේ ගැන අහයිද කියා අවිශ්වාසයක් ඇති කරනවා නම්- ආයෝජකයෝ මේ තරම් ආයෝජනය කරන්න කැමැති වෙන්නේ නැහැ. ඒ නිසා විරුද්ධ පක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන දේ තමයි අපි කවුරුත් එක්කහු වෙලා මේ රටේ මේ බැරෑරුම් අවස්ථාව ඉවර වුණාම මේ රටට මේ ආයෝජනය ගෙනෙන එකට උදවු කරන එක. මේ ෂැන්ග්‍රි-ලා සමාගම ගැන ප්‍රශ්නයක් නැහැයිලු. මොකද, ප්‍රශ්නයක් නැත්තේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ෂැන්ග්‍රි-ලා සමාගමේ නියෝජිතයෝ ගිහිල්ලා හම්බ වුණා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා. විපක්ෂ නායකතුමා හම්බ වුණා. හම්බ වුණු නිසා ප්‍රශ්නයක් නැහැ. කැටික් සමාගමේ අයට යන්න බැරි වුණා. එක්කෝ කැමති නැති නිසා ගියේ නැහැ. මේ නිසා ෂැන්ග්‍රි-ලා හොඳයි, කැටික් එකේ ගනුදෙනුව හොඳ නැහැ. අක්කරයකට ඩොලර් මිලියන 1.5ක් වැඩි වෙච්ච ගනුදෙනුව හොඳ නැහැ, ඒ ගනුදෙනුව ගැන ප්‍රශ්නයක් තියෙනවා. හැබැයි ඩොලර් මිලියන 12.5ට ඩොලර් මිලියනයක් අඩුවෙන් අක්කරයක් දෙන කොට ඒකට ප්‍රශ්නයක් නැහැ, අරකට ප්‍රශ්නයක් තිබෙනවා. ඒකටත් මුලදී ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මම දන්නේ නැහැ, මොනවා හරි අරමුදලක් තියෙනවාද කියලා; අරමුදලකට මේවා එක්කහු කරන්න හදනවාද කියලා. නමුත් පළමුවෙනි දේ හැටියට හිතා ගන්න ඕනෑ මේ ආයෝජනය ගේන්නේ මේ රටටයි කියන එක.

මේ ගනුදෙනුව පිළිබඳව කාටවත් ඇඟිල්ල දික් කරන්න බැහැ. මේ ගනුදෙනුව පිළිබඳව භාණ්ඩාගාරයට ආපු ලේඛන -චෙක් අංකයේ ඉඳලා- මේ පාර්ලිමේන්තුවේ සභාගත කර තිබෙනවා. එතකොට එතුමා කිව්වා, මම මේ පාර්ලිමේන්තුවේදි කිව්වා කියලා. මම පාර්ලිමේන්තුවේ අනුමැතිය අරගෙනලු. නැහැ. මම කිව්වේ අපි එදා විවාදයේදී පාර්ලිමේන්තුව දැනුවත් කළා කියලායි. ඒ නිසා අපි අදත් එදා කියපු එක කියනවා. අපේ ස්ථාවරය මේකයි.

මොකක්ද මේ අවුරුදු 99යි, අවුරුදු 100යි කියන්නේ? අවුරුදු 100ක් කියලා කිව්වොත් ඔප්පුවක් ලියන්න ඕනෑ, විකුණන්න ඕනෑ. අනූනව අවුරුද්දක් කිව්වොත්, ඒක බදු. හැබැයි එකම අලාභය තිබෙන්නේ ඉඩමක් විකුණන කොට විශාල මුදලක් එන එක නැතිව යන එකයි. ඉඩමක් 99 අවුරුදු හෝ 30 අවුරුදු බද්දකට යනකොට අර ගනුදෙනුකාරයාට පුළුවන් පොඩි කාල සීමාවක් නිසා ඒ ගනුදෙනුව අඩුවෙන් කර ගන්න. ඒක තමයි මේ සිදු වෙලා තිබෙන්නේ. මට පෙනෙන විධියට පළමුවැනි දේ ආයෝජකයන් බිය කිරීමයි. යුද්ධ කාලයේදී එච්එස්බීසී බැංකුවටත් මේකම කළා. ආණ්ඩුවට සල්ලි දෙන්න එපා කියලා ඒ බැංකුවට ලියුමක් ලිව්වා. ඒ විතරක් නොවෙයි. ලෝකයේ කිසිම රටක විපක්ෂයක් කියන්නේ නැහැ, ආණ්ඩු බලයක් ආවාම ඒ සල්ලි ගෙවන්නේ නැහැයි කියලා. විපක්ෂයක් එහෙම කරන්නේ නැහැ. මොකද, විපක්ෂය ආණ්ඩු බලයට පත් වුණාට පස්සේ ඒ අයටත් ඒ වගකීම තිබෙනවා. ඒ වග කීමෙන් බැහැර වෙලා ආණ්ඩුවට සල්ලි දෙන්න එපා කියලා එච්එස්බීසී බැංකුවට ලියුමක් ලිව්වා. ලිව්වේ නැහැයි කියනවාද? අපි ඒ ගත්ත ණය අද වන විට ගෙවලාත් ඉවරයි. ඒකෙන් රටට මොකක්ද වුණේ? එච්එස්බීසී බැංකුව අපට සල්ලි දුන්නේ සියයට 9 පොලියටයි. අඩු පොලියට රටට ගන්න තිබුණු සල්ලි. වාසනාවට මේ රටේ යුද්ධය ඉවර වුණා. අපි ඒ අර්බුදත් එක්ක මේ රට අර ගෙන ආවා.

අද තිබෙන්නේ මේ රටට ආයෝජකයන් ගෙන්වලා අවුරුදු තුන හතරක් ඇතුළත මේ විශාල වෙනස කරන්නයි. පසු ගිය අවුරුදු කිහිපය ඇතුළත ඒ පරිවර්තනය මේ රටේ සිදු වෙලා

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

තිබෙනවා. ඒ විතරක් නොවෙයි. යටිතල පහසුකම් සම්පූර්ණ කර ගෙන යනවා. බාධාවක් නැතිව මහා පරිමාණයේ ආයෝජන රටට ගේන්න පුළුවන් තත්ත්වයක් දැන් තිබෙනවා. හැබැයි, මෙහෙම barriers දැම්මොත්, පාර්ලිමේන්තුවේ ඉඳ ගෙන, රූපවාහිනියට ගිහිල්ලා, websitesවලට යවලා මේවා ගැන මතයක් ඇති කළොත් ඒක මේ රටට කරන රාජකීය අපරාධයක්. මේක නොදැන කරනවා නොවෙයි. මේක එන්නේ එක පැත්තකින්. ඒක අපි දන්නවා. ඒක උඩහින් එන්නේ. ඒ හස්තයන් තමයි මේ ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා පොළොවේ පය ගහලා ජීවත් වන දේශපාලනඥයෝ මේ රටේ ඉන්නවා නම්, මේක අපේ රට බව ඒ දේශපාලනඥයෝ දැන ගත යුතුයි.

ඉන්දුනීසියාව අර ගෙන බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දුනීසියාවේ තෙල් කර්මාන්තයෙන් සියයට 7ක් දළ දේශීය නිෂ්පාදනයට එකතු වනවා. එතකොට වාර්ෂික අය වැයේ ආදායම සියයට 25කින් ඉහළ යනවා. ගවේෂණ කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් ඉන්දුනීසියාව වැය කරනවා. එහෙම වැය කරන්න අපට පුළුවන්ද? ඒ නිසා අපි ඒ සමාගම සොයලා, ඒ සමාගම මන්නාරම් ද්‍රෝණියට ඇවිල්ලා ඇමෙරිකානු ඩොලර් මිලියන 110ත් 112ත් අතර ප්‍රමාණයක් වියදම් කරලා අද ගවේෂණ කටයුතු කරනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, please wind up now.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපි මේ පනත යටතේ නියමය ගෙනාවේ බදු පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නයි. ආණ්ඩුව විනිවිදභාවයකින් මෙවැනි බදු සහන දෙන්නේ සමාගමේ ගවේෂණ කටයුතුවලට පමණයි. උප කොන්ත්‍රාත්කරුවන්ට හෝ වෙනත් කිසිම කෙනකුට බදු සහනයක් දෙන්නේ නැහැ. මේ තුළින් ඍජුව සහ වක්‍රව රක්ෂා ලක්ෂ තුනක් ඇති වනවා. මේ කැණීම් කටයුතු ලබන සතියේ පටන් ගත්තොත් ඒ එක්ක ඒ ප්‍රදේශයේ ජනතාවගේ ට්‍රැක්ටරයේ ඉඳලා හැම භාණ්ඩයක්ම යොදවන්නට අවස්ථාව ලැබෙනවා, වාගේම ඒ මඟින් ඍජු සහ වක්‍ර රැකියා ඔවුන්ට ලැබෙනවා. ඒ නිසා තමයි මේ ආයෝජනය කඩිනමින්ම රටට ගේන්න අපට වුවමනා වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි රටක් හැටියට නැඟිටින්න අවශ්‍යයි. මේ ආණ්ඩුවේ කාලසීමාව ඇතුළත අපේ රටේ තෙල් ලැබේවිය කියලා අපි හිතනවා. එහෙම තෙල් ලැබුණොත්, කොහොමත් අවුරුදු තිහක් තිබෙන මේ ආණ්ඩුවට තව අවුරුදු පණහක් හැටක් ඉස්සරහට යන්න පුළුවන්ය කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[4.12 p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Mr. Deputy Chairman of Committees, for giving me this opportunity to partake in this Debate with regard to the Order that has been placed before this House under the Strategic Development Projects Act, No. 14 of 2008.

The proposition of the Government seems to be that nothing is shrouded in secrecy, the tax exemptions that are sought to be granted are laid before this House and therefore there is transparency with regard to the beneficiaries and in this case the oil exploration companies that have been given the task to perform oil exploration in the Mannar Basin and that there is a clear disclosure to this Parliament and to the public as to the strategic importance of these projects and in inviting these contractors to come and invest in oil exploration projects.

This Act, that is, the Strategic Development Projects Act, only enables the Minister to make orders with regard to exemption from applicability of certain taxation provisions. Once a project has been identified as a strategic development project, then Cabinet approval is given and then the Hon. Minister can place before this House his proposals with regard to these exemptions. But, these Acts do not say anything with regard to the choice of the contractor, as to how bids are to be received, as to how the tenders are to be evaluated and how the prospective bidders are chosen. The other provisions of law that apply to projects with regard to the choice of contractors will apply, but unfortunately in this instance, with regard to the Mannar Basin, the choice of contractors who have been granted these different blocks that have been given for oil exploration, as I said before, has been shrouded in secrecy. There have been no bids; there have been no tenders called. Initially the TGS-NOPEC was given the task of doing a survey at their own cost and then to sell that data to prospective oil exploration companies to recover their investment.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)
I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, now you can proceed.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Sir. And, then, any further profit was to be shared with the Government of Sri Lanka. This Agreement with the TGS-NOPEC was signed in the year 2002. But, that was not what happened. Although the contract provides that subsequent to selling the data to prospective oil exploration companies, any further profit was to be shared with the Government of Sri Lanka, that was not honoured. They did the survey, sold the data to two oil exploration companies at a cost of US Dollars two million each and then, in a strange twist of events, the then Minister of Petroleum and Petroleum Resources Development decided to buy that data back from the TGS-NOPEC for a sum of US Dollars 10 million. So, the country lost US Dollars 10 million for nothing even though in 2002 under the previous regime, a careful contract had been signed whereby any further profits by the TGS-NOPEC was to be shared with Sri Lanka. But, for some reason, that did not come to pass. Even for Sri Lanka to obtain that data from the TGS-NOPEC, a sum of US Dollars 10 million had to be paid and not only that, that data is not used as of date and the Government is spending further sums annually to store that data in Perth, Australia because they cannot keep it here. There is no facility in Sri Lanka to store that data. So, having bought that data from the TGS-NOPEC for such a sum as high as US Dollars 10 million, to date we are paying further sums to store it in Australia.

Thereafter, two blocks were decided to be offered to two foreign States, not companies, but to two foreign States. Now, this is again in violation of the rules and laws. As I said earlier, there must be a tender procedure. That is the general rule. The Strategic Development Projects Act does not exempt any particular lease procedures from that general rule and these two blocks were given to two competing States in the region, perhaps to keep a balance: one to India and the other to China. Nothing whatsoever was gained from the nomination or gifts to these two States and until December, 2007 no exploration was done. The Petroleum Resources Development Secretariat then started putting out roadshows for marketing these other blocks to foreign companies and several million rupees were spent on those roadshows. These were held in London, in Houston and in Kuala Lumpur.

A formal bid notice was issued and the bids were closed on 31st January, 2008. Although what was told was that there were several bids, in fact, that was kept in the dark, no guidelines were issued and only three bids were received. That is very strange because in the public realm, the Minister was quoted that 200 oil companies were interested. But, in fact bids were received only from three companies. This is the background in which these different blocks in the Mannar Basin are being awarded to companies for the purpose of oil exploration and today we are debating the exemption from tax to those companies.

So, as I said, Sir, at the outset, I am not challenging the fact that in inviting foreign companies to perform an operation such as oil exploration, that you have to attract them with good tax structures and that these exemptions are necessary. I am placing before this House this question as to how these three companies or one out of these three came to be chosen. I am placing before this House the question as to how two States were gifted different blocks ostensibly for oil exploration because no oil exploration has been done there and we really do not know what they are doing from those strategic positions. So, these are the questions that we raise when this Order made by the Minister in terms of the Strategic Development Projects Act, No. 14 of 2008 is placed before this House. I wish some answers are given at this Debate itself with regard to these serious questions that are being raised.

There were other concerns raised by some other speakers this afternoon with regard to a sale of land and the desirability *vis-a-vis* a sale and a lease. Before I sit down, I want to raise a somewhat different issue but again with regard to land. Now, here we are discussing the Mannar Basin for oil exploration. That is in the Northern Province, in the District of Mannar. Now, we have been confronted with the Circular No. 2011/04 issued by the Lands Commissioner General's Department, which makes a distinction between lands that are situated in the North and East of the country and the rest of the country. We all know that the Northern and the Eastern Provinces although are said to be equal to the other provinces, are not as equal as the other provinces, and this is yet another reminder of the inequality that is made part of the system. Now, in terms of this Circular, alienation of all State lands is suspended forthwith. There is a totally different set of rules that are being brought in, the justification being that since people have been displaced and are coming back, there maybe different land claims and to resolve those claims, a new system is being put into place. But, this has been done in a totally arbitrary manner. Committees have been established with regard to checking titles, resolving disputes of land ownership and in those committees, you find military personnel being appointed. I can understand such a situation when there is some kind of conflict raging. The Government's claim is that the conflict or the violence or the fighting has been brought to an end - and which is true - more than two years ago. After the conclusion of that war, if there are disputes with regard to land ownership - and there will be - particularly, when people have been displaced and come back to reclaim their land, systems must be established. But, those are civilian

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

functions. Those are not functions that the military personnel need to get involved in and we take serious exception to this Circular that has come about, which is only applicable to the Northern and the Eastern Provinces, not to the other provinces; the entirety of the Northern Province and the entirety of the Eastern Province where military officers are being given the power to determine or resolve civil disputes with regard to land. We know that for both these provinces, the Governors who have been appointed are retired military personnel. The Government which continuously says that civil administration is being restored and assures and reassures us of that, continues in this vein and now, a further reversal is this new circular that has been issued. I urge the Government to withdraw this Circular. There have been studies by the United Nations bodies - the United Nations High Commissioner for Refugees - in 2002 and 2003 during the time of the Ceasefire Agreement, when detailed provisions were suggested as to how one can determine or resolve such disputes and I urge the Government to look at those provisions without resorting to military means all over again with regard to potential civil disputes.

I am bringing this to the notice of the Government with the hope that some sense will prevail. I see only two Cabinet Ministers in the House, the Hon. Minister (Senior) is resting. [*Interruption.*] Nevertheless, I hope the message will be taken. I hope the Hon. Minister (Senior) who is very conversant with land issues, particularly in the Ampara District, will take this message to the Government. His district is also affected being part of the Eastern Province.

So, Sir, in winding up, I hope the concerns that I have raised with regard to the granting of the rights for oil exploration, the choice of the companies, the decision to gift blocks of lands to two States and also with regard to the other concern that I have raised in respect of land alienation and land dispute resolution in the Northern and the Eastern Provinces, will be explained in this House,
Thank you very much.

[අ. භා. 4.30 ]

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජාතික ආර්ථිකයට ඉතාම වැදගත් පනත් දෙකක නියමයන් දෙකක් අද මේ ගරු සභාවට ඉදිරිපත් කර සාකච්ඡා කරන අවස්ථාවේදී මටත් අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට අපේ ස්තුතිය පුද කරනවා.

අපි කවුරුත් දන්නා කාරණය තමයි, අද වන කොට අවුරුදු 30ක ශාපලත් යුද්ධය අවසාන වෙලා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු වන බව. අද ගම් දනව්වල ඇවිදින කොට, සැරි සරන කොට අපට පෙනෙනවා, අපේ ගමේ පාරවල් හැදිලා, වරායවල් හැදිලා, ගමේ මිනිසුන්ගේ ආර්ථිකය ශක්තිමත් වෙලා, මිනිසුන්ට ජීවත් විය හැකි ආකාරයේ රටක් අද නිර්මාණය වේ ගෙන යන බව. හැබැයි, මේ සියලු කාරණා මෙහෙම සිදු වුණත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජාතික ආර්ථිකයෙන් සියයට 15කට එහා මුදලක් ඛනිජ තෙල් සඳහා අපට වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ අද අලුත් වැඩකට අපි අත ගහලා තිබෙනවා. මේක අලුත් වැඩක් කිව්වාට මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, ලංකාවේ ඛනිජ තෙල් පර්යේෂණ පිළිබඳව අපට තිබෙන්නේ බොහොම ඈතට ගිය අතීතයක්.

1960 ගණන්වල ඉඳලාම ඛනිජ තෙල් සොයා ගැනීම පිළිබඳ පර්යේෂණ ගණනාවකට අපේ රට යොමු වෙලා තිබෙනවා. එදා 1967, 1968 දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රංශ සමාගමක් එක්ක එකතු වෙලා අපේ රටේ ඛනිජ තෙල් තිබෙනවාද කියන කාරණය පිළිබඳව සොයා බැලුවා. නමුත් ඒක ඉස්සරහාට ගියේ නැහැ. ඊට පස්සේ 1974 දී සෝවියට් දේශයේ අනුග්‍රහය ඇතිව එදා පේසාලේ ප්‍රදේශයේ ඛනිජ තෙල් තිබෙනවාද කියන කාරණය පිළිබඳව පර්යේෂණයක් කළත් අතර මඟදී ගල් හමු වීම නිසා ඒක අත හැරලා දැම්මා. ඊට පස්සේ 1975 දී නැවත වතාවක් පෙන්සොනික් ආයතනය හා සම්බන්ධ වෙලා අපේ රටේ කාවේරි ද්‍රෝණියේ ඛනිජ තෙල් තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් පර්යේෂණයක් කළා. ඊට පස්සේ නැවත වතාවක් 1981 දී සිටීස් සර්විසස් ආයතනය සම්බන්ධ කර ගෙන අපේ රටේ ඛනිජ තෙල් තිබෙනවාදැයි කියලා ගවේෂණයක් කළා. ඊට පස්සේ 1984 දී සීමාසහිත ෆිනික්ස්-කැනඩා තෙල් සමාගම සහ පෙට්‍රෝ-කැනඩා සමාගම මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් තිබෙනවාද කියන කාරණය පිළිබඳව ගවේෂණ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊ ළඟට 2001 දී ටීජීඑස් නොපෙක් සමාගම මන්නාරම් ද්‍රෝණියේ ඛනිජ තෙල් පිළිබඳව ගවේෂණය කරලා එහි තෙල් තිබෙනවාය කියන මතයට ඒමට හැකි ආකාරයේ දත්තයන් හොයා ගෙන තිබෙනවා. නමුත් මේ කිසිදු සමාගමකට නිසියාකාරව තමන්ගේ වැඩ පිළිවෙළ ගෙන යා හැකි දේශපාලන නායකත්වයක් ඒ කාලයේ ලබා දුන්නේ නැහැ. අපි දන්නවා ඒ කාලයේ ඉන්දියාවත් මේ ආකාරයටම ගවේෂණ කර ගෙන ගිය බව. නමුත් ඉන්දියාව තමන්ගේ ගවේෂණ කිසිම ආකාරයකින් නැවැත්වූයේ නැහැ. ඉන්දියාව තමන් ඒ කර ගෙන ගිය ගවේෂණය ඒ ආකාරයෙන්ම කර ගෙන ගිහිල්ලා අද වන කොට ඔවුන් ඛනිජ තෙල් නිෂ්පාදනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට මේ සම්බන්ධයෙන් නව මාවතකට යොමු වන්නේ 2008 අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ සීමාසහිත කෙයාන් ඉන්දියා සමාගම සමඟ අත්සන් කරන ලද ගිවිසුමත් එක්කයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගිවිසුම හිතූ හැටියේ අත්සන් කරන ලද්දක් නොවෙයි. මේ සම්බන්ධයෙන් අපි ළඟ තිබුණු දත්තයන් පිට රටවලට අරගෙන ගිහිල්ලා, ඒ පිට රට සමාගම් දැනුවත් කරලා නියමිත ටෙන්ඩර් පටිපාටියකින් තමයි කෙයාන් සමාගමට මේක දීලා තිබෙන්නේ. ඒ නිසා අද කෙයාන් සමාගමට ඒ ලබා දිය යුතු බදු සහනයන් පිළිබඳව ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා මේ ගරු සභාව දැනුවත් කරලා, ඒ සම්බන්ධයෙන් අපේ රටේ ජනතාව දැනුවත් කරන්න තමයි 2011 අප්‍රේල් 29 දිනැති ගැසට් පත්‍රයේ පළ කළ ඒ නියමය අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමත කරන්න කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමා බොහොම වාසනාවන්ත කෙනෙක්. කාලයක් තිස්සේ අපට ශාපයක් වෙලා තිබුණු යුද්ධය අවසාන කරන්න පුළුවන් වෙයි කියලා කවුරුවත් හිතුවේ නැහැ. එදා ඇමෙරිකාව පවා කිව්වේ ප්‍රභාකරන් අපේ රට යටත් කර ගනීවි කියලා. නමුත් අපි දන්නවා,

කාලයක් තිස්සේ තිබුණු මේ යුද්ධය අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අවසාන කරන්න අපට පුළුවන්කම ලැබුණු බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාගේ වාසනාවට, අපේ රටේ වාසනාවට එතුමාගේ පාලන කාලය තුළදී අපේ රටෙන් ඛනිජ තෙල් හම්බ වෙනවා කියන කාරණය අපි බොහොම වග කීමෙන් කියන්න ඕනෑ. අද ඒ සම්බන්ධයෙන් තොරතුරු ලැබී තිබෙනවා. ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අද මේකට නායකත්වය ලබා දෙනවා. එතුමා බොහොම කැපවීමෙන් තමන්ට පැවරී තිබෙන වගකීම් බොහොම හොඳින් අවබෝධ කර ගෙන ඒ සඳහා නායකත්වය දෙන දේශපාලන නායකයෙක්.

ඉතින් අද අපි දැක්කා, විරුද්ධ පක්ෂයේ අපේ සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ ආකාරයේ චෝදනා කරනවා. අපි දකින දේ ඕක තමයි. අපි දැක්කා එදා යුද්ධය තිබෙන කාලයේත් ඒ යුද්ධය කර ගෙන යෑමේදී නොයෙකුත් පරිහවයන් කළා. "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියලා කිව්වා. මම හිතන්නේ එදාත් විපක්ෂය අපේ රටේ යුද හමුදාවට බොහොම සමච්චල් කළා. තෙල් ගවේෂණය කිරීමත් අද ඒ අය සමච්චලයට ලක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතින් අපි බොහොම වග කීමෙන් කියන කාරණය තමයි, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ -අපේ රජයේ- මේ වැඩ පිළිවෙළ යටතේ මේ කාර්යය අද එනම් අගෝස්තු 10 වෙනිදා පටන් ගන්නවා කියන එක. අද වෙන කොට මන්නාරම් ද්‍රෝණියට ඒ අදාළ යාත්‍රාව ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වැඩ පිළිවෙළ පටන් ගන්න කොටම අපේ රටට ආර්ථික වාසි ලැබෙනවා. මොකද, මේ අදාළ සමාගමට සේවා සපයන්නේ අපේ රටේ උදවිය. අපේ ගම්වල උදවියගෙන් තමයි ඒ අය සේවා ලබා ගන්නේ. එතකොට එයින් අපේ ජනතාවට විශාල ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙනවා. ඒ නිසා ඉදිරි අවුරුදු ගණනාව තුළදී මේ පර්යේෂණ කටයුතු සාර්ථක වුණාට පස්සේ අපේ ආර්ථිකය ඉතාම ශක්තිමත් වෙනවා කියන කාරණය මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අනුමතිය සඳහා ඉදිරිපත් කරන අනෙක් යෝජනාව වන්නේ, 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදන ලදුව, 1964 ඔක්තෝබර් 1 වැනි දින අංක 14186 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ (v) වැනි කොටස සංශෝධනය කරමින්, එම පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සාදන ලද නියමය අනුමත කිරීමයි. මෙහිදී විශේෂයෙන්ම අදහස් කරන්නේ අපේ රටේ ධීවර කර්මාන්තය ඉදිරියට ගෙන ඒමටයි. අපේ රට යුද්ධයෙන් නිදහස් වුණාට පස්සේ උතුරු නැඟෙනහිර සාගර කලාපය අද අපේ රටේ ධීවරයාට අයිති වෙලා තිබෙන බව අපි දන්නවා.

අපේ රට ඉන්දියන් සාගරයෙන් වට වුණු දූපතක් වුණාට අපට එදා සම්පූර්ණයෙන්ම සාගරයේ අයිතිය තිබුණේ නැහැ. ඒක අපි පිළිගන්න ඕනෑ. එල්ටීටීඊ සංවිධානය ඉතාම බලවත් ආකාරයට උතුරු නැඟෙනහිර පාලනය කළා. නමුත් අද වෙන කොට අපේ රටේ තිබෙන සාමකාමී තත්ත්වය නිසා උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ධීවරයින්ට නිදහසේ තමන්ගේ ධීවර රැකියාව කර ගෙන යන්න පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වාගේම ධීවර අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට මම කියන්න ඕනෑ, අපේ ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා සහ එම අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු ඒ සියලු දෙනා ධීවරයා ශක්තිමත් කරන්න අද විශාල මහන්සියක් ගන්නා බව. අපේ රටේ මිනිස්සුන්ගේ ප්‍රෝටීන් අවශ්‍යතාව ලබා ගන්න වැඩිපුරම භාවිතා කරන්නේ මත්ස්‍ය සම්පතයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ කටයුත්ත මඟින් කෙරෙන්නේ අපේ රටේ මිනිස්සු ශක්තිමත් කරන්න, ඒ ධීවර කාර්මිකයා ශක්තිමත් කරන්න, ධීවර සංස්ථාව ශක්තිමත් කරන්න ඒ ගන්නා වූ වැඩ පිළිවෙළට විවරණයක් ලබා දීමයි. ඒ නිසා අපි අද කිසිදු සැකයකින් තොරව කියනවා, එක්සත් ජනතා නිදහස් සන්ධානය මේ ගෙන යන්නා වූ ජනතා හිතවාදී වැඩ පිළිවෙළ යටතේ ඉදිරිපත් කරන්නා වූ මේ නියමයන් තුළින් අපේ රටේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් වෙනවාය අපේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවාය කියන කාර ණය. විරුද්ධ පක්ෂය මොනවා කිව්වත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධාන නායකත්වය යටතේ, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපේ රටේ ආර්ථිකය ඉතාමත් සශ්‍රික වනවාය කියන කාරණය මේ අවස්ථාවේ ප්‍රකාශයට පත් කරන අතර ඔබතුමාට මගේ ගෞරවණීය ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 4.40]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ඉදිරිපත් කර තිබෙන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය තුළින් බදු සහන සම්බන්ධයෙන් අපි කථා කරන මේ අවස්ථාවේ ආණ්ඩුවේ ප්‍රධාන ඇමතිවරුන් කිහිප දෙනෙක් මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අදහස් ප්‍රකාශ කිරීමේදී විශේෂයෙන්ම අවධානය යොමු වුණේ මේ තෙල් කොතරම් වටිනා සම්පතක්ද, ආර්ථිකයට කොයි ආකාරයෙන් බලපානවාද කියන සාධක සම්බන්ධයෙනුයි. ඒ පිළිබඳ අදහස් ගොඩක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. තෙල්වල වටිනාකම සහ ආර්ථිකයට මෙය කොයි ආකාරයෙන් බලපානවාද කියන එක සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව, දේශපාලන භේදයකින් තොරව සියලු දෙනා අදහස් දැක්වූවා.

අද ලෝකයේ ආර්ථික සම්ප්‍රදාය වෙලා තිබෙන්නේ තෙල් හරහා තමන්ගේ ආර්ථිකය දියුණු කරන ක්‍රමයකට තමන්ගේ ආර්ථිකය හසුරුවා ගන්නා ක්‍රමයක් අනුගමනය කිරීමයි. එවැනි ක්‍රමයක් තමයි අද ලෝකයේ සියලුම දියුණු රටවල අපට දකින්න ලැබෙන්නේ. මීට අමතරව මේ දියුණු රටවල් අද බලනවා වෙනත් බලශක්තිවලට තමන්ගේ අවධානය යොමු කරලා මේ තෙල් පදනම් වුණු ආර්ථිකයෙන් මිදී තමන්ගේ ආර්ථිකය තාක්ෂණික දියුණුවත් සමඟ ඉදිරි අනාගතයට ගෙන යන්න. ඉතින් තෙල් සම්බන්ධයෙන් අපේ ප්‍රශ්නයක් නැහැ. තෙල් කොච්චර මේ ආර්ථිකයට වටිනවාද, අපේ රට කොයි ආකාරයෙන් හෝ මේ තෙල් ලබා ගැනීම සිදු කළ හොත් කොතරම් සංවර්ධනයක් මේ රටට අත්කර ගන්න පුළුවන්ද කියන කාරණය සම්බන්ධයෙන් අපේ විවාදයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පක්ෂයේ මන්ත්‍රීවරු විශාල ගණනක් ආණ්ඩු පක්ෂයේ හිටියත් ත්‍රස්තවාදය අවසන් වීමත් සමඟම නොයෙකුත් චෝදනා එක්සත් ජාතික පක්ෂයට ඉදිරිපත් වුණා නොයෙකුත් අවස්ථාවල. හැබැයි යුද්ධයට එක්සත් ජාතික පක්ෂයේ දායකත්වයත් ලබා දුන්නා. නැඟෙනහිර කැඩීම තුළින් කරුණා, පිල්ලෙයාන් හන්දහසකට අධික ප්‍රමාණයක් කඩලා සරත් ෆොන්සේකා මහත්තයාට හෝ වේවා, ජනාධිපතිතුමාට හෝ වේවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට හෝ වේවා, යුද්ධය ජයග්‍රහණය කරන්න ඒ අවශ්‍ය පදනම ලබා දෙන්න එක්සත් ජාතික පක්ෂය විශාල කාර්ය භාරයක් සිදු කළා. අද අපි පසු වන්නේ ඒ යුද සමයේ නොවෙයි. ඒ යුද සමය අවසන් කරලා අවුරුදු දෙක හමාරක් ගිහිල්ලා ලෝකය ඉතා විශාල සංවර්ධනයක් ලබන අවස්ථාවක මහඟු කාර්ය භාරයක් පැවරිලා තිබෙනවා මේ ආණ්ඩුවට. යුද්ධය ගැන කථා කරන්නවත් පසු ගිය අවුරුදු 60 තුළ මේ රටේ සිදු වුණු ව්‍යසනයන් සම්බන්ධයෙන් කථා

[ගරු සුජීව සේනසිංහ මහතා]

කරන්නවත් නොවෙයි, විනිවිද භාවයකින් යුතුව නීතිය හා ප්‍රජාතන්ත්‍රවාදය අගය කරමින් ඒ සාධක තුළ මේ රට දියුණු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ ආණ්ඩුවේ අවධානය අද යොමු කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

මෙම තෙල් සම්පත සම්බන්ධයෙන් නොයෙකුත් අදහස් ඉදිරිපත් කළා. 1970 ගණන්වල ඉඳන් තෙල් සම්පත සම්බන්ධයෙන් පර්යේෂණ කළා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තමයි මේ ලෝකය දියුණු වන අවස්ථාව. අභ්‍යවකාශය සම්බන්ධයෙන් වුණත් මීට පෙර කොච්චර පරීක්ෂණ කළත් මේ කාලයේ එහි දියුණුවක් දකින්න ලැබෙනවා. එක් කාලයක දැන ගන්න ලැබුණා ඒ අභ්‍යවකාශ පරීක්ෂණවලින් සඳු තරණය කරන්න, ඒ වාගේම අනෙකුත් ග්‍රහලෝකවලට යන්න හැකියාව තිබෙන බව. ඊයේ පෙරේදා මට දැන ගන්න ලැබුණා ජුපිටර් ග්‍රහ ලෝකයටත් යානාවක් යවන්න පුළුවන් හැකියාව ඇමෙරිකාව අද ලබා ගෙන තිබෙන බව. ඉතින් මේ ආකාරයෙන් නොයෙකුත් ආණ්ඩු නොයෙකුත් කාලවකවානුවල මොන පරීක්ෂණය කළත් මේ කාලය තමයි ලෝකයේ නොදියුණු රටවල්, විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටවල් මේ තෙල් සම්බන්ධයෙන් උනන්දුව ඇති වෙලා විදේශ රටවල ආධාර ලබා ගෙන කටයුතු කරන අවස්ථාව. මේ තෙල් සම්පත අපේ රටේ වට පිටාවේ තිබෙනවා නම් කොයි ආකාරයෙන් අපි මේක ප්‍රයෝජනයට ගන්නවාද කියන එක සම්බන්ධයෙන් සිතා බලා කටයුතු කරන්න ඕනෑ කාලවකවානුව මේකයි. මොන ආණ්ඩු මොන කාලවල පර්යේෂණ කළත් මේ අවුරුදු 4, 5 තුළ තමයි මේ මාතෘකාව සම්බන්ධයෙන් විශේෂයෙන් අපට කථා කරන්න අවස්ථාව ලැබුණේ.

මටත් මතකයි, ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් 2004 - 2005 කාලයේ එංගලන්තයෙන් පැමිණි අවස්ථාව. ඒ සම්බන්ධයෙන් මටත් උනන්දුවක් තිබුණා. ඇත්තටම ඒ කාලයේ තෙල්වලට වඩා ගෑස් සම්බන්ධයෙන් තමයි උනන්දුව තිබුණේ. යම් කිසි ආකාරයකින් අපට ඒ ගෑස් නිධි හඳුනා ගන්න පුළුවන් නම් මේ රටට විශාල සංවර්ධනයක් ලබා ගන්න පුළුවන්. ඒ අවස්ථාවේදී ඒ ආයතන අදහස් ඉදිරිපත් කරලා තිබුණා. ඒ තෙල් ලබා ගන්නේ කොහොමද, ඒ සඳහා ආයෝජනය කරන්නේ කොහොමද, ඒවාට අපි යොමු වන්නේ කොහොමද කියන ප්‍රශ්නය සම්බන්ධයෙන් 2001, 2002, 2004, 2005 යන කාලවල සාකච්ඡා කරලා, අද එය ක්‍රියාවට නංවන්න මේ ආණ්ඩුව ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඇත්තටම මේ කටයුත්ත අපට සිදු කරන්න තිබුණේ අවුරුදු දෙකකට, අවුරුදු තුනකට කලිනුයි. මේ වන කොට ඉන්දියාව මන්නාරම අවට ප්‍රදේශවල තෙල් නිධි, ගෑස් නිධි සොයා ගෙන තිබෙනවා. ඒ වාගේම ලංකාවේ භූ විෂමතාව අනුව විශේෂයෙන්ම බංග්ලාදේශයට පවා ඒවා ව්‍යාප්ත වනවා. සාමාන්‍යයෙන් අප රට වටේ විශාල භූමි ප්‍රමාණයක් ඒ මුහුදු තීරයට හිමි වන්නේ නැහැ. හැබැයි මන්නාරම් බොක්කේ තිබෙන ස්වරූපය අනුව බංග්ලාදේශය ළඟට යන තෙක් මේ මුහුදු තීරය දික් වනවා. අවුරුදු එකහමාරකට, අවුරුදු දෙකකට කලින් මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා තෙල් ලබා ගන්න කටයුතු කරලා තිබුණා නම් අපට විශාල වාසියක් ලැබෙනවා. අපේ ප්‍රමාදය තුළින් අද ඉන්දියාවට විශාල වාසියක් සිද්ධ වෙලා තිබෙනවා. අපේ නිධිවල තිබෙන තෙල් ප්‍රමාණය ඇද ගන්න ඉන්දියාවට හැකියාව ලැබී තිබෙනවා. විශේෂයෙන්ම මේ කයින්ස්, නැත්නම් කේන් සමාගම මාර්ගයෙන්. මේ සමාගමේ නම කොහොම කියනවාද මා දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කේන් සමාගම.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ ලකුණුගත කර තිබෙන ආකාරය බැලුවාම කේන් කියන සමාගමට හිමි වන්නේ 29වන ස්ථානයයි. මේ සමාගමම ඉන්දියාවට පොඩ්ඩක් නුදුරින් ලංකාවට සම්බන්ධ මුහුදු තීරය තුළම මේ ආකාරයේ කැණීම් කරලා, දැනටත් යම් කිසි ආකාරයක තෙල් ප්‍රමාණයක්, ඒ වාගේම ගෑස් ප්‍රමාණයක් ලබා ගනිමින් සිටිනවා. පළමුවන ස්ථානය Indian Oil Corporation Limited එකටත්, දෙවන ස්ථානය ONGC එකටත්, තුන්වන ස්ථානය Bharat Petroleum Corporation Limited එකටත්, හතරවන ස්ථානය Alliance Petroleum Corporation එකටත් හිමි වනවා. මේ වාගේ විශාල ආයතන ප්‍රමාණයක් අනුගත වෙලා තිබෙන අවස්ථාවක මේ ආයතනයට හිමි වී තිබෙන්නේ 29වන ස්ථානයයි.

විරුද්ධ පක්ෂයේ -අපේ- ප්‍රශ්නය මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කළා, නිවැරදි ටෙන්ඩර් පටිපාටියකින් තමයි මෙය සිදු වන්නේ කියලා. මා වැරදි නම්, නිවැරදි කරන්න. මා හිතන හැටියට මේ පනතට අනුව ටෙන්ඩර් පටිපාටියක් නැහැ. මේ පනතින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? තමන් හඳුනා ගන්නා සමාගමකට - විනිවිදභාවයකින් තොරව, හේතුව නොදන්වා, මොන හේතුව මත ඒ ආයතනයට මේ ව්‍යාපාරය භාර දෙනවාද කියන හේතුව අපට ඉදිරිපත් නොකර, මේ ආකාරයට හිතුමතයට තෝරා ගන්නා සමාගමකට- දීමේ අයිතිය ඒ පුද්ගලයන්ට ලැබෙනවා. මෙන්න මේක තමයි, මේ පනතේ මට පෙනෙන්න තිබෙන විශේෂ ප්‍රශ්නය.

සංවර්ධනය සම්බන්ධයෙන් අපට තේරෙනවා. මෙහිදී ඇමතිවරුන් කථා කරද්දී මා හිතුවා ඇත්තටම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් තමයි කථා කරන්නේ කියලා. එක්සත් ජාතික පක්ෂයේ මතවාදය, එක්සත් ජාතික පක්ෂයේ සංවර්ධනය ගැන තමයි අද මෙතුමන්ලා කථා කරන්නේ. කලින් අපට කිව්වේ මොනවාද? අපි රටේ සම්පත් විකුණනවාය කිව්වා; රටේ සම්පත් සුද්දන්ට දෙනවාය කිව්වා; රටේ සම්පත් සුද්දන්ට බදු දෙනවාය කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු ආණ්ඩුව. හැබැයි අද කථා කරපු බොහෝ ඇමතිවරු එක්සත් ජාතික පක්ෂයේ ස්වරූපය අරගෙන තිබෙනවා. මට දැනුණේ එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන් අර පැත්තේ ඉන්නවාය, මේ පැත්තේ ඉන්නේ වෙන මන්ත්‍රීවරුන් පිරිසක්ද කියලායි. විවෘත ආර්ථිකය සම්බන්ධයෙන් හා පිට රට සමාගම්වලට මේ ආයෝජනය දීම සම්බන්ධයෙන් අද ආණ්ඩුවේ කිසි විරුද්ධත්වයක් නැහැ. අපි මේකට එකඟයි. ආයෝජනය සම්බන්ධයෙන්, රට දියුණු කිරීම සම්බන්ධයෙන් අපේ ප්‍රතිපත්තියත් මේකයි. හැබැයි වෙනස මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි සඳහන් කරනවා, මේ ඉඩම් ප්‍රමාණයන් ලබා දෙන ඒවා විනිවිදභාවයෙන් යුතුව කරන්න ඕනෑ කියලා. එක ඉඩම් කොටසක් -ෂැන්ග්‍රි-ලා හෝටලය- සින්නක්කර ක්‍රමයට ලබා දුන්නාය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමනි, සින්නක්කර ක්‍රමයට දුන්නාම ඒ ඉඩම සම්බන්ධයෙන්, ඒ ආයෝජනය සම්බන්ධයෙන් අපි පාලනයක් පවත්වා ගන්නේ කොහොමද? බදු ක්‍රමයකට දුන්නා නම් ඒ අදාළ අවුරුදු 20කට හෝ අවුරුදු 30කට හෝ අවුරුදු 40කට වරක් නැවත ගිවිසුම්ගත කරන්න පුළුවන්, මෙන්න මේ ආකාරයට සංවර්ධන කටයුතු ඉදිරියට කර ගෙන යන්න ඕනෑය කියලා. බදු ක්‍රමය යටතේ යම් කිසි ඉඩමක් ලබා දුන්නා නම් අපේ රටේ ආණ්ඩුවට ඒ ආකාරයෙන් පාලනයක් හිමි වනවා.

අපට මේක හරියට පැහැදිලි නැහැ. ලක්ෂ්මන් යාපා නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා මේක ලබා දීලා තිබෙන්නේ සින්නක්කර ක්‍රමයට කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සින්නක්කර

ක්‍රමයට ගෝල්ෆේස් පිටිය අසල අක්කර 20ක් කෝටි 2,900ක මුදලකට විකුණනු ලැබුවා නම්, මේක ඩොලර්වලින් බැලුවොත් මිලියනවලින් බැලුවොත් මා හිතන්නේ 260ක වාගේ ආසන්න ප්‍රමාණයකට එනවා. එහෙම නම් මෙතුමන්ලා කියන ආකාරයෙන්ම මිලියන 110ක් මේ වෙළඳාම මඟින් අපට ලැබිලා ඉවරයි. අපි කථා කරන්නේ මේ ඉඩම් ටික විකිණීමෙන් මිලියන 260ක් මේ ආණ්ඩුවට ලැබිලා ඉවරයි කියායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ප්‍රකාශ කරන ආකාරයට අපේ ආර්ථිකය ගොඩ ගන්න පුළුවන්, අපට කෙළින් නැඟිටින්න පුළුවන්, අපේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න පුළුවන්, ආසියාවේ දැවැන්තම රට බවට පත් කර ගන්න පුළුවන් විශාලම සම්පත මේ තෙල් නිධිය නම් අපට පුළුවන් මේ මිලියන 110 -මේ ලබපු ආදායමෙන් සියයට 30ක්- ඒ වෙනුවෙන් වියදම් කරලා, ආයෝජනය කරලා එහි අයිතිවාසිකම, එහි ලාභය ලබා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ තිබෙන අඩු පාඩුව තමයි මේ ලැබෙන බදු සහන කොයි කාලයකටද කියලා පැහැදිලිව දක්වා නොතිබීම. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා යම්කිසි පැහැදිලි කිරීමක් කළා. එතුමාගේ කථාවෙන් තමයි අපට යම්කිසි අවබෝධයක් ලබා ගන්න හැකි වුණේ මේක මොකක්ද කියලා. සරත් අමුණුගම මැතිතුමා කිව්වා, නැවක් එනවා කියලා. නැව් වෙන රටවල කොහේද එන්නේ කියලා ඇහුවා. ආයෝජනය සම්බන්ධයෙන් නීති තිබෙන්නේ කොහේද කියලා ඇහුවා. හැබැයි ඒ අමාත්‍යතුමා කරපු කථාවෙන් මේ පනත සම්බන්ධයෙන් කිසිම ආකාරයක අවබෝධයක් ලබා ගන්න අපට බැරි වුණා. නමුත් මා හිතන්නේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා යම්කිසි ප්‍රවේශයක් ලබා දුන්නා, මොකක්ද මේ සහනයෙන් බලාපොරොත්තු වන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ පුස්තකාල පර්යේෂණ අංශයෙන් ලැබුණු වාර්තාවයි මේ. මා මෙහිදී එහි කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි. මෙතුමන්ලා කිව්වා කිසිම උප කොන්ත්‍රාත්කරුවකුට මේ බදු සහන ලැබෙන්නේ නැහැ කියලා. ඇමතිවරු පුන පුනා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙහි සඳහන් වෙනවා, "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන විට බදු විරාම අදාළ සමාගමට හෝ එම සමාගම නමින් පෙනී සිටින උප කොන්ත්‍රාත් සමාගමට හිමි වේ." කියලා.

**ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා**
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)
ගරු මන්ත්‍රීතුමා ඒ බදු කාලය මේ ගැසට් එකේ තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒක ගැන නොවෙයි මේ කථා කරන්නේ. අහ ගෙන ඉන්න. කාලය ගැනත් මම කියන්නම්. කාලය අවුරුදු 25යි. මන්ත්‍රීතුමා, ඔබතුමා දන්නවාද අවුරුදු 25කට ලබා දුන්නාම මේ තෙල් නිධියේ තෙල් ටික අවුරුදු පහෙන් එළියට ගන්න පුළුවන් කියලා. ආයෙත් කොහේද අපට ලබා ගන්න තෙල් ඉතිරි වන්නේ, තෙල් නිධියකට අවුරුදු 25ක සීමාවක් පැනෙව්වාම. අවුරුදු 25 නොඉක්මවිය යුතු බවයි කියලා තිබෙන්නේ. ඔබතුමන්ලාට මේ ගැන අවධානය තිබුණා නම් මේක අවුරුදු 5ක් කරන්න තිබුණා නේ. එහෙම නැත්නම් අවුරුදු 7ක් කරන්න තිබුණා නේ. එහෙම නම් ඊට පස්සේ ආපසු ඒ බද්ද ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්. ඒ බදු සහනය දීර්ඝ කරන්න පුළුවන්. මෙතැන කථා කරපු ඇමතිවරු කිව්වා උප කොන්ත්‍රාත්කරුවකුට මේ බදු සහනය හම්බ වෙන්නේ නැහැ කියලා. මේ පනත අනුව සඳහන් කරනවා, "...2 වන වගන්තියේ ප්‍රකාර ඉහත සඳහන් උපලේඛනයේ ප්‍රඥප්ති අදාළ වීමෙන් නිදහස් වන දිනය ද එම නිදහස්වීම අවසන් වන දිනය ද නිශ්චිත ගැසට් නිවේදනයේ සඳහන් විය යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 මාර්තු මස 01 වැනි දින නිකුත් වූ ගැසට් නිවේදනයේ අදාළ ව්‍යාපෘතිය භාර ගත් සමාගමට සහ සමාගම නමින් මෙම ව්‍යාපෘතියට පත් කරන ලද උප කොන්ත්‍රාත් කරුවන් හට 2008 ඔක්තෝබර් මස 16 වැනි දින සිට 2016 ඔක්තෝබර් 15 වැනි දින දක්වා වන අවුරුදු 8ක කාලසීමාවකට පනතේ 2 වන වගන්තියේ උපලේඛණයේ සඳහන් බදු විරාම ලැබෙන බවට දක්වා ඇත." කියලා. මොකක්ද මේ කියන්නේ? කාටද බදු සහනය හම්බ වෙන්නේ? දැන් ඔබතුමන්ලා කිව්වා, ඇමතිවරු මෙතැනදී පුන පුනා කිව්වා, මේ ආකාරයේ බදු සහනයක් මේ උප කොන්ත්‍රාත්කරුවන්ට ලැබෙන්නේ නැහැ කියලා; උප කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් මෙහි යම්කිසි සඳහනක් තිබෙනවාද, කවුද මේ උප කොන්ත්‍රාත්කරුවන් කියලා. නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂයක් වශයෙන් අපට තිබෙන ප්‍රශ්නය තමයි මෙහි විනිවිදභාවය නොමැති වීම.

මේ රටේ සම්පතක් තිබෙනවා නම් -ඒක ඉඩමක් වෙන්න පුළුවන්, තෙල් නිධියක් වෙන්න පුළුවන්- ඒක කාට හරි ලබා දෙනවා නම් අනිවාර්යයෙන්ම ටෙන්ඩර් ක්‍රමයට යා යුතුයි. මොකක්ද ටෙන්ඩර් ක්‍රමයේ තිබෙන අඩුපාඩුව? ටෙන්ඩරය ලබා දෙන්නේ ෂැන්ග්‍රි-ලා හෝටලයට වෙන්න පුළුවන්, නැත්නම් වෙනත් එකකට වෙන්න පුළුවන්. ටෙන්ඩරය කැඳවන්නේ ගෝල්ෆේස් පිට්ටනිය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, නැත්නම් වෙනත් ස්ථානයක් සම්බන්ධයෙන් වෙන්න පුළුවන්. ඒ ඕනෑම ස්ථානයක් නීත්‍යනුකූලව ටෙන්ඩර් පටිපාටියට ඉදිරිපත් කරන්න රජයට පුළුවන්. මොකක්ද මේ පනතේ ඇති වෙනස? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත සම්බන්ධයෙන් අපට හිතෙන්නේ මෙයට කොමිස් මුදලක් උපයන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත කියලා දැම්මා නම් හරි කියායි. මොකද, මේ සංවර්ධන ව්‍යාපෘතියේ සභාපතිතුමිය කරන එකම දේ තමයි ටෙන්ඩර් පටිපාටිය මේකෙන් අයින් කරන එක. ෂැංග්‍රි-ලා හෝටලයට මේක දෙන්න යන කොට මේ රටේ ඒ අවට තිබෙන වෙනත් හෝටල්වලට මේ බදු සහනය හම්බ වෙන්නේ නැත්තේ ඇයි? ඒ තිබෙන හෝටල් නවීකරණය කරලා, ඒ ආකාරයෙන් ආයෝජනයක් ඉදිරිපත් කරලා, ඒ ආකාරයෙන් රටට විශාල ලෙස ප්‍රාග්ධනය උපයන, විදේශ විනිමය උපයන ක්‍රමයක් ඇති කරන්න හැකියාව රටේ අනිකුත් ආයෝජකයන්ටත් තිබෙනවා. විශේෂයෙන්ම එක පිරිසකට පමණක්, හඳුනා ගත් පිරිසකට පමණක් මේ වරප්‍රසාදය ලබා දෙන්න හේතුව මොකක්ද කියන ප්‍රශ්නය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය වශයෙන් අපි අහනවා. තෙල් සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් නැහැ. පර්යේෂණ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් නැහැ. මේ රටට ඒක අවශ්‍යයි කියන එකෙත් අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපට ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. අක්කර 20 විකුණන්න පුළුවන් නම් මිලියන 270කට ඒකෙන් සියයට 30ක් වියදම් කරලා අපට මේ රටේ ඉදිරි අනාගතය තීරණාත්මක කරන තෙල් නිධිය හොයා ගන්න පුළුවන්. ඒ ආයෝජනය කරන්න පුළුවන් හැකියාව මේ රටේ ආණ්ඩුවට තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ආණ්ඩුවෙන් උත්තර නැහැ.

පෞද්ගලීකරණයට විරුද්ධයි, විදේශ ආයෝජකයන්ට මේ රට විකුණන්නේ නැහැ කියන කරුණු තමයි අවුරුදු කිහිපයකට කලින් මේ ආණ්ඩුවේ ප්‍රධාන තේමාව වුණේ. හැබැයි බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට සංවර්ධනය ගැන යම්කිසි දැනීමක් තිබෙනවාය කියා මා දන්නවා. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ඇමතිවරුන්ගේ අදහස්වලට වඩා එතුමා දරන අදහස වෙනස්. අපි ඒක අගය කරනවා. ආයෝජනය සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් නැහැ. මේ ආයෝජනය සම්බන්ධයෙන් අපට තිබෙන ප්‍රශ්නය තමයි මේ ගැන තිබෙන විවිධ අදහස්. එක අමාත්‍යවරයෙක් කියනවා, අපි කිසිම දෙයක් පෞද්ගලීකරණය

[ගරු සුජීව සේනසිංහ මහතා]

කරන්නේ නැහැ කියා. තව අමාත්‍යවරයෙක් තනිකරම තමන්ගේ ආර්ථික විප්ලවය කරන්න හදන්නේ පෞද්ගලීකරණය වාගේම විදේශ ආයෝජන තුළිනුයි. ඒ නිසා මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද කියා අපට හිතා ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපට එකක් ඉදිරිපත් කරන්න පුළුවන්. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මේ පනතට ආදරය කරන විශේෂ පුද්ගලයෙක්. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙලා තිබෙන්නේත් එතුමාගේ සංකල්පයක් අනුව වෙන්න ඇති. හැබැයි අපට තිබෙන ප්‍රශ්නය තමයි, සින්නක්කර හෝ වේවා බදු හෝ වේවා මේ පනත අනුව යම්කිසි ඉඩමක් ලබා දෙන අවස්ථාවක ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලා සුදුසුම පුද්ගලයාට වැඩිම මුදලකට දෙන්න බැරි ඇයි කියන එක. ඒ ගැන තිබෙන ප්‍රායෝගික අපහසුතාවය මොකක්ද? මේ තෙල් නිධිය ලැබී තිබෙන කෙයාන් කියන මේ ආයතනය ඉන්දියාවේ විසිනවවැනි ආයතනය. එංගලන්තයේ, අමෙරිකාවේ, ප්‍රංශයේ තව මෙවැනි ආයතනවලට මොන වාගේ සහන අපට ලබා දෙන්න පුළුවන්ද? මෙන්න මේ වාගේ සහන ලබා දෙනවාය, මේ සහන ලබා දීමෙන් මේකෙන් විශාල ආදායමක් අපටත් ලබා ගන්න පුළුවන්ය කියා ඒ ආයතනවලට ඉදිරිපත් වෙන්න අවස්ථාව ලබා දුන්නා නම්, ටෙන්ඩර් පටිපාටියට ඇතුල් වෙන්න අවස්ථාව ලබා දුන්නා නම් අනිවාර්යයෙන්ම ලෝකයේ තිබෙන විශාල සමාගම් ප්‍රමාණයක් ඒ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න අවස්ථාව දෙන්න පුළුවන්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාට පොඩි උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
තෙල් කැණීම්වලට ටෙන්ඩර් කළා. තුන් දෙනෙක් ආවා. ඒකෙන් වැඩිම ලකුණු තිබුණු, සියයට 88.3ක් ගත්තු සමාගමට තමයි දීලා තිබෙන්නේ. නිකෝ කියන සමාගමට සියයට 61.7ක් ලබා ගෙන තිබෙනවා. ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරයෙකුත් මේක කියෙව්වා. ඒ අනුව මේක ටෙන්ඩර් කරලා තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හරි. බොහොම ස්තුතියි, ඇමතිතුමනි. මෙතැනදී මම වැරදි නම් නිවැරදි කරන්නය කියා මම කියනවා. මම හිතන්නේ මේකෙදි ඉල්ලුම් පත්‍ර විශාල ගණනක් ලැබුණා. මම හිතන්නේ ඉල්ලුම් පත්‍ර විසි ගණනක් විතර ලැබුණා. ඇමතිතුමනි, ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙනුත් මෙවැනිම ප්‍රශ්නයක් තිබුණා. කාල්ටන් කියන ආයතනයට ඒ වරප්‍රසාද ලබා දෙද්දී සාමාන්‍ය ටෙන්ඩර් පටිපාටිය ඉදිරිපත් වුණේ නැහැ. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවක පත්තරේ දැන්වීමක් පළ කරන්න ඕනෑ. අපි කියන්නේ මේකේ විනිවිදභාවය සම්බන්ධයෙන් පමණයි. මේවා ආර්ථික අභිවෘද්ධිය සඳහා ඉදිරිපත් කරන යෝජනා ක්‍රම. කාල්ටන් ආයතනය වෙබ් අඩවියක පමණක් ප්‍රවෘත්ති ඉදිරිපත් කර තිබුණා. [බාධා කිරීමක්] මම මේ දෙන්නේ මේ ආණ්ඩුව එකක් කියනවාය එකක් කරනවාය කියන එක සම්බන්ධයෙන් උදාහරණයක් පමණයි. ඔක ජාත්‍යන්තර වෙන්න ඇති. අජාත්‍යන්තර ඒවා වෙන හැටි මම මේ පොඩ්ඩක් පෙන්නුවේ, ආණ්ඩුව යටතේ වෙන අනිකුත් ඒවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ නැහැ ගෝල්ෆේස් පිටියේ ෂැන්ග්‍රි-ලා හෝටලය සම්බන්ධයෙන් ටෙන්ඩර් ඉදිරිපත් වුණා කියලා. ඒ සම්බන්ධයෙනුත් මම වැරදි නම් නිවැරදි කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාට අවස්ථාව තිබෙනවා නිවැරදි කරන්න. ඒ වාගේම කැටික් ආයතනය සම්බන්ධයෙන් එහෙම ඉදිරිපත් වුණේ නැහැ.

අද කොළඹ අවට තිබෙන සියලුම ඉඩම් සුද්ද කර ගෙන යනවා. එය ඉතා හොඳයි. අපි හොඳ දේ අගය කරනවා. අද කොළඹ අවට ලස්සන වෙලා තිබෙනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය මේ ලස්සන වෙන කොට එළි පෙහෙළි වෙන ඉඩම්වලට මොකක්ද වන්නේ කියන එකයි. මේවා මේ ආයතනවලට ලබා දෙන්නේ ටෙන්ඩර් පටිපාටියක් හරහා නොවෙයි නම් අනිවාර්යයෙන්ම එතැන විනිවිදභාවය නැහැ. අනිවාර්යයෙන්ම තමන්ට හිතවත්කමක් තිබෙන පුද්ගලයකුට, ඒ වාගේම විදේශ ආයෝජකයන් අඳුනන විශේෂ පුද්ගලයකුට මේක ලබා දෙන්න පුළුවන්. මේකට ලැබෙන කොමිස් මුදල සියයට තිහක්, සියයට හතළිහක් වෙන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් කවුද ප්‍රශ්න කරන්නේ? ටෙන්ඩර් පටිපාටිය යටතේ වුණත් යම් කිසි ආකාරයක දූෂණයක් වෙන්න පුළුවන්. හැබැයි සිදු වෙන ප්‍රමාණය අඩුයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප ප්‍රකාශ කරන්නේ මේ පනත යටතේ මේ ටෙන්ඩර් පටිපාටිය ඇතුළත් කරන්න ඔබතුමන්ලාට පුළුවන් නම් ඒක හොඳයි කියන එකයි. ඒ වාගේම බදු සහන සම්බන්ධයෙන් මට තව ප්‍රශ්නයක් තිබෙනවා ගරු ඇමතිතුමනි. මේ ගැසට් නිවේදනයේ තිබෙනවා අපට බදු ප්‍රමාණයන් ලබා දෙන ආකාරය. මා හිතන්නේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කිව්වා අවුරුදු පහක කාලයක් තුළ තෙල් නදියෙන් යම් කිසි ආකාරයක තෙල් කැණීමක් සිදු කෙරුණොත් අවුරුදු පහක් යනකම් ඒ ආයතනයට සියයට අසූදෙකහමාරේ ඉඳලා පල්ලෙහාට යන ආකාරයේ ආදායමක් තමන්ට ලබා ගන්න පුළුවන් කියලා. එතකොට ඊට ඉදිරියට අපේ මේ තෙල් නිධිය සම්බන්ධයෙන් ඒ තෙල් සමාගම්වලට තිබෙන අයිතිය මොකක්ද? මෙහි සඳහන් වෙලා තිබෙනවා අවුරුදු 25 නොඉක්ම විය යුතු කාල සීමාවකට මේ බදු සහන ලබා දෙන්න පුළුවන් කියලා.

ගරු ඇමතිතුමනි, මේ බදු සහන සම්බන්ධයෙන් මට තව ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගේ අවස්ථාව ලැබුණාම ඒ ගැන පැහැදිලි කරන්න. මේ බදු සහන හම්බ වන්නේ ආයෝජන මුදලට පමණද? මේ ලැබෙන මිලියන 110ක ආයෝජන මුදලට පමණද මේ බදු සහන හම්බ වන්නේ? ඇමතිවරු ඒ අදහස් ප්‍රකාශ කළ ආකාරයට, මට ලැබුණු මේ ලියකියවිලි ටික අනුව තමයි මගේ අවධානය ඒ සම්බන්ධයෙන් යොමු කළේ. බදු විශාල ප්‍රමාණයක් මේකේ තිබෙනවා. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතත්, තවත් පනත් කීපයක් සම්බන්ධයෙනුත් ඒ විධියට බදු විශාල ප්‍රමාණයක් ලිහිල් කරන ආකාරය මෙම ගැසට් නිවේදනයේ සඳහන් වෙලා තිබෙනවා. එතකොට අපට තිබෙන ප්‍රශ්නය මේකයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආකාරයෙන් බදු ලිහිල් කරන කොට, ඒ මොන ආකාරයේ බදුද -ආයෝජනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන බදුද, මිලියන 110ට පමණද-

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මම පැහැදිලි කරන්නද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔව්, ගරු ඇමතිතුමනි ඔබතුමාට පැහැදිලි කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

ඔබතුමා මේ ගැසට් නිවේදනය බැලුවා නම් එය පැහැදිලි වෙයි. එහි මෙහෙම සඳහන් වෙලා තිබෙනවා:

".....ක්‍රියාවට නංවන ගවේෂණ කටයුතුවලට පමණක් ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ විය යුතු අතර 2008 ඔක්තෝබර් මස 16 වැනි දින සිට ආරම්භ වන වසර 8 ක සීමාවක් සඳහා වූ ගවේෂණ බලපත්‍ර කාලසීමාව තුළ දී ව්‍යාපෘතියට අවශ්‍ය වන සහ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන උපකරණ, යන්ත්‍රසූත්‍ර, ද්‍රව්‍ය, සැපයුම් සහ පරිභෝජනික දේ එම භාණ්ඩවලට ඇතුළත් විය යුතු ය. "

ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ගවේෂණ කටයුතුවලට විතරයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු ඇමතිතුමනි, බොහොම ස්තුතියි ඔබතුමාගේ ඒ පැහැදිලි කිරීමට. ගවේෂණ කටයුතුවලට පමණක් ඒ වාගේ බදු සහනයක් දෙනවා නම් අපේ විරුද්ධත්වයක් නැහැ ගරු ඇමතිතුමනි. එවැනි ආයෝජනයක් කරනවා නම් යම් කිසි පුද්ගලයෙක් අනිවාර්යයෙන්ම යම් කිසි සහන බලාපොරොත්තු වෙනවා. එපමණක් නොවෙයි ගරු ඇමතිතුමනි, ඇත්තටම අපි පොඩ්ඩක් පමා වෙලා මේක පටන් අරගෙන තිබෙන්නේ. ඉන්දියාව මේ ආශ්‍රය නිධි අනාවරණය කර ගෙන මා හිතන්නේ විශාල තෙල් ප්‍රමාණයක් -බිලියනයකට අදාළ තෙල් බැරල් ප්‍රමාණයක්- මේ වෙන කොටත් ඒ ප්‍රදේශය ආසන්න භූමි ප්‍රමාණයෙන් ලබා ගෙන ඉවරයි. ඒ සම්බන්ධයෙන් තවත් ප්‍රශ්නයක් තිබෙනවා ගරු ඇමතිතුමනි. මේ කෙයාන් කියන ආයතනය මේ ආකාරයේම කැණීම් ප්‍රමාණයක් ඉන්දියාවේත් යම් කිසි ස්ථාන කීපයක කර ගෙන යනවා. ඒ වාගේම බංග්ලාදේශයට ළං වෙන්න විශාල මුහුදු තීරයක් තිබෙනවා. අපට එයින් විශාල ප්‍රයෝජන ගන්න පුළුවන්. මේ වෙන කොට -මම වැරැදි නම් ඒකත් නිවැරැදි කරන්න මම ඔබතුමාට පවරනවා- තෙල් සහ ගෑස් ප්‍රමාණයක් වැඩියෙන්ම තිබෙන්නේ මෙන්න මේ භූමි ප්‍රමාණයේ කියලා අදහස් ප්‍රකාශ වෙලා තිබෙනවා. ඒ කියන්නේ බංග්ලාදේශයට ළං වෙන්න අපට අයත් මුහුදු තීරයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් කරන ආයෝජනය පිට රටින් එන්නේ. නීති, අණපනත් ඉදිරිපත් කිරීමේ අයිතිය අපට තිබෙන්නේ. ඉතින් මේ ආයෝජකයන් මීට වැඩිය කලින් මේ ප්‍රදේශවලට ගෙන්වා ගත්තා නම් හොඳයි කියලායි අපට නම් හිතෙන්නේ. බංග්ලාදේශය අවට මුහුදු තීරයේත් මේ වාගේ කැණීම් ඉදිරිපත් කරලා, හරි ටෙන්ඩර් පටිපාටියෙන් යුතු ආයතනයකට මේවා ලබා දීලා මේ ප්‍රදේශය අප හරියට ගවේෂණය කළොත් අපට විශාල ලාභයක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මේ ප්‍රදේශ අප සලකලා බලන කොට මා හිතන්නේ ඉන්දියාව මේ වෙන කොටත් අපට වඩා අවුරුදු එකහමාරක් විතර ඉස්සරහින් ඉන්නේ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත් එකඟ වෙයි, මේ තෙල් ගවේෂණය සම්බන්ධයෙන්, තෙල් ආකර සොයා ගැනීම සම්බන්ධයෙන් ඉන්දියාව අපට අවුරුදු එකහමාරකට, අවුරුදු දෙකකට එහායින් ඉන්නේ කියන එකට.

මා හිතන්නේ අපට විශාල කාර්යභාරයක් තිබෙනවාය කියායි. විපක්ෂයක් වශයෙන් අපි සංවර්ධනයට විරුද්ධ නැහැ. ඔබතුමන්ලා කොච්චර නැහැ කිව්වත්, ඔබතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ සංවර්ධන ප්‍රතිපත්තිය තමයි -අපේ ප්‍රතිපත්තිය තමයි- ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන්නේ.විශේෂයෙන්ම ඇමතිතුමා. අපි ඇමතිතුමාට සුබ පතනවා. එක්සත් ජාතික පක්ෂයේ සංවර්ධන ප්‍රතිපත්තිය හරි කමක් නැහැ හරියට ඉදිරිපත් කරනවා නම්. හැබැයි, විනිවිදභාවයෙන් යුතුව කළ යුතුයි. මේවායේ විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ. මම ඇමතිතුමාට මේ කාරණය කලිනුත් සඳහන් කළා. විදේශ ආයෝජකයන්ට මේ ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාත් විශේෂයෙන්ම විරුද්ධ වුණා. හැබැයි, ඔබතුමන්ලා ෂැන්ග්‍රි-ලා ආයතනයට ඒ ලබා දීපු සහනය ඒ අවට තිබෙන අනෙකුත් හෝටල්වලට විශාල වශයෙන් පාඩුවක් වෙන්න පුළුවන් ගරු ඇමතිතුමනි. මම ඒ සම්බන්ධව ඒ හෝටල්වලින් අහලා බැලුවා. විශේෂයෙන්ම සිනමන්ග්‍රෑන්ඩ්, හිල්ටන් වාගේ විශේෂ හෝටල්වලින් අහලා බැලුවා. ඇමතිතුමා එකඟ වන්න ඕනෑ, 2009 ඉඳගෙන අද වෙන කොට ඒ හෝටල්වල නේවාසිකයන් ප්‍රමාණය කිසිම ආකාරයකින් වැඩි වෙලා නැහැය කියන එකට.

අද ඔබතුමන්ලා පවසනවා, සංචාරක ව්‍යාපාරය විශේෂ ආකාරයෙන් මේ රටේ දියුණු වෙලා තිබෙනවා; සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවාය කියලා. හැබැයි මම ඔබතුමාට අභියෝග කරනවා එහෙම වෙලා නැහැය කියා. මේ විවේචනය කරන්නේ ඔබතුමන්ලාගේ අඩුපාඩුවක් හොයන්න නොවෙයි. මේ හෝටල්වලට 2009, 2010, 2011, 2012 බැලුවොත්- මම හිතන්නේ, සමහර වෙලාවට ඔබතුමන්ලා කාමරයකට අය කරන අවම මුදල මේකට හේතුව වන්න පුළුවන්ය කියායි. ඒකද කියා මම දන්නේ නැහැ. - නේවාසිකයන් ප්‍රමාණය කිසිම ආකාරයකින් වැඩි වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් තොරතුරු හොයලා බලන කොට විශේෂයෙන්ම සංචාරකයන් ප්‍රමාණය වැඩි වෙලා කියලා දත්තවල සඳහන් වෙලා තිබෙනවා. දත්ත පරීක්ෂා කරලා බලන කොට චීනයෙන් සහ මැලේසියාවෙන් ආපු කාර්මිකයන් විශාල ප්‍රමාණයක් -30,000කට ආසන්න ප්‍රමාණයක්- මේ සංචාරක දත්ත ගොනුවට ඇතුළත් වෙලා තිබෙනවාය කියලා අපට අනාවරණය වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අමාත්‍යතුමන්ලා අදහස් ප්‍රකාශ කළා මේකෙන් විශාල රැකියා ප්‍රමාණයක් උත්පාදනය වෙයි කියලා. මේ රැකියා ප්‍රමාණය සම්බන්ධයෙන් අපට විශාල සැකයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රැකියා සම්බන්ධයෙන් මෙතුමන්ලා අදහස් ප්‍රකාශ කළත් අපි දන්නවා, මේ අවස්ථාව වන කොට විශේෂයෙන්ම හම්බන්තොට වරාය අද ලාභ නොලබන, නැව් නොඑන වරායක් බවට පත් වෙලා තිබෙනවාය කියා. මේ වරාය සම්බන්ධයෙන් 10,000කට අධික ප්‍රමාණයක් මේ වන කොට චීනයෙන් කම්කරුවන් ලෙස මේ රටට පැමිණිලා තිබෙනවා. එහෙම නම් මේ ව්‍යාපෘති-

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

10,000ක්?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

10,000ක් නොවෙයි මම හිතන්නේ 12,000ක්. වැරදුණා. සමාවෙන්න. අපේ නියෝජ්‍ය ඇමතිතුමා පොඩ්ඩක් පුදුම වුණා. 10,000ක් නොවෙයි 12,000යි. සමාවෙන්න. තව ගණන වැඩි වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැලේසියාවෙන් සහ චීනයෙන් මේ රටට විශාල කම්කරුවන් ප්‍රමාණයක් අද වන කොට ගලා ගෙන එන්න පටන් අර ගෙන තිබෙනවා. මම හිතනවා, යම් කිසි ආකාරයකින් මේවායින් තෙල් හරි, ගෑස් හරි ලැබුණොත් ඒ ලැබෙන්න පෙර අපේ තිබෙන රැකියා 5,000ක් නැත්නම් 10,000ක් ඉන්දියාවට නැත්නම් වෙනත් රටකට ලබා දෙන්න මේ ආණ්ඩුව ක්‍රියාත්මක වෙයි කියලා. අපි බලාපොරොත්තු වනවා, මේ සමාගම් සමඟ ගිවිසුම්වලට එළඹෙන කොට එසේ කිරීමට මේ ආණ්ඩුවට හැකියාව ලැබෙයි කියා. ඔබතුමන්ලා දන්නවා, එක්සත් ජාතික

[ගරු සුජීව සේනසිංහ මහතා]

පක්ෂය වික්ටෝරියා, කොත්මලේ, මහවැලිය යනාදී ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ඇති කර ගත් ගිවිසුම්වලදී කවදාවත් අපි චීනයෙන් හරි, මැලේසියාවෙන් හරි, උගන්ඩාවෙන් හරි මේ රටට කම්කරුවන් ගෙනාවේ නැහැ කියා. විශේෂඥයන් දෙන්නෙකු හරි, තුන්දෙනෙකු හරි ඒ අවස්ථාවේදී ලබා ගත්තා පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් මම අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ලක්ෂ්මන් යාපා අබේවර්ධන ඇමතිතුමා පැවසුවා, එච්එස්බීසී ණය සම්බන්ධයෙන් අපි විශාල හඬක් නැඟුවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හඬ අදත් නඟනවා. මොකක්ද ඒකට හේතුව? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩ්ඩක් විපරම් කරලා බැලුවා, බටහිර රටවල්වල විශේෂයෙන්ම ඉතාලියේ, ග්‍රීසියේ වාගේ රටවල්වල අද ඇති වෙලා තිබෙන අර්බුදය ගැන. ඒ රටවල් ආර්ථික වශයෙන් කඩා වැටෙන රටවල් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි මේ රටවල් ණය ගන්න පොලිය කීයද? කඩා වැටෙන කොට, තමන්ගේ ආර්ථිකය කෙළින් කර ගෙන යන්න බැරි වෙන කොට -ණය බරිත ප්‍රමාණයෙන් ග්‍රීසිය සහ ඉතාලිය ළඟින් තමයි අපිත් ඉන්නේ. මම හිතන්නේ නව වැනි ස්ථානයේ. අපට උඩින් ඉන්නවා ඉතාලිය. තවත් දෙකක්, තුනක් උඩින් ඉන්නවා ග්‍රීසිය.- මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටවල් ණය ගන්නේ සියයට 5.8ට, සියයට 5.9ටයි. අද මේ රටවල් ඒ ඩොලර් ප්‍රමාණයන් ණය ගන්නේ මේ පොලියටයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි අපි කීයක පොලියටද ණය ගත්තේ? අපේ සමහර ණය පොලිය සියයට 8 වුණා. සියයට 7.2 වුණා. සියයට 6.7 වුණා. සියයට 6.8 වුණා. මෙන්න මේක තමයි අපේ ප්‍රශ්නය මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ණය ප්‍රමාණය අපි සියයට හතේ පොලියට ගත්තොත්, අපේ සංවර්ධන ව්‍යාපෘති අපි යටපත් කළොත් මේ සියයට 7 පොලියට අපට ගෙවන්න සිදු වනවා, රුපියල්වලින් බැලුවොත් සියයට 21 නැත්නම් සියයට 22 පොලී ප්‍රමාණයක්. මෙන්න මේක තමයි අප කියන ප්‍රශ්නය; එක්සත් ජාතික පක්ෂය කියන ප්‍රශ්නය. ඔබතුමන්ලා සංවර්ධන යෝජනා ක්‍රමයන්වලට ණය ගන්නවා නම් සියයට 3.5ට, සියයට 3.8ට, වැඩිම වුණොත් සියයට 4.5ට ලෝක ප්‍රජාවෙන් ණය ගන්න හැකියාව තිබෙනවා.

ඔබතුමන්ලා මේ කරන කාර්යාවලියට අපි අකුල් හෙළන්නේ නැහැ. තෙල් හම්බ වෙනවා නම් හොඳයි. හැබැයි, අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටින්නේ, මේ සියලුම කටයුතු විනිවිදභාවයෙන් යුතුව, නීත්‍යානුකූලව සිදු කරන ලෙසයි. ඒ වාගේම මේ රටට ඔරොත්තු දෙන ආකාරයේ පොලීවලට ණය ලබා ගෙන මේ සංවර්ධනය කළ යුතු බවයි අප ඉල්ලා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මට කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.11]

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළ අද දවස ලංකාවට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කළ දවස තරම් උතුම් දවසක් හැටියටයි මා සලකන්නේ. මේ තෙල් නිධි කැණීමේ ව්‍යාපාරය යම් කිසි දවසක සාර්ථක වුණොත් ලංකා ඉතිහාසයේ අලුත් පරිච්ඡේදයක් විතරක් නොවෙයි, තාක්ෂණ විප්ලවයේ අලුත් මාවතකුත් ආරම්භ කරනවා.

මේ පිළිබඳව පළමුවෙන් කථා කළ ආචාර්ය සරත් අමුණුගම අමාත්‍යතුමා ඉතාම වැදගත් සවිස්තරාත්මක ශාස්ත්‍රීය කථාවක් කළා. ඒ වාගේම ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමාට මම ගරු කරනවා, හැංගිලා තිබුණු කාරණා හුඟක් ඉදිරිපත් කරලා මෙච්චර කල් විරුද්ධ පක්ෂයෙන් කරපු පචෝරිස් කථා ටික නිශ්ප්‍රභ කර දැමීම ගැන. ද්වේෂාත්මකව, ඊර්ෂ්‍යාව වඩමින් ලංකාවට එන ආයෝජකයන් පන්නා දමන්න කරපු කථා එතුමා නිශ්ප්‍රභ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා ඒ කථා දෙකම ලංකා ගුවන් විදුලියෙන්, ලංකාවේ රූපවාහිනියෙන් මහජනතාවට සරලව අහගන්නට සැලැස්විය යුතුයි කියලා. නමුත් ඒ දේ තමයි ස්වර්ණවාහිනියෙන්, ලංකා රූපවාහිනියෙන් සහ ලේක් හවුස් එකෙන් සිදු වන්නේ නැත්තේ. ඔවුන් මේ "Reality" අරවා මේවා කියලා මඟුල් dance එකක් පටන් අර ගෙන මුළු ලංකාවම විකෘති කරනවා. මේවා වහලා දානවා නම් මීට වඩා හොඳයි.

අද මේ වටිනා කාරණය තුළින් ලංකාව අලුත් මාවතකට ගත්තා. ඒ මොකක්ද? තෙල් හෑරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි කථාවක් කියන්න ඕනෑ. තෙල් ළිඳක් හාරනවාය කියන්නේ ගමේ ජේමිස් සිංඤ්ඤෝ ඌරා ළිඳක් හාරනවා වාගේ වැඩක් නොවෙයි. ඒක ඊට වඩා මහා ගැඹුරු, මහා ශාස්ත්‍රීය වැඩක්. ළඟදී, අවුරුද්දකට ඉස්සෙල්ලා මැක්සිකෝ වරායේ තිබුණු British Petroleum කියන සමාගමේ තෙල් ළිඳක් පුපුරා ගියා. ඒ තෙල් ගන්නට නැව සවි කර තිබුණු තැන ඉඳලා හැතැප්ම එකහාමරක් ගියාට පස්සේ තමයි මඩ තට්ටුවට පයිප්පය ගියේ. මඩ තට්ටුවේ ඉඳලා තව හැතැප්ම තුනක් පස් තට්ටුව හෑරුවා. එහෙම හාරලා තමයි පයිප්පය තෙල් නිධියට ගියේ. සාගරයේ මඩ තට්ටුව ඉවර වෙන තැන තිබෙනවා කපොල්ලක්. අන්න එතැනදී ඒ තෙල් උඩට ඇවිත් පිපුරුවා. පුපුරලා කොයි තරම් භයානක දෙයක් වුණාද? මැක්සිකෝ බොක්කෙන් හතරෙන් එකකට හිතන්න බැරි තරම් තාලෙට තෙල් ගලා ගෙන ගිහින් සත්ව විනාශ සහ පැළෑටි විනාශ සිදු වුණා. අදත් ඒ ජලයේ පාට වෙනස් වෙලා තිබෙනවා. අදත් කුරුල්ලෝ දස දහස් ගණනක් මැරෙනවා. මසුන් ඇල්ලීම තහනම් කරලා තිබෙනවා. මසුන් ටින් කිරීමේ කර්මාන්තය නතර කරලා තිබෙනවා. ඒ වාගේ උපද්‍රව රාශියක් මේ තෙල් ළිඳක් හාරනකොට තිබෙනවා. තෙල් ළිං දහයක් හාරනකොට ළිං හතක තෙල් ලබා ගන්න බැහැ. වැරදි කුස්තුරයට යන්නේ. තෙල් පතලක් හාරනකොට සියලුම කාරණා දැන ගත්තත් හරියට ඒ කුස්තුර ගහන්න ලැබෙන්නේ දහයෙන් තුනකට පමණයි. මම බොහොම සන්තෝෂයෙන් ප්‍රාර්ථනා කරන්නේ අද මේ පටන් ගන්නා ව්‍යාපාරය ලංකාව බඹ ගණනක් ඉදිරියට පනින ව්‍යාපාරයක් වෙන්න කියලායි.

මගේ කනගාටුව මේකයි. මේ විදේශ ආයෝජකයින් අධෛර්යමත් කරන්නයි මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මෙතැන කථා කළේ. මේක හොඳ වැඩක් කියලා, ඊට පස්සේ අනෙක් එවා කියන්න පටන් ගත්තා. විදේශ ආයෝජකයාට එන්න එපා කියන්නයි කථා කළේ. විරුද්ධ පක්ෂයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සෑම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මේ රටේ ටෙලිෆෝන් කණුවල එල්ලන්න ඕනෑ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

උපදින්නේ, උප්පත්තිය ලබන්නේ මේ මව් බිම කෙළෙසන්න; පාවා දෙන්න. සෑම කථාවකින්ම කළේ ඒක.

කුරුඳු වත්තේ ග්‍රීස් සිල්වා ග්‍රීස් ගාගෙන භූතයා වාගෙයි. විදේශිකයෝ භය ගන්වන්න ග්‍රීස් සිල්වා මෙතැන කෑ ගැහුවා. ඒකයි කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මහත්මයාට පින් සිද්ධ වෙනවා. මම අවුරුදු පනහක් තිස්සේ කරපු ඉල්ලීමක් තමයි ලංකාවට සාගර විශ්වවිද්‍යාලයක් ඕනෑ කියන එක. මම 1960 ඉඳලා ලිපි, කථා සිය ගණනකින් ඒ ඉල්ලීම කළා. මහින්ද රාජපක්ෂ මහත්මයා ධීවර ඇමති වුණාට පස්සේ සාගර විශ්වවිද්‍යාලයක් අපි ආරම්භ කරවා ගත්තා. ඒකෙන් හුඟක් දේවල් ලැබෙයි කියලා අපි බලාගෙන ඉන්නවා. සාගර විශ්වවිද්‍යාලය ඔස්සේ සාගර කලාපයක්, සාගර ආර්ථිකයක්, සාගර ශිෂ්ටාචාරයක් ඇති කරලා, ගොඩ අය වැය පියවන්න සාගර අය වැයක් හදන්නයි අපේ ඉලක්කය. ලංකාව බෙංගාලයට යනකම් දික් කරන්න කිච්ච සිතියම බලපු හාදයෙක් නොවෙයි ඒ කථා කළේ. බෙංගාලය ලංකාවට හැතැප්ම 1500ක් ඈතයි. හැතැප්ම 350කින් එහාට ලංකාවට මුහුද අයිති නැහැ. එහෙම කථා කළේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කථා කරන්නේ ඔළුව බිම තියා ගෙන. මේ තරම් වටිනා හැතැප්ම 300ක සාගරයක් අපට දීලා තිබෙනවා. ඉංග්‍රීසිකාරයා යන විට හැතැප්ම 12යි අපට අයිති වුණේ. අපට කීකරු වුණේ නැත්නම් හැතැප්ම 200ක දුරකින් තිබෙන ඕනෑම නැවකට අපට අද වෙඩි තැබුව හැකියි. හැතැප්ම 350ක් එහාට ආර්ථික කලාපය හදා ගන්න පුළුවන් අපට ශක්තියක් තිබෙනවා නම්. ඒක තමයි අපි අද ආරම්භ කරන්නේ.

ඇමෙරිකාව ලෝක තෙල් ඒකාධිකාරයක් පිහිටුවා තිබෙනවා. "Seven Sisters" කියලා සමාගම් හතක් ලෝකයේ තෙල් ඒකාධිකාරය අරගෙන යනවා. මේ අය වෙන කිසිම කෙනෙකුට තෙල් ළිඳක් හාරන්න ඉඩ දෙන්නේ නැහැ. ඔක්කොම වළක්වනවා. ඒ ඔත්තුකරුවෝ තමයි අද මේ කටයුතු වළක්වන්න කථා කළේ. වෙන රටවල තෙල් ලැබුණාම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පාඩුයි. තමුන්නාන්සේලා පුදුම විය යුතුයි. තව අවුරුදු 12කින් ඇමෙරිකාවේ තෙල් බින්දුවක් ගන්න නැහැ. ඔක්කොම හිඳිලා ඉවර වෙනවා. තව අවුරුදු 16කදී ඉන්දියාවේ තෙල් නැහැ. ඉන්දියාව ඒ තරම් තෙල් පාවිච්චි කරනවා. ඒ වුවමනාව සපුරාලන්න බැහැ. අවුරුදු 15ක් යන විට ඒ තෙල් ඉවර වනවා. අවුරුදු තුනකට ඉස්සෙල්ලා එංගලන්තය උතුරු මුහුදේ තෙල් ගත්තා. ඒවා දැන් ඉවරයි. නෝර්වේ රටේ අවුරුදු නවකින් තෙල් ඉවරයි. මුළු ලෝකයේම අවුරුදු 100කට වැඩිය තෙල් තිබෙන්නේ, තෙල් ගබඩා වෙලා පොළොවේ තිබෙන්නේ, ඉරානය, ඉරාකය, කුවේට් සහ වෙනිසියුලාව කියන රටවල විතරයි. ඒකයි මේ යුද්ධය. ප්‍රජාතන්ත්‍රවාදය වපුරන යුද්ධයක් නොවෙයි මැද පෙරදිග කරන්නේ. ඒක ඔවුන්ගේ තෙල් ඒකාධිකාරය ආරක්ෂා කර ගැනීම සඳහා කරන යුද්ධයක්. ඒ නිසා ඔවුන් අපට මේ තෙල් ළිඳ හාරන්න ඉඩ දෙන්නේ නැහැ. ඇමෙරිකාවේ තෙල් කොන්ත්‍රාත්කරුවෝ එනකොට මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉස්සරහට දමලා හරස් කපනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැති බේගල් ඇද බානවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන වචන පාවිච්චි කිරීම සුදුසු නැහැ. මේ ගරු සභාවේ සිටින සියලු දෙනාම ගරු මන්ත්‍රීවරු.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඔව්. මන්ත්‍රීවරු තමයි ඔළුවෙන් හිටගත්ත. මට වැරදියට පෙනෙන්නේ ඒකයි. ළමයා හම්බ වෙන්නත් ඉස්සෙල්ලා හඳහන ඉල්ලනවා. තෙල් ළිඳට තවම බැස්සේත් නැහැ. පතලේ තෙල් ගත්තේත් නැහැ. එක්සත් ජාතික පක්ෂය කියන්නේ ටෙන්ඩර් සරණං ගච්ඡාමි කියන පක්ෂයක්.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඕනෑ රට නොවෙයි ටෙන්ඩරය. ටෙන්ඩරය සඳහායි මේ කෑ ගහන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමා ආචාර්යවරයෙක්.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඒවා ඔක්කොම හරි. නමුත් කියන දේත් කියන්න එපායැ. තව විශාල වැදගත් දෙයක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාවේ වචන පාවිච්චි කරන ආකාරයක් තිබෙනවා. ඒක අනුගමනය කළොත් හොඳයි.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව ඉතා වැදගත් දෙයක් තිබෙනවා. ඉන්දියාවයි, ලංකාවයි අතරේ පෝක් සමුද්‍ර සංධියේ, මන්නාරම් බොක්කේ සහ කාවේරි බොක්කේ ද්‍රෝණිවල තෙල්

[ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා]

තිබෙනවා. ඒවායින් භාගයක් දැන් ඉන්දියාව පැත්තේ. අද ඊයේ නොවෙයි, දැනට අවුරුදු දොළහක ඉඳලා ඉන්දියාව, කාවේරි පටුනේ හා නාග පටුනේ මුහුදේ තෙල් ළිං ගණනාවක් හාරලා දවසකට තෙල් බැරල් 15,000 ගණනේ උඩට අදිනවා. ලංකාවේ මන්නාරම් බොක්කේ ඉතා විශාල තෙල් ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැන ඒ ගොල්ලෝ දන්නවා.

නාසා ආයතනය, උඩ ඉඳලා සැටලයිට් එකෙන් ෆොටෝ අරගෙන පෝක් සමුද්‍ර සන්ධියේ සැතැප්ම 22ක මුහුදු තීරයේ සිතියමක් අරන් ලංකා ආණ්ඩුවට දුන්නා, "මෙන්න අහසේ ඉඳලා බලන කොට නුඹලාගේ දූපතෙයි, මුහුදෙයි හැටි" කියලා. "නුඹලාගේ මුහුදේ පතුලේ තිබෙන තෙල් පිළිබඳ දත්ත මෙන්න" කියලා අපට වාර්තාවකුත් දීලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
මට තව දවසක විතර කාලය තමුන්නාන්සේ දෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තව මිනිත්තුවකින් අවසන් කරන්න.

**ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு ஜே. ஆர். பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)
ඒ මුහුද යට තව අවුරුදු ගණනකට ප්‍රමාණවත් වන තරමේ තෙල් පතලක් තිබෙනවා. මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා, ආර්ථික සංවර්ධන ඇමතිතුමා ගැන. අපේ ලංකාවේ ආර්ථිකය භාර ගත්ත ඉතාම දක්ෂ, අනාගත බලාපොරොත්තු තියන්න පුළුවන් ඇමතිවරයෙක් තමයි බැසිල් රාජපක්ෂ මහත්තයා. අවුරුදු තිහකට ඉස්සෙල්ලායි මෙතුමාගේ ගුණාත්මකභාවය මම වටහා ගත්තේ. ඒ අපේ තරුණ සමිතියේ ලේකම් හැටියට එතුමා වැඩ කටයුතු කරද්දී. එතුමා යටතේ මේ කාර්යය සිද්ධ වෙන්න ඕනෑ. එතැන හාරන්න. ජය ශ්‍රී මහා බෝධියට පූජාවක් පවත්වලා හාරන්න. වැඩි යටට යන්න ඕනෑ නැහැ. ස්ථිර වශයෙන්ම මේ තෙල් ගොබය උඩට එනවා. පුවක් ගහක් තරම් තෙල් ගොබයක් උඩට එනවායි කියලා මට ඇහැට පෙනෙනවා. මෙච්චර කල් අපි තෙල් ආනයනය කළා. ඒ තෙල් ගොබය ආපුවාම අපි ස්වයං පෝෂිතයි; අපේ අය වැය ලේඛනයේ තිබුණු සියලු වියදම්වලින් තුන් කාලක්ම වාෂ්ප වෙලා යනවා; අපි අලුත් රටක් වෙනවා. එච්චරක් විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තෙල් ගොබය ගොඩට ආපුවාම එදා සිට කසාද බඳින සෑම ගැහැනු ළමයකුටම තෙල් බැරල් 10,000ක් දැවැද්දට දෙනවාය කියා පොරොන්දු වෙමින් මගේ කථාව නතර කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි ඒ යෝජනාවට. ඒක නම් හොඳම යෝජනාවක්. දැන් ගරු වෛද්‍ය රාජිත සේනාරත්න ඇමතිතුමා.

[අ. භා. 5.24]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සූරියප්පෙරුම මැතිතුමාගේ කථාව ඇහැව්වාම මම කල්පනා කළේ අපරාදේ අපි කලින් කසාද බැන්දේ කියන එක ගැනයි. නැත්නම් අපටත් ඉදිරියේදී ඔය තෙල් බැරල් 10,000 ගන්න තිබුණා. [බාධා කිරීමක්] අපේ සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට නම් ඒක ගන්න පුළුවන්.

මම අද කථා කරන්නේ 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 දී පිහිටු වූ ලංකා ධීවර සංස්ථාවේ එම පනත සංශෝධන කිරීම පිළිබඳවයි. වෙනත් පෞද්ගලික අංශත් එක්ක, විදේශ සමාගම් එක්ක ඒකාබද්ධ ව්‍යාපාර ගොඩනැඟීම සඳහා අවකාශයක් ලබා ගැනීමට තමයි අද මේ සංශෝධනය ගෙන එන්නේ. ඒ වාගේම මම ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා ඇමතිවරයා වෙලා ඉන්න කොට, විදේශ රාජ්‍යවල ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා, මේ විධියටම කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ තිබුණ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සම්බන්ධයෙන් වූ පනතත් එදා සංශෝධනය කර ගත්තා. ඉදිරියේදී මම බලාපොරොත්තු වනවා, මෙවැනි ඒකාබද්ධ ව්‍යාපාර කර ගැනීමට, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සම්බන්ධයෙනුත් මෙවැනි සංශෝධනයන් ගෙන ඒමට.

මොකක්ද, මෙහි අවශ්‍යතාව? මේ රටේ මත්ස්‍ය සම්පත වැඩි කර ගන්න නම් ඒකට අවශ්‍ය මූල්‍යමය සහ අනෙකුත් භෞතික සම්පත් ලබා ගැනීමට අපට අවශ්‍යයි. අපට තිබෙන මූල්‍ය අර්බුදයෙන් බේරිලා මේ කටයුතු කර ගැනීමට විශාල යාත්‍රා ප්‍රමාණයක් අපට ලබා ගන්නට වනවා.

අපේ රටේ දරුවන්ගෙන් සියයට 21කට තවමත් මන්ද පෝෂණය තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා, 2013 වන කොට ඒක සියයට 12කට අඩු කරනවායි කියලා.

අපේ ඉලක්කය තිබෙන්නේ ඒ සියයට 12ත් නැති කරලා මේ රටෙන් මන්ද පෝෂණය නැති කරන්නයි. ඒකට ප්‍රධානම හේතුව තමයි සත්ව ප්‍රෝටීනවලින් සියයට 72ක් තවමත් ලබා ගන්නේ මේ රටේ මත්ස්‍ය සම්පත තුළින් වීම. එම නිසා මේ සත්ව ප්‍රෝටීනවලින් සියයට 72ක් ලබා ගන්නේ මාළුවලින් නම් මාළු මිල තව අඩු කරලා තව හොඳට, බහුලව මේ ව්‍යාපාරය කළොත් අපට පුළුවන් මේ ඉලක්කය කරා යන්න.

2009 වෙන කොට අපේ ඒකපුද්ගල මත්ස්‍ය පරිභෝජනය තිබුණේ සියයට 11.4ක්. එම නිසා මම කියන්න සන්තෝෂයි, ගිය අවුරුද්ද වෙන කොට සියයට 13ක ප්‍රමාණයකට අපේ ඒකපුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි වෙලා තිබෙන බව. 2010 අපේ මත්ස්‍ය නිෂ්පාදනය තිබුණේ මෙට්‍රික් ටොන් 384,670ක්. 2013 වෙන කොට අපි මේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 686,000කට වැඩි කර ගන්නට ඕනෑ. ඒකට අවශ්‍ය මත්ස්‍ය සම්පත ලබා ගන්න නම් අපට විශාල යාත්‍රා ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා අපට මූල්‍යමය ආධාර ලබා ගන්න ඕනෑ. ඒක මේ සංශෝධනයේ එක පරමාර්ථයක්.

දෙවැනි කාරණය තමයි මත්ස්‍ය අපනයනය. අපි මේ වෙන කොට මේ රටෙන් අපනයනය කරනවා, රුපියල් මිලියන 21,000ක් වටිනා මත්ස්‍ය සම්පත්. ඒ කියන්නේ ටූනා මත්ස්‍යයන්, ඉස්සන්, කකුළුවන්, මුහුදු කුඩැල්ලන්, හක් බෙල්ලන්, විසිතුරු මසුන් සහ මේ රටේ value added නිෂ්පාදන. ඒ සියල්ලමෙන්

රුපියල් මිලියන 21,000ක ආර්ථික සම්පතක් අපි ලබා ගන්නවා. 2010 අවුරුද්දේ ප්‍රමාණයට වැඩිය සියයට 10ක වැඩි වීමක් මේ අවුරුද්දේ වාර්තා කරන්න අපට පුළුවන් වුණා.

GSP වාසිය නැතිව ගිහිල්ලා තියෙද්දීත් යුරෝපා සංගමයට අපනයනය කරපු මත්ස්‍ය සම්පත සියයට 67කින් වැඩි කර ගන්න අපට පුළුවන් වුණා. ඒ නිසා මහ බැංකු වාර්තාවට අනුව ධීවර කර්මාන්තයේ 2010 මුල් කාර්තුවේ වර්ධන වේගය අනුව බලන කොට 2011 මුල් කාර්තුවේ වර්ධන වේගය සියයට 18කින් වැඩි වෙලා තිබුණා. අපේ ඉලක්කය වන්නේ, රුපියල් මිලියන 21,000ක ආදායම 2013 වෙන කොට රුපියල් මිලියන 50,000ක ආදායමක් දක්වා වර්ධනය කර ගැනීමයි. මේ තමයි අපේ දෙවැනි බලාපොරොත්තුව. මේ ඉලක්කයට ගමන් කිරීමට තමයි අද මේ සංශෝධනය ගෙන එන්නේ.

තුන්වැනි කාරණය, හැමෝම කථා කළ ටින් මාළු කර්මාන්තයයි. අපේ ගරු සුරියප්පෙරුම මන්ත්‍රීතුමාත් බොහෝ වේලාවට ටින් මාළු ගැන කිව්වා. මේ අවුරුද්ද ඇතුළත ටින් මාළු කර්මාන්තායතන තුනක් අපි විවෘත කරනවා. තව දින ගණනාවකින් මම මීගමුවේ පළමුවැනි ටින් මාළු කර්මාන්තශාලාව විවෘත කරනවා. ඒකේ දවසකට ටින් 10,000ක් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම මම ධීවර සංස්ථාවත් එක්ක ඒකාබද්ධ ව්‍යාපාරයකට ගිවිසුමක් අත්සන් කළා. ඒ අනුව මාස තුනක් ඇතුළතදී ඒ ගොල්ලන් ඒ කර්මාන්තශාලාව විවෘත කරන්නට ඕනෑ. ඒකෙත් දෛනික නිෂ්පාදනය ටින් 10,000ක්. ඒ වාගේම ඔක්තෝබර් මාසයේදී තුන්වැනි ටින් මාළු කර්මාන්තශාලාව පෑලියගොඩදී අපි විවෘත කරනවා. ඒකෙත් නිෂ්පාදනය ටින් 15,000ක්. ඒ අනුව දවසකට ටින් 35,000ක් අපි හදනවා. ඒත් අපට මදි. දවසකට ලංකාවේ පරිභෝජනයට ටින් ලක්ෂයක් විතර ඕනෑ කරනවා. ඒ නිසා තවත් කර්මාන්තශාලා ලබා ගන්නට අපි කථා කර ගෙන යනවා. ඒ මෙම සංශෝධනයේ තවත් බලාපොරොත්තුවක්. ඒකට අවශ්‍ය මත්ස්‍ය සම්පත අපි ලබා දෙන්න ඕනෑ. ලංකාවට ටින් මාළු කර්මාන්තායතනයක් ගේන්නට තිබෙන ප්‍රධානම බාධකය ඒකට අවශ්‍ය මත්ස්‍ය සම්පත නොමැතිවීමයි.

අනෙක් එක තමයි උම්බලකඩ නිෂ්පාදනය. ජපානයේ උම්බලකඩ නිෂ්පාදනය කරන ප්‍රමුඛම ආයතනයේ නිලධාරින් ඇවිල්ලා මාත් එක්ක මේ ගැන සාකච්ඡා කළා. තායිලන්තයේ, පිලිපීනයේ හා ඉන්දුනීසියාවේ ඔවුන්ගේ කර්මාන්තශාලා හදලා තිබෙනවා. මම කිව්වා, අපේ වාර්ෂික උම්බලකඩ අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 6,000ත් 8,000ත් අතර ප්‍රමාණයක තිබෙනවා කියලා. ඒ සම්පූර්ණ උම්බලකඩ ප්‍රමාණය අපේ රටේ නිෂ්පාදනය කිරීමට ඒ පිළිබඳව ශක්‍යතා වාර්තාව අරගෙන ඔවුන් තව නොබෝ දිනකින් ලංකාවට එනවා. මේ සඳහාත් අපි ඔවුන්ට මත්ස්‍ය සම්පත ලබා දෙන්න ඕනෑ. නැත්නම් ඒ අවශ්‍ය මත්ස්‍ය සම්පත ආනයනය කරන්න ඕනෑ. මේ සංශෝධනය ගෙන ඒමේ අනෙක් හේතුව ඒකයි. සමහර වෙලාවට අපට මේ සඳහාම මත්ස්‍ය සම්පත ආනයනය කරන්න වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත් තායිලන්තය ඩොලර් මිලියන 680ක විතර මත්ස්‍ය සම්පතක් අපනයනය කරනවා වාගේම, ඩොලර් මිලියන 640ක විතර මත්ස්‍ය ප්‍රමාණයක් ආනයනයත් කරනවා. ආනයනය කරලා value add කරලා තමයි අර ඉතුරු ගණන ඒ ගොල්ලන් හම්බ කර ගන්නේ. ඉතින් එම නිසා අපටත් ඒ සඳහා මත්ස්‍ය සම්පත ආනයනය කරන්න වෙනවා. ඒකට අපට මූල්‍ය අවශ්‍යතාව තිබෙනවා. ඒ මූල්‍ය අවශ්‍යතාව සම්පූර්ණ කර ගන්න ඒකාබද්ධ ව්‍යාපාරවලින් විශාල මුදලක් ලබා ගැනීමේ හැකියාව අපට තිබෙනවා. ඒ සඳහාත් තමයි අපි මේ සංශෝධනය ගේන්නේ.

අනික් කාරණය තමයි අනික් රටවල තියෙන ආර්ථික කලාපවල අපේ මත්ස්‍ය කර්මාන්තය ආරම්භ කිරීම. දැන් මම රටවල් 4ක් එක්ක සාකච්ඡා කරලා තියෙනවා. බංගලා දේශය මේ සඳහා කැමැතියි. මියන්මාරය, මැලේසියාව හා උතුරු කොරියාව තමයි අනික් රටවල්. ඒ රටවල් හතරේම ඇමතිවරු මම හමු වුණා. පසු ගිය මාසයේ 28, 29 අපේ FAO රැස්වීම තිබුණා. එතැනදී මම ඔවුන් එකක් කථා කළා. ඔවුන් කැමැතියි ඒ ගොල්ලන්ගේ ආර්ථික කලාපවලට අපේ යාත්‍රා ගිහිල්ලා ඒ රටවල තිබෙන මත්ස්‍ය සම්පත නෙළා ගෙන ඔවුන් එක්ක ඒ ලාභය බෙදා ගැනීමේ වැඩ පිළිවෙළවල්වලට යන්න. ඒ සඳහා බංගලා දේශය අපෙන් ඉල්ලීමක් කරලා තිබුණා. අපෙන් report එකක් ඉල්ලුවා, ඒ ගොල්ලන්ගේ කැබිනට් අනුමැතිය මේ සඳහා ලබා ගන්න. ඒ සඳහා යන්න නම් තවත් විශාල යාත්‍රා ප්‍රමාණයක් අපට ලබා ගන්න ඕනෑ. එතකොට අපට අපේ ගැඹුරු මුහුද විතරක් නොවෙයි, අපේ ජාත්‍යන්තර මුහුද විතරක් නොවෙයි, අපේ ආසන්න රාජ්‍යවල තියෙන ආර්ථික කලාපවලත් ව්‍යාපාරික කටයුතු කළ හැකියි.

ඊළඟ කාරණය තමයි මේ රටේ සිල්ලර වෙළෙඳාම තුළින් මේ රටට අවශ්‍ය මත්ස්‍ය ප්‍රමාණය ඒ විධියටම ලබා දෙන එක. අපි මේ වන කොට ධීවර සංස්ථාවේ වෙළෙඳ සැල් 100ක් විතර ආරම්භ කරලා තිබෙනවා. නමුත් ඒ ටික මදි. අපේ ඉලක්කය තමයි වෙළෙඳ සැල් 250කුත්, සතොස වෙළෙඳ සැල් 250කුත්, Co-op City ඒ ප්‍රමාණයකුත් ආරම්භ කිරීම. ඇත්තටම අපි අද සතොස වෙළෙඳ සැල් එකසියඅනූ ගණනක ශීතකරණය කරපු මත්ස්‍ය සම්පත විකුණනවා. ඒ නිසා අද මාළු විකිණීම අතින් අපි ඉතාමත්ම ඉහළ මට්ටමකට ගමන් කරලා තිබෙනවා. 2010 ධීවර සංස්ථාව ලබපු ආදායම වාගේ ආදායමක් අපි මාස හයකින් ලබලා තිබෙනවා. ඒ ආදායම අපි ලබා තිබෙන්නේ මේ වැඩ පිළිවෙළ නිසයි. නමුත් ඒක මදි. මේ වාගේ තව දෙකහමාරක ගුණයකින් අපි ඉදිරියට යන්නට ඕනෑ. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් අපි ආරම්භ කරන ඒකාබද්ධ ව්‍යාපෘතිවලින් අපට ලැබෙනවා.

අපි ඉදිරියේදී බලාපොරොත්තු වනවා, මේ රටේ මත්ස්‍ය සම්පත දියුණු කරන්න. බ්‍රිතාන්‍යයට මම ගිය වෙලාවේ මේ රටේ මත්ස්‍ය සම්පත යුරෝපා සංගමයට බෙදා හරින සියලුම දැවැන්ත ව්‍යාපාරික සමාගම් සියල්ලත් එක්කම කථා කළා. ඒ වාගේම Sainsbury එක, Tesco එක, Marks and Spencer, Seafish, Eurofish කියන ආයතන අද අපිත් එක්ක සහභාගි වෙලා මේ රටේ මත්ස්‍ය සම්පතේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග අරගෙන ක්‍රියාත්මක කරගෙන යනවා. එකක් තමයි මේ රටේ ක්‍රියාත්මක වන "Code of Conduct for Responsible Fisheries" කියන එක; අද යුරෝපා සංගමය බලාපොරොත්තු වනවා, මේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට, සාගර ප්‍රඥප්තියට අනුව ඒකේ තියෙන අර IUU - Illegal, Unreported and Unregulated vessels කියන ඒවා ඇරෙන්න ඉතාමත්ම හොඳ පරිසරාත්මක විධියට ධීවර කර්මාන්තය කිරීම. ඒකට අපි අවනත වන්න ඕනෑ. දෙවැනි කාරණය විධියට ඒකේ තියෙනවා, සෞඛ්‍යාරක්ෂිත තාක්ෂණික ක්‍රමවේදය - HACCP - කියලා. මෙන්න මේ කරුණු දෙකට අපි යන්න ඕනෑ. මගේ ආරාධනාවට අනුව ඒ රටවල ඉඳලා විශේෂඥයෝ කණ්ඩායමක් ලංකාවට ඇවිල්ලා, ඒකේ pre-feasibility එක දැන් ඉවර කරලා තිබෙනවා. යුරෝපා සංගමයේ තිබෙන සියලුම දැවැන්ත ජාලය මට පොරොන්දු වෙලා තිබෙනවා, feasibility එක අවසන් කළාම මේ ක්‍රමවේද ටික අපි දුන්නාට පස්සේ එන අවුරුද්ද මුල වන කොට අපට Marine Certificate කියලා එකක් දෙනවාය කියලා. ඒ Marine Certificate එක අපේ මත්ස්‍ය සම්පතට ලබා දුන්නාම - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Only one speaker can speak at a time.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ ගොල්ලෝ මට පොරොන්දු වෙලා තිබෙනවා, ඒ Marine Certificate එක ලබා ගත්තාට පස්සේ මේ යුරෝපයේ වෙළෙඳ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

පොළෙන් අපේ ශ්‍රී ලංකාවට නොම්මර එකේ ප්‍රමුඛත්වය ලබා දෙනවා, ශ්‍රී ලංකාවට ලබා දෙන්න බැරි මත්ස්‍ය ප්‍රමාණය තමයි වෙන රටවලින් ඒ ගොල්ලෝ ආනයනය කරන්නේ කියලා. ඒ ගොල්ලන්ට මිලේ ප්‍රශ්නයක් නැහැ. ඒ ගොල්ලන්ට අවශ්‍ය ගුණාත්මක භාවයයි. මේ අවුරුද්ද ඉවර වන්නට ඉස්සෙල්ලා ඒ ප්‍රමිති සහතිකය අපට ලබා ගන්න තමයි අපි දැන් ගමන් කරන්නේ. මම ඒ ගොල්ලත් එක්ක කථා කළා. ඊට පස්සේ මම බලාපොරොත්තු වනවා, මේ රටේ trademark එක ඇති කරන්න. "Ceylon Tea" කිව්වාම ඒකට අද ලෝකයේ වෙනමම වටිනාකමක් තිබෙනවා. සාමාන්‍ය තේ එකකට වඩා එහි වෙනසක් තිබෙනවා. මොකද මිනිස්සු ඉල්ලන්නේ "Ceylon Tea" කියලා. "Ceylon Tuna" කියන trademark එක ජාත්‍යන්තර වෙළෙඳ පොළෙන් ලබා ගැනීම තමයි අපේ ඊ ළඟ බලාපොරොත්තුව.

අද යුරෝපා සංගමය මත පමණක් අපේ අපනයන රඳා පවතිනවා. ඒ නිසා ඔවුන්ගේ සියලුම වගකීම් හා සියලුම තහංචිවලට අපි යටත් වන්න වෙනවා. අපට ජපානයේ හොඳ වෙළෙඳ පොළක් තිබෙනවා. අනික් රට තමයි ඇමෙරිකාව. ඒකේ තහංචි නැහැ. ඊට වඩා ඉතාමත්ම ලාභදායී ක්‍රමය තමයි සෂිමි ක්‍රමයට මාළු අල්ලන එක. දැන් ඒ සෂිමි ක්‍රමයට මාළු ටික සපයන්න නම් ඒ සෂිමි ක්‍රමයට මාළු අල්ලන්න උගන්වන්න ඕනෑ. ඒ නිසා විශේෂඥයෝ ගෙනැල්ලා සෂිමි ක්‍රමයෙන් මත්ස්‍ය නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ලබා ගැනීම සඳහා දියඹේදී අපේ ධීවරයන් දැනුවත් කිරීමට අපේ ආයතනත් එක්ක, පෞද්ගලික අංශයත් එක්ක මම ව්‍යාපාර වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. මොකද, ඒ ක්‍රමයෙන් අපට පිරිවැය අඩුයි. අපි යුරෝපා සංගමයට ගෙනියන මාළු process කරන්න factory ඕනෑ. නමුත් සෂිමි ක්‍රමයට යනවා නම් ඔළුව අයින් කළා, වරල් අයින් කළා, ඇතුළේ තිබෙන අතුරු භාණ්ඩ ටික අයින් කළා, clean කළා, ඒ විධියටම කෙළින්ම box එකේ දාලා පිට රට යැව්වා. වෙරළේ ඉඳලාම යවන්න පුළුවන්. එතකොට පිරිවැය හුඟක් අඩු වෙනවා. එම නිසා අපට ලැබෙන ලාභය වැඩියි. එම නිසා අපි ජපානය සහ ඇමරිකාවත් එක්ක කථා කරලා තිබෙනවා. අපේ මාළු ප්‍රමාණය කොච්චර වුණත් සෂිමි ගුණාත්මකභාවය ඇතිව ඒ සියලු මාළු ප්‍රමාණය ලබා ගන්න ඔවුන් ලැහැස්තියි. ඒ නිසා එම වැඩ පිළිවෙළ අපි පෞද්ගලික අංශයත් එක්ක දැනට ආරම්භ කරලා තිබෙනවා.

මේ සඳහා ඇති උපාය මාර්ග මොනවාද, ඒ සඳහා කරන්න තිබෙන්නේ මොකක්ද? අපි දන්නවා, ඔබතුමන්ලා දන්නවා දකුණේ වෙරළ අද සංතෘප්තයි කියලා. දකුණේ ඉලක්ක හඹා ගෙන ගොස් මේ අවුරුද්දටත් අපි ඒක පහු කර ගෙන ගිහිල්ලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ වෙරළ ආසන්න නිෂ්පාදනය සියයට 103ක් දක්වා ගිහිල්ලා තිබෙනවා. අපේ ඉලක්කයටත් වඩා අපි ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. නමුත් අපට දියුණු කරන්න ඉතිරි වෙලා තිබෙන එකම වෙරළ ආසන්න මුහුද වන්නේ උතුරයි. මොකද, එදා 1983 වෙන කොට මේ රටේ මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 41ක් අපි උතුරෙන් ලබා ගත්තා. 2009 දී අපි උතුර නිදහස් කර ගන්න කොට ඒක සියයට 10 විතර දක්වා කඩා ගෙන වැටිලා තිබුණා. අපි ඉදිරියට බලාපොරොත්තු වන්නේ උතුරෙන් සියයට 50ක ප්‍රමාණයක් ලබා ගන්නයි. ගිය අවුරුද්ද වෙන කොට ඒක සියයට 13ක් දක්වා දියුණු වෙලා තිබෙනවා. ඒක සියයට 50 දක්වා ගෙන ඒමයි අපේ බලාපොරොත්තුව. ඒ නිසා උතුරේ ධීවරයා ශක්තිමත් කිරීම සඳහා වෙනම විශාල වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ගැඹුරු මුහුද අරගෙන බැලුවොත්, අපට අවශ්‍ය මත්ස්‍ය සම්පත ගැඹුරු මුහුදෙන් ගන්නවා නම් මේ වාගේ තුන් ගුණයක් දක්වා අපට යන්න පුළුවන්. සියයට 194කින් වර්ධනය කර ගන්නට අපට හැකියාව තිබෙනවා. නමුත් ඒකට අවශ්‍ය දැවැන්ත සහ හොඳ යාත්‍රා ප්‍රමාණයක් අපට ලබා ගන්නට ඕනෑ. ඒ වාගේම නාවික සැතපුම් 200කින් එහා, අපේ ආර්ථික කලාපයෙන් එහා ජාත්‍යන්තර මුහුද තිබෙනවා. ඒ ජාත්‍යන්තර මුහුදේ, ඒ කියන්නේ ඉන්දියන් සාගරයේ මත්ස්‍ය සම්පතින් සියයට 48ක් නෙළා ගන්නේ යුරෝපා සංගමයේ රටවල්. විශේෂයෙන්ම ස්පාඤ්ඤය සහ ප්‍රංශය. ඒ රටවල් දැවැන්ත නාවික යාත්‍රාවලින් තමයි ඇවිල්ලා යන්නේ.

මගේ බලාපොරොත්තුවක් තිබෙනවා, ඒ වාගේ විශාල යාත්‍රා අරගෙන ජාත්‍යන්තර මුහුදේ ඔවුන් එක්ක තරග කරලා අපේ කලාපයෙන් ඔවුන් ඉවත් කරගෙන යන මත්ස්‍ය සම්පත අපට ලබා ගන්නට. ඒ සඳහා මම ඔවුන් සමඟ ගැටීමේදී ඉන්දියාව මගේ පිටිපස්සෙන් ඉඳගෙන ඒ සටනට මට උදව් කළා. මොකද, ඔවුන්ට මේ හැකියාව නැති වුණත් ඒ සඳහා අපට,-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඉන්දියාව පස්සෙන්ද, ඉස්සරහින්ද?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
දැනට ධීවර කර්මාන්තයෙන් ඉස්සරහ. අනෙක් ඒවා කොහොම වුණත්. අද විතරක් නොවෙයි, ඒක ඓතිහාසිකවම දෙයක්. ඒකත් සමඟ ඉතිරි රටවල ආර්ථික කලාපවලට අපි ගමන් කරන එක ගැනත් කියන්න ඕනෑ. උතුරේ වෙරළ ආසන්න මත්ස්‍ය සම්පත නෙළා ගැනීම සඳහා ගිය අවුරුද්දේ අපි උතුරට පමණක් රුපියල් මිලියන 354ක් වියදම් කළා. මේ අවුරුද්ද සඳහා දැනට අපි රුපියල් මිලියන 200කට වැඩිය වියදම් කරලා තිබෙනවා. ඒ සඳහා අපි නොයෙකුත් ආම්පන්න දුන්නා. දැල් දුන්නා, ඔරු දුන්නා, ණය දුන්නා, ආධාර දුන්නා. ඒ එක්කම උතුරට සහ නැඟෙනහිරට අවශ්‍ය සියලුම වරායයන් හදන්න අපි ආරම්භ කරලා තිබෙනවා. ඒකෙන් දෙකක් වන ගුරුනගර් සහ සිලාවතුර වරායයන් හදන්නට අපි ඔළුවිල් වරාය හදපු සමාගමට දීලා තිබෙනවා. ඒ වාගේම අපේ මයිලඩි ධීවර වරාය හදන්න කොරියාව භාර අරගෙන තිබෙනවා. පේදුරුතුඩුව වරාය හදන්න ජපානය භාර අරගෙන තිබෙනවා. ඉතිරි සියලුම වරායයන් ටික හදන්නට නෝර්වේ රාජ්‍යයෙන් භාර අරගෙන ඒවායේ ශක්‍යතා වාර්තා හැදීම සඳහා මේ වන විට ඩොලර් මිලියනයක විතර මුදලක් අපට ලබා දීලා තිබෙනවා. ඉදිරියේදී ඔවුන්ගේ ආණ්ඩුවෙන් ඩොලර් මිලියන 100ක මුදලක් ලබා දීලා නොමිලයේ අපේ වරායන් ටික හැදීම සඳහා ආධාර කරන්නටත් පොරොන්දු වෙලා තිබෙනවා.

අපට අවශ්‍ය නැංගුරම් පොළවල් සකස් කළාම උතුරේ සංවර්ධනය ඇති කිරීම සඳහා ඒවාට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දෙන්න අපට පුළුවන්. ඒ වාගේම උතුරු ප්‍රදේශයට ශීතාගාර අවශ්‍යයි. පළමුවැනි එක අපි වල්ලේපාඩුවල හැදුවා. දෙවැනි එක මුලතිව්වල හදා ගෙන යනවා. ඒ වාගේම ඒවා හදන්නට කාලය ගත වන නිසා අපි උතුරට ජංගම ශීතාගාර 6ක් ලබා දෙනවා ඒ අයගේ මාළු කොළඹ වෙළෙඳ පොළට ගෙන එම සඳහා. ඒ වාගේම අයිස් යන්ත්‍රාගාර, ප්‍රවාහන පහසුකම් මේ සියල්ලම ඉදිරියේදී අපි ඔවුන්ට දෙන්න බලාපොරොත්තු වනවා. මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන -processing centres- කිහිපයක් අපි උතුර සහ නැඟෙනහිර ඉදි කරන්න දැන් සාකච්ඡා කර ගෙන යනවා. දැන් දකුණු වෙරළේ මේ තිබෙන මත්ස්‍ය සම්පත මේ විධියට රැක ගන්නට අපි ගත්තා වූ ප්‍රධානම ක්‍රියා මාර්ගය තමයි නීති විරෝධී ආම්පන්න තහනම් කිරීම. ඩයිනමයිට් තිබුණා ත්‍රිකුණාමලයේ. ඒක සම්පූර්ණයෙන්ම දැන් තහනම් කරලා අවසන් කර තිබෙනවා. දකුණේ තිබුණා light course කියන ක්‍රමය. ඒකත් තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම trawling ක්‍රමය උතුරට තිබුණා. ඒ වාගේම ගම්පහ සහ කල්පිටියටත් තිබුණා. ඒක අපි තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම තංගූස් දැල ආනයනය කිරීමත් තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම ලයිලා, සුරුක්කු දැල් කියන ඒවා

ඔක්කෝම තහනම් කරලා තිබෙනවා. දැනට ඉතිරි වෙලා තිබෙන්නේ හැඹිලි දැල විතරයි. ඒක හොඳ නැහැ කියලා පිළිගන්නවා. නමුත් ලෝකයේ හැම රටකම ඒක භාවිත කරන නිසා අපිත් තවම ඒක භාවිත කරනවා. නමුත් ඉදිරියට අපි බලාපොරොත්තු වනවා ඒකත් මරුවැල් පන්නයට, එහෙම නැත්නම් longline ක්‍රමයට වෙනස් කරන්න.

මේ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අපි විශේෂ කාර්ය බලකායක් පිහිටුවා තිබෙනවා. අපේ ධීවර අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, නාවික හමුදාව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව - Department of Coast Guard - එයට අයත් වනවා. අපි වාරිකව හමු වෙනවා. ඒකේදී විශේෂයෙන්ම ඉන්දියානු ධීවරයින්ගේ ප්‍රශ්නය සඳහා ගන්නා ක්‍රියා මාර්ග ගැන සාකච්ඡා වෙනවා. ඒ වාගේම නීති විරෝධී ආම්පන්න තහනම් කිරීමට ක්‍රියාමාර්ග ගැනීමේදී අපට ඇති වන බාධක ඇතුළු නොයෙකුත් ප්‍රශ්න අපි එතැනදී සාකච්ඡා කරලා, ඒවා මැඩ පවත්වා ගැනීම සඳහා වරින්වර තීන්දු ගන්නවා. මේ කටයුතුවල ප්‍රතිඵල තිබෙනවා.

දැන් බලන්න, වෙරළාසන්න අපේ වැඩිම මත්ස්‍ය නිෂ්පාදනය තිබුණේ 1983 කැරැල්ලට පෙරයි. අස්වැන්න මෙට්‍රික්ටොන් 1,84,049ක් තිබිලා තිබෙනවා. අපට ගිය අවුරුද්දේත් -2010 දී- වාර්තාගත අස්වැන්නක් ලැබුණා. මෙට්‍රික්ටොන් 2,02,420කටත් වඩා වැඩි අස්වැන්නක් අපට ලැබුණා, දැන් උතුරු වෙරළත් නිදහස් කිරීම නිසා.

දැනට අපට තිබෙනවා මුහුදු ධීවර යාත්‍රා 45,163ක්. මේකෙන් වෙරළාසන්න එක්දින යාත්‍රා තමයි 41,817ක් තිබෙන්නේ. අපට ගැඹුරු මුහුදට තිබෙන්නේ බහුදින යාත්‍රා 3,346යි. ඒකෙනුත් යුරෝපා සංගමයට මේ මාළු අපනයනය කිරීම සඳහා අවශ්‍ය, ඒ marine තත්ත්වය ආරක්ෂා කරන්නට පුළුවන් යාත්‍රා අපට තිබෙන්නේ 94යි. ඒ මොකක්ද? මේ Refrigerated Sea Water හෙවත් Chilled Sea Water කියන පද්ධතියෙන් වතුරේ තමයි මාළුවා ගේන්නේ. නමුත් ඒ වතුරේ සෙල්සියස් අංශක ඍණ හතරට උෂ්ණත්වය තියා ගන්නවා. ඒ කියන්නේ මාළුවා ගොඩට ගෙනෙන කොටත් ඉතාම නැවුම් තත්ත්වයෙන්, ගුණාත්මකභාවයෙන් තිබෙනවා. එවැනි යාත්‍රා අපට තිබෙන්නේ 94යි. මම පසු ගිය කාලයේ පුළුවන් තරම් කටයුතු කළා ඒ යාත්‍රා හදවන්නට; හදවලා දියඹට දමන්නට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, longline හෙවත් මරුවැල් පන්න ක්‍රමය මාළු අල්ලන්න තිබෙන ඉතාමත්ම හොඳ ක්‍රමයක්. ඒවා තිබෙන්නේ 349යි. ඒ නිසා අපට විශාල යාත්‍රා පද්ධතියක් ඕනෑ මේ කියන වැඩ පිළිවෙළට යන්න. මේ යාත්‍රා පද්ධතිය දියුණු කිරීමේ එක් ක්‍රියා මාර්ගයක් ලෙස නවීන තාක්ෂණයෙන් යුක්ත බහුදින යාත්‍රා සැපයීම හඳුනා ගෙන තිබෙනවා. ඒක ආරම්භ කරන්න මේ සංශෝධනය සම්මත වන තුරුයි අපි හිටියේ. ඊට පසු පළමුවැනි ගිවිසුමේ කටයුතු සෞදිඅරාබියා අල්-ෆයිසාල් පදනමත් එක්ක සිදු වෙනවා. ඒකේදී ඔවුන් අපට ණය ආධාර ලබා දෙනවා ඩොලර් මිලියන 300ක පමණ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා ඔබතුමාට තව විනාඩි දෙකක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනට ඉවර කරනවා.

අනෙක තමයි දැනට තිබෙන RSW, CSW කියන ක්‍රමය හැම බහුදින යාත්‍රාවකටම හඳුන්වා දෙන්න කටයුතු කිරීම. ඒ වාගේම දැනට තිබෙන ටොන් තුනහමාරේ එක්දින යාත්‍රාවලටත් මරුවැල් පන්නය අපි හඳුන්වා දෙන්න කටයුතු කරනවා, තිබෙන හැඹිලි දැල් ක්‍රමය අයින් කරලා. ඒ වාගේම උතුරට ටොන් තුනහමාරේ ධීවර යාත්‍රා, බහුදින යාත්‍රා හඳුන්වා දීමට කටයුතු කරනවා. ඔවුන්ට තිබෙන්නේ ඉතාමත්ම සුළු ගණනක්. අනෙක, අති නවීන බහුදින යාත්‍රා ජාත්‍යන්තර මුහුදට යොමු කිරීම. ඒ වාගේම මවු යාත්‍රා ක්‍රියාත්මක කිරීම. දැනට අපි ගෙනැල්ලා තිබෙනවා පළමුවැනි මවු යාත්‍රාව. තව එකක් නිෂ්පාදනය කරනවා චීනයේ. මම බලාපොරොත්තු වනවා මවු යාත්‍රා 7ක් 8ක් විතර මේ අවුරුද්ද ඉවර වෙන කොට ලංකාවට ගෙන්වා ගන්න. මේක තිබෙන්නේ මත්ස්‍ය නිෂ්පාදනයේ අධික වියදම සහ සමහර වෙලාවට ඇති වන අලාභය වැළැක්වීමටයි. දියඹට ගිහිල්ලා, ගැඹුරු මුහුදට ගියාම ඔවුන්ගේ අයිස් ටික දිය වෙන කොට, ඔවුන්ගේ කෑම ටික අඩු වෙන කොට, ඔවුන්ගේ තෙල් ටික අඩු වෙන කොට ඔවුන්ට ලාභ වුණා හෝ අලාභ වුණා හෝ නැවත මෙහාට එන්න ඕනෑ. මවු යාත්‍රාව තිබෙනවා නම් මේ සියල්ල ඔවුන්ට ලබා දෙන්න පුළුවන් ගැඹුරු මුහුදේදී. ඒ වාගේම ඔවුන්ගේ මත්ස්‍ය සම්පත මිලයට අරගෙන එන්න පුළුවන්. එතකොට තව තවත් ඔවුන්ට මත්ස්‍ය සම්පත අරගෙන තමන්ට ඉතාමත්ම ලාභදායී විධියට ගොඩබිමට එන්න පුළුවන්. ඒ නිසා ඉතාමත්ම ඉක්මනින් මේ මවු යාත්‍රා ක්‍රමය අපි ආරම්භ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, VMS පද්ධතිය -Vessel Monitoring System - මීට පෙර තිබුණේ නැහැ. අද මේ යාත්‍රාවලින් මාළු අල්ලන්නේ පැරණි සම්ප්‍රදායික ක්‍රමවලටයි. නමුත් දැන් satellite එකෙන් සොයා ගන්න පුළුවන් තමන්ගේ යාත්‍රාව තිබෙන ප්‍රදේශයේ මාළු බිම් තිබෙන්නේ කොහේද කියලා. Fish finder එකෙන් සොයා ගන්න පුළුවන්. ඒ වාගේම කාලගුණ වාර්තාව තව සුමානයක්, දෙකක් එහාට බලා ගන්න පුළුවන්. සුනාමියක් එනවාද, භූමි කම්පාවක් එනවාද, මුහුද ගොඩ ගැලීමක් එනවාද, සුළි සුළං එනවාද, උෂ්ණත්වය කීයද, වහිනවාද, නැද්ද කියන මේ ඔක්කොම ඇතුළත් කාලගුණ වාර්තාව - weather forecast එක - බලා ගන්න පුළුවන්. ඒ වාගේම තමන්ගේ මුහුදු සීමා - maritime borders - හඳුනා ගන්න පුළුවන්. ඒවා කඩා ගෙන ගිහින් අත් අඩංගුවට පත් වන්න ඕනෑ නැහැ. තමන්ට අනතුරක් වුණොත් ඒවායේ warning signals මඟින් එක button එකක් තද කරලා අපේ පද්ධතියට ඒක දැනුම් දෙන්න පුළුවන්. එතකොට අපි දන්නවා ළඟ තිබෙන යාත්‍රා මොනවාද කියලා. අපට ඒ අයට කියන්න පුළුවන් මේ යාත්‍රාව ගලවා ගෙන එන්න කියලා.

ධීවර කර්මාන්තය ජීවිතය පිළිබඳව අන්තරාවක් නැති කර්මාන්තයක් බවට පත් කරන්න අවශ්‍ය VMS ක්‍රමය අපි තව මාස කිහිපයකින් හඳුන්වලා දෙනවා. අපි සන්තෝෂ වනවා, මේ අමාත්‍යාංශය ගිය අවුරුද්දේ අපි භාර අරගෙන මාස 6ක කාල පරිච්ඡේදය තුළ තිබෙන සියලුම බාධකත් එක්ක 2009 තිබුණ මෙට්‍රික්ටොන් 3,39,000ක නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 3,84,670 දක්වා වැඩි කර ගන්නට අපට පුළුවන් වීම ගැන. 2011 ජූනි මාසය දක්වා අපේ ඉලක්කය තිබුණේ මෙට්‍රික්ටොන් 2,25,890යි. අපි මේ වන කොට මෙට්‍රික්ටොන් 2,03,230කට, ඒ කියන්නේ සියයට 90ක ඉලක්කයට අපි ගමන් කරලා තිබෙනවා. 2010ට සාපේක්ෂව බැලුවොත් සියයට 15ක වර්ධනයක් බලා ගත හැකියි.

මට තව කාරණා ටිකක් කියන්නට තිබෙනවා. නමුත් ඔබතුමා කියනවා කාලය අවසන් කියලා. මේ විධියට තව අවුරුදු දෙකක් යන කොට මම අපේ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන්, සූරියප්පෙරුම මැතිතුමා කියනවා වාගේම සාගර අය වැයක් - මේ රටේ අය වැය වාගේම, මේ රටේ සංචාරක ව්‍යාපාරය වාගේම ඒ හා සමානව සාගරයෙන් එන අය වැයක්- ඇති කරනවා. අතිගරු

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ජනාධිපතිතුමා ගෙන යන වැඩ පිළිවෙළේදී, ඒ කියන්නේ මේ රට ආසියාවේ ආශ්චර්යක් බවට පත් කරන්නට යන මේ ගමනේදී මේ රටේ ධීවර කර්මාන්තය ආශ්චර්යක් කිරීම තමයි මගේ බලාපොරොත්තුව. ධීවර කර්මාන්තයෙන් එතුමාගේ ඒ ගමනට දායකත්වයක් ලබා දෙන්න මා බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.47]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ ඉදිරි ආර්ථිකය පිළිබඳව බලාපොරොත්තු තබා ගැනීමේදී අපේ රටේ තෙල් සම්පත ඉතාමත් වැදගත් සාධකයක් බවට පත් වෙනවා. හැබැයි අපි ලෝකය දිහා බැලුවොත් තෙල් සම්පත තමන්ගේ ආර්ථිකයට ප්‍රධාන පිටිවහලක් කර ගත් රාජ්‍යයන් වාගේම තෙල් සම්පත හේතු කොට ගෙන තමන්ගේ රාජ්‍යයන් වෙත විශාල ආක්‍රමණයන්වලට, විශාල මැදිහත් වීම්වලට මුහුණ දුන් ඉතිහාසයකුත් අපි දැකලා තිබෙනවා. ඒ වාගේම තමයි ඕනෑම රටක තිබෙන සම්පතක් රටේ උන්නතිය සඳහා උපයෝගී කර ගන්න කොට ඒ සම්පත අපි නෙළා ගන්නේ කොහොමද, ඒ සම්පත අපි පරිහරණය කරන්නේ කොහොමද, ඒ සම්පත අපි බෙදා හදා ගන්නේ කොහොමද කියන කාරණය අතිශය වැදගත්. ඒ නිසා තෙල් සම්පත තිබීමම ප්‍රමාණවත් නැහැ. ඒ තෙල් සම්පත අපි පරිහරණය කිරීම සඳහා ගන්නේ කොහොමද, එහිදී අපට ලැබෙන පංගුවේ, කොටසේ ප්‍රමාණය කොච්චරද කියන එක අතිශය වැදගත්. දැන් මීට කලින් 2008 ජූලි මාසයේ 08 වෙනිදා මේ තෙල් සම්පත පිළිබඳව කැණීම් සහ ගවේෂණය කරන්න ටෙන්ඩර් කැඳවීමෙන් ඉන්දියාවේ කෙයාන් කියන සමාගමට ලබා දෙනු ලැබුවා. මෙම කෙයාන් කියන සමාගමට මෙය භාර දීමට පෙර මේ පාර්ලිමේන්තුවේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සම්මත කර ගත්තා. ඒ පනත සම්මත කර ගනු ලැබුවේ 2008 පෙබරවාරි මාසයේ 22 දිනයි. ඒ පනතට අනුරූපී වන පරිදි ගැසට් නිවේදන දෙකක් මේ වන විට නිකුත් කරලා තිබෙනවා. එකක් නිකුත් කරලා තිබෙනවා 2011.03.01 වෙනි දා. ඊ ළඟ ගැසට් නිවේදනය නිකුත් කරලා තිබෙනවා 2011.04.29 වෙනි දා.

එතකොට අප අද සාකච්ඡාවට ගන්නේ, 2011 අප්‍රේල් 29වැනි දා නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ පළ කර ඉදිරිපත් කරන ලද නියමයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම ගැසට් පත්‍රයේ මෙහෙම සඳහන් වනවා:

"2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මම, විදුලිබල හා බලශක්ති විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා මෙම නියමය මඟින්-"

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon MR. ALHAJ A.H.M. AZWER left the Chair and MR. DEPUTY CHAIRMAN OF COMMITTEES took the Chair.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මෙම නියමයෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද? කෙයාන් සමාගම සඳහා ජූලි මාසයේ 08 වැනි දා අපේ තෙල් බිම් තුනක් කැණීම පිළිබඳව ටෙන්ඩරය කැඳවනකොට, ඒ ටෙන්ඩර් ලියවිල්ලේ තිබුණේ කුමක්ද? ඒ ටෙන්ඩර් ලියවිල්ල අනුව අපි අතර බෙදා හදා ගන්නා ප්‍රමාණයන් පිළිබඳව, ඒ වාගේම බෙදා ගැනීම පිළිබඳ ගිවිසුමකට අපි එළඹෙනවා. හැබැයි ඒ ගිවිසුමේ කොතැනකවත් නැහැ, එම ලබා ගන්නා ලද සමාගමට දෙන සහන මොනවාද කියලා. ඒ වනකොට ප්‍රකාශයට පත් කරලා තිබුණේ නැහැ. කවර හෝ සම්පතක් සමාගමකට පවරන්නට අපි සූදානම් කරනවා නම් ඒ සම්පත පැවරීමේ දී, ඒ සම්පත පවරන ආකාරය පිළිබඳ නිවැරදි දත්ත, තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීමෙන් තමයි ඒ සම්පත නිවැරදි ලෙස අපට වාසි සහගත සමාගමකට පවරන්නට පුළුවන්කම තිබෙන්නේ. හැබැයි අපි 2008 ජූලි මාසයේ කෙයාන් සමාගමට ටෙන්ඩරයකින් පවරනවා. ඒ පවරනකොට අපි සඳහන් කරන්නේ නැහැ, තෙල් සම්පත නෙළා ගන්න එන සමාගම්වලට දෙන වරදාන - වරප්‍රසාද- මොනවාද කියලා. ඒ වරදාන -වරප්‍රසාද- සහවලා, ඒ වරදාන -වරප්‍රසාද- මොනවාද කියලා ඉදිරිපත් කරන්නේ නැතිව ඉන්දියානු කෙයාන් කියන සමාගම තෝරා ගන්නවා තෙල් බිම් කැණීම්වලට. හැබැයි ඒ තෝරා ගන්නා ලද සමාගමට අද මොනවාද තමුන්නාන්සේලා දෙන්න හදන්නේ? තෝරා ගන්නා ලද සමාගම අද අපේ රටේ තිබෙන සියලු බදුවලින් නිදහස් කිරීමක් තමයි තමුන්නාන්සේලා මේකෙන් අපේක්ෂා කරන්නේ. [බාධා කිරීමක්] ආයෝජකයන්ට බදු නිදහස දෙනවා. හැබැයි කල්පනා කරලා බලන්නට ඕනෑ, මේ ටෙන්ඩරය දෙන්නේ නිකම් ඇවිල්ලා කෙසෙල් සිටුවන සමාගමකට නොවෙයි කියා. මේ අපේ රටේ වටිනාම සම්පත වන තෙල් සම්පත කැණීම පිළිබඳව දෙන ටෙන්ඩරයක්. මෙය අපේ රටේ අපේ වර්තමාන ආණ්ඩුවට නොවෙයි, මේ රටේ උපන් නූපන් දරු පරම්පරාවට අයිති ඉතා වැදගත් ජාතික සම්පතක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපේ රටේ ආර්ථිකය ඉදිරියට යනවාද, පසුපසට යනවාද, විවිධ ජාවාරම් කරුවන්ට හසු වනවාද නැද්ද කියන සහතිකය රඳා පවතින්නේ මේ සම්පත මතයි. මේ සම්පත අතිශයින් වැදගත් සම්පතක්. කෙසෙල් වගාවක් කරන්න හරි, මැණික් ඉල්ලමක් කපන්න හරි, [බාධා කිරීමක්] මාවනැල්ල පෙට්‍රල් ෂෙඩ් එකක් සඳහා හරි දෙන ටෙන්ඩර් එකක් නොවෙයි මේක.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මොකක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මෙය ඊට වඩා වැදගත් වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. [බාධා කිරීමක්] මෙය අපේ රටේ ජාතික සම්පතක් පිළිබඳ ප්‍රශ්නයක්. එතකොට ජාතික සම්පතක් ටෙන්ඩර් කැඳවා දෙනකොට අපි මොකක්ද කරන්න ඕනෑකම තිබෙන්නේ? ඒ සම්පත් අපි දෙන්නේ කවර ප්‍රමාණයෙන්ද? කවර ආකාරයටද? කවර අන්දමේ බදු සහනයක්ද අපි ලබා දෙන්නේ? ඒවා පිළිබඳව සඳහන්වන්නට ඕනෑකම තිබෙනවා.හැබැයි දැන් තමුන්නාන්සේලා මොකක්ද කරන්න හදන්නේ? දැන් තමුන්නාන්සේලා කරන්න හදන දේ තමයි, විශේෂයෙන්ම ටෙන්ඩර් ලියවිල්ලේ සඳහන් වෙලා නැති, අනෙකුත් සමාගම්වලට නිවැරදි ලෙස දත්ත, තොරතුරු, වාර්තා, ඉදිරිපත් නොකර, තෝරා ගන්නා ලද සමාගමට අවශ්‍ය වන පරිදි බදුවල වෙනස් කිරීමක් කිරීම. ඒක සාධාරණද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකෙන් මොකක්ද කරන්නේ? පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ

බදු ගෙවීමේ නිදහසද ලබනවා. රඳවා ගැනීමේ බදු, ප්‍රාග් ධන වියදම සඳහා ලබා ගත් විදේශ ණය මත පොලිය, උපදේශකයන්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව, ඒවා ඉවත් කරනවා. සංස්ථාපිත බදු කියන එක ඉවත් කර දෙනවා, කෙයාන් සමාගමට. මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ ඇති බදු ටික ඉවත් කරලා දෙනවා, කෙයාන් සමාගමට. මේ පාර්ලිමේන්තුවේ සම්මත කරලා පනවා තිබෙන, 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කර දෙනවා, කෙයාන් සමාගමට. මේ පාර්ලිමේන්තුවේ සම්මත කර තිබෙන 2005 අංක 5 දරන මුදල් පනත යටතේ ගොඩනැගිලි කර්මාන්ත සහතික අරමුදල් අය කිරීමේ බදු ඉවත් කර දෙනවා, කෙයාන් සමාගමට. මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 1989 අංක 13 දරන නිෂ්පාදන බදු විශේෂ විධිවිධාන පනතෙන් පවරා තිබෙන බදුවලින් නිදහස් කර දෙනවා, කෙයාන් සමාගමට. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත මේ පාර්ලිමේන්තුවේ සම්මත කර තිබෙනවා. ඒ බදු පිළිබඳ නීති මේ පාර්ලිමේන්තුවේ සම්මත කර දීලා තිබෙනවා. ඒ බදුවලින් නිදහස් කර දෙනවා, මේ කෙයාන් සමාගමට. ඒ වාගේම රේගු ආඥා පනත යටතේ 2003 අංක 26 දරන ඛනිජ තෙල් සංවර්ධන පනතේ අර්ථානුකූල ව්‍යාපෘති ක්‍රියාත්මක වන සමාගම් නමින් ඒ අයට මේක දෙනවා. කල්පනා කර බලන්න.

දැන් මොකක්ද මේ කරන්නේ? ඔක්කොම බදු නිදහස් කරලා දෙනවා, කලින් තෝරා ගන්නා ලද කෙයාන් සමාගමට. එහෙම නම් අඩුම තරමේ මේ ටෙන්ඩර් ලියවිල්ල හදනකොට ඒ සමාගම්වලට අපට කියන්න තිබුණා, "අපි අපේ රටේ ටෙන්ඩර් ලියවිල්ලක් හදනවා. තෙල් සම්පත ලබා දෙන්න තමයි අපි ලැහැස්ති කරන්නේ. මෙන්න මේ බදු නිදහස ලබා දෙන්න අපි ලැහැස්තියි. ඒ බදු නිදහසට අනුරූප වන පරිදි තමුන්නාන්සේලා ටෙන්ඩරය ඉල්ලන්න. ඒ අනුව වැඩිම සම්පත ගන්න. ඒ අනුව වැඩිම මිලක් ඉදිරිපත් කරන්න. ඒ අනුව අපට වැඩිම රාජ්‍ය භාගය ගෙවන්න." කියලා ඒ විධියට කියන්න අපට අයිතියක් තිබුණා. හැබැයි තමුන්නාන්සේලා ටෙන්ඩරය දීලා ඉවර වෙලා ටෙන්ඩරය ප්‍රදානය කරලා ඉවර වෙලා තමන්ගේ හිතමිතුරු කෙයාන් සමාගම තෝරා ගෙන ඉවර වෙලා දැන් මොකද කරන්නේ? දැන් මේ පාර්ලිමේන්තුවට මේ රෙගුලාසි ගෙනැල්ලා බදු නිදහසක් දෙනවා. කවදා වන තුරුද? 2016 වන තුරු. අවුරුදු අටක බදු නිදහසක්. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එතැනින් නතර නොවී අවුරුදු 25ක බදු නිදහසක් දක්වා යාමේ ඉඩක් මේකේ සැඟවිලා තිබෙනවා. පළමු වතාවට අවුරුදු අටක බදු නිදහසක් දෙනවා, 2016 වන තුරු. මේ පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙන සියලු බදු පනත්වලින් නිදහස් කරලා තමුන්නාන්සේලා කෙයාන් සමාගමට මේ සම්පත දෙනවා. මොකක් වෙනුවෙන්ද? කොමිස් වෙනුවෙන්. තෙල් නොවෙයි. තෙල් සහ කොමිස්. ලෝකයේ හැම තැනම තෙල් සහ කොමිස් එකම වෙළෙඳ පොළේ කටයුතු කරන තත්ත්වයක්. ඒක තමයි මේ කටයුතු කරමින් තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. වැදගත්ම කාරණය මේකයි. ඒ නිසා දැන් මොකක්ද ඉතුරු වෙන්නේ? දැන් අපට ඉතුරු වෙන්නේ රාජ්‍ය භාගය විතරයි. අපි අහනවා තමුන්නාන්සේලාගෙන් අපට මොකක්ද ඉතුරු වෙන්නේ කියලා. අපට ඉතුරු වෙන්නේ රාජ්‍ය භාගය විතරයි. තමුන්නාන්සේලාගේ ගිවිසුමේ වගන්ති ටික බලන්න. ඒ රාජ්‍ය භාගයත් ආරම්භයේදී සියයට 5යි. ඒක යම් යම් ප්‍රමාණයක් ගියාට පස්සේ තමයි අපට සියයට 35 දක්වා වර්ධනය වෙන්නේ. මේ ටෙන්ඩර් ලියවිල්ල හදන වෙලාවේ ආයෝජන මණ්ඩලයේ හිටපු සමහර නිලධාරි මහත්වරුත් එක්ක අපි කථා කළා. කථා කරපු වෙලාවෙදි කිව්වා, රාජ්‍ය භාගය කුඩා වුණාට ප්‍රශ්නයක් නැහැ; ඒ සමාගම විසින් බදු පවරලා අපි අපේ අනෙක් කොටස ගන්නවා; ඒ නිසා අපට තෙල් සම්පත නෙළීමේදී එයින් අත් පත් කර ගන්නා ලාභයෙන් සියයට 38ක් අපට ලැබෙනවා කියලා. ඒ සියයට 38 ගණනය කළේ කොහොමද? ඒ ගණනය කළේ අපට ලැබෙන රාජ්‍ය භාගයෙන්. ඒ එන සමාගමෙන් ගහන බදු මුදල් මත තමයි සියයට 38ක ලාභයක් අපි අපේක්ෂා කරන්නේ. හැබැයි තෙල් සම්පත දැන් දෙනවා. තෙල් සම්පත දීලා බදු මුදල් සියල්ල ඉවත් කරලා දෙනවා.

මේ පාර්ලිමේන්තුවේ අපි අත උස්සලා සම්මත කරලා දීලා තිබෙන සියලු බදු මේකෙන් ඉවත් කරනවා. මොකක් වෙනුවෙන්ද? මොකක්ද, අපට තෙල් සම්පතෙන් ඉතුරු වෙන්නේ? මේ බදු පනත අනුව මේ තෙල් සම්පතෙන් සියයට 10ක්වත් අපට ලැබෙන්නේ නැහැ. බැරල් 100ක් ගොඩ ගත්තොත් බැරල් 90ක් ඉන්දියාවට; බැරල් 10ක් ලංකාවට. බැරල් 1,000ක් ගොඩ ගත්තොත් බැරල් 900ක් ඉන්දියාවට; බැරල් 100ක් ලංකාවට. බැරල් ලක්ෂ 10ක් ගොඩ ගත්තොත් බැරල් ලක්ෂයක් ලංකාවට; බැරල් ලක්ෂ නවයක් ඉන්දියාවට. ඒකයි තමුන්නාන්සේලාගේ අනුපාතය. ඒකයි සිද්ධ වෙන්නේ. හැබැයි මේ බදුත් එකතු වුණා නම් තෙල් සම්පත නෙළීමෙන් සියයට 38ක ලාභයක් අපට තිබුණා. ඒ සියයට 38 ලාභය ඉවත් කරලා මොකද කරලා තිබෙන්නේ? සම්පූර්ණ බදු නිදහසක් දීලා තිබෙනවා. තෙල් සම්පත ගොඩ ගැනීමේ මහා ආශ්වාදජනක බලාපොරොත්තුව අප කා තුළත් තිබෙනවා. තෙල් සම්පත නෙළා ගෙන අපේ රට සංවර්ධනය කිරීමේ මහත් බලාපොරොත්තුවක් අප කා තුළත් තිබෙනවා. ඒ බලාපොරොත්තුවට මුවා වෙලා මොකක්ද කරන්නේ? බැලූ බැල්මට තෙල් සම්පත ගොඩ ගැනීම. හැබැයි කරලා තිබෙන්නේ මොකක්ද?

ලංකාවේ මන්නාරම් ද්‍රෝණියෙන් තමයි තෙල් සම්පත ගොඩ ගන්නේ. හැබැයි වැඩිම පංගුව යන්නේ ඉන්දියානු සමාගමට. ඒ නිසා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන මෙම නියමය මේ පාර්ලිමේන්තුව සම්මත නොකළ යුතුයි. අපේ රටේ අනාගත පරම්පරාවට උරුමකම් කියන මහා දැවැන්ත සම්පතක් වුණු තෙල් සම්පතෙන් අපේ රටට ලබා ගතහැකි ලාභ පංගු අඩු කරලා අපේ රටට ලැබෙන රාජ්‍ය භාගය අඩු කරලා අපේ රටට තිබෙන ආර්ථික ප්‍රතිලාභ අඩු කරලා තමන්ගේ සුවච කීකරු ගෝල සමාගම්වලට ලාභ ලබන්න ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමයක් සකස් කරලා දීලා තිබෙනවා. ඒ නිසා මේ නියමය පාර්ලිමේන්තුව සම්මත නොකළයුතු බවත් ඒ වාගේම එය මේ පාර්ලිමේන්තුවෙන් ඉවත් කළ යුතු බවත් ඒ වාගේම මේ නියමය පිළිබඳව පාර්ලිමේන්තුව තුළ මීට වඩා පුළුල් සංවාදයක් ඇති කළයුතු බවත් සඳහන් කරන අතරම මේ නියමය පරාද කළ යුතුයි කියන යෝජනාවත් කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.59]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ අද දින ඉදිරිපත් කර තිබෙන නියමය පිළිබඳව මීට කලින් කථා කරපු විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම අදහස් ප්‍රකාශ කළේ මේ සම්පූර්ණ ගැසට් පත්‍රය කියවන්නේ නැතිවයි. ඒ වාගේම මෙයට අදාළ නොවන කරුණු තමයි ඔවුන්ගෙන් ඉදිරිපත් වුණේ.

නමුත් මගේ යුතුකමක් තිබෙනවා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මුළුමහත් ආර්ථික වැඩ පිළිවෙළ ගැන සඳහන් කරලා, මේ ගැසට් නිවේදනය ගැනත් ඒ වාගේම විරුද්ධ

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

පක්ෂයෙන් ඉදිරිපත් කළ තර්ක ගැනත් කරුණු දක්වන්න. රටක් සංවර්ධනය කිරීමේදී, මහා පරිමාණ සංවර්ධන වැඩ පිළිවෙළවල් මඟින් වාගේම සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘති මඟින් රටේ සියලු ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරලා රටක් සංවර්ධනය කරන්න පුළුවන්. විශේෂයෙන්ම "මහින්ද චින්තනය" තුළත්, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළත් අඩංගු අපේ රජයේ ප්‍රතිපත්තිය වන්නේ, පුද්ගලයා, පවුල, ගම සහ රට කියන තේමාව යටතේ ආර්ථික සංවර්ධනය ඇති කිරීමයි. මේ රටේ ජීවත් වන සියලු ජන කොටස් දියුණු තත්ත්වයට පත් කිරීම සඳහා පුද්ගලයාගේ ආදායම් මාර්ග වැඩි කරන්නටත්, ඔවුන්ගේ සමාජයීය අවශ්‍යතාවන් සපුරන්නටත්, ආර්ථික සංවර්ධනය ඇති කරන්නටත්, සදාචාරාත්මක සංවර්ධනයක් ඇති කිරීමටත් මේ රජය විශාල වැඩ පිළිවෙළවල් රාශියක් දියත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම පුද්ගලයා නඟා සිටුවන්න "දිවි නැඟුම" වැඩ සටහනත්, මේ රටේ සියයට 80කට වැඩි ජනතාවක් ජීවත් වන ගම සහ ඒ ගමේ ජනතාව නඟා සිටුවන්න "ගම නැගුම" "ජාතික සවිය" වැඩ සටහනත්, "පුර නැඟුම" වැඩ සටහන තුළින් නගරය තුළ ඉන්න ජනතාව නඟා සිටුවන්නත් කටයුතු කරලා තිබෙනවා.

රටේ මේ දැවැන්ත සංවර්ධනය ඇති කරන්නට නම්, රට දියුණු කරන්නට නම් රජයෙන් මහා පරිමාණයේ ආයෝජන අපි ඇති කරන්න ඕනෑ. මේ සඳහා මේ රජය පත් වුණු දවසේ ඉඳලා විවිධ අංශවලින් ආයෝජන කළා. ඒ ආයෝජනය එක ප්‍රදේශයකට, එක අංශයකට පමණක් සීමා වුණේ නැහැ. අපි මේ මහා පරිමාණයේ සංවර්ධනයට මේ රටේ සියලු පළාත් ඇතුළත් කළා. විශේෂයෙන්ම යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා හැම පළාතකම මහා පරිමාණයේ ආයෝජන ඇති කළා. ඒ වාගේම හැම ක්ෂේත්‍රයකම සංවර්ධනය ඇති කරන්න අවශ්‍ය පසුබිම සකස් කළා. විශේෂයෙන්ම දිවයින් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව වැදගත් වන අපේ නාවික ශක්තිය වැඩි දියුණු කරන්න, අපේ වරායවල් දියුණු කරන්න අපි විශාල ආයෝජන කළා. ඒ වාගේම ගුවන් තොටුපොළවල් දියුණු කරන්න අපි විශාල ආයෝජන කළා. ඒ වාගේම රටක සංවර්ධනයට අවශ්‍ය බලශක්තිය නිෂ්පාදනය කරන විදුලිබලය සඳහා අපි ආයෝජනය කළා.

ඒ වාගේම මාර්ග පද්ධතිය දියුණු කරන්න විශාල ආයෝජනයක් කළා. මේ සියල්ල කිරීම තුළ අපි බලාපොරොත්තු වුණේ අපේ රටේ ආර්ථිකය සංවර්ධනය කරන්නයි.

අපි එහෙම කරන කොට ඊට අවශ්‍ය පසු බිම් සියල්ල සකස් වුණා වාගේම, ඊට අදාළ තවත් වැදගත් සාධකයක් වුණා රටේ සාමය. විශේෂ අයෝජනයක් කරලා, විශාල පරිත්‍යාග රාශියක් කරලා ඒ සාමයත් මේ රටට උදා කරලා තිබෙනවා. රටක් ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය සියලු මූලික කටයුතු සම්පූර්ණ කරමින් සිටින අවස්ථාවක අපට සිද්ධ වෙලා තිබෙනවා එතැනින් එහාට යන්න; අපි ඇති කර ගත් වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගෙන යන්න.

විශේෂයෙන්ම මේ රටේ තරුණ තරුණියන්ට රැකියා සැපයීම සඳහාත්, අපේ ගොවියා, ධීවරයා, පශු සම්පත් අංශයේ ඉන්න අය, කාර්මිකයන් දියුණු කිරීම සඳහාත් අපි ආයෝජනය කළා. ඒ වාගේම ඒ අයගේ දූ පුතුන් උගතුන් වුණාට පස්සේ, යම් කිසි මට්ටමක ඉහළ තත්ත්වයේ දැනුමක් ලැබුණාට පස්සේ ඔවුන්ට සුදුසු රැකියා බිහි කිරීමට නම් අනිවාර්යයෙන්ම මේ රටේ විශේෂ ආයෝජන ඇති වන්න ඕනෑ. මේ ආයෝජන සියල්ලක්ම රජයකට කරන්න බැහැ. අපේ රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, යටිතල පහසුකම්වලට රජය ආයෝජනය කරන අතර, අනික් පැත්තෙන් මේ රටේ පෞද්ගලික අංශයේ ආයෝජනත්, විදේශීය සෘජු ආයෝජනත් මේ රටට ලබා ගෙන ආර්ථික සංවර්ධනය ඇති කරන එකයි. ලෝකයේ දියුණු වෙච්ච රටවල් සියල්ලටම වාගේ දියුණු වන්න ඉවහල් වුණේ ඒ රටවලට ලැබුණු විදේශ ආයෝජනයි. විදේශ ආයෝජන ලබා ගැනීමට සුදුසු, අවශ්‍ය සියලුම කරුණු සර්ව සම්පූර්ණ කරන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට පුළුවන් වුණා.

මෙහිදී විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමෙක් කිව්වා, "මේ තෙල් කණින්න අපි පරක්කු වුණා නේද? මීට ඉස්සෙල්ලා අල්ලපු රටේ, එහෙම නැත්නම් වෙනත් තැන්වල මේ කැණීම් කළා නේද?" කියලා. ඔව්. මේ තෙල් කැණීමේ කටයුත්ත මීට කලින් කළා නම් තමයි හොඳ. නමුත් එදා කරන්න බැරි වුණු එක අද මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට කරන්න පුළුවන්කම ලැබුණාය කියන එක අපි කියන්න ඕනෑ. මීට ඉස්සෙල්ලායි මේක කරන්න තිබුණේ. මේ සඳහා රජයන් කිහිපයක් පැහැදිලිවම උත්සාහ ගත්තා. නමුත් තමුන්නාන්සේලා දන්නවා, එදා ඒ ප්‍රදේශයට එල්ටීටීඊ සංවිධානයෙන් තර්ජන තිබුණා කියලා. ඒ අය තර්ජනය කළා, තෙල් කැණීමේ කටයුතුවලට ඒ ප්‍රදේශවලට එන්න එපා කියලා. මේ රටේ තෙල් කණින්න තියා හෝටලයක් දමන්න, සයිබර් කඩයක් දමන්න තරම්වත් කිසිම ආයෝජකයෙක් ඉදිරිපත් වුණේ නැහැ. ඒ පරිසරය වෙනස් වෙලා අද ආයෝජනයට සුදුසු පරිසරය සකස් වෙලා තිබෙනවා. දැන් අපට දේශීය ආයෝජකයෝ ඉන්නවා. අනික් පැත්තෙන් විදේශ ආයෝජකයෝත් ඉන්නවා.

අපි තෙල් කැණීම් කිරීම සඳහා පරක්කු වුණා විතරක් නොවෙයි, ලෝකයේ අනික් රටවල් වේගයෙන් දියුණු වන කොට අපේ රට අවුරුදු 30ක් තිස්සේ මන්දගාමීව ගියා. එහෙම නැත්නම් ආපස්සට ගියා. එහෙම නම් අපි මේ කාලය තුළ වේගවත්ව ඉස්සරහට යන්න ඕනෑ. ලෝකයේ අනික් රටවලුත් මේ ආයෝජන දෙස බලා ගෙන ඉන්නවා.

දේශීය අයෝජකයා මේ රටේ නවත්වා ගන්න බලනවා වාගේම අපේ යුතුකම තමයි විදේශීය ආයෝජකයොත් මේ රටට ගෙන්වා ගන්න එක. එහෙම නැතුව අර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ සියයට 30ක, 35ක වාගේ ආයෝජනයක් ගෙනෙන්න බැහැ. ඒ ප්‍රමාණය අපිට ලැබුණේ නැත්නම් අපේ මේ වර්ධන වේගය පවත්වාගෙන යන්න බැහැ. ඒ විතරක් නොවෙයි අපේ තරුණ තරුණියන්ට ඉදිරියේදී රැකියා සැපයීමට පරිසරයක් ලැබෙන්නේ නැහැ. මේ පරිසරය අපි සකස් කරන කොට ආයෝජන බලා ගෙන ඉන්න තවත් රටවල් රාශියක් තිබෙනවා.

ආයෝජකයාට මේ ශ්‍රී ලංකාව විතරක් නොවෙයි, තවත් ඕනෑ තරම් රටවල් තිබෙනවා ආයෝජනය කරන්න. නමුත් එහෙම කියලා හැම ආයෝජකයෙක්ම මෙහාට ගෙන්නා ගන්න අපි සූදානම් නැහැ. අපි තෝරා ගත්ත අංශවලට, ඒ තෝරා ගත්තු නිර්ණායක මතයි අපි ආයෝජනවලට ආරාධනා කරන්නේ. අපේ රජය පැහැදිලිව ප්‍රතිපත්ති මාලාවක් සකස් කරලා තිබෙනවා, අපි මොන, මොන අංශවලටද ආයෝජන ගන්නේ, විදේශ ආයෝජනවලට ඉඩ දෙන්නේ මොන මොන අංශවලින්ද, ඔවුන්ට දෙන පහසුකම් මොනවාද කියලා. මෙතෙක් කල් මේ ආයෝජකයන්ට දෙන සහන ගැන කිසිම දවසක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ.

අතිගරු ජනාධිපතිතුමා 2007 දී එතුමාගේ අය වැය ලේඛනයේ යෝජනාවක් හැටියට ගෙනැල්ලා 2008 දී තමයි මේ පනත ඉදිරිපත් කරලා කිව්වේ මේවා ගැන ජනතාව දැනුවත් කරන්න ඕනෑය කියලා. මේකට අදාළ පළමුවැනි ගැසට් පත්‍රය නිකුත් කරන්නේ ජනතාවට කරුණු දැන ගන්න. දින 30ක් තිබෙනවා විරෝධතා පළ කරන්න. ඒ දින 30 තුළ යම් කිසි විරෝධතාවක් ආවොත් හෝ වෙනත් අදහසක් ආවොත් ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට මම ඒ ගැනත් හොයලා බලලා නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනවා. කැබිනට් මණ්ඩලයට

ඉදිරිපත් කරලා ඒ අනුමැතිය අනුව තමයි තමුන්නාන්සේලාගේ මේ උත්තරීතර සභාවට ගෙනෙන්නේ. මීට ඉස්සරවෙලා කිසිම දවසක ආයෝජන මෙහෙම ඇවිල්ලා නැහැ. මේ ආකාරයටම දීපු සහන දැනටත් මේ රටේ ආයෝජනය කරන හැම සමාගමකටම ලැබෙනවා. හැබැයි මේක තමයි මේ උත්තරීතර සභාව සහ ජනතාව දැනුවත් කරපු පළමුවැනි අවස්ථාව. මේක තමයි අපේ විනිවිදභාවය. මේක විතරක් නොවෙයි මීට ඉස්සරහාට එන ඒවාත් අපි ගැසට් කරනවා. ගැසට් කළාම ජනතාවට තීන්දු කරන්න පුළුවන්. ඒ වාගේම මේකේ කරුණු දෙකක් තිබෙනවා. එක, මේ දෙන බදු සහන පිළිබඳව. අපි ඒක දෙනවා. ඒක තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අතර තෙල් ගැනීමේ කොන්දේසි වෙනම තිබෙනවා.

මෙම ගැසට් පත්‍රයේ උපලේඛනයේ අංක 7 වගන්තිය යටතේ අපි ඒක පැහැදිලිව කියලා තිබෙනවා. මේක කවුරුවත් කියෙව්වේ නැහැ. හැමෝම කියවන්නේ නැති කෑල්ල. මේකේ කියලා තිබෙනවා ".....පත්කරන ලද උප කොන්ත්‍රාත්කරුවන්ගේ නමින් ආනයනය කරන ලද සියලුම ප්‍රාග්ධන භාණ්ඩ සඳහා රේගු බදු අදාළ වේ. මේ භාණ්ඩ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන පරිදි ව්‍යාපෘතිය මඟින් ක්‍රියාවට නංවන ගවේෂණ කටයුතුවලට පමණක් ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ විය යුතු අතර 2008 ඔක්තෝම්බර් මස 16 වැනි දින සිට ආරම්භ වන වසර 8ක සීමාවක් සඳහා වූ ගවේෂණ බලපත්‍ර කාලසීමාව තුළදී ව්‍යාපෘතියට අවශ්‍ය වන ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරනු ලබන උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ද්‍රව්‍ය, සැපයුම් සහ පරිභෝජනික දේ එම භාණ්ඩවලට ඇතුළත් විය යුතු ය" කියලා. ඒ සියල්ල ලබා දෙන්නේ ගවේෂණ කටයුතුවල යෙදෙන අයට විතරයි. [බාධා කිරීමක්] තෙල්වලට නොවෙයි මේ බදු සහනය දෙන්නේ. මේක ගවේෂණ කටයුතුවලට දෙන සහනයක්. මේකේ පැහැදිලිව ඒක කියලා තිබෙනවා. අනෙක් එක වෙනම ගිවිසුමක්.

තෙල් ගැනීම කියන එක ගැන කථා කරන කොට අප කියන්න ඕනෑ, ලෝකයේ තෙල් ගැනීමේ සම්ප්‍රදායයක් තිබෙන බව. අපේ රටේ පොළොවේ තිබෙන සම්පත් ගන්නවා. මේ රටේ ඉඩම්වල මැණික් තිබෙනවා. රත්නපුරය දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරු ඒ ගැන හොඳට දන්නවා. බොහෝ වෙලාවට ඒ මැණික් ගැරීමේ බලපත්‍රය එක්කෙනෙක් ගන්නවා; ඒ වාගේම තව කෙනෙක් ගරන්න කටයුතු කරනවා; තව කෙනෙක් වතුර පොම්පය දෙනවා. මේවාට බෙදන ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම ගොවිතැනේත් එහෙම තිබෙනවා.

1956 බණ්ඩාරනායක ආණ්ඩුවේ අපේ ගරු පිලිප් ගුණවර්ධන ඇමතිතුමා හිටපු කාලයේ ඉදිරිපත් කරපු කුඹුරු පනත යටතේ තිබුණා, අඳ ගොවියාට දෙන ගණන. කුඹුරු හිමියා වුණාය කියලා ඔහුට ගොවිතැනින් ලැබෙන ලාභය සියයට සියයක්ම ගන්න බැහැ. ඒකෙන් යම්කිසි කොටසක් ගොවියාට යනවා. ඒ විධියට හැම එකකටම ප්‍රමාණය අනුවයි වෙන් කරන්නේ. මැණික් ගරන කොට ඉඩම් හිමියාට ලැබෙන ප්‍රතිශතයක් තිබෙනවා. ඒ වාගේම වැඩ කරන අයට ප්‍රතිශතයක් තිබෙනවා. මේ විධියට හැම සම්පතකම ලාභය බෙදිලා යනවා. නමුත් යම්කිසි විධියකින් තමාම ඒ කටයුතු සියල්ලක්ම කළොත් -ඉඩම අයිති කෙනාම බලපත්‍රයත් අර ගෙන, වියදමත් කරලා, කුලීකාරයන් නැතිව තමුන්ම පතලට බැස්සොත්- ඒ සම්බන්ධ බෙදා ගැනීම වෙනයි. ගරු පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා නම් ඒ ඔක්කෝම කරනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් ගැනීමේ කටයුත්ත අප සැලසුම් කරලා තිබෙන්නේ කොහොමද? ගරු සූරියප්පෙරුම මන්ත්‍රීතුමා මෙහිදී පැහැදිලි කරපු විධියට මේකට විශාල තාක්ෂණයක් අවශ්‍යයි. විශාල ආයෝජනයක් අවශ්‍යයි. මැණික් පතල් බැස්සාම සමහර වෙලාවට එක ගලක්වත් හම්බ වෙන්නේ නැහැ. එතකොට ඒ පාඩුව අපට දරා ගන්න වෙනවා. මේ දවස්වල කථා වෙන හෙජින් එක වාගෙයි. අපට ලාභය ලැබෙනවා නම් හොඳයි. නමුත් පාඩු වුණාම නරකයි. ඒ වාගේ මෙහි විශාල ආයෝජනයක් කරන්න ඕනෑ. මේකට තාක්ෂණික දැනුමක් ඕනෑ. මේවා ප්‍රමාද කරන්න ප්‍රමාද කරන්න එහි අවාසිය තිබෙන්නේත් අපටයි. ඒ නිසා මේ කටයුත්ත අප කරන්නේ ඉතාම විනිවිදභාවයකින්. තෙල් කැණීමේ කටයුතු තීන්දු කිරීමේදීත් ඉතාම විනිවිදභාවයකින්කළේ. අවුරුදු ගණනක් සාකච්ඡා කරලා, අවුරුදු ගණනක් තාක්ෂණික කමිටුවලින් හදාරලා තමයි මේ කටයුත්ත කළේ. ඒ වාගේම මේ බදු සහන දෙන එකත් ඒ ආකාරයටමයි කළේ.

බදු සහන දෙන එක අද ඊයේ කෙරුණු එකක් නොවෙයි. චීන බත් කඩේකටත් බදු සහන දීපු රටක් මේක. මේ වාගේ විශාල මුදලක් ආයෝජනය කරන අයට අනිවාර්යයෙන්ම මේ සහන දිය යුතුයි. ඒ වගකීම අප දැරිය යුතුයි. ඒක මේ පාර්ලිමේන්තුව සම්මත කරපු පනතකින් දීපු බද්දක් කියා කියනවා. පාර්ලිමේන්තුවේ සම්මතියකින් තමයි අපි ආයෝජනවලට සහන දීලා තිබෙන්නේත්. මේකත් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරපු එකක්. අපි නැවත මෙය මේ පාර්ලිමේන්තුවට දමන්නේත් ඒකයි. මේවා මීට කලින් ආයෝජන මණ්ඩලයේ නිලධාරියකු එක පෑන් පහරකින් දීපු සහනයි. අද එය පළමුවෙනි වතාවට තමුන්නාන්සේලාගේ මේ උත්තරීතර සභාවට ඇවිල්ලා තිබෙනවා. මේ සභාවට එන්න ඉස්සර වෙලා ජනතාව දැනුවත් කරලා, ඔවුන්ට දින ගණනාවක් දීලායි මේ කටයුත්ත කරලා තිබෙන්නේ. ඒ නිසා මෙම ආයෝජනය, මේ ආරම්භය රටේ හැම කෙනකුම සතුටු විය යුතු දෙයක් කියලායි මා හිතන්නේ. මේ රටේ තිබුණු කුරිරු ත්‍රස්තවාදයෙන් මේ රටේ ජනතාව බේරා ගෙන මේ රටට සාමය උදා කළා වාගේම මෙය මේ රටේ ආර්ථික සංවර්ධනය ඇති කරලා ආර්ථික නිදහස ලබා ගත හැකි ඉතා ඉහළ පියවරක් කියන එක මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

මම හිතන්නේ නැහැ, මේ උත්තරීතර සභාවේ කිසිම කෙනෙක් ප්‍රශ්න කරාවිය කියලා, අද මේ ඛනිජ තෙල්වල තිබෙන වටිනාකම ගැන. අද ලෝකයේ වැදගත්ම භාණ්ඩය මොකක්ද කියා ඇසුවොත් අපි දන්නවා, අද ලෝකයේ දේශපාලන තීන්දු, යුදමය තීන්දු සියල්ලක්ම ගන්නේ තෙල් පදනම් කරගෙනය, බල ශක්තිය පදනම් කරගෙනය කියන එක. බොහෝ වෙලාවට රටක නිදහස, ස්වෛරීභාවය රඳා පවතින්නේ ඒ රටේ ආහාර සුරක්ෂිතතාව වාගේම බලශක්තියේ සුරක්ෂිතතාව උඩයි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනය අනුව අවුරුදු 6ක් පුරා, කන්න 13ක් එක දිගට පොහොර සහනාධාරය දීලා, ඒ වාගේම එක මිලකට ගොවීන්ගේ වී මිල දී අරගෙන, විවිධාකාරයෙන් සහන දීලා අවුරුදු ගණනාවකට පසුව මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කළා. වී නිෂ්පාදනය කරන මඩකළපුව, අම්පාර, අනුරාධපුරය, පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වී ගොවිතැන මේ අවුරුද්ද ආරම්භයේදීම සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙද්දිත් මේ වර්ෂයේදී එක හාල් ඇටයක් හෝ මේ රටට ගෙන්වන්නේ නැති තත්ත්වයට අපට හාල්වලින් ස්වයංපෝෂිත වන්න පුළුවන් වුණා. අද එළවලු මිල ගැන කතා කරන්නේ නැහැ. අද හැම ගෙදරකම වාගේ ඒ කටයුත්ත කෙරෙනවා. ඒ වාගේම තව අවුරුදු කිහිපයකින්, දැනට මේ රටට ගෙන්වන, මේ රටේ වගා කළ හැකි හැම දෙයක්ම මේ රටේ වගා කරලා අපි ආහාර සුරක්ෂිතතාව ඇති කරනවා.

ඊළඟට, අපට තිබෙන බලශක්තියෙනුත් අපි සුරක්ෂිත වන්න ඕනෑ. අපට තර්ජන ඇති වන්න පුළුවන්. අපි දන්නවා, ලෝකයේ රටවල තෙල් ලැබෙනකොට ඒ රටවලට විදේශ ආක්‍රමණ වැඩියි, විදේශ බලවේග එල්ල වෙනවා වැඩියි කියලා. ඒ නිසා එක පැත්තකින් අපි ස්වාධීන වෙනවා වාගේම, අපේ රට බල ශක්තියෙන් ස්වෛරී වෙනවා වාගේම අනික් පැත්තෙන් ඒ සමඟම අපට තර්ජනයක් එනවා. ඒ නිසා මේ ගිවිසුම්වලදී ඒ ගැනත් අපි සැලකිලිමත් වුණා. භූමිය බෙදා ගැනීමේදී බොහොම

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

කල්පනාවෙනුයි අපි ඒ කටයුත්ත කළේ. මේකෙදි ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා.

මුදල් පැත්ත විතරක් නොවෙයි, සියලු පැත්තක්ම අප බැලිය යුතුයි. ඒ නිසා ආවාට ගියාට මේක තීන්දු කරන්න පුළුවන්කමක් නැහැ. ඒකයි මෙහි තිබෙන අනික් වැදගත්කම. මේ ආයෝජනවලදී -මේ කටයුත්තේදී- එක අංශයකින් විතරක් නොවෙයි සෑම අංශයකින්ම අපි බලා තිබෙනවා. එක පැත්තකින් සංචාරක ව්‍යාපාරය සඳහාත්, අනික් අතට මේ රටේ වෙනත් වෙනත් ආයෝජන සඳහා, කර්මාන්ත සඳහා අවශ්‍ය ආයෝජකයන් ගෙන්වා ගන්නත් උත්සාහ කරනවා. මම පැහැදිලිව කියනවා, මෙන්න මෙය. ආයෝජකයා කියන්නේ කාටද? ආයෝජනය කරන්න ඒ සමාගම මුලින්ම තීන්දු කරන්න ඕනෑ. යම්කිසි කෙනකුට, එහෙම නැත්නම් යම්කිසි සමාගමකට මුදලක් ලැබුණාම මුලින්ම ඔවුන් ඒ මුදල ආයෝජනය කරන්න තීන්දු කරන්න ඕනෑ. ඒ අය ඒක තීන්දු කරන්නේ අපට ඕනෑ වෙලාවට නොවෙයි. ඒක තීන්දු කරන්නේ, ඒ ආයෝජන කරන අයගේ තිබෙන කාලානුරූපව ඒ අවස්ථාවේදී. ඊළඟට බලනවා, මොන ක්ෂේත්‍රයේද මේක ආයෝජනය කළ යුත්තේ කියලා. බොහෝ ආයෝජකයෝ තමන්ට හුරු පුරුදු ක්ෂේත්‍රවල තමයි ආයෝජනය කරන්නේ.

ඊළඟට බලනවා මේ ආයෝජනය තමුන්ගේ රටේ කරන එකද වැඩිය හොඳ, නැත්නම් වෙන රටක කළ යුතුද කියලා. එහෙම වෙන රටක කරන්න ඕනෑ කියලා එයා හිතුවොත්, ඊළඟට බලනවා තමුන්ට සුදුසු රට මොකක්ද කියලා. මේ සුදුසු රට තීන්දු කරන කොට ඒවායේ බලන නොයෙක් කරුණු තිබෙනවා. මම කලින් කිව්වා වාගේ ඒ රටේ සාමය තිබෙනවාද, ඒ වාගේම දේශපාලන ස්ථාවරත්වය තිබෙනවාද, ඒ රටේ බලශක්තිය -විදුලිය වාගේ ඒවා- කිසිම අඩුවක් නැතිව 365 දවසේම පැය 24 පුරා ලැබෙනවාද, ඒ රටේ කම්කරු සාමය තිබෙනවාද, ඒ ඔක්කොටම වැඩිය එහි හොඳ මානව සම්පතක් තිබෙනවාද, උගත්, දක්ෂ, ක්‍රියාකාරී, විනය ගරුක, කැප වෙච්ච කම්කරු -සේවක- පිරිසක් ඉන්නවාද කියන මේ සියල්ලක්ම බලනවා.

ඒ අය බලන තව කාරණයක් තමයි ඒ ආයෝජකයාට ලබා දෙන පහසුකම් මොනවාද කියන එක. විශේෂයෙන්ම ඔවුන් බලාපොරොත්තු වෙන පහසුකම තමයි කරදරයක් නැතිව තමුන්ගේ ව්‍යාපාරය ආරම්භ කරලා එක එක තැනට යන්නේ නැතිව -අර කාර්යාලයට, මේ කාර්යාලයට, මේ නිලධාරියා ළඟට, මේ දේශපාලනඥයා ළඟට යන්නේ නැතිව- ඒ කටයුත්ත කර ගන්න පුළුවන්ද කියන එක. තවත් ඔවුන් බලනවා ඔවුන්ගේ ආයෝජනයට තිබෙන සුරක්ෂිතභාවය ගැන. මේක කවුරු හරි ඇවිල්ලා පවරා ගනීද, එහෙම නැත්නම් විරුද්ධ පක්ෂයේ අය මේකට මඩ ගහයිද, එහෙම නැත්නම් තවත් කෙනෙක් ඇවිල්ලා ගිනි තියයිද කියන එක බලනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have only two more minutes. We want to finish at 6.30 p.m. and the Adjournment Motion.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
මේ විධියට ඒ කරුණු බලලා තමයි ආයෝජකයෝ එන්නේ. නමුත් දැන් මේ සියලු කරුණු විශාල වශයෙන් සම්පූර්ණ වෙලා ආයෝජන එන පරිසරයක් ඇවිල්ලා තිබෙනවා. ඒ ආයෝජනය ශීඝ්‍රයෙන් ගලා එනවා. හැබැයි දැන් මේකට බාධා පමුණුවන්න කට්ටියක් ඉන්නවා. ඔවුන් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙනවා. තියන තියන ඡන්දයේදී ඔවුන් පරදිනවා. ඒ වෙලාවට හිතනවා මේකේ රහස මොකක්ද කියලා. ඒ රහස මොකක්ද? අතිගරු ජනාධිපතිතුමාගේ රජය කරන වැඩ ඔක්කොම ජනතාව ඉහළින් පිළි අරගෙන ඒවා ඔක්කොම සාර්ථක වෙන එකයි. අපේ රජය මානුෂික මෙහෙයුමක් මෙහෙය වූවා. රටට නිදහස ලැබුණා. අවුරුදු 60කට පස්සේ වැඩිම වර්ධන වේගය ළඟා කර ගත්තා. නිදහසින් පස්සේ අඩුම විරැකියා ප්‍රතිශතය වාර්තා කළා. ඉහළම මට්ටමේ, මාස දෙකකට කන්න දෙන්න තරම්වත් විදේශ විනිමය නොතිබුණු අපේ රටේ ජනතාවට බිලියන 7ක පමණ විදේශ විනිමයක් ලබා දුන්නා.

මේ සියල්ල ඉෂ්ට වෙන කොට තවත් ආයෝජන ඇවිල්ලා අපේ තරුණ තරුණියන්ට රැකියා ලැබිලා රට තවත් සංවර්ධනය වුණොත් ඔය තිබෙන ඡන්ද ප්‍රමාණයත් නැති වෙයි කියන බයට දැන් මේ අසත්‍ය කථා කියලා මේ ආයෝජකයන් එන එක වළක්වන්න කටයුතු කරන්න එපාය කියලා මම ඒ අයගෙන් ඉල්ලා සිටිනවා. කරුණාකරලා ඔබලාගේ ශක්තියෙන් ජය ගන්න උත්සාහ කරන්නය කියන ඉල්ලීම විපක්ෂයෙන් කරමින්, රටක් හැටියට ගොඩ නැඟෙන්න මේ ආයෝජකයන් දිරි ගන්වන්න කටයුතු කරන්න අපිත් එක්ක එකතු වන්න කියලා තමුන්නාන්සේලාටත් ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදී.***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*வினா விடுக்கப்பட்டது. குரல்களின்படி "ஆம்" மேலோங்கிற்று என குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அறிவித்தார்கள்.*
*Question put.*
MR. DEPUTY CHAIRMAN OF COMMITTEES , *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා බෙදීමක් ඉල්ලා සිටිනවා.

***පාර්ලිමේන්තුව 43 ස්ථාවර නියෝගය යටතේ -පක්ෂව 58 ; විරුද්ධව 04 යනුවෙන් බෙදුණේය.***
*பாராளுமன்றம் 43 ஆம் நிலைக்கட்டளைப்படி பிரிந்தது: சார்பாக 58; எதிராக 04*
*The Parliament divided under Standing Order No 43: Ayes 58 ; Noes 04*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The Motion is passed.

I ask the permission of the House for extension of time for the next item to be moved.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye!

## රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත: නියමය
## அரச கைத்தொழில் கூட்டுத்தாபனங்கள் சட்டம்: கட்டளை
## STATE INDUSTRIAL CORPORATION ACT: ORDER

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
Sir, I move,

"That the Order made by the Minister of Fisheries and Aquatic Resources Development under subsection (1) of Section 2 of the State Industrial Corporation Act, No. 49 of 1957, and published in the Gazette Extraordinary No. 1712/21 of June 30th, 2011 amending the item (V) of the Order made under Section 2 of the said Act, and published in the Gazette Extraordinary No. 14186 of October, 01st, 1964, which was presented on 19.07.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now, the Adjournment Motion is to be moved by the Hon. Sajith Premadasa.

## ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ සේවකයන් මුහුණ පාන ගැටලු
## லங்கா சோல்ட் லிமிரெட் நிறுவன ஊழியர்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்
## PROBLEMS ENCOUNTERED BY EMPLOYEES OF LANKA SALT LIMITED

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"හම්බන්තොට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන්ගේ වෘත්තීමය ගැටලු විසඳාලීම සඳහා අදාළ බලධාරින් මෙතෙක් කටයුතු කර නොමැත. අද වන විට එම ආයතනයේ සේවය කරන සේවක මහත්ම මහත්මීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා නොවීම මත ඔවුන් මානසික පීඩනයට හා කලකිරීමට ලක්ව ඇත. එබැවින් එම අර්බුදකාරී තත්ත්වය විසඳා මෙම සේවක මහත්ම මහත්මීන්ගේ වෘත්තීය ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දී තෘප්තිමත් සේවක පිරිසක් තුළින් වඩා ඵලදායී සේවාවක් ආයතනයට ලබා ගැනීමට කටයුතු කරන මෙන් සභාව කල් තබන අවස්ථාවේ මම යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය හම්බන්තොට දිස්ත්‍රික්කය, ඒ වාගේම දිස්ත්‍රික්කයේ ජනතාව සතු වටිනාම සම්පතක්. මෙම ආයතනය සුරැකීම - ආරක්ෂා කිරීම- ශක්තිමත් කිරීම අප සියලු දෙනාගේම වග කීමක්. මෙම ආයතනයේ සේවය කරන සේවක පිරිසෙන් අති බහුතරයක් දිස්ත්‍රික්කයේ ජීවත් වන අහිංසක අසරණ ජනතාවයි. මෙම ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ඇප කැප වන්නේ සේවක පිරිසයි. මෙම සේවක පිරිසට ලබා දිය හැකි උපරිම රැකවරණය ලබා දීම ආයතනික බලධාරින්ගේ යුතුකම සහ වගකීම වනවා. එවන් රැකවරණයක් තුළින් සේවක පිරිසේ මානසික තත්ත්වය ශක්තිමත් වනවා සේම ආයතනික දියුණුව උදෙසා ද එය අතිවිශාල රුකුලක් වනවා නොඅනුමානයි.

ප්‍රථමයෙන්ම මම කැමැතියි මේ අවස්ථාවේ අවධානය යොමු කරන්නට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය කුමන අංශයට අයිති ආයතනයක්ද, මෙහි නීතිමය පදනම මොකක්ද කියන එක ගැන. මේක රජයේ ආයතනයක්ද, මේක පෞද්ගලික ආයතනයක්ද? ඇයි මම මෙහෙම අහන්නේ? මෙම යෝජනාව මම ඉදිරිපත් කරන කොට රාජ්‍ය පාර්ශ්වයට සම්බන්ධ පාර්ලිමේන්තු සභානායක කාර්යාලයෙන් මට දැන ගන්නට ලැබුණා මෙය පෞද්ගලික ආයතනයක් බව. ඒ අදාළ ලිපිය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ලංකා සෝල්ට් ලිමිටඩ්හි සාමාන්‍යාධිකාරිවරයා රාජ්‍ය සේවය පිණිස උපහාර පැකේජය ලබා ගැනීම උදෙසා ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ප්‍රයිවෙට් ලිමිටඩ් කළමනාකාරවරයාට යවන ලද ලිපියේ මෙන්න මේ ආකාරයට සඳහන් වනවා:

"සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයට සියයට 90ක කොටස් හිමිකාරිත්වයක් ඇති ආයතනයක් මෙන්ම රජයේ ක්‍රියා පටිපාටින්ට අනුකූලව කටයුතු කරන ආයතනයක්ද වේ." ඒ වාගේම ඒ ලිපියේ සඳහන් වෙනවා, " රාජ්‍ය ආයතනයකට හිමිකාරිත්වය ඇති ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ සේවකයින් වෙත ද ඔබ ආයතනය විසින් නිකුත් කර ඇති රාජ්‍ය සේවය පිණිසයි "උපහාර" පැකේජය ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි " කියා. මම ඒ ලිපියත් **සභාගත*** කරනවා.

විශේෂයෙන් මේ ලිපියෙන්ම පැහැදිලි වෙනවා, මේක රජය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බව. ඒ වාගේම 2003.12.17වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජිත හේරත් මහතා නැඟූ ප්‍රශ්නයකට පිළිතුර සැපයීම සඳහා එවකට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී එල්. පිංටෝ මහතාගේ ඉල්ලීමකට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඒ.එම්.යූ. සෙනෙවිරත්න මහතා විසින් ගොනු කරන ලද ලිපියක් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

---

***** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේ ලිපි සියල්ලක්ම අධ්‍යයනය කරනකොට අපට පැහැදිලිව පෙනෙනවා, මේ ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය රජය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බව. ඊට අමතරව තවත් මට උදාහරණ විදිහට දක්වන්නට පුළුවන්. එකක් තමයි පී.එම්.තිලක් පුෂ්ප කුමාර මහතා විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කරන ලද අභියාචනාව. ඒ වාගේම පාලිත වික්‍රමරත්න මැතිතුමා එවන් අභියාචනාවක් ඉදිරිපත් කළ අවස්ථාවකදී පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා ලබා දුන් නිගමනය. ඒ වාගේම ඩබ්ලිව්. සුගතපාල මහතා විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල පිළිගෙන ලියා පදිංචි කළ බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එවන ලද ලිපිය. ඒ වාගේම 2001 අප්‍රේල් මාසයේ පැවැත් වූ වැඩ වර්ජනය හා ඒ තුළින් උද්ගත වූ තත්ත්වය තුළ සිදු වූ සිදුවීම් තුළින් රාජ්‍ය දේපළවලට හානි සිදු වීම යටතේ මහාධිකරණ නඩු අංක එච්.සී 325/2007 යටතේ පවරා ඇති නඩුව.

මේ සියලු කරුණු කාරණා තුළින් අපට පැහැදිලි වෙනවා, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය රජයට සම්බන්ධ, රජයට අනුයුක්ත රජයේ අරමුදල්වලින් පෝෂණය වන ආයතනයක් හැටියට. ඒ වාගේම මා මතක් කරන්නට කැමතියි, එවකට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ තිබුණු මෙම ආයතනය 1997 වර්ෂයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ මුදල් උපයෝගී කර ගෙන ඒ අරමුදල තුළින් මෙම ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ කොටස් සියයට 90ක අයිතිය ලබා ගත්තාය කියන එක. එසේ නම්, මෙය රජයට සම්බන්ධ දේපළක්ය, රජයට සම්බන්ධ ආයතනයක්ය කියන එක සක් සුදක් සේ පැහැදිලි වෙනවා.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාමත්ම පැහැදිලිව විග්‍රහ කරනවා, රජයට සම්බන්ධ දේපළ ගැන. රාජ්‍ය සංස්ථාවක්ය කියන්නේ මොකක් ද කියන එක ගැන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව දක්වා තිබෙනවා. නමුත් පුදුමයට කාරණාව වන්නේ ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය විගණකාධිපතිවරයාගේ විගණනයකට ලක් නොවීමයි. විශේෂයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154.ව්‍යවස්ථාවේ (1), (2) යන අනුව්‍යවස්ථාවන්ට අනුකූලව අනිවාර්යයෙන්ම විගණනයට ලක් විය යුතු ආයතනයක් හැටියටයි අප මේ ආයතනය දකින්නේ. 1997 සිට මේ වන තෙක් ඇති වී තිබෙන මේ බරපතළ අඩු පාඩුව, මේ වරද නිවැරදි කිරීමට පියවර ගත යුතු යයි මම මේ සභාවට යෝජනා කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ආයතනයේ සේවක ක්ෂේත්‍රය දෙස බැලුවාම බරපතළ -සංකීර්ණ- සේවක අර්බුදයක් අද උද්ගත වෙලා තිබෙන බව පෙනෙනවා. දීර්ඝ කාලයක් මෙම ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලියට සෘජුවම දායක වුණු වාරික සේවකයින් ජ්‍යෙෂ්ඨත්වය මත ස්ථිර නොකිරීම නිසා අද ඒ වාරික සේවක පරපුර ඉමහත් පීඩනයකට, ඉමහත් අසහනයකට පත් වෙලා සිටිනවා. ඇත්ත වශයෙන්ම මේ ආයතනය තුළ උසස්වීම් මාරුවීම් පිළිබඳව පොදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන්නේ නැහැ. දේශපාලන හේතූන් මත ඉතාමත්ම අවිධිමත් අන්දමේ බඳවා ගැනීම් අද දවසේත් ක්‍රියාත්මක වනවා. කනගාටුවට කාරණාව මේකයි. බඳවා ගැනීම්, උසස්වීම්, මාරුවීම් කියන ඒ කරුණු කාරණා දෙස බලන විට නිෂ්පාදන ක්‍රියාවලියට සෘජු සක්‍රීය දායකත්වයක් ලබා දෙන සේවක පිරිස වෙනුවෙන් කිසිම ක්‍රියා පටිපාටියක් නැහැ.

ඇත්ත වශයෙන්ම ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ක්‍රියා පටිපාටිය ප්‍රසිද්ධියට පත් කරලා, සර්ව සාධාරණත්වය මුදුන් පත් කර ගෙන, බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථිර කිරීම් ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මා මේ අවස්ථාවේ යෝජනා කරනවා. අපි තර්කානුකූලව කරුණු කාරණා ගණනාවක් ඉදිරිපත් කළා, ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනය රාජ්‍ය ආයතනයක් සතු වරප්‍රසාද, ප්‍රතිලාභ ලැබිය යුතු ආයතනයක් බවට. එසේ නම් රජයේ සේවකයන්ට ලබා දෙන විශේෂ වරප්‍රසාදයක් වන වයස අවුරුදු 55 සිට 57 දක්වා සේවා දීර්ඝ කර ගැනීම් ඒ වාගේම වයස අවුරුදු 57 සිට 60 දක්වා තවදුරටත් සේවයේ නිරතව සිටීම් මෙම ආයතනයේ සේවක පරපුරට අහිමි වෙලා තිබෙනවා.

තවත් කාරණයක් මම මේ ගරු සභාවට මතක් කරන්න කැමැතියි. 2006 සිට අද දක්වා කාල සීමාව තුළ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන කිසිම වාරික සේවකයෙක් ස්ථිර කරන්න මේ ආයතනය අපොහොසත් වෙලා තිබෙනවා. 2006 සිට අද දක්වා කාල සීමාව තුළ ස්ථිර සේවකයින් 125ක් පමණ විශ්‍රාම ගිහින් තිබෙනවා. එයින් සේවකයින් 76ක් පමණ නිෂ්පාදන අංශයේ සේවකයින්. අද වන විටත් මේ පුරප්පාඩු පුරවන්නට ඒ අදාළ බලධාරීන් කටයුතු කර නැහැ. වසර පහක් පමණ කාලයක් තුළ සේවකයින් ස්ථිර නොකිරීම නිසා ඇති වී තිබෙන අර්බුදකාරී තත්ත්වය විසඳන්නටය කියා අදාළ බලධාරීන්ට මා යෝජනා කරනවා. විශේෂයෙන්ම රජයේ මැදිහත් වීම තුළින් මේ සේවකයින්ගේ රැකියාව, වාරික සේවකයින්ගේ ඒ සේවාව තිරසාර ස්ථිර සේවාවක් බවට පත් කරන්න වහාම කටයුතු කරන්න. 2006 සිට අද දක්වා කාල වකවානු තුළ මේ කිසිවක් නොකිරීම නිසා ඉමහත් අසහනයට පත් වී තිබෙන ඒ සේවක පිරිසට ශක්තිය ලබා දෙන්න කියන යෝජනාව මා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මේ ප්‍රශ්නය කොච්චර බරපතළ ලෙස උග්‍ර තත්ත්වයකට පත් වෙලා තිබෙනවාද කියතොත් විවිධ වෘත්තීය සමිති මේ සේවා ප්‍රශ්නය කම්කරු කොමසාරිස් කාර්යාලය දක්වා ගෙන ගිහින් තිබෙනවා. අදටත් මේ ප්‍රශ්නය පිළිබඳව පරීක්ෂණයක් සිදු වෙමින් පවතිනවා. මා විශ්වාස කරන ආකාරයට මෙම ආයතනයේ සේවා බඳවා ගැනීම් රටාව විනිවිදභාවයෙන් යුක්තව නිර්ව්‍යාජව ක්‍රියාත්මක විය යුතු වැඩසටහනක්. එහෙම නම් මා අහන්න කැමතියි, මේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය ප්‍රසිද්ධියට පත් කරන්නේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය. අඩුම ගණනේ ගැසට් නිවේදනයක් හරහා හෝ මේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය ප්‍රසිද්ධියට නැංවීම වැදගත් යැයි මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ කාර්යාල සේවකයන් සහ නිලධාරින්, සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳව වූ පනතට අනුව සේවා සහ වරප්‍රසාද ලබා ගැනීමේ තත්ත්වයකට එළැඹිලා තිබෙනවා. නමුත් කනගාටුවට කාරණාව වන්නේ මේ ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ ජීවය හා ප්‍රාණය බඳු ක්ෂේත්‍ර නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන්ගේ සේවා කොන්දේසි කුමන පනතක් අනුව තීරණය වනවාද කියන කරුණ අද අපැහැදිලි තත්ත්වයක තිබීමයි. මෙන්න මේ වාගේ තත්ත්වයන් තුළ මම පැහැදිලි යෝජනාවක් කරනවා, වසර පහක කාල වකවානුවක් තුළ සේවය කරන වාරික සේවක පිරිස ස්ථිර කිරීමට මැළිකමක් දක්වන මේ පාලන අධිකාරියට වහා නියෝගයක් නිකුත් කරලා, විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨත්වය මත ඒ අදාළ පත්වීම් ලබා දෙන්නට කටයුතු කරන්න කියලා. ජ්‍යෙෂ්ඨත්වය අනුව වාරික සේවක කණ්ඩායමේ නාම ලේඛනයක් හැන්සාඩගත කිරීම සඳහා මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මම සඳහන් කරන්න කැමැතියි, මෙම නාම ලේඛනයට සියලුම දේශපාලන පක්ෂවලට සම්බන්ධ සාමාජික සාමාජිකයන් ඇතුළත්ව සිටිනවාය කියන එක.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Sajith Premadasa, you may carry on.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාක්ෂි සහිතව පැහැදිලිවම ඉදිරිපත් කරපු කරුණු කාරණා මත මම විශ්වාස කරනවා, මෙය රජය යටතේ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහනක් හැටියට. එසේ නම් 20/2009 චක්‍රලේඛනය උපයෝගී කර ගෙන, අනියම් සේවයේ නියැළී සිටින, වාරික සේවයේ නියැළී සිටින ඒ සියලුම සේවක පරපුර සඳහා ස්ථිර රැකියාව ලබා දෙන්නට අනිවාර්යයෙන්ම කටයුතු කරන්න කියන යෝජනාව මා මේ අවස්ථාවේ ඉදිරිපත් කරමින්, මේ යෝජනාව ඉදිරිපත් කරන්නට මට අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තුති කරමින්, මේ යෝජනාවට අදාළව තිබෙන්නා වූ ඒ ලිපි ලේඛන සියල්ලක්ම හැන්සාඩ්ගත කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

අවසාන වශයෙන් මා නැවත වරක් කියා සිටින්නේ, හම්බන්තොට බල ප්‍රදේශයට අතිවිශාල සම්පතක් වූ මේ වැදගත් ආයතනය සුරැකීමේ වගකීම මේ වර්තමාන ආණ්ඩුව සතුයි; මේ වර්තමාන පාලනය සතුයි; මේ වර්තමාන ආයතන බලධාරීන් සතුයි කියන කාරණයයි. මේ ආයතනය විනිවිදභාවයකින් යුක්තව ඉතාම ශක්තිමත්ව ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය ශක්තිය ඔවුන්ට ලැබේවා! යි කියා ප්‍රාර්ථනා කරනවා.

මේ යෝජනාව ඉදිරිපත් කරන්නට ඒ තොරතුරු කරුණු කාරණා අදහස් සියල්ලක්ම ලේවායේ ඒ කම්කරු ප්‍රජාව හරහා ලබා ගන්නට අපට පුළුවන්කම ලැබුණා. මේ යෝජනාව ඉදිරිපත් කිරීමට අපට තොරතුරු ලබා දුන් කරුණු මත ඒ කිසිම කෙනකුට දේශපාලන පළිගැනීමක් අත් නොවන්නට වග බලා ගන්න කියන එකත් ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයේ සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන්ගේ වෘත්තීමය ගැටලු විසඳාලීම සඳහා අදාළ බලධාරීන් මෙතෙක් කටයුතු කර නොමැත. අද වන විට එම ආයතනයේ සේවය කරන සේවක මහත්ම මහත්මීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා නොවීම මත ඔවුන් මානසික පීඩනයට හා කලකිරීමට ලක්ව ඇත. එබැවින් එම අර්බුදකාරී තත්ත්වය විසඳා, මෙම සේවක මහත්ම මහත්මීන්ගේ වෘත්තීය ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දී තෘප්තිමත් සේවක පිරිසක් තුළින් වඩා ඵලදායී සේවයක් ආයතනයට ලබා ගැනීමට කටයුතු කරන මෙන් සභාව කල් තබන අවස්ථාවේදී ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට මහ ලේවායත්, පලටුපාන ලේවායත්, බුන්දල ලේවායත් යන ලේවා තුනම හම්බන්තොට ලංකා සෝල්ට් ලිමිටඩ් ආයතනයෙන් තමයි පාලනය වන්නේ. මේවා මුළු හම්බන්තොට දිස්ත්‍රික්කයටම වටිනා කියන වස්තූන්.

මෙය අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට වටිනා කියන වස්තුවක්. ඒ වස්තුව රැක ගැනීම අප කාගේත් යුතුකමක්. ඒ නිසා අද ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ගෙනා යෝජනාව මම නැවත වතාවක් ස්ථිර කරනවා.

1997 එවකට හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය Lanka Salt Limited ආයතනය, පර්ක් ආයතනය හරහා පෞද්ගලිකකරණය කරන්න හදපු අවස්ථාවේ එවකට කම්කරු ඇමතිවරයා හැටියට හිටපු ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා එය පෞද්ගලිකකරණය කරන්න නොදී රුපියල් කෝටි 4,000ක මුදලක් දීලා එය සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - ETF එක- යටතට ගෙන තිබෙනවා. ඒ රුපියල් කෝටි 4,000ක මුදල දී මේ ආයතනය ලබා ගෙන, ඒකෙන් සියයට 90ක් ETF එකටත්, සියයට 10ක් කම්කරු අයිතියටත් ලබා දීලා තිබෙනවා. ඒ සියයට 10ත් කම්කරුවන්ගේ අයිතිය සුරක්ෂිත වෙනවා.

මම සේවකයන්ගේ අයිතිය වෙනුවෙන් කථා කරන්නේ. අද ඒ ETF එක පාලනය වෙන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. මුදල් අමාත්‍යාංශයෙන් පාලනය වන නිසා, අපේ ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා පෙන්වා දුන් ආකාරයට අනිවාර්යයෙන්ම මේ ආයතනය රාජ්‍ය ආයතනයක් බව ඔප්පු වෙනවා. මේ ආයතනය රාජ්‍ය ආයතනයක් බව ඔප්පු වෙන කොට ඒ කම්කරුවන්ගේ අයිතිය ලබා දිය යුතුයි. අද දකුණු පළාතේ තිබෙන ආදායම් ලබන ප්‍රධානම ආයතනයක් තමයි මේ Lanka Salt Limited ආයතනය. ඒ වාගේම මෙම ආයතනය ලංකාවේ ජනතාවගේ ජන ජීවිතයේ පරිභෝජනයට අවශ්‍ය සම්පතක් ලබා දෙන ආයතනයක්.

මෙම ආයතනයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කම්කරුවන්, සේවකයන් තමයි වැඩ කරන්නේ. දකුණු පළාතේම විශාල පිරිසක් සේවය කරන ආයතනයක්. ස්ථිර සේවකයන් 760ක් හා වාරික සේවකයන් 1,500ක් සිටින, ලුණු කඩන කාලයට අමතර සේවකයන් තුන්, හාරසියයක් බඳවා ගන්නා ආයතනයක්. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් 4,000ක් පමණ ජීවනෝපාය කර ගෙන යන ආයතනයක් තමයි මේ Lanka Salt Limited ආයතනය. මෙය අපේ දිස්ත්‍රික්කයට තිබෙන ලොකු සම්පතක්. එය රැක ගැනීම අපේ යුතුකමක්. ඒ වාගේම ඒ සේවකයන් රැක ගැනීමත් අපේ යුතුකමක්. නමුත්

හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක්, කිසිම ඇමතිවරයෙක් අද මේ අවස්ථාවේදී සභා ගර්භයේ නැහැ.

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ඉතිහාසය ගැන කථා කරන කොට ඔබතුමාත් දන්නවා, ලෙනාඩ් වුල්ෆ් කියන මහ දිසාපතිවරයා හම්බන්තොට දිස්ත්‍රික්කයේ හොඳ පාලනයක් කරපු සුදු නායකයෙක් කියලා. ඒ නායකයා පාලනය කරන කාලයේ නීතියක් ගෙනාවා. ඒ නීතිය තමයි කම්කරුවාගේ පරම්පරාවෙන් පරම්පරාවට Lanka Salt Limited ආයතනයේ කම්කරුවන්ගේ පුරප්පාඩු පිරවීම. පියා සේවය කළා නම්, ඒ පියාගේ දරුවාටද, මව සේවය කළා නම්, ඒ මවගේ දරුවාටද අනිවාර්යයෙන්ම ඒ රැකියාව හිමි විය යුතුයි කියලා ලෙනාඩ් වුල්ෆ් දිසාපතිතුමා පාලනය කරන කාලයේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. දේශපාලනීකරණය කරන නිසා අද ඒ වැඩ පිළිවෙළ නැවතිලා තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයටත්, අපටත් දෙපක්ෂයටම ඡන්දය ලබා දුන් ජනතාව තමයි මේ ලේවායේ සේවය කරන්නේ. අන්න ඒ නිසා පරම්පරාවෙන් ඒ දරුවන්ට හිමි වුණු, ඒ නැති වී ගිය අවස්ථාව යළි ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී මේ උත්තරීතර සභාවට මම යෝජනා කරනවා.

මේ ආයතනය සම්බන්ධයෙන් තවත් කරුණක් කියන්නට තිබෙනවා. 2009 දෙසැම්බර් මාසය දක්වා ලේවායේ සභාපතිවරයා සේවකයන්ගෙන් අර්ථසාධක අරමුදල් කපා ගෙන තිබෙනවා.

මහා භාණ්ඩාගාරයට ඒ මුදල් යවලා නැහැ, 2009 දෙසැම්බර් මාසයේ විතර. නමුත් සේවකයන්ගෙන් ඒ මුදල් කපා ගෙන තිබෙනවා. අද විශ්‍රාම ගිය සේවකයන්ට ඒ අර්ථ සාධක අරමුදල් ලැබෙන්නේ නැහැ. විශ්‍රාම ගිය සමහර සේවකයන්ට අද කම්කරු උසාවිවල නඩු දාලා තියෙනවා. ඔවුන්ට අර්ථ සාධක අරමුදල් ලබා ගන්න විධියක් නැහැ. අපේ සේවකයන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරන, ඔවුන් දේශපාලනීකරණයට ලක් කරන යුගයක් නිසා තමයි රටට සම්පතක් ලබා දෙන හම්බන්තොට ලේවායේ කම්කරුවන්ට මේ ඉරණම අත් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, මෙම ආයතනයේ සභාපතිවරයා වන මහින්ද ගුණවර්ධන, සාමාන්‍යාධිකාරිවරිය වන මාලිනි බණ්ඩාර යන දෙපළ මේ ලේවායේ වැඩ කරන තුන්දාහකට ආසන්න සේවකයන්ගේ වරප්‍රසාද කප්පාදු කරනවාය කියලා. ඒ අය ගිහිල්ලා ඇහුවාම, කථා කළාම ඒ අයට ප්‍රකාශ කරන්නේ මේක පෞද්ගලික ආයතනයක් කියලායි. ඇත්තටම පෞද්ගලික ආයතනයක් තමයි. ඒ දෙන්නාගේත් දේශපාලනය කරන කට්ටියගේත් පෞද්ගලික ආයතනයක් හැටියට තමයි හම්බන්තොට Lanka Salt Limited ආයතනය අද පරිපාලනය වෙන්නේ. නමුත් මේක පෞද්ගලික ආයතනයක් නොවෙයි. රජයේ මහා භාණ්ඩාගාරයෙන් පාලනය වන ආයතනයක්. රජයේ ආයතනයක් හැටියට අපට පෙන්නලා දෙන්න පුළුවන්. ඒ වාගේම කම්කරුවන්ගේ අයිතිවාසිකම් කප්පාදු කරලා දේශපාලන අධිකාරය පාවිච්චි කරමින් ඒකාධිපති පාලනයක් හැටියටයි ඒ දෙන්නා එහි පරිපාලනය ගෙනි යන්නේ. ඒ නිසා මම මේ උත්තරීතර සභාවට යෝජනා කරනවා, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කම්කරුවන්ට ලබා දුන් අයිතිය එතුමාගේ නාමයෙන් මේ සේවකයන්ට ලබා දෙන්න කියලා. සේවකයන් බඳවා ගැනීම, උසස් වීම් ලබා දීම, ස්ථාන මාරු ලබා දීම, සේවකයන්ගේ අයිතිය සහ අනිකුත් සියලුම වරප්‍රසාද මේ සේවකයන්ට ලබා දෙන ලෙස ගරු උත්තරීතර සභාවෙන් දෙවියන්ගේ නාමයෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අහිංසක, දුප්පත් කම්කරු ජනතාව වෙනුවෙන් අද දින මේ උත්තරීතර සභාවට ගෙනාපු යෝජනාව නැවත වතාවක් ස්ථිර කරමින් මේ සේවකයන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න කියලා නැවත වතාවක් ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාව පිළිබඳව රජයේ ස්ථාවරය පැහැදිලි කිරීමට කැමැතියි. විශේෂයෙන්ම එතුමා මේ යෝජනාව ගෙන එන අවස්ථාවේදී යෝජනාවට අදාළ වූ කරුණුවලට පිළිතුරු දිය හැකි අන්දමට කිසිදු විස්තරයක් දීලා නැහැ. සාමාන්‍ය වශයෙන් වෘත්තීයමය ගැටලු විසඳාලීම සඳහා බලධාරීන් කටයුතු කරලා නැහැ කියලා තිබෙනවා. සේවක මහත්ම මහත්මීන් මානසික පීඩනයට ලක් වෙලා ඇත කියලා තිබෙනවා. ඒ වාගේම ඒ තුළින් අතෘප්තිමත් සේවක පිරිසක් ඉන්න නිසා මේ ආයතනයට ඵලදායී සේවයක් වෙන්නේ නැහැ කියලා තිබෙනවා. EPF එකේ මුදල් ගෙවීම පැහැර හැරීම වැනි කරුණු පිළිබඳව එතුමා යෝජනාවේ සඳහන් කළා නම් ඒ පිළිබඳව අපට කම්කරු කොමසාරිස්තුමාගෙන් අහලා හොයලා බලලා එහි සත්‍ය අසත්‍යතාව මේ සභාවට ඉදිරිපත් කරන්න තිබුණා. නමුත් එතුමා සාමාන්‍යයෙන් නිකම් වචන මාලාවක් පමණක් දාලා මේ යෝජනාවට ප්‍රස්තුත වූ කාරණයන් පිළිබඳව නිසි දැනුම් දීමක් අපට කරලා නැහැ. ඒක මුලින්ම ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා අපිට ඔය කියන චෝදනා පිළිබඳව මේ සභාවේදී උත්තර දීමට පුළුවන්කමක් නැහැ. ඒක පළමුවැනි කාරණයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය මෙයයි. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාට මම කියන්නට ඕනෑ, එතුමන්ලා දැන් කී පරිදිම Lanka Salt Limited ආයතනය සේවක භාරකාර අරමුදල් මණ්ඩලය කොටස් සියයට 90යි, සේවකයන්ගේ කොටස් සියයට 10ක් සහිතව සමාගම් පනත යටතේ වෙනම සමාගමක් ලෙස ලියාපදිංචි කළාය කියලා. එතකොට EPF එකේ සහ ETF එකේ සියයට 90ක කොටස් රජයට තිබෙනවා. නමුත් රාජ්‍ය සංස්ථාවක් ගත්තොත්, රජය යටතේ තිබෙන ආයතනයක් ගත්තොත් ඒවා සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරපු ඒවා නොවෙයි. සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරලා ආයෝජනයක් වශයෙන් රජය විසින් එහි කොටස් ගත්තාය කියලා එය රාජ්‍ය ආයතනයක් බවට පත් වෙන්නේ නැහැ. ඒ නිසා සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද එවැනි සියලු සමාගම් වැටෙන්නේ පෞද්ගලික සමාගම් ගණයටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික සමාගම් ගණයට අයත් වුණායින් පස්සේ පෞද්ගලික ව්‍යවසායකයකු හැටියට ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට එය පාලනය කිරීමට පුළුවන්. රජයේ නීතිරීති, රෙගුලාසි බලපාන්නේ නැහැ. නමුත් කම්කරු කටයුතු පිළිබඳව බලපානවා. ඒක ඇත්ත. EPF ගෙවන්න ඕනෑ, ETF ගෙවන්න ඕනෑ, පඩිනඩි ගෙවන්න ඕනෑ. ඒවා ගෙව්වේ නැති නිසා වෙන්න ඇති ඔබතුමා කියන පරිදි දැන් ඒ ගොල්ලෝ කම්කරු කොමසාරිස්වරයා ළඟට ගිහිල්ලා තිබෙන්නේ. ඒක කම්කරු කොමසාරිස්තුමා විසඳයි.

ඒ වාගේ ප්‍රශ්න ලංකාවේ සෑම පෞද්ගලික අංශයේ සමාගම් සහ සේවකයන් අතරම තිබෙනවා. කම්කරු කොමසාරිස්තුමාට පුළුවන්, EPF ගෙව්වේ නැත්නම් අධ්‍යක්ෂ මණ්ඩලය හිරේ යවන්න. ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන තිබෙනවා. නමුත් ආණ්ඩුවේ වාගේ බඳවා ගැනීමේ පරිපාටි, මෙච්චර දින ගණනක් වැඩ කළාම

රාජ්‍ය සේවකයෝ ස්ථිර කරන්න කියලා රජය චක්‍රලේඛයක් යැව්වාම ඒක Lanka Salt Limited එකට බලපාන්නේ නැහැ. පෞද්ගලික සමාගමක් වශයෙන් ඒ අයට ඒක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මෙන්න මේ තත්ත්වය පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. අනිත් කාරණය, Lanka Salt සමාගම බොහෝ වෙලාවට එක් එක් seasonal වැඩ තමයි කරන්නේ. ඒ කියන්නේ සමහර අවස්ථාවන්හිදී එක එක කාල වකවානුවලදී තමයි එහි සේවකයන්ට රැකී රක්ෂා තිබෙන්නේ. සියලු දෙනාම එකවර සේවයේ යොදවා ගන්න අපට පුළුවන්කමක් නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වාරික සේවය.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
වාරික සේවයකයින් ස්ථිර කරන්නේ කොහොමද? වාරික සේවය කියන්නේ වාරිකවලට වැඩ කරන අය. එතකොට අවුරුද්දට මාස 3ක් වැඩ කරන අය ස්ථිර කරන්න පුළුවන්ද? ලෝකයේ කොයි රටකවත් එහෙම දෙයක් වෙන්නේ නැහැ. එහෙම කළොත් ඒ ආයතනය ණය වෙලා, ඒ ආයතනයේ සේවක අතිරික්තයක් ඇති වෙලා, වැඩ නොකරන මාසවලටත් පඩි දීලා, ඒ ආයතනය කඩා වැටෙන තත්ත්වයක් තමයි ඇති වෙන්නේ. එම ආයතනය වට්ටන්නට ඕනෑ නම්, සජිත් ප්‍රේමදාස මැතිතුමාට ඒ තුළින් රජයට අප්‍රසාදයක් ගේන්න ඕනෑ නම් මේක තමයි හොඳම යෝජනාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙවැනි දේවල් ප්‍රායෝගික නැහැ. මොකද, මේක පෞද්ගලික අංශයේ සමාගමක්. ඒ සමාගම ඒ පරිපාලන කටයුතු කරනවා.

මෙම ආයතනයේ සේවකයන්ට අසාධාරණයක් වුණොත් කම්කරු කොමසාරිස්වරයා වෙත හරි, Labour Tribunal වෙත හරි යන්න පුළුවන්. ඒක තමයි තිබෙන ක්‍රමවේදය. හැබැයි රජයට වග කීමක් තිබෙනවා. සියයට 90ක් මුදල් සේවක අර්ථ සාධක අරමුදලින් යොදලා තිබෙන නිසා අපට යම් යම් කරුණු පිළිබඳව සොයා බලන්න පුළුවන්. ඒ වග කීමෙන් රජය ගැලවෙන්නේ නැහැ. නමුත් විගණකාධිපතිවරයාට ගිහිල්ලා ඒක audit කරන්න, ඒවා මේවා කරන්න බැහැ. ඒක පෞද්ගලික සමාගමක්. රජය කිව්වොත්, අපි දැන් වෙනත් පෞද්ගලික සමාගමක ආයෝජනය කරනවා කියලා, අපිට ගිහිල්ලා ඒ සමාගම audit කරන්න බැහැ. රජයෙන් ලබා දෙන නිවාඩු හරි, වෙනත් ප්‍රතිලාභ හරි ඒ සමාගමට ලබා දෙන්න බැහැ. පෞද්ගලික සමාගම් සඳහා ලැබිය යුතු, ඒ සඳහා තිබෙන නීතිරීති රෙගුලාසි තමයි ඒකට අයත් වෙන්නේ. ඒ නිසා රජයේ ඒ අයිතිවාසිකම් ආදේශ කිරීමට නීතිමය හැකියාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරිපත් කළ තවත් කාරණයක් තමයි මව සහ පියා වැඩ කළා නම් ඒ අයගේ දරුවන්ට එම ස්ථානයේ රැකියාව දෙන්න ඕනෑය කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සංකල්පය දැන් ඉවරයි. සෝල්ට් එකේ වැඩ කරපු අම්මාගේ හෝ තාත්තාගේ පුතා අද ඊට වඩා ඉහළ රැකියාවන් හම්බන්තොට සංවර්ධනයත් එක්ක හොයා ගෙන යනවා. දැවැන්ත සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයගේ දරුවන්ට අද උසස් අධ්‍යාපනය තුළින් උපාධිධාරින් වීමට ඒ වාගේම කොම්පියුටර් තාක්ෂණය ලබා ගැනීමට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයෙන් අවස්ථාව ලබා දීලා තිබෙනවා. සෝල්ට් ඒකේ ලුණු එකතු කරපු දෙමාපියන්ගේ දරුවන් ඒ තත්ත්වයේම තබා ගැනීමට, අර වැඩවසම් යුගයේ තබා ගැනීමට එක්සත් ජාතික පක්ෂයට වාගේ අදහසක් අපට නැහැ. ඒ අය ඒ වැඩ කරන්නෙත් නැහැ. ගෝලීයකරණය වූ නව ලෝක සංස්කෘතිය හා ඒ ආර්ථිකය තුළ ඒ තරුණ තරුණියන්ට ඊට වඩා හොඳ රැකියා අපි සපයා දෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා එවැනි ඉල්ලීමක් කිරීම ඉතාම අසාධාරණයි. ඒ සමාගම් නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා තමන්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව ඒ අවශ්‍ය වැඩ කටයුතු කරනවා. එහෙම සේවකයන් තළන පෙළන බවට කිසිදු චෝදනාවක් අපට ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සේවකයෝ ගැන කියන අනික් කාරණය තමයි මේ අය අහිංසක, අසරණ අයයි කියන එක. කොහෙද අසරණ වෙලා තිබෙන්නේ? අසරණ අය කොහෙද ඉන්නේ? මොකටද අසරණ අය වන්නේ? තමන්ට ලැබෙන පඩියෙන් කසිප්පු බීලා, දුම් වැටි පාවිච්චි කරලා ඒ සල්ලි නාස්ති කරන අය තමයි අසරණ වන්නේ. නැත්නම් හොඳ පඩියක් ලැබෙනවා. ඒ පඩිය ජීවත් වීමට ප්‍රමාණවත්. ඒ අය අසරණ නැහැ. අත පය කැඩිලා, අංග විකල වෙලා ඉන්නවා නම් ඒ අය තමයි අසරණ වන්නේ. හැමදාම එක්සත් ජාතික පක්ෂය කියන්නේ, ලංකාවේ ඉන්නේ ඔක්කෝම අසරණ, අහිංසක අය කියලායි. අහිංසක වන්න පුළුවන්. අහිංසක කියන්නේ හිංසාවක් නොකරන. ඒක හරි. අහිංසක ජනතාවක් ඉන්නේ. නමුත් අසරණ නැහැ. ඔවුන්ට සරණක් ලැබිලා තිබෙනවා. අපේ රජය රැකිරක්ෂා 700කට වැඩි ප්‍රමාණයක් මේ තුළින් සාක්ෂාත් කරලා දීලා තිබෙනවා.

ඊළඟට එදා පාඩුවට ගිය ඒ ව්‍යාපාරය අද ලාභ ලබන ව්‍යාපාරයක් බවට පත් කරලා තිබෙනවා. ඒ අයගේ රැකියාවේ සුරක්ෂිතභාවය අපේ රජය යටතේ ඇති කරලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උදාහරණයක් වශයෙන් 2009 වර්ෂයේ මිලියන 130ක ලාභයක් ලැබුවා පාඩුවට දුවාපු මේ සමාගම. 2010 වර්ෂයේ මිලියන 100ක ලාභයක් ලබා තිබෙනවා. ඒ නිසා අති විශිෂ්ට ප්‍රෞඪත්වයක් තිබෙනවා ඒ සේවකයන්ට. තමන් බංකොලොත් සමාගමක සේවකයෝ නොවෙයි. ලාභ උපදවන සමාගමක ප්‍රෞඪ සේවකයන් හැටියට වැඩ කටයුතු කිරීමේ වාතාවරණය, ඔවුන්ගේ අනාගත සුරක්ෂිත භාවය ලැබිලා තිබෙනවා. කොයි වෙලාවේ හෝ මේක බංකොලොත්වෙලා රැකියාව නැති වුණොත් තමයි ඒ ගොල්ලන් අසරණ වන්නේ. අපි ඒ අය එහෙම අසරණ කරලා නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, කාරණයක්-

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
නැහැ, එපා. ඔවුන්ට සේවා සුරක්ෂිත භාවය අපේ රජයෙන් ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ පෞද්ගලික සමාගම් කෝප් එකටවත් ගේන්න බැහැ. පාර්ලිමේන්තුවේ අණසකට යටත් වන්නේ නැහැ. එහෙම නම් ඉතින් පෞද්ගලික සමාගම අහෝසි කරලා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, එහෙම නම් කොහොමද මේ යෝජනාව ගරු සභාව පිළිගත්තේ?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්න තිබුණා. නමුත් රජයක් වශයෙන් අපේ යම් බැඳීමක් තිබෙන නිසා, අපේ යම් ආයෝජනයක් තිබෙන නිසා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

රජය කල්පනා කළා මේ වැරදි ප්‍රචාරවලට පිළිතුරක් දෙන්න. නැත්නම් කියාවි, ඔන්න අපි මේකට භයේ උත්තර දෙන්නේ නැතිව ඉන්නවා කියලා. අපේ රජයේ පාරදෘශ්‍ය හා විවෘත භාවය ප්‍රදර්ශනය කරමින් අපට හොඳ අවස්ථාවක් ලැබුණා මේ කරුණු ටික කියන්න. ඒ නිසා එතුමාට ස්තුතියි. මොකද, සමහර වෙලාවට තමන් ගහන සමහර දේවල් තමන්ටම පාරාවළලු බවට පත් වෙනවා. ඒකයි අපි කිව්වේ එක්සත් ජාතික පක්ෂයේ ඒ ප්‍රතිපත්තිය, ඒ වැඩවසම් යුගයේ ක්‍රියාදාමයන් උළුප්පා දක්වන යෝජනාවක් තමයි මේක කියලා. අපි එහෙම නැහැ. අපි නවීන ලෝකය, නවීන තාක්ෂණය සමඟ මේ පෞද්ගලික සමාගම මඟින් අද ඉතා විශාල සේවයක් කරනවා. මම දන්නවා මම සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් ඉන්න අවස්ථාවේදී ලුනුවලට අයඩින් යෙදීම සම්බන්ධව විශාල ප්‍රශ්නයක් තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අයඩින් දාන්න ඕනෑ ලුනුවලට. ලුනුවලට අයඩින් එකතු කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතියට අනුව අවශ්‍යතාවක්.

අයඩින් ඌනතාව මැකීම සඳහා ලෝකයේ හැම තැනම ලුනුවලට අනිවාර්යයෙන්ම අයඩින් එකතු කරනවා. අයඩින් එකතු කරලා තමයි ඒ ලුනු වෙළඳ පොළට ගෙන යන්නේ. ඒ සඳහා නිසි ක්‍රියාවලියක් ලංකාවේ තිබුණේ නැහැ. නමුත් මේ සමාගම ඒ ක්‍රියාවලිය ආරම්භ කළා. ඒ සමඟම අනෙකුත් සමාගම්වලට සහ සුළු ව්‍යවසායකයන්ට අනිවාර්යයෙන්ම ඒ ක්‍රියාවලියට ඇතුළත් වන්නට සිදු වුණා. ඒ අතිනුත් -සෞඛ්‍ය අංශයෙනුත්- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ලුනු නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට මේ සෝල්ටන් සමාගම දායක වෙලා තිබෙනවා. ඒ නිසා මෙවැනි අති දැවැන්ත සේවාවක් කාලීන හා නූතන යුගයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි නවීන යන්ත්‍රෝපකරණ ගෙනල්ලා, මේ විධියට අයඩින් එකතු කරලා, අයඩින් සහිත ලුනු අපේ පාරිභෝගික ජනතාවට දීමේ වගකීම අපට ලබා දීලා තිබෙනවා. එම නිසා මා එම සමාගමට ස්තුතිවන්ත වෙනවා එවැනි දැවැන්ත සේවයක් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සේවකයන්ට එවැනි යම් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් අපි අපිට කරන්නට පුළුවන් දෙයක් කරනවා කියා මම රජය වෙනුවෙන් කියන්නට කැමැතියි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්න අපේ නියෝජිතයන් මාර්ගයෙන් අපි නියෝග කරනවා එවැනි දෙයක් වෙලා තිබෙනවා නම් ඒ පිළිබඳව සානුකම්පිතව, නිසි ලෙස සහ නීත්‍යනුකූලව සොයා බලා ඒ සේවකයන්ට එම සමාගම් ක්‍රියාවලිය තුළ ලබා දිය හැකි ඉහළම ප්‍රතිලාභ ලබා දීලා, ඒ සේවක ගැටලු නිරාකරණය කරන්න කියලා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කියන්නේ මේ රටේ වැඩ කරන පන්තියේ ජනාධිපතිවරයෙක්. හාම්පුතුන්ගේ ජනාධිපතිවරයෙක් නොවෙයි. ඒ නිසා එතුමාගේ රජයෙන් එම යුතුකමත් ඉටු වන බව ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7. 17ට, 2011 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பாராளுமன்றம் பி. ப. 7.17 மணிக்கு, 2011 ஓகஸ்ட் 11, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 7.17 p.m. until 1.00 p.m. on Thursday, 11th August, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.